# අනුරාධපුර, රන්මසු උයනේ පිහිටි සංකේත චක්‍රයේ බෞද්ධ මුහුණුවර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ*[1]

සංකේතාත්මක කලා කෘතිවලින් බෞද්ධ සන්නිවේදන ලක්ෂණ හෙළි වේ. එවැනි සුවිශේෂී කලා කෘතියක් ලෙස රන්මසු උයන සංකේත චක්‍රය හඳුනාගත හැකි ය. රන්මසු උයන රාජකීය ජල උද්‍යානයේ පර්වතයක් ආශ්‍රිත ලෙනක දක්නට ලැබෙන සංකේත චක්‍රය පිළිබඳ වත් එහි බෞද්ධ මුහුණුවර පිළිබඳ වත් විමසුමක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අපේක්ෂාවයි. අනුරාධපුර ඓතිහාසික පුද බිමේ හමු වන සියලු නටබුන්, කලා කෘති ආගමික පසුබිමක් මත ගොඩනැගුණු ඒවා වුව ද අතීත රාජකීයන්ගේ විනෝදයට නිර්මාණය වූ රන්මසු උයන එම ආගමික නිර්මාණ අතර වන එක ම ගිහි ජීවිතානුබද්ධ නටබුන්හි ශේෂයයි. එහෙත් එහි ද බෞද්ධ මුහුණුවරකින් යුතු කලා කෘති දක්නට ලැබේ. රන්මසු උයන ශ්‍රී ලංකාවේ අනුරාධපුරයේ ඉසුරුමුණි විහාරයට ආසන්න ව ඇති පෞරාණික ජල උයනකි. ක්‍රි. ව. දහ වන සියවසට අයත් සිවු වන මිහිඳු රජුගේ වෙස්සගිරි සෙල්ලිපියේ මෙම උද්‍යානය හඳුන්වා තිබෙන්නේ රන්මසු උයන යනුවෙනි. රන්මසු උයනට අයත් අංක 34 ලෙනෙහි විශ්ව චක්‍රය ලෙස හඳුන්වනු ලබන රූප සහිත මෙම විශේෂ සංකේත චක්‍රයක් දැකගත හැකි වේ. මීටර් 1.8 ක පමණ විශ්කම්භයකින් යුත් වෘත්තයක් වූ මෙහි විවිධ ජ්‍යාමිතික හැඩතල හා සත්තව රූප දක්නට ලැබේ. රන්මසු උයන රාජකීය ජල උද්‍යානයේ පිහිටි මෙම සංකේත චක්‍රය පිළිබඳ මේ වන විටත් නිශ්චිත නිගමනයක් නොමැත. එහෙත් අතීත කලා කෘතිවල සංකේතාත්මක මුහුණුවර විමසීමේ දී එම පොදු සංකේතාත්මක මුහුණුවර මෙම සංකේත චක්‍රය තුළ ද දැකගත හැකි ය. සඳකඩ පහණට, චෛත්‍ය නිර්මාණයන්ට සබැඳි ආගමික අර්ථ දැක්වීම්හි සංකේතාත්මක ආගමික මුහුණුවරින් ඔබ්බට ගොස් මනස මූලික කරගත් චිත්ත ඒකාග්‍රතාව පසුබිම් වූ බෞද්ධ මුහුණුවර මෙම සංකේත චක්‍රයෙන් විමසිය හැකි අතර ම අතීත කලාකරුවාගේ බෞද්ධාගමික නැඹුරුව මෙමගින් විද්‍යාමාන වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** චිත්ත ඒකාග්‍රතාව, බෞද්ධාගමික නැඹුරුව, බෞද්ධ මුහුණුවර, රන්මසු උයන, සංකේත චක්‍රය

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com

# මකුලාන රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක ලක්ෂණ සහිත අංග පිළිබඳ ව අධ්‍යයනයක්

*එම්.එම්.එන්.එස්. විජේරත්න*[1]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලිගන්හත්පත්තුවේ ගන්දහයේ කෝරළේ මාවතගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අරම්පොළ නම් ගමෙහි මකුලාන රජමහා විහාරය පිහිටා ඇත. කණක නම් බමුණා විසින් මෙම ගල් පර්වතයට රැගෙන ආ කේශධාතූන් වහන්සේ තැම්පත් කරමින් සෑදූ චෛත්‍ය මකුලාන ලෙසින් හැඳින්වේ. මෙම ස්ථානයෙහි පුරාවිද්‍යාත්මක ලක්ෂණ සහිත අංග ගණනාවක් හඳුනාගත හැකි අතර ඒ පිළිබඳ ව මෙමගින් අධ්‍යයනය කළ හැකි ය. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර ගවේෂණයක් මෙන් ම ද්විතීයක මූලාශ්‍රයන් භාවිත කරමින් ද තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදි. මහනුවර යුගයට අයත් යැයි විශ්වාස කෙරෙන පැරණි විහාර මන්දිරයක් පවතින අතර එලෙස හඳුන්වන්නේ විහාර මන්දිරයේ වහලයේ ඇති හැඩය, විහාර මන්දිරයේ ඇති බුද්ධ ප්‍රතිමා නෙලා ඇති ආකාරය හා සිතුවම් ආදිය නුවර යුගයට සමාන වීම නිසා ය. මෙම චෛත්‍ය ඉදි කළ කාලවකවානුව සනාථ කිරීම සඳහා සෙල්ලිපි හතක් කොටා ඇත. එහෙත් දැනට ඉතිරි ව ඇත්තේ සෙල්ලිපි දෙකක් පමණි. එඩ්වඩ් මියුලර් විසින් රචිත ග්‍රන්ථයේ මෙම සෙල්ලිපි පිළිබඳ ව සඳහන් වේ. මීට අමතර ව පියගැටපෙළ අසල ඇති පොකුණෙහි, පියගැට පෙළෙහි හා පහන්වැට ආශ්‍රිත ව නෂ්ටාවශේෂ දැකගත හැකි වේ. මෙම ස්ථානයේ පවතින අනෙක් පුරාවිද්‍යාත්මක අංගය වන්නේ නොසිඳෙන දිය පොකුණයි. මෙය ගල් පර්වතය මුදුනේ තිබෙන පොකුණක් වුව ද මෙයට ජලය සැපයීමක් නොමැත. මෙය ස්වභාවික පොකුණකි. කොතරම් නියගයක දී වුව ද මෙම පොකුණ නොසිඳී පවතින අතර මෙය හඳුන්වනේ නොසිඳෙන පොකුණ නමිනි. බෝධීන් වහන්සේට නුදුරින්, පොකුණ අසිලින්, උමගක් වැනි යමක් පිහිටා ඇත. එයට ඉහළින් ඇති කළු ගලින් හා ගඩොලින් සෑදූ තාප්පයක් වැනි බැම්මක් දැකගත හැකි අතර පැරැන්නන් පවසන්නේ මෙය උමං මාර්ගයක් බවත්, එයින් රිදී විහාරයට යා හැකි බවත් ය. එහෙත් ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොමැති බැවින් මෙය බෙනයක් ලෙස ද උපකල්පනය කළ හැකි ය. මෙම ස්ථානයෙහි අලංකාර ලෙස ගලින් නිමවන ලද සිරිපතුලක් ද දැකගත හැකි වේ. මකුලාන රජමහා විහාරයෙහි එවැනි වටිනා පුරාවිද්‍යාත්මක අංගයන් හඳුනාගත හැකි වුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෙම ස්ථානය වෙත අවධානය යොමු කර තිබෙන්නේ අල්ප වසයෙනි. වර්තමානය වන විට මෙම ස්ථානය අභාවයට පත් වන ආකාරයක් දැක ගත හැකි බැවින් මේ පිළිබඳ ව තව දුරටත් අවධානය යොමු කරන්නේ නම් අගනේ ය.

***ප්‍රමුඛ පදඃ*** කුරුණෑගල, මකුලාන රජමහා විහාරය, නොසිඳෙන පොකුණ, පුරාවිද්‍යාත්මක අංග

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. Nadee123a@gmail.com

# දෙවනගල රජමහා විහාරයේ අගයන් පිළිබඳ අධ්‍යයනයක්

*බී.ආර්.අයි. විනෝදනී බෝරදෙනිය*[1]

රටක උරුමය අතීත පරම්පරාවෙන්ගෙන් වර්තමානයට ලබාදෙන්නා වූ දායාදයක් වන අතර උරුමයේ වටිනාකම රඳා පවතින්නේ එහි පවතින අගයන් තුළිනි. උරුමයකට පුද්ගලික, ප්‍රාදේශීය, ජාතික හෝ අන්තර්ජාතික වටිනාකමක් ලබා දෙන්නේ අගයන් හරහා ය. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල - හෙම්මාතගම මාර්ගයේ දෙවනගල ප්‍රදේශයේ අක්කර 72ක පමණ විශාලත්වයකින් යුතු පර්වතයක් මත ඉදි කර ඇති දෙවනගල රජමහා විහාරයේ අගයන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර ගවේෂණය මඟින් සහ ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍රයන් පරිහරණය හරහා තොරතුරු ලබා ගන්නා ලදී. උරුමයක අගයන් පිළිබඳ විමසීමේ දී භාව විෂයයික අගයන්, සංස්කෘතික අගයන් සහ ව්‍යවහාරික අගයන් ලෙස ප්‍රධාන වසයෙන් අගයන් හඳුනාගත හැකි ය. ඒවා යටතේ තවත් අගයන් ගණනාවක් පවතී. උරුම ස්ථානයක් සංරක්ෂණය කිරීමට පෙර මෙම අගයන් සියල්ල හඳුනාගැනීම ඉතා මත් වැදගත් වේ. දෙවනගල රජමහා විහාරයේ පෞරාණික, පුරාවිද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක ලක්ෂණවලින් යුතු ස්මාරක සහ ඒ ආශ්‍රිත පරිසරය නිසා ම එහි අගයන් රැසක් හඳුනාගත හැකි ය. දෙවනගල රජමහා විහාරය පිහිටා ඇති පර්වතයේ උසම කොටසේ ටැම්පිට පිළිමගෙය, දාගැබ, ධර්ම ශාලාව, පැරණි සංඝාවාසය සහ ශෛලමය විහාරයේ නටබුන් මෙන් ම අලංකාර පොකුණක් ද දක්නට ලැබේ. මෙම සියලු ස්මාරක හරහා දෙවනගල රජමහා විහාරයට ලැබී ඇත්තේ සුවිශේෂී වටිනාකමකි. විශේෂයෙන් ම මෙහි මහනුවර යුගයට ආවේණික වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුතු ටැම්පිට ප්‍රතිමාඝරය සහ එහි බිතුසිතුවම් තුළින් පුරාවිද්‍යාත්මක, වාස්තු විද්‍යාත්මක, සංස්කෘතිමය හා කලාත්මක අගයන් රැසක් හඳුනාගත හැකි විය. එසේ ම විහාරයේ ගල් තලාව මත දක්නට ලැබෙන පළමු පරාක්‍රමබාහු රජු සහ විමලධර්මසූරිය රජු විසින් කරවන ලද සෙල්ලිපි මඟින් දෙවනගල රජමහා විහාරයේ උරුමයන්හී වටිනාකම විදහා දක්වයි. මෙම ස්ථානයේ භූගෝලීය පිහිටීම එයට ම ආවේණික වූ පාරිසරික සුවිශේෂීතාව නිසා ම සෞන්දර්යාත්මක, ආශ්චර්යාත්මක අගයන් පවතින බව මෙම අධ්‍යයනය මඟින් හඳුනාගත හැකි විය. මූලාශ්‍රයගත තොරතුරු අනුව අනුරාධපුර යුගය දක්වා ඈත ඉතිහාසයක් ඇති දෙවනගල රජමහා විහාරයේ අගයන් රැසක් වර්තමානය දක්වා ම නො නැසී පවතින බව මෙම පර්යේෂණය මඟින් ගම්‍යමාන විය.

***ප්‍රමුඛ පදඃ*** දෙවනගල, රජමහා විහාරය, පුරාවිද්‍යාත්මක, උරුම අගයන්

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. imeshavinodani332@gmail.com

# THE EFFECT OF THE ANNUAL EDUCATIONAL TRIPS TOWARDS THE ATTITUDE OF CULTURAL HERITAGE MANAGEMENT OF PRIMARY SCHOOL STUDENTS IN NORTH WESTERN PROVINCE.

*M.A.S. Fernando.[1]*

The development of a country from every section such as politically, socially, culturally, and economically depends on the attitudes of citizens. The development of attitudes of the younger generation for cultural heritage management is essential. In Sri Lanka, one of the principal methods to develop a positive attitude towards cultural heritage is the annual educational trip. The unique purpose of my study is to observe the credibility of annual educational trips toward the improvement of attitudes about cultural heritage management in primary school students' minds. The method utilized during my research is mixed research. The sources that were referred to during the study are ideas of 20-year-old students of secondary schools representing Kurunegala and Puttlam districts in North Western province about their primary school period educational trips. According to those data, the main reason for visiting historically and culturally important sites is the Grade 5 Scholarship exam. The second reason revealed during my research is the limited period allowed by the Ministry of Education for the annual educational trip of primary school students. Due to that fact, students don't have enough time to visit and observe, and the most important thing; is to appreciate a single monument. According to my opinion, this is the most critical factor for the blockage of developing positive attitudes about the country's cultural heritage, in these students' minds. Furthermore, parents encourage schools to visit a maximum number of places during a single educational trip due to financial difficulties. In conclusion, my research has revealed that government schools' educational trips were less organized and have malfunctioned in the development of positive attitudes about cultural heritage in Sri Lankan primary students' minds.

***Keywords:*** Cultural Heritage, Educational trip, Primary school students

[1] Rajarata University of Sri Lanka, Mihintale. amodafernando21@gmail.com

# කොළඹ කොටුව දුම්රිය ස්ථානය පිළිබඳ කාර්මික පුරාවිද්‍යා අධ්‍යයනයක්

*ඩබ්. පි. ඩී. සී ගුණවර්ධන*[1]

කොළඹ නගරයේ දැනට පවතින ඓතිහාසික ගොඩනැගිලි අතර කොළඹ කොටුව දුම්රිය ස්ථානයට හිමි වනු ලබන්නේ සුවිශේෂී වැදගත්කමකි. 1917 වර්ෂයේ නිර්මිත මෙම දුම්රිය ස්ථානය සඳහා ප්‍රධාන වසයෙන් ආභාසය කොටගන්නා ලද්දේ බ්‍රිතාන්‍යයේ මැන්චෙස්ටර් වික්ටෝරියා දුම්රිය ස්ථානයෙහි ආකෘතියයි. එයට අමතර ව දේශීය වසයෙන් පැවති යම් යම් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ද, රෝමානු ගොතික් සම්ප්‍රදායේ ආභාසය ද මෙම දුම්රිය ස්ථානය තුළින් දිස් වේ. මෙම පර්යේෂණය තුළින් හඳුනාගත් කාර්මික පුරාවිද්‍යා අංගයන් අතර ලීස්ටර් රථය, පැරණි ජල ස්ථම්භය, මඟී පාලම් හා පැරණි ප්‍රවේශ පත්‍ර කවුළුව වැදගත් වේ. මෙම කාර්මික උරුමයන්ගෙන් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කොට ඇත්තේ එංගලන්තයේ වන අතර තාක්ෂණික විශේෂතා ගත් කල ලීස්ටර් රථය තුළින් මුල් කාලීන මෝටර් රථ තාක්ෂණයේ ලුහුඬු තාක්ෂණික අංගයන් ද, දුම්රිය ස්ථානය පිළිබඳ පොදුවේ සලකා බැලීමේ දී ගැල්වනයිස් කිරීම, චීනච්චට්ටි ලෝහය භාවිතය, දේශීය වසයෙන් සපයා ගත හැකි ගම්මාළු, වරා වැනි ශක්තිමත් දැව භාවිතයත් හඳුනාගත හැකි ය. ලංකාවේ දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉතිහාසය පිළිබඳ ව මේ වන විට ප්‍රාමාණික පර්යේෂණයන් සිදු ව ඇතත් කාර්මික පුරාවිද්‍යා පදනමක් යටතේ එම පර්යේෂණවල තොරතුරු අන්තර්ගත නොවීම හේතුවෙන් එක් දුම්රිය ස්ථානයක් පිළිබඳ ව හෝ කාර්මික පුරාවිද්‍යා පදනමක් යටතේ තොරතුරු ගොනු කරලීම මෙම පර්යේෂණයේ වැදගත්කමයි. එසේ ම කොළඹ කොටුව දුම්රිය ස්ථානය තුළ මේ වන විටත් මූලික ස්වරූපය වෙනස් නොවී භාවිත වන හා භාවිත නොවන කාර්මික පුරාවිද්‍යා උරුමයන් හඳුනා ගනිමින් ඒවායේ උපයෝගීතාව කුමක් ද යන්න සොයා බැලීම පර්යේෂණ ගැටලුව වන අතර එම උරුමයන් පිළිබඳ ව විමර්ශනාත්මක ව හා ගවේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කරලීම මෙහි අරමුණ වේ. මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලද්දේ පුරාවිද්‍යාත්මක අධ්‍යයනවල දී භාවිත කරනු ලබන ගවේෂණාත්මක ක්‍රමවේදයයි. මේ සඳහා දත්ත රැස්කර ගැනීමේ දී ප්‍රාථමික සහ ද්විතියක මූලාශයන් හා ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත භාවිත කරන ලදි. රැස්කර ගන්නා ලද මෙම දත්තයන් විස්තරාත්මක ඡේද ක්‍රමය, ඡායාරූප හා දළ සටහන් භාවිතයෙන් ඉදිරිපත් කරනු ලැබී ය. මෙම පර්යේෂණය තුළින් එළඹිය හැකි නිගමණය නම් කොළඹ කොටුව දුම්රිය ස්ථානය ආශ්‍රිත ව පවතින කාර්මික පුරාවිද්‍යා උරුමයන්ගෙන් බහුතරයක් යාවත්කාලීන වෙමින් වර්තමානය වන විට ද අඛණ්ඩ ව භාවිතයේ පවතින බව ය.

***ප්‍රමුඛ පදඃ*** කොළඹ කොටුව දුම්රිය ස්ථානය, කාර්මික පුරාවිද්‍යාව, කාර්මික පුරාවිද්‍යා උරුමයන්, ලීස්ටර් රථය, ජල ස්ථම්භය

---

[1] කැලණිය විශ්වවිද්‍යාලය. denukacharith25@gmail.com

# ශ්‍රී ලංකාවේ විවිධ ගිනි අවි සම්භවයට බලපෑ යුද උපක්‍රම පිළිබඳ විමර්ශනයක්.

*යූ.සී. ලත්හාරි* [1]

යුරෝපීයන්ගේ ආගමනයේ පටන් මෙරට රාජධානිවල විශාල පිරිස් බලයකින් යුත් යුද්ධ ශක්තියක් තිබුණ ද යුරෝපීයන්ගේ ගිනි අවි තාක්ෂණය ඊට අභියෝගයක් විය. එමෙන් ම උඩරට රාජධානියෙහි ආරක්ෂක යුද්ධ උපායන් භාවිතයෙන් තුවාලකරුවන් අවම කරගැනීමට ද ගිනි අවි භාවිත විය. එම නිසා මෙරට ගිනි අවි භාවිතයේ ආරම්භයත් ප්‍රචලිත වීමත් මෙසේ සිදු විය. ශ්‍රී ලංකාවේ විවිධ ගිනි අවි සම්භවයට බලපෑ යුද උපක්‍රම මොනවා ද යන පර්යේෂණ ගැටලුව මුල් ව සිදු වූ මෙම පර්යේෂණයේ අරමුණ මෙරට ගිනි අවි සම්භවය හා විකාශනය හරහා එවකට පැවති යුද්ධමය ස්වරූපය අතර සම්බන්ධය හඳුනාගැනීමයි. මෙහි දී යොදාගත් ක්‍රමවේදය වසයෙන් පුස්තකාල සහ අන්තර්ජාල පරිශීලනය භාවිතයට ගැනිණි. ලංකාවේ පැරණිතම තුවක්කුව කොඩිතුවක්කුව වේ. ඉන් ආරම්භ ව කාලතුවක්කු, දික් තුවක්කු, අත් තුවක්කු වැනි විවිධ ගිනි අවි යුධ බිමේ විවිධ අවශ්‍යතාවන්ට නිපදවීය. සැහැල්ලු ප්‍රහාරක කාලතුවක්කු වසයෙන් භාවිත කොඩිතුවක්කු පාබල හමුදාවේ ආධාරක ප්‍රහාර දියත් කිරීමටත් පහසුවෙන් නැවත එකලස් කළ හැකි බැවින් ගරිල්ලා සටන්හි දීත් වඩාත් උචිත විය. එසේ ම පෘතුගීසීන්ට එරෙහි ව සීතාවක රාජසිංහ දවස කැලණි ගං ඉවුරෙහි ස්ථාපිත ව තැබූ කාලතුවක්කු සතුරු සැපයුම් විනාශ කරලී ය. මෙරට පිරිසැකසුම් කළ විශේෂතම ගිනි අවිය වන දික් තුවක්කුවේ මුළු දිග අඩි හතකට වඩා වේ. සටන්වල දී තිරස් දිගු දුර වෙඩි තැබීම්, සතුරු හමුදාවේ අණදෙන නිලධාරී සහ වෙඩි බෙහෙත් රැගෙන යන්නා වැනි විශේෂිත ඉලක්කවලට පහර දීමට මෙය භාවිත වීය. එබැවින් සැඟ ව සිට පහර දීමේ වාසිය ලබා තිබේ. අඩි පහක් දිගින් යුත් සිංහල හේවායන්හට පොදුවේ ලබාදුන් අවසන් තුවක්කු වර්ගය අත් තුවක්කු ය. පාබල හමුදාවන් මුහුණට මුහුණ කරන සටන්හි දී මෙය භාවිතයට ගැණිනි. එමඟින් ඉදිරිපෙළ පාබල හමුදා ශක්තිමත් විය. මේ අනුව පෙනෙනුයේ ගිනි අවි භාවිතයත් සමඟ සිංහල හමුදාව යුරෝපීය යුධ තාක්ෂණයට මැනවින් අනුවර්තනය වූ බවයි. විශේෂිත කාර්යයන්ට පිරිසැකසුම් කළ තුවක්කු සැඟ ව සිට පහර දීමේ වාසියත් භූමියේ වාසියත් ගරිල්ලා උපක්‍රමයන්ගේ වාසියත් ලබාගත් නිසා යුද බිම නූතන යුද්ධ උපක්‍රමයන්ට සමපාත වන සේ පරිවර්තනය විය.

***ප්‍රමුඛ පද:*** ගිනි අවි, යටත් විජිත පාලන සමයේ සටන්, යුද්ධ තාක්ෂණය

---

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. lathharic@gmail.com

# තිරස් ජාලගත වැව් පද්ධති ආශ්‍රිත පාරිසරික පසුබිම

(දකුණු විලච්චි කෝරළයේ පහළ හල්මිල්ලෑව ඇදුතු වැව් පද්ධතිය ආශ්‍රිත ව)

*ඒ.එම්.ජී.එච්.එම්. හේමාතිලක*[1] *එම්.පී.එන්.එන්. ජයසිංහ*[2] *සී.ආර්. විතානච්චි*[3]

කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් විවිධ අවශ්‍යතාවන් උදෙසා ජලය රඳවා ගැනීමට ඉදි කරන ලද කෘත්‍රිම තඩාගය වැව වන අතර එකිනෙකට ඈඳී සම්බන්ධ වන පරිදි පෝෂණ රටාවකින් යුතු කුඩා වැව් සහ මහ වැව්වලින් යුතු වැව් තිරස් ජාලගත පද්ධතියක් වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු විලච්චි කෝරලේ පහළ හල්මිල්ලෑව ප්‍රදේශයෙහි මෙවැනි තිරස් ජාලගත වැව් පද්ධතියක් නිරීක්ෂණය වන අතර ඒ ආශ්‍රිත පාරිසරික පසුබිම කෙබඳු ද යන පර්යේෂණ ගැටලුව මුල් කර ගනිමින් දකුණු විලච්චි කොරලේ පහළ හල්මිල්ලෑව ජාලගත වැව් පද්ධතිය ආශ්‍රිත පාරිසරික පසුබිම හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. එහි දී ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේද යොදා ගැනිණි. ප්‍රධාන වසයෙන් ඊසානදිග මෝසමෙන් වර්ෂාව ලැබෙන මෙම ප්‍රදේශය ආශ්‍රිත ව පවතින්නේ වියළි කාලගුණික තත්ත්වයකි. එහෙත් මෙම ජාලගත වැව් පද්ධතිය ආශ්‍රිත ව දක්නට ලැබෙන පාරිසරික තත්ත්වය ඊට හාත්පසින් වෙනස් ස්වරූපයක් ගන්නා ආකාරයක් පෙන්නුම් කරයි. එයට හේතුව ලෙස මෙම ජාලගත වැව් පද්ධතිය ආශ්‍රිත පරිසරය වැවෙහි ජලයෙන් පෝෂණය වීමයි. පහළ හල්මිල්ලෑව ලෙස ව්‍යවහාර කෙරෙන වැව් පද්ධතිය ආශ්‍රිත ව කුඩා උස් වැටි කිහිපයක් දක්නට ලැබේ. එහෙත් භූ දර්ශනයේ වැඩිපුර ම පෙන්නුම් කරන්නේ තැනිතලා භූමීන් ය. මෙම වැව් පද්ධතිය ආශ්‍රිත ව පවතින ගස්ගොම්මන සහ කට්ටකාඩුව සුවිශේෂී ජෛව විවිධත්වයක් පෙන්නුම් කරයි. මෙහි ශාඛායනය පිළිබඳ පරීක්ෂා කිරීමේ දී ඝන ශාඛ, යටි ශාඛ, සහ ජලජ ශාඛ විශේෂ පවතින බව හඳුනාගත හැකි විය. ඝන ශාඛ ව්‍යාප්තිය බහුල ව දැකගත හැකි වූයේ වැව් තාවුල්ල හා වෑ කන්ද ආශ්‍රිත ව වේ. කුඹුක්, මයිල, කෝන්, වීර, සියඹලා, නුග යන ශාඛ ද යටි ශාඛ ලෙස වැල් පෙනෙල, කීකිරිදිය, බැලතණ වැනි ඖෂධීය ශාඛ සහ මුගුණුවැන්න, කංකුං, තැල්කොළ වැනි පලා වර්ග, පන් වර්ග එරමිනියා, දං වැනි කුඩා පළතුරු ශාඛ හඳුනාගත හැකි වේ. ජලජ ශාඛ ලෙස නෙළුම්, කුමුදු, මානෙල්, ඕලු සහ හම්බු විශේෂ මෙන් ම ජපන් ජබර, සැල්වීනියා වැනි ආක්‍රමණශීලී ශාඛ දක්නට ලැබේ. මෙම වැව් පද්ධතිය ඇසුරු කොට ගනිමින් පරිසරයේ වාසය කරන සත්ත්ව ප්‍රජාව ලෙස ජලජ ජීවීන්, උභය ජීවීන්, පක්ෂීන්, උරගයන්, කෘමි විශේෂ හඳුනාගත හැකි ය. ඔවුන් අතර ඒකදේශික මෙන් ම සංචාරක සත්ත්වයෝ ද වෙති. ඒ අනුව පහළ හල්මිල්ලෑව තිරස් ජාලගත වැව් පද්ධතිය මඟින් එම ප්‍රදේශයේ මානව හා සත්ත්ව ප්‍රජාවන් පෝෂණය වීමට සුවිශේෂී දායකත්වයක් ලැබෙන බව හඳුනාගත හැකි වේ. එසේ ම මෙම තිරස් ජාලගත වැව් පද්ධතිය වියළි තැනිතලා ප්‍රදේශය ජලජ පාරිසරික රටාවක් ගොඩනැඟීම සම්බන්ධයෙන් පැහැදිලි නිදසුනක් ලෙස පෙන්වාදීමට හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** තිරස් ජාලගත වැව්, පහළ හල්මිල්ලෑව, ශාඛායනය, සත්ත්ව ප්‍රජාව, පරිසර පද්ධතිය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hasankamadumali123@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. nimalshajayasinghe@gmail.com

[3] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. chandanawithanachchi@hotmail.com

# රජගල ආරාම පරිශ්‍රයේ භූ දර්ශනය සහ එහි ජෛව විවිධත්වය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ගුණවර්ධන. ඩී.ඒ.එම්.පී,[1] ප්‍රේමරත්න ජී.ඩී.ඩබ්.[2] විතානාච්චි. සී.ආර්,[3]*

භූ දර්ශනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් ප්‍රදේශයක භූ පිහිටීමේ ස්වරූපය වන අතර ජෛව විවිධත්වය යනු යම් කිසි භූ කලාපයක දක්නට ලැබෙන පාරිසරික විවිධත්වයකි. ඉහත ප්‍රස්තුතය සම්බන්ධයෙන් සුවිශේෂීතාවක් නැගෙනහිර පළාතේ අම්පාර රජගල තැන්න ආශ්‍රිත කලපයේ හඳුනාගත හැකි විය. මෙම ආරාම සංකීර්ණය පිහිටා තිබෙන මෙම කඳුගැටය නැගෙනහිර පළාතේ ගල් ඔය ශේෂ කඳුවලින් නිමග්න වූවක් ලෙස සැලකේ. ප්‍රධාන වසයෙන් රජගල කඳු පර්වතයේ භූ දර්ශනය ස්වභාවික හා සංස්කෘතික ලෙස සකස් වී ඇත. ව්‍යවහාරයේ රජගල කන්ද ලෙසින් හැඳින්වෙන මෙය මුහුදු මට්ටමේ සිට අඩි 1038ක් පමණ උසකින් යුක්ත ය. සමස්ත කඳු පර්වතයෙහි ව්‍යාප්තිය දළ බෑවුම් හා මද බෑවුම් සහිත ස්වභාවික භූ දර්ශනයකින් ද කඳු මුදුන තැනිතල ස්වරූපයකින් ද යුක්ත වේ. ගල් ඔය ශේෂ කඳු පන්තිය ප්‍රධාන වසයෙන් ග්‍රැනයිට් පාෂාණයෙන් සකස් වී ඇත. එම පාෂාණ බෙහෙවින් ජීරණයට ලක් ව ඛාදනයට ලක් වී ඇති බව නිරීක්ෂණය වේ. ආරාමික ප්‍රරිශ්‍රයක් ලෙස ගොඩනැඟීමට පූර්වයෙන් මෙම භූමිය විවිධ මානව ක්‍රියාකාරක්ම් පැවතී භූ ඛණ්‍යක් බව ශේෂ ව පවතින මානව ක්‍රියාකරකම්වල සාධක අනුසාරයෙන් නිගමනය කළ හැකි වේ. ඓතිහාසික ජනාවාස ගොඩනැඟීමට පෙර ප්‍රාග් ඓතිහාසික මානවයා ගල්ලෙන් සිය වාසස්ථාන බවට පත් කරගෙන ඇති නමුත් ඒ සඳහා භූගෝලීය දේශගුණික හා පාරිසරික සාධක බලපා ඇත. රජගල කඳු ප්‍රදේශය ආශ්‍රිත ව ස්වභාවික කුඩා ජල මාර්ග කිහිපයක් පවතී. ස්වභාවික ගල් කෙවෙනි තුළ ද වර්ෂයේ වැඩි කාලයක් ජලය රැඳී තිබෙනු දැකගත හැකි වේ. ආරාම සංකීර්ණය ආශ්‍රිත පරිසරයේ මිල්ල, දඹ, මාදං, වීර, හල්මිල්ල, නා, වෙලන්, රුක් අත්තන, යකඩමරන්, කලු මැදිරිය, කළු කෝන්, ගල් සියඹලා වැනි ඝන ශාක වැස්මක් පවතී. යටි ශාක වැස්මෙහි ඉලුක්, පතොක්, මානා, එරමිනියා වැනි ශාක ගහණයකින් යුත් ශාක ව්‍යාප්තියක් දක්නට ලැබේ. තෘණ වර්ග හා පුස්වැල් ආරාම පරිශ්‍රයේ පැරණි ගොඩනැගිලි නටඹුන් ආශ්‍රිත ව බහුල ව පවතී. සිවුපාවුන්, උරග විශේෂ හා ආගන්තුක පක්ෂි වර්ග ද සත්ත්ව ප්‍රජාව ආශ්‍රිත ප්‍රජාව ලෙස වසර මුළුල්ලේ දැකගත හැකි අතර ඇතැම් කාලවල වැසි සමයේ පමණක් සක්‍රීය වන ස්වභාවික ඇළ මාර්ගවලින් පෝෂණය වන ඇතැම් පොකුණුවල ගල් හඬියා, මඩකරියා, දණ්ඩියා වැනි සුළු මත්ස්‍ය විශේෂ ජීවත් ව සිටිති. මෙම පර්යේෂණ සඳහා ප්‍රධාන වසයෙන් උපයෝගී කරගනු ලැබූ ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රියාවලියයි. මීට අමතර ව ප්‍රදේශවාසීන් සමඟ කල සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද වැදගත් තොරතුරු අනාවරණය කරගැනීමට හැකි විය. ආරාම සංකීර්ණයේ මෙම භූ දර්ශණ පරිශ්‍රයේ පිහිටුවාලීමට උපයෝගී වූ භූ දර්ශණය සහ පාරිසරික තත්ත්වය අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම කඳු ගැටය ආශ්‍රිත භූ දර්ශනය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි විශේෂත්වය වන්නේ ස්වභාවික ලෙන් රාශියක් මෙම ස්ථානය ආශ්‍රිත ව පිහිටා තිබීම ආරම්භක අවධියේ දී මෙහි සංඝාරාම ගොඩනැගීම කෙරෙහි ප්‍රධාන වසයෙන් බලපාන්නට ඇති බව ය. මෙහි භූ පිහිටීම නිසා ඇති වන සිසිල් පාරිසරික තත්ත්වය බෙහෙවින් භාවනානුයෝගී භික්ෂූන් සඳහා සුදුසු වටපිටාවක් පවතින්නට ඇති බවට සිතිය හැකි ය. ස්වභාවික ජල මාර්ග ආශ්‍රිත ව සකසා තිබෙන කෘත්‍රීම ජල සම්පාදන ක්‍රියාවලිය තුළින් පරිසරයෙන් ලැබෙන ජලය කළමනාකරණය කළ ආකාරය හඳුනාගැනීමට හැකි ය. බොහෝ පැරණි ආරාම සංකීර්ණ ආශ්‍රිත ව දක්නට ලැබෙන තවත් විශේෂත්වයක් වන ඉහළ විහිදෙන ස්වභාවික ගල් තලාවක් මෙම පරිශ්‍රයේ දැකගත හැකි වේ. එවැනි ස්ථාන පදනම් කරගනිමින් ස්තූප ඉදිකිරිම සිදු කොට ඇත. ඒ අනුව රජගල අරාම සංකීර්ණය පිහිටුවීමෙහි ලා සංජානනය වී ඇත්තේ එහි සුවිශේෂී භූ දර්ශනය හා ජෛව විවිධත්වය බව පැහැදිලි ය.

***ප්‍රමුඛ පද:*** රජගල, ජෛව විවිධත්වය, භූ ලක්ෂණ, ශේෂ කඳු

[123] පුරාවිද්‍යාව සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. pereramaduwanthi615@gmail.com

# කටුපිටිය ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිට රජමහා විහාරයේ පවත්නා වාස්තුවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳ විමර්ශනයක්.

*ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සී. ජයසිංහ*[1]

මහින්දාගමනයෙන් පසු ව මෙරට පැවති සංස්කෘතිය සුවිශේෂීමානයකට නැඹුරු වූයේ බුද්ධාගම නිසා ය. එහි දී බෞද්ධාගමේ ආභාසයෙන් බොහෝ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සිදු වූ අතර මහනුවර යුගය වන විට ප්‍රචලිත ඉදිකිරීම් ලෙස ටැම්පිට විහාරයන් හඳුනාගත හැකි ය. ශෛලමය ටැම් මත ඉදිවූ විහාර ටැම්පිට විහාර ලෙස හැඳින්වූ අතර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ටැම්පිටි විහාරයන් 28කින් යුක්ත ප්‍රදේශයකි. ඒවායින් සුවිශේෂි විහාරයක් ලෙස කටුපිටිය ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරය සඳහන් කළ හැකි ය. නාගරුක්ඛාරාම ටැම්පිට විහාරයේ පවත්නා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන් මොනවා ද යන්න අධ්‍යයන කිරිම මෙම පර්යේෂණය සිදු කිරිමේ මූලික ගැටලුව වන අතර මෙම විහාරය සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණයේ අරමුණ වන්නේ නාගරුක්ඛාරාම ටැම්පිට විහාරයෙන් හමු වන්නා වූ වාස්තුවිද්‍යාත්මක සාධකයන් ලාංකේය ටැම්පිට විහාර සම්ප්‍රදායේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කොතෙක් දුරට වැදගත් වූවා ද යන්න අධ්‍යයනය කිරීම ය. එසේ ම මෙම පර්යේෂණය සිදු කිරීම උදෙසා ක්ෂේත්‍ර ගවේෂණයන් මෙන් ම ක්ෂේත්‍ර නොවන ගවේෂණයන් භාවිත කරන ලදී. මහනුවර අවදීයේ දී සංඝයා වහන්සේලා උදෙසා ඉදිකරන ලද මෙම ටැම්පිට විහාරස්ථානය චෛත්‍යය, බණ මඩුව, දේවාලගෙය, බෝධිය, ආවාසගෙය වැනි තවත් බොහෝ විහාර අංගන්ට මැදිව කටුපිටිය ග්‍රාමයේ පිහිටා තිබේ. වර්තමානයේ පස් පුරවන භූමියේ සිමෙන්තියෙන් නිර්මාණය කරන ලද පාදමක් දැකිය හැකි වූව ද එය ශිලාමය නිර්මාණයක් ලෙස පූර්වයේ දී පවතින්නට ඇත. එම පාදම මත ශෛලමය ආකාරයෙන් ඉදිවුණු ටැම් නමයකින් මෙහි ප්‍රතිමා ගෘහය ඉදිවී තිබේ. ගල්ටැම් මත දිග අතට තබා තිබෙන දැව බාල්ක මත ලී තට්ටුවලින් ඉදි කර තිබෙන ප්‍රතිමා ගෘහය සෙ. මී. 709 ක් හා පළල සෙ. මී. 473 ද, උස සෙ. මී. 173 කින් ද යුක්ත වේ. ප්‍රතිමා ගෘහයට පිවිසෙනුයේ අලංකාර ලී පියගැට පෙළකින් වන අතර පූර්වයේ දී මෙම පියගැට පෙළට සමාන ව අත්වැටක් සකසා තිබීණි. ප්‍රතිමා ගෘහයට පිවිසෙන දොරටුව අසල ඉදි කර තිබෙන දොරටුපාලක මූර්තීන් හා ප්‍රතිමාගෘහය ඇතුළත තිබෙන හිටි බුදුපිළිමය, විෂ්ණු හා දැඩිමුණ්ඩ දෙවියන්ගේ මූර්ති නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන් පෙන්නුම් කරන සාධක වේ. එසේ ම ප්‍රතිමාගෘහයේ අභ්‍යන්තර හා බාහිර බිත්ති තුනී හුණු බදාම තට්ටුවකින් යුක්ත වන අතර ඒ මත ජාතක කථාවන් නිරූපණය වන සිතුවම් ඇඳ තිබෙන්නේ සුදු, කලු, දුඹුරු හා ලා කහ ආදි වර්ණයන් යොදා ගනිමිනි. ඒ අනුව මෙම පර්යේෂණය මඟින් ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරය මහනුවර යුගයේ වාස්තුවිද්‍යා අංගයන් රැසකින් යුත් සුවිශේෂී විහාරස්ථානයක් බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ටැම්පිටි විහාර, ශ්‍රී නාගරුක්ඛාරාම විහාරය, වාස්තුවිද්‍යාව, මූර්ති, සිතුවම්

---

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. janithjayanath7@gmail.com

# මාතර දිස්ත්‍රික්කයට ආවේණික මහසෝන් සමයම ශාන්තිකර්මය පිළිබඳ අධ්‍යයනයක්

*එම්.ජී.ආර්. තරුෂිකා[1] එම්.ජී.එච්. මදුසිකා[2] ඩී.එම්.වී. විශාකා[3]*

මාතර දිස්ත්‍රික්කය වූ කලී යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම්, හදි හූනියම්, බලිතොවිල් ආදි වත් පිළිවෙත් පිළිබඳ ව සමස්ත ශ්‍රී ලංකාවේ ම අවධානය යොමු කරගත් ප්‍රදේශයකි. මහසෝන් යකු හෙවත් මහසෝන් දේවතාවාගෙන් සිදු වන අතුරු අනතුරුවලින් අත්මිදීම සඳහා කරන ශාන්තිකර්මය මහසෝන් සමයම ලෙස හැඳින්වෙන අතර මාතර දිස්ත්‍රික්කයට ආවේණික මහසෝන් සමයම ශාන්තිකර්මය යනු කුමක් ද, යන්න අනෙකුත් ජනයාට විස්තරාත්මක විග්‍රහයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ගැටලුවයි. අභිචාරාත්මක රෝග නිවාරණ ක්‍රමයක් ලෙස මහසෝන් සමයම පිළිබඳ මිනිසා තුළ පවත්නා විශ්වාසය කෙබඳු ද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණය විමර්ශනය සඳහා දැනට ලියවී ඇති මූලාශ්‍රයගත සාධක, සම්මුඛ සාකච්ඡා ,සහභාගීත්ව නිරීක්ෂණ තුළින් ලබාගත් දත්ත උපයෝගී කොටගෙන ඇත. සොහොනෙහි ඉපදී, සොහොන්වල හැසිරෙමින් මළ මිනී අනුභව කරනු ලබන බැවින් මොහු මහසෝන් යක්ෂයා ලෙස හැඳින්වෙන අතර, මොහුට අත් හතරක් හිමි ය. නිල්පැහැති ශරීර වර්ණයකට හිමිකම් කියනු ලබන මොහුගේ වාහනය වනුයේ " ඌරා"ය. අතිප්‍රබල යකෙකු ලෙස පිළිගැනෙන මහසෝනා සෙසු යක්ෂයන් මෙන් බැල්ම හෙළීමෙන් පමණක් ලෙඩ ඇති නො කරයි. සොහොන්පළක දී, තොටමුණක දී, පාළුකනත්තක දී බලාපොරොත්තු රහිත අවස්ථාවක දී පහර දී ලෙඩ කිරීම සිදු කරයි. මහසෝනා පහර දුන් පසු පිට පෙදෙස නිල් පැහැ ගැන්වී අතේ ඇඟිලි සටහන් පිහිටීම, කක්කල් කැස්ස, ඔල්මාදය, පිස්සු විකාරයෙන් නන්දෙඩවීම, කෑම අරුචිය, උදර රෝග ආදි රෝග ලක්ෂණ දක්නට ලැබේ. එවන් රෝග ලක්ෂණ ඇත්තේ නම් "ඇප නූල්" බැඳ මහසෝන් සමයමක් නැටීමට කටයුතු කරයි. පවත්නා රෝගී ලක්ෂණ අනුව තොවිලයක් නියම කිරීම සහ අදාළ තොවිලයට අයත් පෙළපාලි ස්වරූපය නියම කිරීම යකදුරෝ සිදු කරති. එක් එක් තොවිලය සඳහා නිශ්චිත පෙළපාලි රටාවක් ඇත්තා සේම, ඊට එක් කළ යුතු අවස්ථා තීරණයට එළඹෙන්නේ අදාළ ආතුරයාගේ රෝගී ලක්ෂණ නිරීක්ෂණයෙන් අනතුරුවයි. අදාළ පෙළපාලි රටාව, නර්තනවල ඇති තාණ්ඩව ලක්ෂණ, භාවපූර්ණ සමයම් නැටීම සහ අවතාර ඉහිළීම් ආදියෙන් මහසෝනා අති ප්‍රබල යකෙකු බවත්, සුව කළ නොහැකි තත්ත්වයේ පවත්නා යක්ෂ රෝගාබාධ සඳහා මෙන් ම එවැනි රෝගී අවස්ථාවක් හේතුවෙන් මරණාසන්න තත්ත්වයට පත්වන රෝගතුරයන්ට නිරෝගී බව උදා කර දෙනු ලබන මහසෝන් සමයම වර්තමානයේ ද මාතර පවතින අතිශය ප්‍රබල ශාන්තිකර්මයක් බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** මහසෝන් සමයම ශාන්තිකර්මය, යකදුරන්, රෝග ලක්ෂණ, මහසෝන් යක්ෂයා, මාතර

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. tharushikaroshani95@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. harshanimadusika9@gmail.com

[3] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

# බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

*සෙව්වන්දි ඒ.එම්.සී.*[1]

බෙල්ලන්විල රජමහා විහාරය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාවගේ ගෞරවයට පාත්‍ර වන උරුමයකි. මෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන මෙන් ම ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයන් ද සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යනයනය වසයෙන් එම විහාර පරිශ්‍රයේ සිතුවම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම, වැඩිහිටි පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා කර දත්ත ලබාගැනීම සිදු කිරීම සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යනය ලෙස බෙල්ලන්විල රජමහා විහාරය පිළිබඳ මූලාශ්‍රයන් පරිශීලනය කර තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. නූතන අවධියට මෙම විහාරයේ රූප මන්දිරය කලාත්මක ව සැරසීමට සෝමබන්දු විද්‍යාපති සමත් වී තිබේ. බෞද්ධ සාහිත්‍යයේ එන සංසිද්ධීන් සිතුවමට නැඟීමට කටයුතු කර තිබෙන අතර ඔහු විසින් බෞද්ධ චිත්‍ර කලාවට නව අරුතක් එක් කිරීමට උත්සාහ දරා තිබේ. මෙම සිතුවම් අතර මාර පරාජය, නාටිකාංගනාවන්ගේ විප්‍රකාර, පටාචාරාගේ දරු සෙනෙහස, සිදුහත් උපත, ශිල්ප හැදෑරීම, විවාහ මංගල්‍යය, සතර පෙරනිමිති, සිද්ධාර්ථ කුමරුගේ සැපවත් ගිහි ජීවිතය, අභිනිෂ්ක්‍රමණය, සුජාතාවන් කිරිපිඬු පූජා කිරීම, පළමු සතිය හා සවැනි සතිය, රෝගී භික්ෂුවකට බුදුන් වහන්සේ විසින් උවටැන් කිරීම, අංගුලිමාල දමනය, දේවදත්ත පුවත ආදි සිතුවම් හඳුනාගත හැකි ය. ඒ අතර ම බෞද්ධ ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ සමීපතම මිතුරා වන ධර්මාශෝක රජු පිළිබඳ සිතුවම් කිහිපයක් ද මෙහි නිරූපණය කර ඇත. බෙල්ලන්විල විහාරයේ දක්නට ලැබෙන සිතුවම් කොළඹ යුගයේ නූතන අවධියේ විහාර සිතුවම් සම්බන්ධයෙන් අතිශය වැදගත් සාදක ලෙස පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** බෙල්ලන්විල රජමහා විහාරය, සිද්ධාර්ථ, සිතුවම්, නූතන අවධියේ බිතුසිතුවම්, උරුමය

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. chethanasewwandi00@gmail.com

# ශ්‍රී උප්පුලාදේවි පුරාණ ගල්ලෙන් රජමහා විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

*පී. ජී. අයි. එස්. විජේවර්ධන*[1]

මාතලේ දිස්ත්‍රික්කයේ සීගිරිය ඉනාමළුව ප්‍රධාන මාර්ගයේ පොතානෙන් හැරී අතුරු මාර්ගයක මීටර් 300ක් පමණ ගිය විට හමු වන කුඩා කඳු ගැටයක් මත පිහිටා ඇති පොතාන රජමහා විහාරය හෙවත් ශ්‍රී උප්පුලාදේවී පුරාණ ගල්ලෙන් රජමහා විහාරය පුරාවිද්‍යාත්මක සාධක රැසක් හමු වන සුවිශේෂි ස්ථානයකි. මෙම විහාරය පිළිබඳ අධ්‍යයනය සිදු කරගෙන යාමේ දී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය ද සිදු කරන ලදී. මෙම විහාරයේ කටාරම් කෙටූ ගල්ලෙන් 10ක් හමු වන අතර ඉන් ගල්ලෙන් කිහිපයක සිදු කරන ලැබූ කැණීම් මඟින් මානව ඇටසැකිලි 2ක්, විවිධ සත්ත්ව අවශේෂ මෙන් ම ශිලා මෙවලම් හමු වී ඇති අතර මෙම ස්ථානය භික්ෂූන්ගේ වාසස්ථාන වීමට පෙර ප්‍රාග් මානව ජනාවාසයක් ලෙස පැවති බව පැහැදිලි කර ගැනීමට ඉන් හැකි වී ඇත. සත්ත්ව අවශේෂ ලෙස ගස් බෙල්ලන්, පුළුස්සන ලද කක්කුටු අවශේෂ, මෝරෙකුගේ දතක්, ගල් මාළුවෙකුගේ අවශේෂ, හිපපොටේමස් නම් සත්වයාගේ දතක්, ගෝනා, තිත් මුවා වැනි ක්ෂීරපායි සත්ත්ව අවශේෂ බොහොමයක් හමු වී ඇත. මෙම සතුන් වියළි කලාපයට අයත් වන අතර මෙම සාධක මත මෙහි ජීවත් වූ පැරණි මානවයාගේ  ආහාර රටාව පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ මෙම ලෙන් අනුරාධපුර සමයේ දී ලංකාවට බුදු දහම ලැබීමත් සමඟ භික්ෂූන් වහන්සේලාගේ ආරාම බවට පත් වී ඇත. මෙම විහාරයේ පිහිටි ගල්තලාවක ස්වාභාවික පොකුණු 7ක් දක්නට ලැබෙන අතර මෙම විහාරයේ ඇති එක් ලෙනක ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවසට අයත් "*බක තිස්ස ප්‍රධානියාගේ පුත් තිස්ස ප්‍රධානියාගේ ලෙන*" යන අර්ථය සහිත පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපියක් දැකගත හැකි වේ. මෙම ස්ථානයෙහි කාශ්‍යප රජතුමාගේ දියණියක වූ උත්පලවණ්ණා කුමරිය, මෙහෙණියක වී බවුන් වැඩූ නිසා මෙම විහාරය උප්පුලාදේවි පුරාණ ගල්ලෙන් රජමහා විහාරය ලෙස හැඳින්වීමට හේතු වූ බවට ජනප්‍රවාදයක් පවතී. වර්තමානය වන විට භික්ෂු ආරාමයක් වසයෙන් ක්‍රියාත්මක වන මෙම උප්පුලාදේවි පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථානය ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථාන අවධියේ සිට පසු ව භික්ෂූන් උදෙසා පූජා කරන ලද ලෙන් විහාර දක්වා සංවර්ධනය වෙමින් පැවත ආ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු විහාර පරිශ්‍රයක් ලෙස පෙන්වා දීමට හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** පොතාන විහාරය, පුරාවිද්‍යාත්මක ඇගයීම, ප්‍රාග් මානව ජනාවාස

---

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
isharasw26@gmail.com

# වියළි කලාපීය වැව් ගම්මානයන්ට ආවේණිකව ගොඩනැගුණ ආහාර රටාව පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යනයක් : කුංචුට්ටු කෝරළය ඇසුරින්

*එස්.ආර්.එල් සේනානායක [1]*

වැව කේන්ද්‍ර කරගෙන ගොඩනැගුණු පාරිසරික විවිධත්වය  වියළි කලාපීය වැසියන්ට අනන්‍ය වු ජීවන ක්‍රමයක් සඳහා අඩිතාලම සැපයිනි. ඒ ඔස්සේ ඔවුන්ටම ගැළපෙන ආහාර රටාවක් නිර්මාණය කර ගැනීමට සමත් විය. ඒ බව පුරාණ කුංචුට්ටු කොරළයේ සාම්ප්‍රදායික ජීවන අත්දැකීම් පාදක කරගනිමින් අධ්‍යනය කිරීම මෙහි මූලික අරමුණ වේ. ඒ අනුව වියළි කලාපයේ භාවිත විවිධ ආහාරයන් දේශගුණික සාධකයන්ට අනුව හැඩගැසුනේදැයි අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටළුව බවට පත් වේ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගැනීම සිඳු කරන ලදී. කර්කශ දේශගුණයෙන් යුතු වියළි කලාපයේ සුලබව භාවිත කරන්නේ හොදි වර්ග සහ කැඳ වර්ගයි. ඒ අතර ශරීරය සිසිල් කරන සියඹලා හොදි හා විෂ නසන දිවුල් හොදි ආදීය පායන කාලයේ දී භාවිත කරයි. එමෙන්ම මෛත්‍ර ලිංගික පද්ධතියට ඉතා හිතකර බෝ නොවන රෝග වලින් ආරක්ෂා කරන පාන වර්ග කිහිපයක් භාවිත කර ඇත. බෙලි, රණවරා, ඉකිරිය, පොල්පලා, ඉරමුසු, තල්, දිවුල්, කොතලහිඹුටු ඒ අතර විශේෂ වේ. අධික අව් රශ්මියේ වැඩ කිරීමේ දී ඇති වන තෙහෙට්ටුව මඟහැරීමටද එම පාන උපයෝගි වේ. කැකිරි, පිපිඤ්ඤා, තියඹරා ඇඹුල සෑදීමට මෙන්ම ශරීරය සිසිල් කිරීමට උපකාරි කරගෙන ඇත. මීක් පැණි, මී පැණි, බඹර පැණි, දඬුවැල් පැණි භාවිත කර අග්ගලා, අලුවා, කැවිම් සදාගෙන අහේනි කාලයට ආහාර වේලක් පිරිමසා ගනි. කැළැ පැණි භාවිතය තුළ දියවැඩියාව වැනි රෝග වලින් වැලකේ. පායන කාලයේ දී ලි කොළ, කර කොළ, මුරුංගා, කිරි අගුන වැනි ශාක හා වැල් වල ඇති කොළ භාවිත කිරීමට යොමුව තිබිණි. නියං ප්‍රතිරෝධි බෝග ලෙස තුඹ කරවිල, අවර, නියං වැටකොලු, බටු කරවිල ආදිය තම ආහාරයට එක් කරගෙන තිබේ. කුරක්කන් පිට්ටු, දියබත්, හීල් බත් ආහාරයට ගැනීමෙන් පුරාණ ගැමියා තම ආහාර ජීරණ පද්ධතිය නිරෝගිව පවත්වාගෙන ගොස් ඇත. දුමේ වේලාගත් මාළු සහ දඩමස් ඉඩෝර කාලයේ දී පරිභොජනයට තබාගනි. වර්ෂා කාලයේ දී බිම්මල් ආහාරයට ගන්නා අතර ඒවා වේලා කල්තබා ගැනීමද සුවිශේෂි වේ. එමෙන්ම වියළි කලාපයේ දැහැත් විට සඳහා ගත් ද්‍රව්‍ය ප්‍රදේශයට ආවේණික වු ඒවා විය. බුලත් වෙනුවට තලා කොළ, දෙමට පොතු ද පුවක් වෙනුවට මයිල පොතු, ගෑකරා පොතු, ගොඩරත්මල් හා වැල් පොතු ද හුණු වෙනුවට කුඹුක් පොතු, මොර පොතු ද භාවිතයට ගෙන තිබේ. මේ ආකාරයට මෙම ප්‍රදේශයේ පුරාණයේ සිටම පැවති උණුසුම් පාරිසරික තත්ත්වයටත්, උෟෂ්ණාධික ස්වරූපයටත් ඔරොත්තු දෙන ලෙසින් තමන්ටම ආවේණිකව ගොඩනගාගත් ආහාර සංස්කෘතියක් පැවති බව ඉතාමත් පැහැදිලිය. එහෙත් වත්මත් සමාජයේ නව්‍යකරණයත් සමඟ මෙම සෞඛ්‍යාරක්ෂිත ආහාර සම්ප්‍රදාය ප්‍රදේශයෙන් කෙමෙන් පරිහානියට ලක් වෙමින් පවති.

***ප්‍රමුඛ පදඃ*** ආහාර, අවේණික, දේශගුණය, වියළි කලාපීය වැව් ගම්මාන, සාම්ප්‍රදායික

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
randisenanayaka09@gmail.com

# සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේ යොදාගනු ලබන දැනුම හා තාක්ෂණය

*ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.කේ.ජී.ඩබ්ලිව්.සී.පී.කේ. විජේරත්න*[1]

ලාක්ෂා කර්මාන්තය නැතහොත් ලාකඩ කර්මාන්තය පිළිබඳ මෙම පර්යේෂණ වාර්තාව තුළින් සාකච්ඡා කරනු ලබන අතර එහිදී විශේෂයෙන් ම ලාක්ෂා ශිල්පීන් විසින් භාවිතා කරන ලද ශිල්පය දැනුම හා තාක්ෂණය පිළිබඳ අධ්‍යයනය කරනු ලබයි. පර්යේෂණය මගින් සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයේදී භාවිතා කරනු ලබන දැනුම හා තාක්ෂණය පිළිබඳව  සහභාගිත්ව නිරීක්ෂණය යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරයි. ලාක්ෂා කර්මාන්තය නැතහොත් ලාකඩ කර්මාන්තය වසර හාරදාහක් පමණ පැරණි කර්මාන්තයකි. මෙම කර්මාන්තය පිලිබඳ කව්සිළුමිණ, පූජාවලිය, ගිරා සංදේශය, අමාවතුර, ධම්පියා අටුවා ගැටපදය තුළ තොරතුරු දැක්වෙන අතර ශ්‍රී ලංකාවේ ලාක්ෂා නිෂ්පාදනය යනු නූතනය වන විට ලොව පුරා විශාල ආකර්ෂණයක් දිනාගත් නිෂ්පාදනයකි. ක්‍රිස්තු පූර්ව 288 සංඝමිත්තා තෙරණියගේ දුමින්දාගමන යත් සමඟ කුල දහ අටක් ලංකාවට පැමිණි අතර ඒ අතර පැමිණි ඊ වඩුවන් ලාක්ෂ කලාවේ පරපුර විය. වර්ෂ 1634-1654" 1634-1984 කාලය දෙවන රාජසිංහ රජුගේ රාජ්‍ය කාලයේ කඩා පොල විජේපාල නම් රජුගේ පාලන කාලයේ අච්අතමිටි, මුරායුධ, හැරමිටි නිර්මාණයට මෙම ලාක්ෂා යොදාගෙන ඇත. ලාක්ෂා සෑදීමේදී එය හෙම්ටෙරා ගෝත්‍රයට අයත් කොකසයිට් කෘමියා විසින් ශ්‍රාවය කරන දුම්මල වැනි ස්‍රාවයක් ආශ්‍රයෙන් සකස් කර ගැනීම සිදුකරනු ලබයි. කෝන්, මසන්, කැපිපෙටියා, කොබ්බෑ ශාකය තුල මෙය සෑදෙන අතර මෙම ශාකයේ අතු ඉති මත කෘමීහු ශ්‍රාවය කරනු ලබන මෙම ශ්‍රාවය තුළින් කබලු වශයෙන් සෑදෙන මෙම ලාකඩබොර ලාකඩ ලෙසින් හඳුන්වනු ලබයි. පසුව ඒවා මද පවනේ වියළා පෙරා කහට ඇදීම සිදු කරනු ලබන අතර යකඩ පතුරු පිරිමැද නූල් ඇදීම තුළින් මෙය සිදුකරනු ලබයි. මෙහිදී කළු වර්ණය, කහ වර්ණය, රතු වර්ණය නිර්මාණ සඳහා ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කරනු ලබන අතර මෙමගින් නියපොතු වැඩ හා පට්ටල් වැඩ ලෙස පාරම්පරික ශිල්ප ක්‍රමයේ කලාත්මක අංගය මගින් සකස් කරනු ලබයි.මෙහි දී කට්ටලයක් භාවිතා නොකොට මහපටැඟිල්ලෙ නිය ආධාරයෙන් ආක්ෂා නිර්මාණය කිරීමේ නියපොතු වැඩ වන අතර කලින් සකසා ගත් භාණ්ඩය ලාක්ෂා කෙදි මගින්  සැරසිලි මෝස්තර යෙදීම මෙහිදී සිදු කරයි. ලාක්ෂා මෝස්තර දැමීමේ අනිත් අනිත් අංගය වන්නේ පට්ටල් දැමීමයි. භාණ්ඩ ඔප දැමීම,පටි ගැසීම,කැටයම් කිරීම උදෙසා මෙය උපයෝගී කර ගනු ලබන අතරඉතා සංයමයකින් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ එක් සංස්කෘතික අනන්‍යතාවයක් හෙළි කරනු ලබන විශිෂ්ට පාරම්පරික නිර්මාණයක් ලෙස මෙම ලාක්ෂා කර්මාන්තය යොදාගනු ලබන අතර සංස්කෘතික ශිල්ප ක්‍රම හා ශිල්පීන් රැක ගැනීම සියලු දෙනාගේ වගකීමක් වේ. සම්ප්‍රදායික ලාක්ෂා කරුවන් විසින් යොදාගනු ලබන දැනුම හා තාක්ෂණය සහශිල්පීය දක්ෂතාවය පිළිබඳ පර්යේෂණය තුළින් ඉදිරිපත් කරනු ලබයි.

***ප්‍රමුඛ පදඃ*** නියපොතු වැඩ, පට්ටල් වැඩ , හෙම්ටෙරා ගෝත්‍රය, කෘමින්

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. mailto:ssh2020519@ssh.rjt.ac.lk

# ANCIENT IRRIGATION SYSTEMS IN SRI LANKA AND THEIR SOCIOECONOMIC AND ENVIRONMENTAL IMPACT.

*V.W.K.H.Bambarenda*[1]

Irrigation archaeology in Sri Lanka, as a unique field of study, delves into ancient irrigation systems and their profound implications for understanding the agricultural practices, civilization, and environmental impact of the island's past. Spanning over two millennia, the island's history boasts a rich legacy of complex irrigation networks, constructed, and maintained by various kingdoms and empires. The focus of irrigation archaeology in Sri Lanka predominantly centers on the ancient hydraulic civilization, particularly during the Anuradhapura and Polonnaruwa periods (3rd century BCE to 13th century CE). These eras were marked by the construction of extensive irrigation systems that played a pivotal role in sustaining the nation's agriculture. A prime example of these remarkable irrigation projects is the Anuradhapura Jaya Ganga, an imposing reservoir constructed during the Anuradhapura period. Covering around 1800 hectares, it served as a lifeline for thousands of paddy fields, showcasing the advanced engineering skills of ancient Sri Lankans through its sophisticated design and construction techniques. Likewise, the Polonnaruwa period witnessed the development of several irrigation systems, including the colossal Parakrama Samudra, one of the world's largest ancient reservoirs. Encompassing approximately 2,500 hectares, it featured a complex network of canals. The study of these ancient irrigation systems is indispensable for comprehending the agricultural practices and socioeconomic development of ancient Sri Lanka. These irrigation networks not only facilitated crop cultivation but also exerted a profound influence on the growth of settlements, trade routes, and governance systems. Furthermore, the investigation of irrigation archaeology can offer insights into the environmental impacts of these ancient hydraulic civilizations. The construction of reservoirs and canals inevitably reshaped the local ecosystem, potentially leaving enduring effects on biodiversity and land use patterns. In conclusion, irrigation archaeology in Sri Lanka is a pivotal discipline that unravels the technological achievements, social dynamics, and environmental consequences of ancient Sri Lankan civilizations. By examining these ancient irrigation systems, researchers can acquire invaluable insights into the past while gaining a deep appreciation for the ingenuity and resilience of those who engineered and maintained these vital water management systems.

***Keywords:*** Irrigation Archaeology, Ancient Irrigation Systems, Socioeconomic Development, Ancient Sri Lankan Civilizations.

[1] Department of Archeology and Heritage Management. Rajarata University of Sri Lanka. vishwamithrabambarenda@gmail.com

# UNVEILING MARITIME HISTORY AND LOST CIVILIZATIONS THROUGH UNDERWATER ARCHAEOLOGY.

*V.W.K.H.Bambarenda*[1]

Underwater archaeology is a sub-discipline offering profound insights into maritime history and ancient civilizations by studying submerged archaeological sites. This research paper is dedicated to exploring shipwrecks and sunken cities, revealing their significance, interdisciplinary nature, and promising future. Recent technological advances have paved the way for remarkable discoveries, making underwater archaeology an exciting frontier in archaeological research. Shipwrecks, acting as historical time capsules, unveil crucial information about ancient trade routes, maritime warfare, and seafaring technology. Prominent examples from the Age of Exploration and World War II shed light on critical historical events and societal conditions. Moreover, the excavation of Thonis - Heraklion, an ancient Egyptian city submerged for over a millennium, exemplifies the wealth of knowledge hidden in these sites, revealing insights into religious rituals, trade networks, and daily life. Beyond shipwrecks, submerged cities like Heracleion in Egypt, Pavlopetri in Greece, and Dwarka in India have become burgeoning research topics. Advanced technologies such as side-scan sonar, bathymetry, and LiDAR enable archaeologists to uncover these hidden urban centres and explore their remarkably preserved structures and artefacts. These discoveries offer significant insights into past civilizations, trade networks, and urban planning. The interdisciplinary aspect of underwater archaeology is a key highlight, with partnerships between archaeologists, oceanographers, geologists, marine biologists, and conservationists offering a comprehensive understanding of submerged landscapes. These collaborations address ecological impacts and preservation challenges, illustrated through successful case studies. Ethical considerations in underwater archaeological research are vital, as they balance the drive for discovery with responsible excavation practices and community engagement. Initiatives and guidelines have been developed to protect and manage submerged cultural heritage. The future of this field is promising, with extensive unexplored underwater territories holding the potential for further discoveries. Emerging technologies such as underwater drones, and DNA analysis are poised to revolutionize underwater archaeology. This research paper aims to inspire curiosity, underscore the significance of underwater archaeology, and emphasize the need for responsible exploration and preservation of our hidden submerged heritage.

***Keywords:*** Underwater Archaeology, Sunken Cities, Shipwrecks, Ethical Considerations, Emerging Technologies.

---

[1] Department of Archeology and Heritage Management. Rajarata University of Sri Lanka.
vishwamithrabambarenda@gmail.com

# ශ්‍රී ලංකාවේ සමුද්‍රික පුරාවිද්‍යාවේ ඉතිහාසය, වර්තමානයේ පවතින අභියෝග සහ යෙදී හැකි පිළියම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*ඩබ්ලිව්.එම්.එච්.පී.ජේ.කේ. වීරසිංහ*[1]

ශ්‍රී ලංකාවේ සමුද්‍රික පුරාවිද්‍යාව යනු මෙරට පොහොසත් සමුද්‍ර ඉතිහාසය සහ සංස්කෘතික උරුමයන් පිළිබඳ අධ්‍යයනය කරනු ලබන සිත් ඇද ගන්න ක්ෂේත්‍රයකි. මෙරට සමුද්‍රික පුරාවිද්‍යාවේ ආරම්භය 1960 දශකයේ දී සනිටුහන් විය. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීමෙන් මෙරටට වෙරළබඩ ප්‍රදේශ සියවස් ගණනාවක් පුරාවට වාණිජ සහ සංස්කෘතික සඳහා වැදගත් මධ්‍යස්ථානයක් වී ඇති බවට සාධක පවතී. එම වෙරළබඩ සමුද්‍ර ආශ්‍රිත ව ගිලි පවතින සුන්බුන් මගින් දිවයිනේ අතීතය පිළිබඳ වටිනා සාධක රැසක් ලබා දෙයි. ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සමුද්‍ර පුරාවිද්‍යා ඒකකය මෙරටට සමුද්‍රික පුරාවිද්‍යා පර්යේෂණ වල නියැලි සිටින ප්‍රධාන ඒකකයි. එමගින් ජලයෙන් යට වූ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා සමුද්‍රික සමීක්ෂණ, කැණීම් සහ සංරක්ෂණ කටයුතු සිදු කරයි. මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු වනුයේ මෙරට සමුද්‍රික පුරාවිද්‍යාවේ ඉතිහාසය , වර්තමාන අභියෝගයන් හඳුනාගෙන අභියෝගයන් ට යෙදිය හැකි පිළියම් පිළිබඳ විමර්ශනය කිරීමයි. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලු වනුයේ ශ්‍රී ලංකාවේ සමුද්‍රික පුරාවිද්‍යාවේ පවතින අභියෝග මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේද වශයෙන් ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේද ඔස්සේ දත්ත එක් රැස් කිරීම මූලාශ්‍ර පරිශීලනය , ක්ෂේත්‍ර ගවේෂණය වර්ගීකරණය, විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. ප්‍රතිඵල සාකච්ඡා කිරීමේදී ශ්‍රී ලංකාවේ සමුද්‍රික පුරාවිද්‍යාවේ ඉතිහාසය කෙටියෙන් හඳුනාගැනිම සිදු කරනු ලබයි. ඒ අනුව ගොඩවාය නැව් සුන්බුන් සොයාගැනීම ඉතා වැදගත් වේ. මෙමගින් නව වන සියවස දක්වා දිවෙන අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ වටිනා තොරතුරු රැසක් අනාවරණය වේ. මීට අමතරව තවත් කැපිපෙනෙන තවත් සොයාගැනීමක් වනුයේ පැරණි ගාල්ල වරායේ දියයට නටඹුන් ය. මෙමගින් නගරයේ පිරිසැලසුම සහ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සාධකයන් තහවුරු වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමුද්‍රික පුරාවිද්‍යාව අභියෝගයන් රැසකට මුහුණ දෙනු ලබයි. වෙරළ ඛාදනය, ස්භාවික විපත් ඇති වීම, මිනිස් ක්‍රියාකාරකම් මගින් ඇතිවෙන බලපෑම් , සම්පත් සහ අරමුදල් හිඟය වශයෙන් හඳුනා ගත හැකිය. මෙම අභියෝගයන් ජය ගැනීම යෙදී හැකි පිළියම් වන්නේ ක්‍රමවත්ව ගල් වැටි යෙදීම, මහජන දැනුවත් කිරීම් සිදු කිරීම, නීති රීති ක්‍රියාත්මක කිරීම, සමුද්‍රික පුරාවිද්‍යාව සම්බන්ධ විශේෂඥතාවක් ඇති ජාත්‍යන්තර සංවිධාන සහ පර්යේෂණ ආයතන මගින් දැනුම, සහය ලබා ගැනීම යනාදී පිළියම් යෙදීම කාලෝචිත ය. මෙම පර්යේෂණයේ නිගමනය වනුයේ යථෝක්ත අභියෝගයන් ට නිසි පිළියම් යෙදීමෙන් ශ්‍රී ලංකාව සතු සමුද්‍රික පුරාවිද්‍යාවේ උරුමයන් අනාගත පරපුරට සුරක්ෂිත කරලීමට හැකියාව ලැබේ.

***ප්‍රමුඛ පද:*** සමුද්‍රික පුරාවිද්‍යාව, අභියෝග, පිළියම්, ගාල්ල, සමුද්‍රික උරුමයන්

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. weerasinghemalisha054@gmail.com

# මිහින්තලා පුරාවිද්‍යා පරිශ්‍රයේ උරුම කළමනාකරණ පද්ධතිය සකස් විමෙහි ලා විවිධ පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් බලපා ඇති ආකාරය (අතීතයේ සිට වර්තමානය දක්වා)

*බී.වී.ඩී.ටී.එල් දිසානායක්*[1]

පැරණි ලේඛනගත මූලාශ්‍රවල සෑගිරිය යනුවෙන් මිහින්තලය හඳුන්වා දී ඇති අතර මෙම පිං බිම ලංකාවේ සංස්කෘතික අතීතය පිළිබඳ ජීවමාන කෞතුකාගාරයකි. ඈත අතීතයේ සිට වර්තමානය දක්වා මිහින්තලා පුරාවිද්‍යා පරිශ්‍රයේ උරුම කළමනාකරණ පද්ධතිය සකස් විමෙහි ලා විවිධ පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරකම් බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරිම මෙහි අරමුණ වේ. යථෝක්ත පර්යේෂණ ගැටලුව සාධනය කරගැනීම සඳහා මා විසින් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදාගත් අතර තවදුරටත් අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා මිහින්තලා පුරාවිද්‍යා පරිශ්‍රය පිළිබඳ ලියැවී ඇති සාහිත්‍යමය මූලාශ්‍ර අධ්‍යයනයක් සිදු කරනු ලැබිණී. මිහින්තලා පුදබිම ශේෂ කුදු කිහිපයක් ඇසුරු කරමින් ව්‍යාප්ත වී ඇති අතර මිහින්තලේ කන්ද හෙවත් අම්බස්ථල කන්ද, ඇත් වෙහෙර පිහිටි කන්ද, කණ්ඨක සෑ කන්ද, කණ්ඨක සෑයට නැගෙනහිරින් පිහිටි නමක් නොමැති ස්ථූපය පිහිටි කන්ද, කලුදිය පොකුණ ආරණ්‍ය සේනාසනය පිහිටි ඇත් පැටියා කන්ද හා රාජගිරි ලෙන පිහිටි රාජගිරි ලෙන කන්ද එම කුදු පන්ති ඒ අතර වේ. බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනයෙන් ශෛල චේත්‍යය ද, දේවානම්පියතිස්ස රජුගේ මැදිහත් වීමෙන් අටසැට ලෙන් ද, චේතියගිරිය, අඹතලා මහා සෑය, නාග සොඩ නම් පොකුණ, කටුසෑය ආදී වූ තවත් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් නවාංග රාශියක් එකතු වී ඇත්තේ මිහින්තලා පුරාවිද්‍යා පරිශ්‍රයේ විවිධ පාර්ශවකරුවන්ගේ බලපෑම් මත ය. ප්‍රදේශිය ප්‍රජාව, රජයේ ආයතන, පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල , සංචාරකයින්, මිහින්තලයේ වැඩ සිටින සඝ පරපුර, පුරාවිද්‍යාඥයින්, ආගමික ආයතන වැනි විවිධ පාර්ශවකරුවන් විසින් මිහින්තලා පුරාවිද්‍යා අඩවියේ තිරසාර කළමණාකරණය සඳහා පුලුල් ප්‍රවේශයක් සහතික කරනු ලබයි. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ මැදිහත්වීම සාම්ප්‍රදායික චාරිත්‍රවල අඛණ්ඩ පැවැත්ම හා මිහින්තලාවේ ජීවමාන උරුමය සුරැකීම සඳහා මහගු කාර්යභාර්යයක් ඉටු කරයි. පර්යේෂණ, සංරක්ෂණ, තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය නෛතික රාමු, ප්‍රතිපත්ති, මූල්‍ය ආධාර රජයේ ආයතන සපයා දී ඇත. මිහින්තලා ඉතිහාසය පිළිබඳ නිවැරදි අවබෝධයක් පුරාවිද්‍යාඥයින් ලබා දී ඇති අතර සංරක්ෂණ මූල පිරීම් කැණීම් සඳහා මග පෙන්වීම, පර්යේෂණ සඳහා අර්ථකථන ලබා දීම් සඳහා ඔවුන් සතු විශේෂඥ දැනුම ලබා දී ඇත. ආගමික ආයතන මගින් මෙම ස්ථානය පූජනීය ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම, ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන ඒම වැනි වැදගත් කාර්යභාර්යයන් ඉටුකර ඇති අතර මෙම පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාවය හා අඛණ්ඩ ක්‍රියාකාරීත්වය මිහින්තලේ උරුම කළමණාකරණයට වැදගත් වේ.

***ප්‍රමුඛ පදඃ*** *මිහින්තලා පුදබිමෙහි නවාංග; ප්‍රාදේශීය ප්‍රජාව; රජයේ ආයතන; සංචාරකයින්; පුරාවිද්‍යාඥයින්; ආගමික ආයතන*

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, tharushikadissanayake122@gmail.com

# උඩරට ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික දැනුම හා තාක්ෂණය මෙන්ම වර්තමාන අභියෝගතා (මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද හා ලැලිඅඹේ ප්‍රදේශ ආශ්‍රිත විමර්ෂණාත්මක අධ්‍යයනයක්)

*එන්.එම්.එස්.ඩී.කේ.නාරායන*[1]

බටහිර සංස්කෘතික සංස්පර්ශය ට පෙර වූ සිංහල සංස්කෘතියේ ගතිසොබා මෙන්ම සාම්ප්‍රදායික ශිල්ප කලාවන්ගෙන් ආඪ්‍ය වූ උඩරට පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද, ලැලිඅඹේ ප්‍රදේශය ආශ්‍රිත හස්ත කර්මාන්තයේ සොඳුරුතම ලකුණ සාම්ප්‍රදායික ලාක්ෂා කර්මාන්තයයි. ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොදා ගනුලබන ශිල්ප ක්‍රම මෙරට සාම්ප්‍රදායික ශිල්ප ක්‍රමයන්හි සුපෝෂිතතාව මෙන්ම පරිසර හිතකාමී බව ප්‍රකට කරයි. වර්තමානයේ ලාක්ෂා ශිල්පය සමාජ - ආර්ථික රටාව සමඟ විපර්යාසයන්ට ලක් වෙමින් අභාවයට යන ශිල්ප කලාවක් වේ. ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම හා දැනුම මෙන්ම වර්තමාන අභියෝගතා පිළිබඳව විමසුමක් කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථය වේ. මේ නිසාවෙන් වියැකී යන ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත පවතින වත්මන් අභියෝගතා හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඉහතින් දැක්වූ පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ගුණාත්මක දත්ත රැස් කිරීමට මූලිකවම සාහිත්‍ය මූලාශ්‍ර ඔස්සේ පූර්ව අධ්‍යයනයක් සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේද යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද හා ලැලිඅඹේ ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරාගත් අතර එහිදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත ලබාගන්නා ලදී. ලබාගත් දත්ත විශ්ලේෂණය හා සංසන්දනය කරමින් අවසාන වශයෙන් නිගමනයන්ට පැමිණ ඇත. මහනුවර යුගයේ ක්‍රි.ව.1630 දෙවන රාජසිංහ රජු සමයේ මෙම කර්මාන්තය වඩාත් පුළුල්ව පැවති අතර ඒ බව ජනවංශය ආදී මූලාශ්‍රගත සාධක අනුව තහවුරු වේ. මෙම කාර්මිකයන් ඊ වඩුවන් ලෙස එකල හඳුන්වා ඇත. මාතලේ දිස්ත්‍රික්කයේ හපුවිද පල්ලේ හපුවිද, ලැලිඅඹේ ආදී ග්‍රාමයන් අතීතයේ සිට ලාක්ෂා ග්‍රාම කේන්ද්‍රස්ථාන වන අතර වර්තමානය දක්වාම යම් මට්ටමකින් සක්‍රියව පවතී. මෙම නිෂ්පාදන සඳහා යොදාගන්නා මූලික අමුද්‍රව්‍ය ලාකිරි හෙවත් ලාකඩ වන අතර එය කෙම්ටෙරා ගෝත්‍රයට අයත් කෘමියකුගේ ශ්‍රාවය ඇසුරින් නිපදවා ගන්නා ලදී. ලාක්ෂා නිෂ්පාදන ක්‍රම ශිල්ප අතර නියපොතු වැඩ හා පට්ටල් වැඩ ක්‍රමය ප්‍රධාන ශිල්ප ක්‍රමයන් ට අයත් වන අතර එය සංකීර්ණ ක්‍රියාවලියකි. මෙහි සුවිශේෂීත්වය වන්නේ ලාක්ෂා ආශ්‍රිත නිෂ්පාදන සඳහා දේශීය වෙළඳපොළට වඩා විදේශීය වෙළෙඳ පොළෙහි වටිනාකමක් හිමිවීමයි. අධ්‍යයන ප්‍රදේශ ආශ්‍රිත පවුල් සීමිත පිරිසක් පමණක් මෙහි නියැලෙන අතර ලාක්ෂා කර්මාන්තය ආශ්‍රිත වර්තමාන අභියෝගතා ලෙස පළිබෝධ නාශක යෙදීම නිසා ලාක්ෂා කෘමීන් වඳවීම, අමුද්‍රව්‍ය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම, තරුණ ප්‍රජාව වෙනත් වෘත්තීන් කරා යොමු වීම මෙන්ම පරම්පරාවෙන් පරම්පරාවට පමණක් ලාක්ෂා කර්මාන්තය විකාශනය වීම නිසා යම් සමාජ කොට්ඨාසයකට පමණක් සීමා වීම ආදී කරුණු රැසක් ලාක්ෂා කර්මාන්තය පරිහානියට ලක්වීමේ ප්‍රධාන අභියෝගතා ලෙස හඳුනාගත හැක. ඒ අනුව සියවස් ගණනාවක් සිට පැවත එන ලාක්ෂා කර්මාන්තය පාරම්පරිකව පවත්වාගෙන ආ එක් පිරිසකට පමණක් සීමා වී ඇතත් නූතන සමාජ ආර්ථික ක්‍රමය යටතේ යම් යම් විපර්යාසයන්ට ලක් වෙමින් පවතින බවත් ධනවාදී ආර්ථික ක්‍රමය තුළ ඉහළ පැලැන්තිය නියෝජනය කරන ප්‍රජාවගෙ පාරිභෝගික අවශ්‍යතා සපයන සුඛෝපභෝගී භාණ්ඩයක් බවට පත් වී ඇති බවත් නිගමනය කළ හැක.

***ප්‍රමුඛ පද*** *: ලාක්ෂා ,ශිල්ප ක්‍රම, කර්මාන්තය, ලාකිරි, නිෂ්පාදන*

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. ssh2020298@ssh.rjt.ac.lk

# වියළි කලාපීය වැව් ගම්මානයන්ට ආවේණිකව ගොඩනැගුණ ආහාර රටාව පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යනයක් : කුංචුට්ටු කෝරළය ඇසුරින්

*එස්.ආර්.එල් සේනානායක*[1]

වැව කේන්ද්‍ර කරගෙන ගොඩනැගුණු පාරිසරික විවිධත්වය  වියළි කලාපීය වැසියන්ට අනන්‍ය වූ ජීවන ක්‍රමයක් සඳහා අඩිතාලම සැපයිනි. ඒ ඔස්සේ ඔවුන්ටම ගැළපෙන ආහාර රටාවක් නිර්මාණය කර ගැනීමට සමත් විය. ඒ බව පුරාණ කුංචුට්ටු කොරළයේ සාම්ප්‍රදායික ජීවන අත්දැකීම් පාදක කරගනිමින් අධ්‍යනය කිරීම මෙහි මූලික අරමුණ වේ. ඒ අනුව වියළි කලාපයේ භාවිත විවිධ ආහාරයන් දේශගුණික සාධකයන්ට අනුව හැඩගැසුනේදැයි අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටළුව බවට පත් වේ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගැනීම සිඳු කරන ලදී. කර්කශ දේශගුණයෙන් යුතු වියළි කලාපයේ සුලබව භාවිත කරන්නේ හොදි වර්ග සහ කැඳ වර්ගයි. ඒ අතර ශරීරය සිසිල් කරන සියඹලා හොදි හා විෂ නසන දිවුල් හොදි ආදීය පායන කාලයේ දී භාවිත කරයි. එමෙන්ම මෛත්‍ර ලිංගික පද්ධතියට ඉතා හිතකර බෝ නොවන රෝග වලින් ආරක්ෂා කරන පාන වර්ග කිහිපයක් භාවිත කර ඇත. බෙලි, රණවරා, ඉකිරිය, පොල්පලා, ඉරමුසු, තල්, දිවුල්, කොතලහිඹුටු ඒ අතර විශේෂ වේ. අධික අව් රශ්මියේ වැඩ කිරීමේ දී ඇති වන තෙහෙට්ටුව මඟහැරීමටද එම පාන උපයෝගි වේ. කැකිරි, පිපිඤ්ඤා, තියඹරා ඇඹුල සෑදීමට මෙන්ම ශරීරය සිසිල් කිරීමට උපකාරි කරගෙන ඇත. මීක් පැණි, මී පැණි, බඹර පැණි, දඬුවැල් පැණි භාවිත කර අග්ගලා, අලුවා, කැවිම් සදාගෙන අහේනි කාලයට ආහාර වේලක් පිරිමසා ගනි. කැළෑ පැණි භාවිතය තුළ දියවැඩියාව වැනි රෝග වලින් වැලකේ. පායන කාලයේ දී ලි කොළ, කර කොළ, මුරුංගා, කිරි අගුන වැනි ශාක හා වැල් වල ඇති කොළ භාවිත කිරීමට යොමුව තිබිණි. නියං ප්‍රතිරෝධී බෝග ලෙස තුඹ කරවිල, අවර, නියං වැටකොලු, බටු කරවිල ආදිය තම ආහාරයට එක් කරගෙන තිබේ. කුරක්කන් පිට්ටු, දියබත්, හීල් බත් ආහාරයට ගැනීමෙන් පුරාණ ගැමියා තම ආහාර ජීරණ පද්ධතිය නිරෝගිව පවත්වාගෙන ගොස් ඇත. දුමේ වේලාගත් මාළු සහ දඩමස් ඉඩෝර කාලයේ දී පරිභොජනයට තබාගනි. වර්ෂා කාලයේ දී බිම්මල් ආහාරයට ගන්නා අතර ඒවා වේලා කල්තබා ගැනීමද සුවිශේෂි වේ. එමෙන්ම වියළි කලාපයේ දැහැත් විට සඳහා ගත් ද්‍රව්‍ය ප්‍රදේශයට ආවේණික වූ ඒවා විය. බුලත් වෙනුවට තලා කොළ, දෙමට පොතු ද පුවක් වෙනුවට මයිල පොතු, ගෑකරා පොතු, ගොඩරත්මල් හා වැල් පොතු ද හුණු වෙනුවට කුඹුක් පොතු, මොර පොතු ද භාවිතයට ගෙන තිබේ. මේ ආකාරයට මෙම ප්‍රදේශයේ පුරාණයේ සිටම පැවති උණුසුම් පාරිසරික තත්ත්වයටත්, උෂ්ණාධික ස්වරූපයටත් ඔරොත්තු දෙන ලෙසින් තමන්ටම ආවේණිකව ගොඩනගාගත් ආහාර සංස්කෘතියක් පැවති බව ඉතාමත් පැහැදිලිය. එහෙත් වත්මත් සමාජයේ නව්‍යකරණයත් සමඟ මෙම සෞඛ්‍යාරක්ෂිත ආහාර සම්ප්‍රදාය ප්‍රදේශයෙන් කෙමෙන් පරිහානියට ලක් වෙමින් පවති.

***ප්‍රමුඛ පද :*** *ආහාර, අවේණික, දේශගුණය, වියළි කලාපීය වැව් ගම්මාන, සාම්ප්‍රදායික*

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, රජරට විශ්ව විද්‍යාලය
randisenanayaka09@gmail.com

# තැපැල් කෞතුකාගාරය ආශ්‍රිත කාර්මික උරුමය පිළිබඳව විමර්ශනයක්

*එච්. එම්. වයි. පී. වික්‍රමසිංහ[1], එච්. ආර්. මදුවන්ත[2]*

2010 වර්ෂයේ විවෘත කළ ශ්‍රී ලංකාවේ තැපැල් කෞතුකාගාරය කොළඹ නගරයේ මැකලම් මාවතේ පිහිටි නව තැපැල් මූලස්ථාන පරිශ්‍රයේ පිහිටා ඇත. මෙහි ලන්දේසි යුගයේ සිට 21වන සියවසේ පලමු දශකය දක්වා තැපැල්, පනිවිඩ හුවමාරු හා සන්නිවේදන කටයුතු සඳහා භාවිතයට ගත් විවිධ උපකරණය ප්‍රදර්ශනයට තබා ඇත. මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ ඒ ආශ්‍රිත කාර්මික පුරාවිද්‍යා උරුමය පිළිබඳව අධ්‍යයනයක් සිද්ධ කිරීමටය. එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යනය මෙන්ම ක්ෂේත්‍ර නොවන අධ්‍යනය ක්‍රම ද යොදාගනු ලැබිනි. මේ ප්‍රතිඵල ලෙස තැපැල් කටයුතු සඳහා යොදාගනු ලැබූ උපකරණ රාශියක් දක්නට ලැබිනි. ඒ අතර මුද්දර නිකුත් කිරීමේ හා මුද්දර අවලංගු කිරීමේ යන්ත්‍ර, තැපැල්පත් හා පාර්සල් වල බර කිරණ තරාදි, තැපැල් කාර්යයාල වල භාවිතා වූ ගණක යන්ත්‍ර, ඔරලෝසු, කඩදාසි සිඳුරු විදිනයන්, කොළ කපන යන්ත්‍ර, ලාම්පු, ලාකඩ උණුකල උඳුන්, ආදියද විවිධ යුගවල නිර්මාණය වූ තැපැල් පෙට්ටි ආදියත් ටෙලිග්‍රෑම් යැවීම සඳහා භාවිතා කළ තාක්ෂණික උපකරණ, අතීතයේ සිට වර්තමානය තෙක් භාවිතා වූ දුරකතක, ආදී තැපැල් සේවය සඳහා උපයෝගී කරගත් භාන්ඩ රැසක් හඳුනාගත හැකිවිය. මේවාගේ ඇතැම් උපකරණ වල නිශ්පාදිත සමාගම ඇති අතර ඒ අතරින් ඇතැම් සමාගම් වැසී ගොස් ඇතිබව සෙවීමෙන් අනාවරණය විය. ඇතැම් කෞතුක වස්තු දිරාපත් වෙමින් පවතී. උපකරණ ලැබුනු මූලාශ්‍රයක් ගැන සදහනක් නැත. නරඹන්නන්ට මෙහි අගය තේරුම්කර දීමට නිලධාරීන් ප්‍රමාණවත් නැත. ඒ අනුව මෙම කාර්මික පුරාවිද්‍යා උරුමය යම් අවධානමකට ලක්ව ඇතිබව පෙනේ. මෙයට විසඳුම් ලෙස කෞතුක වස්තු නැවත ප්‍රතිලේඛනගත කර ඒවාගේ නිෂ්පාදිත වර්ෂය, මොඩලය, භාවිතා කළ ස්ථාය, භාවිතා කරන ආකාරය ආදිය සොයාගත යුතුය. ඒ සඳහා අන්තර්ජාලය හරහා අදාල ආයතනයන්ගේ වෙබ් අඩවි උපකාර කරගත හැකිය. එසේම එහි සේවකයන්ට කෞතුකාගාරයේ කටයුතු කළයුතු ආකාරය පිළිබඳ පුහුණුවක් ද ලබාදිය යුතුය. එමගින් තැපැල් කෞතුකාගාරයේ කාර්මික පුරාවිද්‍යා උරුමය ආරක්ෂාකරගත හැකිය.

***ප්‍රමුඛ පදඃ*** *ශ්‍රී ලංකාවේ කාර්මික කෞතුකාගාර, කාර්මික උරුමය, තැපැල් කෞතුකාගාරය, ශ්‍රී ලංකාවේ තැපැල් සේවය*

[1] University of Kelaniya, Kelaniya. yasangapraveenwick@gmail.com

[2] University of Kelaniya, Kelaniya. rajakamaduwantha@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Communication & Media Society



**FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES**
**RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE**

# FACTORS EFFECTING TO THE SWITCHING BEHAVIOR OF MOBILE SERVICE PROVIDERS BY THE MOBILE PHONE CONSUMERS IN SRI LANKA.

(With a Special Reference to Mobile Phone Consumers in Colombo District)

*WMJD Prasanga[1] TUS Senarath[2] LI Manorathne[3]*

The mobile telecommunication industry is highly competitive and it is crucial for companies to build long-term relationships with their customers to retain market share. Therefore, understanding the reasons behind consumer switching behavior is important for marketers. This study aimed to explore the factors that influence the switching behavior of mobile phone consumers in Colombo district, Sri Lanka. A well-structured questionnaire was employed to collect primary data from 300 respondents in the Colombo district. A conceptual framework was developed to investigate the impact of independent variables on switching behavior. Before the study, interviews were conducted with customers to determine what drives them to switch mobile service providers. The collected data was analyzed using multiple regression analysis to test the hypotheses and determine the degree of switching behavior and the influence of independent variables on it. The independent variables included core service failure, service encounter failure, employee responsiveness to a service failure, attraction by competitors, and technology change. Convenience sampling was used to collect the data, which is a non-probability sampling method. SPSS 21 software was used to analyze the data. The research findings concluded that there is a high level of switching behavior to the mobile service providers and factors such as price, technology change, responsiveness to service failure is influencing to the switching behavior of mobile service providers of the mobile phone consumers in Colombo district in Sri Lanka. Among price, technology change, service encounter failure, responsiveness to service failure, core service failure, inconvenience, attraction by competitors, switching cost, technology change is the salient factor which influences the switching behavior. The results of the study can help key market players in the mobile telecommunication industry to identify and evaluate the factors that influence switching behavior to gain and retain market share.

***Keywords:*** Switching behaviour, mobile phone, mobile service, service providers

[1] Department of Information Systems, Faculty of Management Studies, Rajarata University of Sri Lanka. janithdinidu1998@gmail.com

[2] Department of Information Systems, Faculty of Management Studies, Rajarata University of Sri Lanka. udesh.senarath@mgt.rjt.ac.lk

[3] Department of English, Faculty of Humanities and Education, CINEC Campus, Millenium Drive, IT Park, Malabe, Sri Lanka. lakshithamanorathne@gmail.com

# තරුණ ප්‍රජාවගේ වත්මන් ගුවන්විදුලි මාධ්‍ය භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*පී. පී. ඩී. සෙව්වන්දි*[1]

රේඩියෝව යනු විශාල ප්‍රේක්ෂක පිරිසකට විද්‍යුත් තරංග හරහා පණිවිඩ යැවීමේ ශ්‍රව්‍ය උපකරණයකි. මෙම තරංග හරහා ශබ්දය යැවීමට සහ ලබා ගැනීමට හැකියාව පවතින අතර එය විද්‍යුත් චුම්භක තරංග භාවිතයෙන් වාතය හරහා පණිවිඩ යැවීමේ සහ ලැබීමේ ක්‍රියාවලිය ලෙස හඳුනාගත හැකි ය. වත්මන් තරුණ ප්‍රජාවගේ ගුවන්විදුලි ශ්‍රවණය කිරීමේ වෙනසක් පවති. ඒ අනුව නූතන තරුණ ප්‍රජාවගේ ගුවන්විදුලි ශ්‍රාවකත්වය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. වයස අවුරුදු 20-30 අතර තරුණ තරුණියන්ගේ ගුවන්විදුලි මාධ්‍ය ශ්‍රවණය කෙබඳු ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන අතර මිශ්‍ර ප්‍රවේශයෙන් අධ්‍යයනයට හසු කර දුරකථන සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවනාවලියක් මඟින් දත්ත රැස්කරන ලදී. ඒ අනුව දත්ත සංතෘප්තිය අනුව ප්‍රශ්නාවලියෙහි දත්ත විශ්ලේෂණය කිරීමේ දී ස්වයං විශ්ලේෂණය භාවිත කරන ලද අතර සම්මුඛ සාකච්ඡා පිටපත් කර තේමාත්මක විශ්ලේෂණයට ලක් කර ඇත. අවුරුදු 20-30 අතර ප්‍රජාව තිස්දෙනෙකුගෙන් ගුවන්විදුලිය ශ්‍රවණය කිරීම 86.7% ක ප්‍රමාණයක් වුව ද ඉන් පුරුද්දක් ලෙස ශ්‍රවණය කරන්නේ 13.8% ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව ගුවන්විදුලිය ශ්‍රවණය කිරීම ඉතා අඩු මට්ටමක පවතින බව හඳුනාගත හැකි වූ අතර එයින්ද පැයකට වැඩි කාලයක් ගුවන්විදුලිය ශ්‍රවණය කරන්නේ 28% ප්‍රමාණයක් බවත් හඳුනාගත හැකි විය. තව ද එම ශ්‍රවණය කරන පිරිසෙන් 68%ක් උදෑසන කාලයේ ගුවන්විදුලිය ශ්‍රවණය කරන අතර ඔවුන්ගේ අරමුණු අතර ප්‍රධාන වී ඇත්තේ විනෝදාස්වාදය සපයා ගැනීම බව ද එය 59.3%ක් බව ද තහවුරු විය. එසේ ම ගුවන් විදුලිය ශ්‍රවණය නොකිරීමට ප්‍රධාන හේතු ලෙස අනාවරණය වූයේ ගුවන් විදුලිය මඟින් අපේක්ෂා කරන විනෝදාස්වාදය නොලැබීමත් එමඟින් ලබා දීමට තැත් කරන විනෝදාස්වාදයට තරුණ පරපුර රුචි නොවීමත් ය. ඒ අනුව, එම හේතු සාධක පදනම් ව අවුරුදු 20-30 අතර තරුණ ප්‍රජාව ගුවන්විදුලිය ශ්‍රවණය කිරීම තරමක අඩු මට්ටමක පවතින බවත්, එම නිසා ග්‍රාහකයාගේ රුචිකත්වයට ගැළපෙන, කාලීන බවින් යුතු, ඉහළ රසවින්දනයක් හා උසස් විනෝදයක් ලබා දීමට හැකි වැඩසටහන් ශ්‍රාවකයාට සමීප අයුරින් ඉදිරිපත් කළ යුතු බවත් අවසන් වසයෙන් පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** ගුවන්විදුලිය, තරුණ ප්‍රජාව, මාධ්‍ය, විනෝදාස්වාදය, ශ්‍රවණය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, dinushka986@gmail.com

# ඉහළ කොත්මලේ ජලාශ ව්‍යාපෘතිය තුළ සංවර්ධන සන්නිවේදනය භාවිතයේ ගැටලු පිළිබඳ අධ්‍යයනයක් - තලවාකැලේ ප්‍රදේශය ඇසුරින්

*කේ.ඒ.ජේ.එස්. ජයසූරිය[1] ඩබ්ලිව්.ඒ.ටී.ඩී. වික්‍රමරත්න[2] එච්.ඒ.එම්.පීරිස්[3] ජේ.ඊ.එම්.සී.එල්. ගුණරත්න[4]*

ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජීය වසයෙන් බොහෝ ග්‍රාමීය ජනතාවගේ දැත් ශක්තිමත් කිරීම සඳහා මහවැලි ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ඇත. මෑත කාලයේ දී මධ්‍යම කඳුකරයේ ඉදි කළ අවසන් ජලාශය වසයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ඉහළ කොත්මලේ ජලාශය පෙන්වා දිය හැකි ය. නාගරික ප්‍රදේශයකට ඉතා ආසන්නව මෙම ජලාශය පිහිටා ඇත. ඉහළ කොත්මලේ ජලාශයට අයත් වර්ග කිලෝමීටර 310කට ආසන්න ජල පෝෂක කලාපය තුළ මේ වන විට සිදු වන විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වටිනා සංවර්ධන ව්‍යාපෘතියකට දැඩි බලපෑමක් නිර්මාණය වී ඇත. ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටා ඇති ජනාවාස, කඩ, වීදී හා වගාකටයුතු ඇතුළත් මානව ක්‍රියාකරකම් බහුල ප්‍රදේශය තුළ නිසි පරිදි සංවර්ධන සන්නිවේදනය භාවිත කර තිබේ ද යන්නත්, එකී ප්‍රදේශයන් තුළ සිදු වන සංවර්ධන ක්‍රියාවලිය ඵලදායී ඉලක්කයක් කරා ලගා කර ගැනීම සඳහා සංවර්ධන සන්නිවේදනය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ වත් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණු ලෙස පෙන්වා දිය හැකි ය. ප්‍රාථමික සහ ද්විතීයික දත්ත මූලාශ්‍රයන් භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කර තිබේ. තලවාකැලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශිය සභා බලප්‍රදේශය මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. ඒ අනුව ප්‍රශ්නාවලී 90ක් භාවිත කර ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදු කරන ලදී. වයස් කාණ්ඩ 3ක් යටතේ මෙම දත්ත රැස් කරන ලදී. හිරුබට නිම්නය කොත්මලේ ග්‍රන්ථය සහ ඉහළ කොත්මලේ ව්‍යාපෘති යෝජනාව ද්වීතීයික දත්ත මූලාශ්‍රයන් ලෙස භාවිත කරන ලදී. ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටා ඇති නගර තුළින් දෛනික ව ටොන් 10ක පමණ ඝණ අපද්‍රව්‍යය ප්‍රමාණයක් පරිසරයට එක් වන බව තලවාකැලේ ප්‍රාදේශීය සභාවේ සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ දත්ත තුළ පැහැදිලි වේ. ජලාශය ආසන්න ම ප්‍රදේශයේ පවතින තලවාකැලේ නගරය තුළින් විශාල ඝන අපද්‍රව්‍යය ප්‍රමාණයක් මෙකී ජලාශයට එක් වීම අද වන විට දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවකි. මෙම ප්‍රදේශයට නිරන්තරයෙන් ඇද හැලෙන වර්ෂාව හේතුවෙන් පරිසරයට බැහැර කර ඇති ඝන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ජලාශයට රැස් වේ. එය වර්ෂයක් තුළ ටොන් 3650කට අධික ප්‍රමාණයකි. මේ පිළිබඳ ව ජනතාව තුළ නිවැරදි දැනුමක් නොමැති වීම ප්‍රබල ම ගැටලුව බව පැහැදිලි විය. ප්‍රදේශය තුළ දමිළ සහ සිංහල යන ද්විභාෂා භාවිත කරමින් පාරිසරික බලපෑම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි වේ. සංවර්ධනයට සාපේක්ෂ ව නිවැරදි සන්නිවේදනයක් සිදු නොවීම මත මෙම ගැටලු වර්ධනය වී ඇත. සාර්ථක ව්‍යාපෘතියක් ඉතා ඉක්මනින් විනාශ වී යාමට ඉඩ නො දී මේ පිළිබඳ ව සාම්ප්‍රදායික සන්නිවේදනය, දෙපියවර සන්නිවේදනය සහ ජනමාධ්‍ය භාවිතය තුළින් කඩිනමින් ජනතාව සහ රජය සම්බන්ධ වී කටයුතු කළ යුතු ය. සංවර්ධන සන්නිවේදනය භාවිතය සීමා වී ඇති බවත් සංවර්ධන ක්‍රියාදාමය තුළ අහිතකර බලපෑම් ගොඩනැගෙන බවත් එය පාලනය සඳහා සංවර්ධන සන්නවේදනය අවශ්‍යතාව පවතින බවත් පැහැදිලි වේ.

***ප්‍රමුඛ පදඃ*** මහවැලි ව්‍යාපෘතිය, ඉහළ කොත්මලේ ජලාශය, ඝන අපද්‍රව්‍ය, සංවර්ධන සන්නිවේදනය, මානව ක්‍රියා

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. jayasankajs11@gmail.com

[2] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,මිහින්තලේ. ssh2020507@ssh.rjt.ac.lk

[3] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. annmaleesha1999@gmail.com

[4] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. chaminilakshika2000@gmail.com

# ජංගම දුරකථන හා පරිගණක ක්‍රීඩා හරහා ළමා පරපුරට ඇතිවන අහිතකර බලපෑම් පිළිබඳව උඩුගම කලාපයේ තෝරාගත් පාසල් කිහිපයක් ඇසුරෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

*වී.ජී.කේ. මධුෂාන්*[1]

නව තාක්ෂණයේ දියුණුව සහ මාර්ගගත අධ්‍යාපන ක්‍රමය යටතේ වර්තමානයේ බොහෝ සිසුන් ජංගම දුරකථන හා පරිගණක භාවිත කිරීමට යොමු වී ඇත. මෙම ප්‍රවේශ වීමේ ප්‍රතිඵලයක් මත ජංගම දුරකථන හා පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහිවීමේ වර්ධනීය ගැටලුවක්ට සිසුන් මුහුණ දී සිටිති. ජංගම දුරකථන හා පරිගණක කීඩා හරහා ළමා පරපුරට ඇති කරන අහිතකර බලපෑම් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වන අතර, ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් පහක සිසුන් පනස් දෙනෙකු වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලියක් හා එයින් අහඹු ලෙස තොරාගත් පාසල් සිසුන්ගේ දෙමව්පියන් 10ක් සම්මුඛ සාකච්ඡා සඳහා යොදාගනිමින් දත්ත රැස් කළ අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ද්විත්ත්ව ප්‍රවේශය ම මේ සඳහා යොදා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත MS excel මෘදුකාංගය භාවිතයෙන් ද, ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණයට ලක් කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයට අනුව මුළු සිසුන් ප්‍රමාණය 62%ක් ඔන්ලයින් ක්‍රීඩා සඳහා යොමු වී ඇති අතර එහි වැඩි ප්‍රමාණයක් එනම් 44%ක ප්‍රතිශතයක් පිරිමි ළමයින් වේ. වර්තමාන පාසල් ළමුන්ගේ දෛනික අධ්‍යාපන කටයුතු අඩාළ වීමට ජංගම දුරකථන ක්‍රීඩා හා පරිගණක ක්‍රීඩා සෘජු ව බලපෑම් කරන ආකාරය ද ළමා මනස තුළ ඇති වන මානසික විපර්යාස මෙන් ම කායික වසයෙන් සිය දිවි හානි කර ගැනීම් වැනි ක්‍රියා සඳහා ළමුන් යොමු වීම ද ළමා පරපුර තුළ අනවශ්‍ය ප්‍රචණ්ඩත්වය හා ආවේගශීලී හැසිරීම් රටා හා ආකල්ප වැඩි වීම ද, ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂ ව නාගරික ප්‍රදේශවල බහුල ව පරිගණක ක්‍රීඩා හා ජංගම දුරකථන ක්‍රීඩා ළමා පරපුර අතර වඩාත් ප්‍රබල ව ව්‍යාප්ත වන ආකාරය ද මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය. ජංගම දුරකථන ක්‍රීඩා, පරිගණක ක්‍රීඩා හරහා ළමුන්ගේ අධ්‍යාපනයට ඇති වන බලපෑම අධ්‍යයනය, ළමා පරපුරට මානසික හා කායික වශයෙන් ඇතිවන විපර්යාස හඳුනාගැනීම, ළමුන් වෙනුවෙන් වැඩි කාලයක් වැය කිරීමට දෙමාපියන් පෙලඹවීම මෙන් ම මෙවැනි ක්‍රීඩා හැකිතාක් දුරට අවම කර කායික හා මානසික වසයෙන් ඉහළ මට්ටමක් ඇති වන ක්‍රීඩාවලට ළමුන් යොමු කළ යුතු ය.

***ප්‍රමුඛ පදඃ*** පරිගණක ක්‍රීඩා, ජංගම දුරකථන ක්‍රීඩා, ළමුන්, අධ්‍යාපනය, අහිතකර බලපෑම්

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. kavindamadushan621@gmail.com

# ශ්‍රී ලාංකේය රූපවාහිනී මාධ්‍ය තුළ අන්තර්සංස්කෘතික සන්නිවේදනය ප්‍රවර්ධනය සඳහා ආගමික වැඩසටහන්වල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

*ඒ. ඒ. අයි. සී අමරසිංහ*[1]

මිනිසා සහ සන්නිවේදනය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. එසේ වන්නේ මිනිසාගෙන් තොර ව සන්නිවේදනයට පැවැත්මක් නොමැති නිසා ය. එහෙත් මිනිසා ද ඔහු ජීවත් වන්නා වූ ජන කණ්ඩායමේ වෙසෙන ජනතාවගේ ඇවතුම් පැවතුම්, ගති සිරිත්, චාරිත්‍ර වාරිත්‍ර සහ මානව සම්බන්ධතාවන් පදනම් කොට ගනිමින් සන්නිවේදනය ක්‍රියාත්මක වන්නේ ය. විවිධ මානව කණ්ඩායම් තුළ ගොඩ නැගුණු සංස්කෘතීන් ප්‍රකාශයට පත්වන්නේ සන්නිවේදනය මාධ්‍ය කොට ගනිමිනි. සංස්කෘතියේ ස්වභාවය, විවිධත්වය මත ඒ ඒ ජන කණ්ඩායමේ සන්නිවේදන ස්වරූප ද විචල්‍යයකට බඳුන් වේ. ගෝලීය වසයෙන් අන්තර් සංස්කෘතික සන්නිවේදනය වඩාත් සක්‍රීය ව සිදු වන සංහතික මාධ්‍යයක් ලෙස රූපවාහිනිය හඳුන්වාදීමට හැකි ය. රූපවාහිනියට පැවරෙන සංස්කෘතික කාර්යය හේතුවෙන් ගෝලීය වසයෙන් පමණක් නො ව  බහු වාර්ගික සංස්කෘතික පසුබිමක් සහිත අප වැනි රටක් තුළ එක් එක් වාර්ගික සංස්කෘතීන් අතර අන්තර් සංස්කෘතික සන්නිවේදනය වඩාත් සාර්ථක ව සිදු කළ හැකි මාධ්‍යයක් බවට රූපවාහිනිය පත් වේ. බහු ජනවාර්ගික සංස්කෘතික සමාජයක් තුළ තම සමාජයේ එකිනෙක ජනවර්ගයට අයත් සංස්කෘතික වටිනාකම් සහ හරපද්ධතීන් ජනතාවට හඳුනාගැනීමට ඒවා වඩාත් ආකර්ෂණීය අන්දමින් සන්නිවේදනය කළ හැකි මාධ්‍යයක් බවට ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය පදනම් කරගත් රූපවාහිනියට හැකි වී ඇත. මෙරට බහුවාර්ගික සංස්කෘතික විවිධත්වයන් තුළ ආගමික ප්‍රපංචය ගත් විට එය සංකීර්ණ ස්වරූපයක පවතී. බෞද්ධ, හින්දු, ඉස්ලාම් සහ කතෝලික දහම මූලික ව අදහන මෙම සමාජයන් තුළ ඒ ඒ ආගමික ක්‍රියාවලීන් නිසි සන්නිවේදනයකට හසු කරවීම උදෙසා රූපවාහිනී මාධ්‍යය කෙබඳු දායකත්වයක් ලබා දෙයි ද  යන ගැටලුව මෙහි දී අවධානයට යොමු කරන ලදී. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික  රූපවාහිනී නාලිකාවන් ද්විත්වයකට විශේෂිත ව 2022 වර්ෂයේ විකාශිත වැඩසටහන් සහ අදාළ විකාශන කාලය, ප්‍රේක්ෂකයාගේ රුචිකත්වය යන කාරණාවන් පිළිබඳ නිරීක්ෂණාත්මක, අන්තර්ගත සහ සමීක්ෂණ භාවිත පර්යේෂණයක මෙහි දී නියුතු විය. ආගමික පසුබිම මූලික ව බෙහෝ වැඩසටහන් ආකෘති මෙන් ම විශේෂ ආගමික දින අනුව වැඩසටහන් සැකසීම පැහැදිලි වේ. එහෙත් මෙහි දී අන්තර්සංස්කෘතික හුවමාරුව උදෙසා විවිධ ආගම්හී දායකත්වය යම් යම් වැඩසටහන්වල ඌන සහභාගීත්ව ස්වරූපයක් පවතී. මෙම පර්යේෂණයේ දී අන්තර්ආගමික සහභාගීත්වය තවදුරටත් පැවතිය යුතු බව අනාවරණය විය. රූපවාහිනිය තුළින් සිදුවන අන්තර් සංස්කෘතික සන්නිවේදනය මඟින් ලෝකයේ විවිධ අනන්‍යතාවන් සහිතව ජීවත් වන්නා වූ විවිධ ජාතීන්, විවිධ ජන කොටස් ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ කිරීම වර්තමානය වන විට සිදුකරන අන්දම ද හඳුනාගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** අන්තර්සංස්කෘතික සන්නිවේදය, රූපවාහිනිය, ආගමික සහජීවනය, ජනවාර්ගිකත්වය

[1] කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී පාලි මණ්ඩපය, aaishanthiamarasinghe@gmail.com

## නූතන සමාජයේ පැවැත්මට සන්නිවේදනයේ අවශ්‍යතාව

*ඩබ්.කේ.එම්.පී. වීරසූරිය*[1]

සන්නිවේදනය යනු ක්‍රියාවලියකි. සන්නිවේදනයේ අවශ්‍යතාව සමාජයේ පැවැත්ම සඳහා කෙතරම් බලපාන්නේ ද යන්න විවිධ විද්වතුන් විසින් පර්යේෂණ සිදු කොට ඇත. එහෙයින් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ අවශ්‍යතාව තීව්‍ර ලෙස පවතින යුගයක එහි අවශ්‍යතාව පිළිබඳ විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. මේ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කළ අතර ඒ සම්බන්ධ විද්වතුන් දෙදෙනෙකු සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන් ම ද්විතීයික මූලාශ්‍රය වසයෙන් සන්නිවේදනය හා සමාජය, මාධ්‍යයේ ප්‍රවණතා, නූතන සමාජය සම්බන්ධ ග්‍රන්ථ ද, තෘතීයික මූලාශ්‍රය ලෙස සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ආදිය ද පරිශීලනය කිරීම මඟින් දත්ත ඒකරාශී කර ගැනීම සිදු විය. මෙසේ ගොනු කරගත් දත්ත ආශ්‍රයෙන් නූතන සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනයේ දැඩි අවශ්‍යතාව ඇති බව අනාවරණය විය. සන්නිවේදනය හා සමාජය අතර පවතින්නේ අවියෝජනීය වූ සම්බන්ධතාවකි. එනම් එම සම්බන්ධතාව වෙන් කළ නොහැකි ය. එසේ ම මෙම සම්බන්ධතාව ප්‍රබල වේ. සමාජයේ පැවැත්මට මෙන් ම බිඳ වැටීමට ද මෙය හේතු වේ. පුද්ගලයන් අතර පවතින සම්බන්ධතාව වර්ධනය වීමට ශක්තිමත් සන්නිවේදනයක් අවශ්‍ය වේ. මිනිසාට ඇති ප්‍රධාන අවශ්‍යතාවන් ලෙස ආහාරපාන, සනීපාරක්ෂණය, වාසස්ථාන ආදියට අමතර ව අනෙකුත් සියලූ කටයුතු කරගැනීම සඳහා සන්නිවේදනය අවශ්‍ය වේ. සමාජයක් පැවැත්මට මෙන් ම එහි ක්‍රියාකාරිත්වයට සන්නිවේදනය අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසා ය. මේ අනුව බලන කළ සමාජයේ පැවැත්මට සන්නිවේදනය පැවතීම අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුනාගත හැකි ය. වත්මනේ නව තාක්ෂණය සමඟ හුදකලා වී ඇති මිනිස් සමූහයා සමාජයෙන් වෙන් වී සිටිනු දැකගත හැකි ය. ඔවුන් නිසි පරිදි සමාජානුයෝජනය වන්නේ ද නැත. සන්නිවේදනය නොමැති ව සමාජයේ පැවැත්ම තහවුරු කරගත නොහැකි මෙන් ම සන්නිවේදනයේ පැවැත්මට ද සමාජයක් අවශ්‍ය වේ. අවශ්‍යතාව අනුව යෝග්‍ය ම සන්නිවේදන ක්‍රමය උපයෝගී කරගැනීම මඟින් නිවැරදි ප්‍රතිඵල ළඟා කරගත හැකි බව ද හඳුනාගත හැකි ය. ඒ අනුව සන්නිවේදන කුසලතා වර්ධනය, මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී මාධ්‍ය පරිහරණය, අවස්ථෝචිත භාෂා භාවිතය, මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය, මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම, තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය, මාධ්‍ය ආචාරධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය සහ යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම ආදිය සන්නිවේදනය තුළින් නූතන සමාජයක් යහපත් ලෙස ගොඩනගා ගැනීමට අවශ්‍ය බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** සන්නිවේදනය, සමාජය, තාක්ෂණය, සමාජානුයෝජනය, අවියෝජනීය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. maleeshapiyumini7@gmail.com

# ළමුන් ප්‍රචණ්ඩත්වයට හා අසභ්‍යත්වයට යොමුවීම කෙරෙහි රූපවාහිනී චිත්‍රපටවල බලපෑම

*ඒ.ජී.එස්.ඩී. කරුණාරත්න*[1]

යෞවනත්වයට පා තබන ළමුන් වැඩිහිටි ලෝකයට ප්‍රවිශ්ටවීමට බලවත් ආශාවක් දක්වන අතර ඒ සඳහා අවශ්‍යය කරන පසුබිම රූපවාහිනී තිරයෙන් විවර වන චිත්‍රපටයෙන් ලැබෙනු නියත ය. මුල් කාල වකවානුව තුළ දී සිනමාව වෙන ම අංශයක් ලෙස පැවතුණ ද රූපවාහිනියෙහි ආගමනයත් සමඟ එම ගමන්මඟ වෙනසකට බඳුන් වන්නට විය. මෙම විපර්යාසය පදනම් කොට ගෙන සිනමාව හා රූපවාහිනිය අතර වරින් වර සට්ඨනකාරී තත්ත්වයන් ඇති වු නමුත් එහි අවසාන ප්‍රතිඵලය වූයේ මේ ද්විත්වය අතර සහසම්බන්ධතාවක් නිර්මාණය වීමයි. එහි දී ළමා චිත්‍රපට, වැඩිහිටියන්ට පමණී ආදි වූ චිත්‍රපට නිර්මාණය වන අතර ඒ සඳහා වැඩි නැඹුරුතාවක් දක්වන්නේ ළමා පරපුර ය. සිනමාව තුළ භාවිත වු Adults only, Erotic, soft Pronography, Hardcare Pronography යන වදන් හරහා ළමා ප්‍රේක්ෂකයාට චිත්‍රපට නැරඹීමේ අවකාශයෙහි සීමාවීමක් සිදු වූ අතර අසභ්‍යත්වය හා ලිංගිකත්වය කැටි සිනමා කෘති ළමා ප්‍රේක්ෂකයාට තහනම් විය. මෙවන් වපසරියක් හමුවේ රූපවාහිනිය ඔස්සේ චිත්‍රපට විකාශය වීම ළමා ප්‍රේක්ෂකයා වඩාත් තෘප්ත කරන ලද්දක් වූහ. රූපවාහිනී චිත්‍රපටයන්හි ලිංගිකත්වය නිරූපිත දර්ශන සහා ප්‍රචණ්ඩත්වය ඉස්මතු කරන දර්ශන කිසිදු වාරණයකින් තොර ව ඍජු ව ප්‍රේක්ෂකයා වෙත මුදා හැරීම ළමා ප්‍රේක්ෂකයාට නැවුම් අත්දැකීමක් ගෙන දෙන්නට සමත් වූවකී. මෙය නුහුරු නුපුරුදු අත්දැකීමක් නිසා ම ළමුන්ගේ වැඩි අවධානයක් මේ සදහා යොමු විය. එසේ ආරම්භ වන ගමන අද විනාශයක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ළමුන් ප්‍රචණ්ඩත්වයට හා අසභ්‍යත්වයට යොමුවීම කෙරෙහි රූපවාහිනී චිත්‍රපටවල බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය ගැටලුව ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත. දත්ත රැස් කිරීමේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ 01 වසරේ සිට 06 වසර දක්වා ඉගෙනුම ලබන සිසුන් 20 දෙනෙක් අහඹු ලෙස යොදා ගනිමින් නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා සඳහා භාජනය ලදී. එමෙන් ම එලෙස ලබා ගත් ප්‍රථමික දත්ත සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය කොට ඇත. ගුණගරුක සදාචාර සම්පන්න දරුවකු සමාජයට දායාද කිරීම දෙමාපියන්ගේ පරමාර්ථය වූව ද අද එය වියැකී යන යථාර්ථයක් බවට පත්වීමට රූපවාහිනිය මඟින් විකාශය වන චිත්‍රපටය ප්‍රබල දායකත්වයක් සපයා ඇත. අද වාණිජත්වය ඉලක්ක කර ගනිමින් නිර්මාණය වන ප්‍රචණ්ඩ හා අසැබි දර්ශන සහිත චිත්‍රපට රූපවාහිනිය හරහා තිරගත වීම ළමා මනස විකෘති තත්ත්වයන්ට පත්වීමට සහ ප්‍රචණ්ඩත්වයට පත් විමට හේතු වන ප්‍රබල සාධකයක් වී අවසාන ය. එකී සාධකය හමුවේ වත්මන් තරගකාරී ලෝකයෙහි අධ්‍යාපනයට ඇති අවධානය ක්‍රමයෙන් ඍණාත්මක අගයක් ගෙන ඇති බව මෙම පර්යේෂණය හරහා පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** රූපවාහිනිය, චිත්‍රපටය, ළමා පරපුර, ළමා ප්‍රේක්ෂකයා, ළමා ප්‍රචණ්ඩත්වය සහා අසභ්‍යයත්වය

[1] ජන සන්නිවේදන අධ්‍යනාංශය මානව ශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මිහින්තලේ ssh1819177@ssh.rjt.ac.lk

# සමාජ මාධ්‍ය පුද්ගල සම්බන්ධතාව කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සිදුකරන විමර්ශනාත්මක අධ්‍යනයක්

*ඩී.එස්. අභිමානී සමරජීව*[1]

මානවයා තම අදහස් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය සන්නිවේදනය ලෙස සරල ව ඉදිරිපත් කළ හැකි ය. තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයේ සන්නිවේදනය ඉතාමක් සරල ක්‍රියාවක් බවට පත් ව ඇත. වර්තමාන ඇති ව ඇති දියුණුවත් සමඟ පුද්ගල සබඳතාවන් බිඳ වැටීමේ ප්‍රවණතාවක් ගොඩ නැඟී ඇත. වත්මන් පුද්ගල මනෝභාවයන්ට අනුව, මිනිසා ඒකාකාරි ජීවන රටාවකට හුරු වී ඇත. මෙහි දී ඇති වන රික්තකයට විසඳුම් සෙවීමේ දී සමස්ත සමාජය තුළ සමාජ මාධ්‍ය භාවිතය ප්‍රමුඛ වී ඇත. අතීතයේ දී රූපවාහිනිය, ගුවන් විදුලිය වටා පවුල් ක්ෂේත්‍රය විසරණය වී තිබුණත් අද වන විට සමාජ මාධ්‍ය ඒ සියල්ල අභිබවමන් පුද්ගලන්ට සෘජු ව බලපෑම් ඇති කරනු ඇත. එහි දී විශාල වසයෙන් සන්නිවේදන ක්‍රියාවලිය පුද්ගල කේන්ද්‍රියත්වයෙන් යුතු ව නිර්මාණය වී තිබේ. ඒ නිසා ම සමාජ පුද්ගල අවශ්‍යතාවන් ද විෂමාකාර වෙමින් විවිධාකාර වූ දිශාවන්ට ව්‍යාප්ත වෙමින් පවතී. එසේ ම වර්තමාන සමාජයේ පුද්ගලයන් සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වීම පෙළඹීම හේතු කොට ගනිමින් එකිනෙකා අතර සහ සම්බන්ධතාව අවම වීම බහුල ව දැක ගත හැකි වේ. සමාජ මාධ්‍ය පුද්ගල සබඳතාව කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී භාවිත කරන ලද අධ්‍යයන ක්‍රමවේදය වූයේ, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ද්විතීක මූලාශ්‍රය යොදා ගන්නා ලදි. තව ද සම්මුඛ සාකච්ඡා මඟින් ද මෙම පර්යේෂණයට අවශ්‍ය වන තොරතුරු රැස් කර ගන්නා ලදි. එසේ රැස් කර ගන්නා ලද දත්ත තුළින් විශ්ලේෂණයේ දී නිගමනය කර ගත හැකි වූයේ වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමඟ සමාජ මාධ්‍ය ජාලා මඟින් පුද්ගල සම්බන්ධතාවන්ට වයස් භේදයකින් තොර ව සෘජු හෝ වක්‍ර බලපෑම් රාශියක් එල්ල කරමින් සයිබර් මානසිකත්වයක් ගොඩනගමින් සිටින බවයි. මෙම සමාජ මාධ්‍ය හේතුවෙන් වත්මන් සමාජයේ පවුල් සංස්ථාවන් තුළ ආරවුල් ඇති වීම, විවාහ දෙදරා යාම හා අනියම් සම්බන්ධතා ගොඩනැඟිම, විවිධ අපචාර සිදුවීම් ආදිය බහුල ව දැකගත හැකි වේ. වර්තමාන සමාජ සංස්කෘතියේ පුද්ගලයන් අතර සම්බන්ධතාවන් ගොඩනැඟිමට නොහැකි වී ඇත්තේ සමාජ මාධ්‍යයන්ගේ ඇති අසීමිත අහිතකර බලපෑම් හේතුවෙන් යන්න මෙම අධ්‍යනය තුළින් නිගමනය කළ හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** සමාජ මාධ්‍ය, පුද්ගල සම්බන්ධතාව, සන්නිවේදනය, තාක්ෂණය, බලපෑම

[1] මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය abimanisathsara00@gmail.com

# මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යතාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා මාධ්‍ය නියාමනයේ භූමිකාව පිළිබඳ නෛතික ප්‍රවේශයේ උපයෝගීතාව

*ඒ.එම්.එස්.ටී. අබේරත්න*[1]

මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යථාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා මාධ්‍ය නියාමනයේ උපයෝගීතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. පර්යේෂණයේ ගැටලුව වූයේ මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යතාර්ථවාදී ප්‍රවේශයක් උදෙස මාධ්‍ය නියාමනයේ භූමිකාව පිළිබඳ නෛතික ප්‍රවේශයේ උපයෝගීතාව අධ්‍යනය කිරීමයි. ඒ අනුව මෙහි උපන්‍යාසය වූයේ මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යථාර්ථවාදී ප්‍රවේශයක් උදෙස මාධ්‍ය නියාමනයේ භූමිකාව පිළිබඳ නෛතික ප්‍රවේශය ධනාත්මක ලෙස බලපෑම් කරයි. මෙම පර්යේෂණයේ අභිමතාර්ථ වූයේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව සංකල්පීය ව හා න්‍යායාත්මක ව අධ්‍යනය කිරීම, සන්නිවේදනය යනු කුමක් දැයි අර්ථකථනය කරමින් ජනමාධ්‍යයේ සංකල්පීය හා න්‍යායාත්මක පසුබිම විමර්ශනය කිරීම, නියාමනය හා නෛතික ප්‍රවේශය පිලිබඳ ව නිර්වචනාත්මක ව විමසීම, මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා මාධ්‍ය නියාමනයේ නෛතික ප්‍රවේශය පිළිබඳ ව ගවේෂණය කිරීම, මාධ්‍ය නිදහස සහ මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යතාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා මාධ්‍ය නියාමනයේ භූමිකාව පිළිබඳ නෛතික ප්‍රවේශයේ උපයෝගිතාව පර්යේෂණයට ලක් කරමින් ඒ පිළිබඳ නිගමන යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම යනාදියයි. මෙහි දී දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන මිශ්‍ර ක්‍රමවේදය යොදා ගැනිණි. පර්යේෂණයේ නියැදිය ලෙස දෙසීයකගෙන් යුත් ජනමාධ්‍ය/ජනසන්නිවේදන උපාධි අපේක්ෂකයින් පිරිසක් සහ හැටකගෙන් යුත් ජනමාධ්‍ය වෘත්තියකයන් පිරිසක් යොදා ගත් අතර එම නියැදි දෙක තුළ ප්‍රශ්නාවලි ද්විත්වය බෙදා හැර ලබාගත් දත්ත Statistical Package for Social Science (SPSS) මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. සම්මුඛ සාකච්ඡාව සඳහා සම්පදායකයෝ සය දෙනෙක් යොදාගනු ලැබූහ. මෙම පර්යේෂණය තුළින් එළැඹිය හැකි නිගමන අතරින් කිහිපයක් වූයේ මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යතාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා දැනට පවතින නියාමයේ නෛතික ප්‍රවේශය ශක්තිමත් නොමැති බව ය. මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යතාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා මාධ්‍ය නියාමනයේ නෛතික ප්‍රවේශයක ශක්තිමත් කළ යුතු බව ය. එය මාධ්‍ය ක්ෂේත්‍රය තුළ ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව ය. ඒ අනුව මෙම පර්යේෂණ යෝජනාවක් ලෙස මාධ්‍ය නිදහස හා මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ යථාර්ථවාදී ප්‍රවේශයක් උදෙසා මාධ්‍ය නියාමනයේ නෛතික ප්‍රවේශය ශක්තිමත් කළ යුතු බවයි.

***ප්‍රමුඛ පද:*** මාධ්‍ය, මාධ්‍ය නිදහස, මාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය, නියාමනය, නීතිය.

[1] කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී පාලි මණ්ඩපය. shashikaberathna@gmail.com

# සන්නිවේදන සහ මාධ්‍ය සමාජයට AI තාක්ෂණයේ බලපෑම - ගෝලීය මාධ්‍ය සමාජ මත AI තාක්ෂණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*එම්.ජී. කසුන් සමීර මීගස්තැන්න*[1]

මෙම අධ්‍යයනය මගින් ලොව පුරා සන්නිවේදන සහ මාධ්‍ය සමාජ කෙරෙහි කෘත්‍රිම බුද්ධිය හෙවත් AI තාක්ෂණයේ බලපෑම විමර්ශනය කරයි. ගෝලීය මාධ්‍ය සමාජය කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම පර්යේෂණය සමකාලීන භූ දර්ශනය තුළ AI තාක්ෂණයේ ඒකාබද්ධතාවේ බහුවිධ ඇඟවුම් පරීක්ෂා කරයි. ඒ තොරතුරු ව්‍යාප්තිය, අන්තර්ගත නිර්මාණ, ප්‍රේක්ෂක නියැලීම සහ සමස්ත සමාජ ගතිකත්වය තුළ AI තාක්ෂණයේ භූමිකාව විශ්ලේෂණය කිරීමෙන්, සන්නිවේදනය සහ මාධ්‍ය භූ දර්ශන මත AIහි පරිවර්තනීය බලපෑම් පිළිබඳව හඳුන්වයි. AI බලයෙන් ක්‍රියාත්මක වන ඇල්ගොරිතම විවිධ මාධ්‍ය වේදිකා හරහා තොරතුරු බෙදා හැරීමේ විප්ලවීය වෙනසක් සිදු කර ඇත. විශාල දත්ත කට්ටල විශ්ලේෂණය කිරීමෙන් සහ පරිශීලක මනාපයන් පිළිබඳ පුරෝකථනය කිරීමෙන්, AIහි පුද්ගලීකරණය කළ අන්තර්ගත බෙදාහැරීම, පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ නියැලීම වැඩි කරයි. එපමණක් නො ව, AIහි ජනනය කරන ලද අන්තර්ගතයේ නැඟීම සම්ප්‍රදායික මාධ්‍ය නිෂ්පාදනයට බාධා කර ඇත. ස්වයංක්‍රීය ලිවීම, වීඩියෝ සංස්කරණය සහ AIහී උත්පාදනය කරන ලද කලා කෘති කර්තෘත්වය සහ නිර්මාණශීලිත්වය පිළිබඳ සාම්ප්‍රදායික සංකල්පවලට අභියෝග කරයි. මෙම අධ්‍යයනය මඟින් සන්නිවේදන සහ මාධ්‍ය සමාජයට AI තාක්ෂණයේ බලපෑම ප්‍රශස්ත ලෙස භාවිත කිරිම පිළිබද අධ්‍යයනය කරයි. මෙම පර්යේෂණයෙහි ලා ප්‍රාස්තුත අධ්‍යයන ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක දත්ත රැස් කිරිමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක සාහිත්‍ය හා මාර්ගගත මූලාශ්‍ර අධ්‍යයනය කළ අතර පුස්තකාල හා ඒ පිළිබද රූපරාමු අධ්‍යයනයෙන් දත්ත රැස් කර ගන්නා ලදි. සන්නිවේදන සහ මාධ්‍ය සමාජයට AI තාක්ෂණයේ බලපෑම ගෝලිය ව සන්නිවේදන ක්ෂේත්‍රයට ඵලදායි වුව ද පර්යේෂණය මාධ්‍යවේදි අඛණ්ඩතාව, ප්‍රකාශන හිමිකම් නීති සහ මාධ්‍ය ප්‍රතිදානයේ ගුණාත්මක භාවය වෙත අහිතකර බලපෑම් ඇති කරන බව හඳුනා ගන්නා ලදි. අවසාන වශයෙන්, AI තාක්ෂණය පෙර නොවූ විරූ අවස්ථාවන් සහ අභියෝග ඉදිරිපත් කරමින් වර්තමාන සන්නිවේදන සහ මාධ්‍ය සමාජවල විශාල වෙනස්කම් ඇති කර ඇති බවත් ගෝලීය මාධ්‍ය සමාජවල අභිවෘද්ධිය සඳහා එහි විභවය උපයෝගී කර ගනිමින් ප්‍රශස්ත මට්ටමින යොදා ගනිමින් තොරතුරු ව්‍යාප්තිය, අන්තර්ගත නිර්මාණ කරණය මත AI තාක්ෂණය ප්‍රශස්ත ලෙස භාවිත කිරිම අත්‍යවශ්‍යය වන බව පෙනි යයි.

***ප්‍රමුඛ පද:*** AI තාක්ෂණයෙ, සන්නිවේදනය, මාධ්‍ය සමාජය, අභිවෘද්ධිය, විස්තීර්ණ

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. kksameera12@gmail.com

# සංවර්ධන සන්නිවේදනය නිසියාකාර ව සන්නිවේදනය වූවා ද - ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජයේ සංවර්ධන සන්නිවේදන විකාශනය පිළිබඳ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ඇසුරෙන් කළ අධ්‍යයනයක්

*ඒ.එම්.ජී. කසුන් සමීර මීගස්තැන්න*[1]

සංවර්ධනය උදෙසා සන්නිවේදනය භාවිත කිරීම "සංවර්ධන සන්නිවේදනයයි". මෙරට ආරම්භ කළ සෑම ව්‍යාපෘතියක ම එහි සංවර්ධන සන්නිවේදනය නිසි පරිදි සිදු වුවා ද යන්න ගැටලුවකි. ඒ පිළිබඳ මෙම අධ්‍යයනය තුළින් අධ්‍යනය කරයි. මෙරට 1977න් පසුව විවෘත ආර්ථිකයත් සමඟ විශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක් මගින් සංවර්ධනය ක්‍රියාත්මක කළ අතර ඒ සෑම ව්‍යාපෘතියකින් ම ග්‍රාමීය ජනතාව වෙත සන්නිවේදනයක් සිදු කෙරිණි. ඒ අතර ජල විදුලිය ලබා ගනිමින් රට ම විදුලි ආලෝකයෙන් බැබළවීමට කටයුතු කරන බව ජනතාවට සන්නිවේදනය කිරීම සිදු වුව ද ඒ තුළින් නිවරදි ව සංවර්ධන සන්නිවේදනය සිදු වුවා ද යන්න ගැටලුවක් වන්නේ අදටත් විදුලිය නොමැති පිරිසක් රටෙහි ග්‍රාමීය ව ජීවත් වන බැවිනි. මෙරට කඩිනම් මහවැලි ව්‍යාපෘතිය යටතේ ආරම්භ කළ ජල විදුලිය නිෂ්පාදන ව්‍යාපෘති පිළිබද හා එහි සංවර්ධනය පිළිබඳ ව ජනතාව වෙත සන්නිවේදනය කරන ලදදේ සමස්ත ශ්‍රී ලංකාවට ම විදුලි බලය ලබා දී අතිරික්තය ඉන්දියාවට අපනයනය කරන බවත් ය. එසේ පවසමින් ආරම්භ කළ ව්‍යාපෘතිවල නිසි පරිදි අරමුණ පණිවිඩයක් ලෙසින් ග්‍රාමීය ප්‍රජාව වෙත සන්නිවේදනය වුවා නම් අදටත් ශ්‍රී ලාංකීය ග්‍රාමිය ජනයා කුප්පි ලාම්පුවෙන් විදුලි අවශ්‍යතාව සපුරාලීමට අවශ්‍ය නො වේ. ජනතාවට සන්නිවේදනය වු පණිවිඩයට හාත්පසින් ම වෙනස් අරමුණක් මෙම ව්‍යාපෘතින්හි තිබු බව නිරික්ෂණය විය. එනම් ජනනය කිරීමෙන් ලබාගන්නා ජල විදුලි බලය විවෘත ආර්ථිකය හමුවේ මෙරට කර්මාන්ත ආරම්භ කළ ආයෝජකයන්ට අවශ්‍යය විදුලිය එම කර්මාන්ත පිහිටි රත්මලාන, කටුනායක ආයෝජන කලාපය වෙත ලබා දීම එහි අරමුණ වු බව නිරීක්ෂණය විය. මෙම පර්යේෂණයෙහි ලා ප්‍රාස්තුත අධ්‍යයන ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක දත්ත රැස් කිරිමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක සාහිත්‍ය හා මාර්ගගත මුලාශ්‍රය අධ්‍යයනය කළ අතර පුස්තකාල හා ඒ පිළිබඳ රූපරාමු අධ්‍යයනයෙන් දත්ත රැස් කර ගන්නා ලදි. මෙම පර්යේෂණය තුළින් සංවර්ධන සන්නිවේදනය නිසි පරිදි ග්‍රාමීය ප්‍රජාව වෙත සන්නිවේදනය වුවා ද යන්න අධ්‍යයනය කරන ලද අතර එහි දී පැහැදිලි වුයේ මෙරට බෝහෝමයක් සංවර්ධන ව්‍යාපාතීන්හි නිසි අරමුණු ජනතාව වෙත සන්නිවේදනය නොවු බවත් ය. එනම් ග්‍රාමීය ජනයා වෙත සංවර්ධනය මුවාවෙන් වැරදි පණිවිඩයන් සන්නිවේදනය තුළින් සංවර්ධන සන්නිවේදන තුළ සංවර්ධනයේ මුවාවෙන් නිසි පරිදි සන්නිවේදනය නොකළ බවයි. අවසාන වසයෙන් සංවර්ධන සන්නිවේදය තුළ ගත යුතු පියවර ලෙස සෑම ව්‍යාපෘතියකට ම පෙර ජනතාව වෙත එහි ප්‍රතිලාභවල සිට අවසානය දක්වා සැලැස්ම පිළිබඳ නිසි සන්නිවේදනයක් සිදු කළ යුතු බව මෙම පර්යේෂණය තුළින් පෙන්වා දි ඇත.

***ප්‍රමුඛ පද:*** සංවර්ධන සන්නිවේදනය, ග්‍රාමීය සමාජයෙ, ව්‍යාපෘති, ප්‍රජාව, සංවර්ධනය

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. kksameera12@gmail.com

# ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය 'The Elephant Whishperers' වාර්තා චිත්‍රපටය ඇසුරින්

*ඩබ්.කේ.ඩී. සෞම්‍යා සරත්චන්ද්‍ර*[1]

වාර්තා චිත්‍රපට (Documentary Film) සමාජ විශ්ලේෂණය සඳහා භාවිත කළ හැකි ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වන අතර, ලෝක සිනමාවේ ප්‍රවර්ධනයට මෙන්ම සමාජ ප්‍රවාහයට ද දැඩි බලපෑමක් එල්ල කරන්නා වූ නිර්මාණාත්මක ප්‍රවේශයකි. මාධ්‍යයන් හරහා ලොවට අභිමුඛ වන සිනමාව, අද වන විට ගවේෂණාත්මක ක්‍රමවේදයන් හරහා වාර්තා සිනමාපට නිර්මාණයට සුවිශේෂී ස්ථානයක් ලබා දී ඇත. ඒ අතරින් ඉන්දියානු වාර්තා චිත්‍රපට නිර්මාණ ශිල්පිනියක් වන Kartiki Gonsalves ගේ `*The Elephant Whishperers*` (2022) නම් වූ ගවේෂණාත්මක වාර්තා චිත්‍රපටය (Exploration Documentary) ඉන්දායාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ වෙසෙන අනාථ වූ අලි පැටවුන් රැකබලාගන්නා යුවලක් වටා ගෙතෙන්නකි. වාර්තා චිත්‍රපට පිළිබඳ නිර්මාණය වී ඇති පර්යේෂණ අධ්‍යයනය සාහිත්‍ය විමර්ශනය තුළ සිදු කළ අතර, එහි දී මෙම වාර්තා චිත්‍රපටයෙහි කාන්තා නිරූපණය පිළිබඳ පර්යේෂණය කේන්ද්‍ර කරගැනීම පර්යේෂණ හිඩැස ලෙස හඳුනාගන්නා ලදී. සමාජ සංවෘත වූ ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය අධ්‍යයනය කිරීම, ඒ සඳහා ඉන්දියානු මාධ්‍ය සමාජයේ බලපෑම, වාර්තා චිත්‍රපට මානව විද්‍යාත්මක මූලාශ්‍රයන් ලෙස අධ්‍යයනය කිරීම සඳහා ශාස්ත්‍රීය පර්යේෂණයේ භාවිතය මෙන් ම, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස වාර්තා චිත්‍රපටකරණය පිළිබඳ අධ්‍යයනයක නිරත වීම, මෙම ශාස්ත්‍රීය කතිකාවතේ මුඛ්‍ය අරමුණු වේ. සමාජයෙන් මුළුගැන්වී තවදුරටත් සිටිනු විනා, සොබාදහම සමඟ ද මුහු වෙමින් තම ආයාසයන් නොයෙක් ආකාරයෙන් විදහා දක්වන ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය සිදු වී ඇති ආකාරය කෙසේ ද යන්න පර්යේෂණයට ලක් කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. ගුණාත්මක දත්ත මත පදනම් වූ අන්තර්ගත විශ්ලේෂණයක් ලෙසින් මෙම පර්යේෂණය සිදු කරන අතර වාර්තා චිත්‍රපටය පඨිතයක් ලෙස ගෙන ඒ මත පදනම් වූ පර්යේෂණ, විචාර වැනි ලිඛිත, ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍රය අධ්‍යයනය හරහා දත්ත රැස් කිරීමක් ලෙස සිදු කරන ලදී. මෙම වාර්තා චිත්‍රපටිය තුළ අන්තර්ගත රූප රාමු, පසුබිම් කථන හා ශබ්ද සහ සම්මුඛ සාකච්ඡා පාදක කරගනිමින් අන්තර්ගත විශ්ලේෂණය සිදු කරන ලදී. ඒ අනුව ග්‍රාමීය කාන්තාවන් තවදුරටත් මෙවැනි සුළුපටු නොවන, මෙතෙක් ඔවුන් ළඟා නොවූ තම සමාජ ජීවිකාවේ නව පරිචයන් වෙත යොමුවීම ගැන විවිධ දෘෂ්ටිවාදයන් ගොඩනැගුණ ද, ඔවුන් ක්‍රමයෙන් යාවත්කාලීන වන ලෝකයට නව මුහුණුවරකින් නිරාවරණය වීම ධනාත්මක අයුරින් සිදු වන අයුරු මෙන් ම, ඔවුන් වටා නිර්මාණය වී ඇති සමාජ, ආර්ථික, පාරිසරික, සන්නිවේදන පසුබිම මෙම පර්යේෂණය ඇසුරින් තහවුරු කරගැනීමට හැකි විය.

***ප්‍රමුඛ පද :*** වාර්තා චිත්‍රපටය, ඉන්දියානු ග්‍රාමීය සමාජය, කාන්තාව, ඉන්දියානු මාධ්‍ය සමාජය, සන්නිවේදනය

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. contactsaumyasarathchandra@gmail.com

# නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය පවතින ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ ජීවන විලාසිතාව වඩාත් යහපත් කර ගැනීම සඳහා උත්තේජකයක් ලෙස භාවිත කිරීම.

*ඒ.එම්.ඩී.එස්. අලහකෝන්*[1]

නිර්මාණාත්මක සන්නිවේදනය වනාහි සන්නිවේදකයා සිය පණිවිඩය ග්‍රාහකයා වෙත වඩාත් සමීප කිරීම සඳහා අපූර්ව ලෙස යොදාගනු ලබන ක්‍රමෝපායකි. කතන්දරය එකී අපූර්ව ක්‍රමෝපායන් අතර ගාමක බලය ලෙස දැක්විය හැකි ය. එය මානව පැවැත්මේ ආරම්භයේ සිට ම විවිධ ආකාරයෙන් විකාශනය වෙමින් පුද්ගල ජීවනානුභූතීන් ගෙනහැර පෑමට සමත් සරල ආකර්ෂණීය සන්නිවේදන මාධ්‍යයකි. සමාජ මාධ්‍ය හා ජන මාධ්‍ය හරහා ලාංකේය අපට අත්දකින්නට ලැබෙන්නේ නූතන පරිභෝජනවාදී තරඟයට හසු වූ රටේ තරුණ තරුණියන්ගේ ජීවිත තත්ත්වය, සමාජ සම්බන්ධතා සහ හැසිරීම් දිනෙන් දින පිරිහෙමින් පවතින බවකි. එබැවින් අපගේ මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස ඒලෙස පිරිහෙමින් පවතින ශ්‍රී ලාංකේය තාරුණ්‍යයේ ජීවන විලාසිතාව වඩාත් යහපත් කර ගැනීම සඳහා උත්තේජකයක් ලෙසින් නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය භාවිත කිරීම කෙතරම් ඵලදායී ද යන්න ගවේෂණය කිරීම මූලික කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය, තරුණ තරුණියන් 500කට පවත්වන ලද ලෝක සෞඛ්‍ය සංවිධානයේ දින පහක මනෝහාරී චිත්තවේග කළමනාකරණය නේවාසික වැඩසටහනට සහභාගී වූ තරුණ තරුණියන් 40 දෙනෙකු මෙහි දී නියැදිය ලෙස තෝරාගත් අතර ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය සිදු කෙරිණි. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණය තෝරාගත් අතර දත්ත රැස්කිරීම, සහභාගිත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් හරහා මෙය සිදු කෙරිණි. කේතකරණය හරහා පළමු ව දත්ත වර්ගීකරණයට ලක් කරන ලද අතර, පසු ව එම වර්ගීකරණයන්ට අදාළ තේමා හඳුනා ගන්නා ලදී. හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස නිර්මාණාත්මක සන්නිවේදන මෙවලමක් වන කතන්දරය යොදාගැනීමෙන් පුද්ගල ජීවිතය විපර්යාසයට ලක් වීම, සමාජ සම්බන්ධතා යහපත් වීම සහ පුද්ගල ප්‍රජානන හැකියාව වර්ධනය වීම යන දෑ දැක්විය හැකි ය. පුද්ගල ජීවිතය විපර්යාසයට ලක් වීම යටතේ පුද්ගල ආකල්ප වර්ධනය වීම, පුද්ගල අත්දැකීම් පුළුල් වීම සහ පුද්ගල හැසිරීම් වඩාත් යහපත් වීම දැක්විය හැකි ය. සමාජ සම්බන්ධතා යහපත් වීම යටතේ අන්තර්පුද්ගල සබඳතා දියුණු වීම සහ සහකම්පනය දැක්විය හැකි අතර, පුද්ගලයාට වඩා පුළුල් වූ සිතීමක් අත්කර දීම, පුද්ගල ජීවිතය පිළිබඳ ඉගනුම ලැබීම සහ නිර්මාණශීලීත්වය පුද්ගල ප්‍රජානන හැකියාව වර්ධනය වීම යටතේ දැක්විය හැකි ය. මෙකී පර්යේෂණය හරහා දිනෙන් දින අගාධයට පත්වෙමින් තිබෙන තාරුණ්‍යයට මානවීය ජීවන මංපෙත් විවර කරදීමට කතන්දරය වඩාත් ඵලදායි ක්‍රමෝපායක් ලෙසින් යොදා ගන්නා ලදී. එබැවින් මිනිසාට තම ජීවන විලාසිතාව සාරවත් කර ගැනීම උදෙසා ඉගෙනුමක් සහ උත්තේජනයක් ලබා දීමට කතන්දරය භාවිත කිරීම වඩාත් යෝග්‍ය වූත් උචිත වූත් ක්‍රමෝපාය යි.

***ප්‍රමුඛ පද:*** නිර්මාණාත්මක සන්නිවේදනය, කතන්දරය, පුද්ගල ජීවන විලාසිතාව, උත්තේජකය

[1] ජනසන්නිවේදනය, මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. alahakoonsaumya@gmail.com

# සාම්ප්‍රදායික දැනුම හා බැඳි කෙම්ක්‍රම ග්‍රාමීය ජන පැවැත්මට සිදු කරනු ලබන බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

*එච්.එම්.ජී.කේ.ටී. හේරත්*[1]

කෙම්ක්‍රම පාරම්පරික ගැමි විශ්වාසය හා අත්දැකීම් මත පදනම් වූ සුවිශේෂී රහසිගත ක්‍රමවේදයකි. මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රදේශයක ග්‍රාමීය ජනයා සතු සාම්ප්‍රදායික දැනුම හා බැඳි කෙම්ක්‍රම ඔවුන්ගේ ජන ජීවිතයට කෙසේ බලපා ඇත් ද යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. එම ග්‍රාමයේ ජනයා සතු කෙම්ක්‍රම පුද්ගල ජීවිතයට බද්ධ වී ඇති ආකාරය හා ඒවායෙහි වර්තමාන භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක ක්‍රමවේදය හා සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි. මෙහි දී වයස 70ට වැඩි පුද්ගලයන් 3ක් හා පාරම්පරික වෙද මහත්තුරු 2ක් සමග සම්මුඛ සාකච්ඡාවන් පැවැත්වූ අතර තේමාත්මක විශ්ලේෂණය යටතේ කෘෂිකර්මාන්තය, සත්ත්ව දෂ්ටන, සුළු අසනීප යන තේමා යටතේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. ඒ අනුව ගෝනුස්සෙකු දෂ්ටනයක දී හැඳ සිටින ඇඳුම කණපිට පෙරලා ඇඳගැනීම, සර්ප දෂ්ටනයක දී කෙස් රොදක් ගලවා එම ස්ථානයට මදක් ඉහළින් ගැට ගැසීම, ඇසේ නගනයක් හටගත් විට පාන්දර අවදි වී නිශ්ශබ්දව මැටි කලයකට ලුණු කැටයක් දැමීම, කුඹුරෙහි වී ඉසීමෙන් අනතුරු ව වක්කඩයෙහි කොළ අත්තක් සිටුවීම, ගම්මිරිස් කරලේ නාරටිය පයට පෑගෙන පරිදි පාරට දැමීම, හරකුන්ගේ කටුවාකෑම වලක්වා ගැනීමට ඖෂධ ගෙනවිත් දුමේ තැබීම ආදි කෙම්ක්‍රම බහුල ව භාවිත කර ඇත. පර්යේෂණ ආචාරධර්මයන්ට අනුව සහභාගීවූවන්ගේ අනන්‍යතාව හෙළි නොකිරීම, ග්‍රාමය හෙළි නොකිරීම, ඔවුන්ගේ කැමැත්ත සහිත ව තොරතුරු ලබා ගැනුණි. වර්තමානයේ කෙම්ක්‍රම භාවිතය යහපත් වුවත්, අයහපත් වුවත් ගැමියන්ගේ විශ්වාසය මත අදටත් භාවිත කරනු ලබයි. අසනීපයක දී කෙම්ක්‍රම විශ්වාස කොට රෝහලෙන් ප්‍රතිකාර නොගැනීමට ගැමියන් පෙළඹී ඇත. ඒ අනුව නිගමනයන් වසයෙන්, වර්තමානයේ එම ප්‍රදේශයේ ජන ජීවිතය තුළ තාක්ෂණය දියුණු වුවත් කෙම්ක්‍රම භාවිතය අදටත් සිදු කරයි. පරම්පරාවේ විශ්වාසය මත කෙම්ක්‍රම මූලික ප්‍රතිකාරවලට යොමු වීමට පෙර සිදු කරනු ලබන ගුප්ත රහස් ක්‍රමයක් වසයෙන් ද භාවිත කරයි. කෙම්ක්‍රම ඉතා සරල වන අතර එදිනෙදා ජීවිතයේ විවිධ ගැටලුවලට විසඳුම් ලබාදීමක් ලෙස පිළිගැනේ.

***ප්‍රමුඛ පදඃ*** කෙම්ක්‍රම, ග්‍රාමය, ජන ජීවිතය, දෂ්ටන, වර්තමාන

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. krishanthiherath06@gmail.com

## මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව ග්‍රාහකයාගේ දැනුවත් බව

*එච්. සුදේශ් හසංග මෙන්ඩිස් අබේනායක*[1]

ග්‍රාහකයා මාධ්‍ය භාවිතයේ දී  මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත ව මාධ්‍ය පරිහරණය කළ යුතු වේ. එමෙන් ම ග්‍රාහකයා මාධ්‍ය සංදේශ ඇසුරු කිරිමේ දී මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ විමසිලිමත් විම ඉතා වැදගත් වේ. ශ්‍රි ලංකාවේ මාධ්‍ය ආචාර ධර්ම යන්න පුවත්පත් මාධ්‍ය තුළ විධිමත් අයුරින් දැක ගත හැකි වුව ද අනෙකුත් මාධ්‍යන්හි අඩු වැඩි වසයෙන් දක්නට ලැබේ. වර්තමානයේ දී මාධ්‍ය තුළ මාධ්‍ය ආචාරධර්ම කඩ වන අවස්ථා බොහො ඇත. මාධ්‍ය ආචාර ධර්ම කඩ වූ විට එවා විභාග කිරිමට යාන්ත්‍රණ ද නිසි පරිදි සකස් ව නොමැති බව පෙර අධ්‍යනයන් පෙන්වා දී ඇත. මේ තත්ත්වය මත  ග්‍රාහකයා තමා භාවිත කරන මාධ්‍ය හා බැඳි ආචාරධර්ම මොනවා ද දැන සිටිම වඩාත් වැදගත් වේ. ග්‍රාහකයා මාධ්‍ය සන්දේශ පරිහරණයේ දී  මාධ්‍ය ආචාරධර්ම ගැන දැනුවත් ද  යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ග්‍රාහකයාගේ මාධ්‍ය සන්දේශ භාවිතයේ දී මාධ්‍ය ආචාර ධර්ම ගැන දැනුවත්භාවය පිළිබඳ සොයා බැලිම මෙහි ප්‍රධාන අධ්‍යයන අරමුණ වේ. මෙම පර්යේෂණය මිශ්‍ර ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණයක් වේ. දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත  භාවිත කළ අතර සමීක්ෂණ ක්‍රමය යටතේ මාර්ගගත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. ප්‍රශ්නාවලියෙ දී දත්ත එක්රැස් කිරීම උදෙසා නියැදිය වසයෙන් බස්නාහිර පළාතේ අවුරුදු 18ත් 35ත් අතර තරුණ තරුණියන් 100 දෙනෙකුගේ දත්ත පර්යේෂණය සඳහා භාවිත කරන ලදී.  පර්යේෂණය තුළ විශ්ලේෂී ක්‍රමය හා තුලනාත්මක ක්‍රමය ඔස්සේ දත්ත විශ්ලේෂණය ඉදිරිපත් කරනු ලබයි. පර්යේෂණ අධ්‍යයනයේ දී නිගමන වසයෙන් ග්‍රාහකයා මාධ්‍ය සන්දේශ ලබා ගැනීමේ දී ආචාර ධර්ම නො සලකා හරින බවත්, මාධ්‍ය සාක්ෂරතාවය විධිමත් ලෙස අධ්‍යයනය කළ ග්‍රාහකයන් පවා මාධ්‍ය සංදේශ පරිහරණයේ දී මාධ්‍ය ආචාර ධර්ම ගැන නො සලකා මාධ්‍ය භාවිත කරන බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම බහුතරක් ග්‍රාහකයන්ට මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ  විධිමත් අධ්‍යාපනයක් ද ලැබි නොමැති බව පර්යේෂණය පෙන්වා දෙයි. ඒ සඳහා මාධ්‍ය සාක්ෂරතාව ඉගනුම සඳහා ප්‍රවේශ පුළුල් කිරීමට පර්යේෂණය විසින් යෝජනා කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** මාධ්‍ය ආචාර ධර්ම, ග්‍රාහකයා, මාධ්‍ය, සංදේශ

[1] ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. sudeshhasanga7@gmail.com

# ලිංගික සංක්‍රාන්තිය සම්බන්ධ ව අතත්‍ය සන්නිවේදනයන් පැවැත්වීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් යූ ටියුබ් වැඩසටහන් දෙකක් ඔස්සේ)

*ඩී.ජී. නිපුනි හංසිමා ගමගේ* [1]

මෑත කාලයේ දී සැලකිය යුතු අවදානයක් දිනාගත් මාතෘකාවක් වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ සංක්‍රාන්තික ලිංගිකත්වයයි. සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්, උපතේ දී ඔවුන්ට පවරා ඇති ලිංගිකත්වයට වඩා වෙනස් ලිංගිකයන් ලෙස හඳුනාගෙන දිගු කලක් තිස්සේ වෙනස් ලෙස සැලකීමට ලක් ව ඇත. අතත්‍ය සන්නිවේදනය සංක්‍රාන්තික ලිංගික ප්‍රජාවට තොරතුරු බෙදා ගැනීමට, දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට වැදගත් මෙවලමක් ලෙස මතු වී ඇත. ලිංගික සංක්‍රාන්තිය පිළිබඳ අතත්‍ය සංවාදල පුද්ගලයන්ට ඔවුන්ගේ භූගෝලීය පිහිටීම නො සලකා අර්ථවත් සාකච්ඡාවල නිරත වීමට වේදිකා සපයයි. වීඩියෝ ඇමතුම්, කතාබස් සංසද සහ සබැඳි ආධාරක කණ්ඩායම් වැනි අතත්‍ය මාධ්‍ය හරහා පුද්ගලයන්ට ලිංගික සංක්‍රාන්තික ප්‍රජාව වෙත සම්බන්ධ වීමට, ඉගනීමට සහ ප්‍රවර්ධනය කිරීමට හැකි ය. නව තාක්ෂණය තුළින් විනිවිද යමින් සාකච්ඡා වන ලිංගික සංක්‍රාන්තිය පිළිබඳ අතත්‍ය සංවාද පිළිබඳ සොයා යමින් ලිංගික සංක්‍රාන්තිකයන් මුහුණ දෙනු ලබන සැබෑ අභියෝග සහ ගැටලුකාරී තත්ත්වයන් කවරක් ද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ තේමාවයි. අධ්‍යනයේ ගැටලුව වන්නේ නූතන ශ්‍රී ලාංකීය සමාජය තුළ ලිංගික සංක්‍රාන්තිකයන් නිරූපණය වන ආකාරයයි. අධ්‍යනයේ විෂය පථය ලෙස යූ ටියුබ් මාධ්‍යයේ ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ අතත්‍ය සන්නිවේදන වැඩසටහන් දෙකක් අධ්‍යනයේ මායිම් ලෙස ගෙන ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය හරහා සිදු කෙරෙන මේ අධ්‍යයනය සඳහා වැඩසටහන් දෙකේ දෙබස්, සංයුතිය සහ රාමු විශ්ලේෂණය සිදු කෙරේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ලිංගික සංක්‍රාන්තියට ලක් වන පුද්ගලයන් සමාජීය වසයෙන් මුහුණ දෙනු ලබන ගැටලුකාරී තත්ත්වයන් ඉස්මතු කිරීමත්, සාමාජීය වසයෙන් ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ පවත්නා සෘණාත්මක මතවාදයන් තුරන් කිරීමයි. මෙම පර්යේෂණය ඔස්සේ සංක්‍රාන්තික ලිංගිකත්වය යනු මානසික රෝගී තත්ත්වයක් නො ව ජෛව විද්‍යාත්මක පදනමක් සහිත සංසිද්ධියක් බවට සනාථ වනු ලැබේ. ඒ අනුව මේ වැඩසටහන් ද්විත්වය අධ්‍යයනය කිරීමේ දී ලිංගික සංක්‍රාන්තිකයන් ශ්‍රී ලංකාව තුළ සාමාජීය වසයෙන් විශාල අසාධාරණයන්ට ලක් ව ඇති ආකාරය හඳුනාගත හැකි විය. ලිංගික සංක්‍රාන්තිකයන් පිළිබඳ අතත්‍ය සන්නිවේදනය හරහා සාමාජීය වසයෙන් පවත්නා සෘණාත්මක මතයන් තුරන් කොට ධනාත්මක මතයන් ගොඩ නැංවීමට හැකි ආකාරය අනාවරණය වීය. මේ හරහා ශ්‍රී ලංකාව තුළ සාමාජීය වසයෙන් ලිංගික සංක්‍රාන්තිකයන්ට සිදු වන අසාධාරණයන් වලක්වා ගත හැකි වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** ලිංගිකත්වය, සංක්‍රාන්තිකයන්, ශ්‍රී ලාංකීය, අතත්‍ය සන්නිවේදනය, වැඩසටහන්

---

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
dnipunihansima99@gmail.com

# සයිබර් අවකාශය තුළ මුහුණු පොත ආශ්‍රිත කාන්තා ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ඩබ්.එම්.සී.එස්. පතිරණගේ* [1]

සරල සන්නිවේදන මාධ්‍යයන් වඩාත් සංකීර්ණ සහ කාර්යක්ෂම සන්නිවේදන මාධ්‍යයන් බවට පරිවර්තනය වීමත් සමඟ නිර්මාණය වූ සන්නිවේදන මාධ්‍යයන් අතර මුහුණු පොතට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. අතීත සාම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් මිදී සමාජ සම්බන්ධතා ඇඟිලි තුඩකට සීමා වූ කාල වකවානුව ආරම්භ වීමත් සමඟ එමඟින් කාන්තාවට සිදු වූ සහ මේ වන විටත් සිදුවෙමින් පවතින අපරාධයන්, ප්‍රචණ්ඩත්වයන් ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගෙන ඇත. මුහුණු පොත මඟින් කාන්තාවට එරෙහි ප්‍රචණ්ඩත්වයක් ඇතිවන්නේ ද යන්න සමාජය තුළ පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වයක් බැවින් එය මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස පෙන්වාදිය හැකි අතර මුහුණුපොත මගින් සිදු වන නීතිවිරෝධී කාන්තා ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ කරගත් මෙම අධ්‍යයනයෙහි උපඅරමුණු බවට පත් වන්නේ මුහුණු පොත තුළ කාන්තාව ප්‍රචණ්ඩත්වයට ලක් වීමට බලපාන හේතු හඳුනාගැනීමත්, මුහුණුපොත ආශ්‍රිත ව සිදු වන කාන්තා ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා පවතින නීතිරීතිවල ප්‍රායෝගිකභාවය අධ්‍යයන කිරීමත් ය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් සිදු කරන මෙම අධ්‍යයනය සදහා අරමුණු සහගත නියැදිය ඔත්සේ තෝරාගත් ප්‍රතිචාරකයන් 100ක් ඇසුරින් දත්ත රැස් කිරීම සිදු විය. ප්‍රථමික දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යොදා ගැනීම සිදු වූ අතර ද්විතියක දත්ත යටතේ පොලිස් වාර්තා, යූ ටියුබ් වීඩියෝ, ප්‍රවෘත්ති ප්‍රකාශන ආදිය මඟින් මෙම අධ්‍යයනය පෝෂණය කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගෙන ඇත. මෙලෙස මුහුණු පොත ආශ්‍රිත ව සිදු වන කාන්තා ප්‍රචණ්ඩත්වයේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසා බැලීමේ දී, ප්‍රශ්නාවලියට මුහුණ දුන් කාන්තාවන් 60 දෙනෙකුගෙන් බහුතරයක් කාන්තාවන් එනම්, 98.5 % ක ප්‍රමාණයක් මුහුණු පොත භාවිත කරන අතර ඉන් 11.9% ම මුහුණුපොත භාවිතය සදහා ඉහළ රුචිකත්වයක් දක්වා ඇත. මුහුණුපොත ආශ්‍රිත ව ගැටලුවලට හෝ අපහසුතාවන්ට ලක් වූ පිරිස 61.2% බවට වාර්තා වී ඇත. එයින් අසභ්‍ය ඡායාරූප හා වීඩියෝපට යැවීමේ ස්වරූපයෙන් කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක් වී ඇති ප්‍රමාණය වැඩි ප්‍රතිශතයක් ගන්නා අතර 38.2% ප්‍රතිශතාත්මක අගයක් ගන්නා බව පර්යේෂණය තුළින් අනාවරණය විය. පර්යේෂණයට යොදා ගත් නියැදියෙන් බහුතරයක් ම සමාජ මාධ්‍ය තුළින් වන ප්‍රචණ්ඩත්වයට එරෙහි ව පවතින නීති පිළිබඳ දැනුවත් බවක් ඇතත් ඔවුන් නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු නොවී ඇති බව අනාවරණය විය. මේ අනුව නූතන තාක්ෂණයේ දියුණුවත් සමඟ ශීඝ්‍ර සන්නිවේදන පරිවර්තනයක් සිදු වී ඇති මෙම කාල වකවානුවේ දී සමාජ මාධ්‍ය මඟින් කාන්තාවන් විවිධ ස්වරූපයෙන් ප්‍රචණ්ඩත්වයට ලක් වන බවත් ඊට එරෙහි ව කාන්තාවන් නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමේ ප්‍රවණතාව විරල බවත් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** නූතන තාක්ෂණය, සමාජ මාධ්‍ය, මුහුණු පොත, කාන්තා ප්‍රචණ්ඩත්වය, සමාජ සම්බධතා

[1] ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය. chathurajisrimali62@gmail.com

# අභිසාරී මාධ්‍ය ක්‍රියාවලිය මානව දෘශ්‍ය සංස්කෘතික සංජානනයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*ඒ.කේ. සමරවික්‍රම*[1]

නූතන සන්නිවේදන මාධ්‍යයේ සහ තාක්ෂණික දියුණුව හේතුවෙන් ලෝකයේ පෙර පැවති සංස්කෘතික ව්‍යුහයන්හි සීමා ඉක්මවමින් මුළු ලොවම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත. මෙකී දෘශ්‍ය සංස්කෘතිය විශාල පෙරළියකට ලක් කිරීම සිදු වන්නේ නව මාධ්‍යයේ බිහි වීමත් සමඟ ඇති වූ ව්‍යුහාත්මක බලපෑම හේතුවෙනි. එහි ප්‍රබලතම ව්‍යුහාත්මක වෙනස ලෙසින් මාධ්‍ය අභිසාරී ක්‍රියාවලිය හඳුනාගත හැකි ය. අභිසාරී මාධ්‍ය විවාදයට භාජනය වන්නේ ඇනලොග් මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය බවට පරිවර්තනය වීමත් සමඟයි. මාධ්‍ය පර්යේෂකයන් අභිසාරීතාව පැහැදිලි කරන්නේ තොරතුරු පද්ධති, විදුලි සංදේශනය, මාධ්‍ය තාක්ෂණය, එක් පාර්ශවයකින් ඒකරාශී වන විට අනෙක් පාර්ශ්වයෙන් සමාජීය සහ කර්මාන්ත ලෙස එකට මිශ්‍ර වීමක් ලෙසිනි. කල් යත් ම මෙම අදහස් වෙනස් වී මාධ්‍ය අභිසාරීතාව තාක්ෂණයේ බලපෑම් හඳුනා ගන්නා ලදි. පශ්චාත් නූතනවාදී ආකෘතිය තුළ මෙම මාධ්‍ය අභිසාරීතාව සංස්කෘතික දෘශ්‍ය සංජානනය අභියෝගාත්මක ලෙස වෙනස් කර ඇති අතර එහි ධනාත්මක මෙන් ම ඍණාත්මක පැතිකඩයන් ඉස්මතු කරනු ඇත. ඒ අනුව, අභිසාරී මාධ්‍ය මානව දෘශ්‍ය සංස්කෘතික සංජානනයට බලපෑම් කර තිබේ ද යන්න මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව වසයෙන් තෝරා ගැනිණ. අභිසාරී මාධ්‍ය මානව දෘශ්‍ය සංස්කෘතික සංජානනයට සිදු කරන බලපෑමේ විශේෂතා විමර්ශනයට ලක් කිරීම මෙහි අරමුණ වෙයි. පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල සමීක්ෂණ, අන්තර්ජාල තොරතුරු මෙන්ම නිරීක්ෂණයන් ද පුද්ගලයන් 50 දෙනෙකුගෙන් යුත් නියැදියක් හරහා ලබාගත් සම්මුඛ සාකච්ඡාවන් හා ප්‍රශ්නාවලි ක්‍රමයන් භාවිතයට ගැනිණ. අද්‍යතන සමාජ, ආර්ථික ක්‍රමයේ විවිධ අවශ්‍යතා මත එවැනි දෘශ්‍ය ආඛ්‍යාන ගොඩනැඟීම තුළ එය අතථ්‍ය ප්‍රතිනිර්මාණයක් බවට පත් වී තිබීමත්, එමඟින් පුද්ගලයා සංකීර්ණ අයුරින් මතවාදී මෙහෙයවීමට ලක් කිරීම සහ සමාජීය බලපෑමක් සිදු වීමත් නිසා එම ප්‍රතිනිර්මාණිත දෘශ්‍ය සංස්කෘතිය දෘශ්‍ය ප්‍රකාශනයක් බවට පත් වී තිබීමත් මෙහි දී හඳුනා ගැනිණ. ඒ අනුව අභිසාරී මාධ්‍ය තුළ අන්තර්ගත දෘශ්‍ය සංස්කෘතික සංජානනය පුද්ගල දෛනික චර්යාවන් වෙනස් කර ඇති බවත් එය ඔවුන්ගේ ජීවිතයේ ගාමක බලවේගය බවට පත්ව ඇති බවටත් නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** අභිසාරී මාධ්‍ය, දෘශ්‍ය සංස්කෘතිය, නව මාධ්‍ය, සංජානනය, සන්නිවේදනය

[1] ජනමාධ්‍ය අධ්‍යනාංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය. aksachini96@gmail.com

# THE HUMAN LIBRARY CONCEPT OF EXPERTS IN BUDDHIST COMMUNICATION

*L.A Dilini Liyanaarachchi*[1]

The human library concept of experts in Buddhist communication epitomizes the spirit of the Dharma, emphasizing the transmission of wisdom through direct human interaction. In this unique library, individuals who have attained profound understanding and realization of Buddhist principles serve as living books, embodying the teachings of compassion, mindfulness, and enlightenment. As visitors engage with these expert living books, they are immersed in transformative dialogues that transcend mere intellectual exchange. The living books exemplify the core values of Buddhism, such as non-attachment, selflessness, and right speech, fostering an environment of respect and openness. Participants in the human library have the opportunity to learn from the accumulated experiences and insights of these experts. Through active listening and contemplation, they gain a deeper understanding of the Four Noble Truths, the Eightfold Path, and other fundamental teachings of Buddhism. Moreover, the library promotes the development of empathy and kindness, encouraging visitors to cultivate these qualities within themselves. As seekers absorb the wisdom of the living books, they are inspired to apply the teachings in their daily lives, promoting harmony and well-being in their communities. The concept of experts in Buddhist communication within the human library also emphasizes the impermanence of knowledge. Rather than treating the living books as static sources of information, participants recognize that each interaction is a dynamic and ever-evolving process of learning and growth. In essence, the human library of experts in Buddhist communication serves as a living embodiment of the Dharma, fostering the dissemination of ancient wisdom and promoting the path to awakening for the benefit of all sentient beings. In today's world, the Human Library concept of experts remains crucial. It promotes diverse perspectives, fosters understanding, and facilitates the exchange of knowledge, helping us navigate complex, interconnected global challenges.

***Keywords:*** human library, Buddhist communication, experts, wisdom, knowledge

[1] Department of Pali and Buddhist Studies, Nagananda International Institute for Buddhist Studies, Sri Lanka. dilini93liyanaarachchi@gmail.com

# ශ්‍රී ලංකාවේ කර්තෘ අයිතිය සුරක්ෂිත කිරීමෙහි ලා නව මාධ්‍ය අවකාශයේ පවතින අභියෝග පිළිබඳ අධ්‍යයනයක් (අනීතික PDF ග්‍රන්ථ ප්‍රකාශන විශේෂිත ව)

පී.ඒ.පී.වී.ටී. කුමාරි[1]

මුද්‍රිත ග්‍රන්ථ PDF ප්‍රකාශන ලෙස නව මාධ්‍ය අවකාශයෙහි සංසරණය වීම හමුවේ කර්තෘ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා පවතින අභියෝග පිළිබඳ 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ ප්‍රකාශන හිමිකම් නීතිය සහ ටෙලිග්‍රෑම් මාධ්‍ය විශේෂිත ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. අද්‍යතනය වන විට කර්තෘ අවසරයකින් තොර ව මුද්‍රිත ග්‍රන්ථ පරිලෝකනය (Scan) කර PDF මගින් නව මාධ්‍ය අවකාශයේ බෙදාහරින ප්‍රවණතාවක් නිර්මාණය වී ඇති අතර නව මාධ්‍ය අවකාශයේ සිදු වන මෙම අනීතික PDF මංකොල්ලය හමුවේ කර්තෘ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පවතින අභියෝග පිළිබඳ අධ්‍යනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කෙරිණි. පර්යේෂණයේ දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය යොදා ගත් අතර එහි දී පාඨක, ලේඛක සහ ප්‍රකාශන ආයතන යන ත්‍රිත්ව නියදි යටතේ සමස්ත පුද්ගලයන් 170ක් වෙත එම එක් එක් නියදීන්ට විශේෂිත ව සකසන ලද ප්‍රශ්නාවලි මුදා හරින ලදි. තව ද නිරීක්ෂණ ක්‍රමවේදයේ දී කර්තෘ අවසරයකින් තොර ව මුද්‍රිත ග්‍රන්ථ PDF ප්‍රකාශන ලෙස සංසරණය වූ ටෙලිග්‍රෑම් සමූහ පහක ක්‍රියාකාරීත්වය මාස 03ක් නිරීක්ෂණ කෙරිණි. එමෙන් ම සම්මුඛ සාකච්ඡා සඳහා විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, කථිකාචාර්යවරුන්, නීතිඥයන්, අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් මෙන් ම ලේඛකයන්, ප්‍රකාශන ආයතන කළමනාකරුවන් ඇතුළු වෘත්තීය ප්‍රවීනයන් සහ PDF ග්‍රන්ථ ප්‍රකාශන පරිශීලකයන් සහභාගී කර ගන්නා ලදි. දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ කර්තෘ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ව්‍යවස්ථාපිත බුද්ධිමය දේපළ පනතේ ප්‍රකාශන හිමිකම් නීතිය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමේ ගැටලු පවතින බව අනාවරණය විය. ලේඛකයන්ට, ප්‍රකාශන ආයතනයන්ට සහ පාඨකයන්ට කර්තෘ අයිතිය සුරක්ෂිත කිරීමේ වැදගත්කම සහ කර්තෘ අයිතිය සුරක්ෂිත කිරීමට අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ පුළුල් අවබෝධයක් නොමැති බව පර්යේෂණය ඔස්සේ නිගමනය විය. අනීතික PDF වංචාවට එරෙහි ව නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ බලධාරීන් සියල්ල එක් ව පවතින නෛතික ප්‍රතිපාදන ක්‍රියාවට නංවාලිය හැකි සාධනීය ක්‍රමවේදයක් ගොඩනැගිය යුතු ය.

***ප්‍රමුඛ පදඃ*** කර්තෘ අයිතිය, බුද්ධිමය දේපළ සංකල්පය, ග්‍රන්ථ ප්‍රකාශන, ටෙලිග්‍රෑම් සමාජ මාධ්‍ය, නව මාධ්‍ය, අනීතික PDF ග්‍රන්ථ ප්‍රකාශන

[1] කොළඹ විශ්වවිද්‍යාලය thakshilav1998@gmail.com

# ශ්‍රී ලාංකේය රූපවාහිනී ටෙලි නාට්‍ය සාර්ථකත්වය කෙරෙහි පූර්ව නිෂ්පාදන අවදියේ දායකත්වය පිළිබඳ විමර්ශනයක්.

(ස්වාධීන රූපවාහිනී සේවයට සහ ටී. වී. දෙරණ නාලිකාවන්ට විශේෂිත ව)

*ආර්.එම්.ඒ.ආර්. රත්නායක*[1]

ශ්‍රී ලාංකේය රූපවාහිනී ටෙලි නාට්‍ය සාර්ථකත්වය කෙරෙහි පූර්ව නිෂ්පාදන අවධියේ දායකත්වය පිළිබඳ ස්වාධීන රූපවාහිනී සේවය සහ ටී. වී. දෙරණ නාලිකාවන් නියැදිය ලෙස භාවිත කරමින් මෙම පර්යේෂණය සිදු කෙරේ. එහි දී ශ්‍රී ලාංකේය රූපවාහිනී ටෙලි නාට්‍ය පූර්ව නිෂ්පාදන අවධිය කෙරෙහි නිසි අවධානයක් යොමු වන්නේ ද යන්න, මෙම පර්යේෂණයේ දී පර්යේෂකයාගේ ගැටලුව විය. එබැවින්, පර්යේෂණය තුළ දී උපන්‍යාසය ලෙස භාවිත කරන ලද්දේ, වත්මන් ශ්‍රී ලාංකේය රූපවාහිනී ටෙලි නාට්‍යයන්හි පූර්ව නිෂ්පාදන අවධිය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොවන බව ය. මෙහි මූලික අභිමතාර්ථ වූයේ, වත්මන් ශ්‍රී ලාංකේය රූපවාහිනි ටෙලි නාට්‍යයන්හි පූර්ව නිෂ්පාදන අවධිය කෙරෙහි යොමු වන අවධානය පිළිබඳ අධ්‍යනය කිරීමත්, ශ්‍රී ලාංකේය රූපවාහිනි ටෙලි නාට්‍යයන්හි පූර්ව නිෂ්පාදන අවධිය තුළ දක්නට ඇති ගැටලු හඳුනා ගැනීමත්, අද්‍යතන ශ්‍රී ලාංකේය ටෙලි නාට්‍ය කලාව තුළ පූර්ව නිෂ්පාදන අවධිය ශක්තිමත් කරලීමට ගත හැකි ක්‍රියාමාර්ගයන් පිළිබඳ විමසා බැලීමත් ය. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින්, ලබා ගත් දත්තයන් සම්මුඛ සාකච්ඡා සහ අන්තර්ගත විශ්ලේෂණය යන ක්‍රම උපයෝගී කොටගනිමින් පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය සිදු විය. ඒ අනුව සිදු කළ දත්ත විශ්ලේෂණය ඔස්සේ ලාංකේය ටෙලි නාට්‍ය පූර්ව නිෂ්පාදන අවධිය කෙරෙහි යොමු වන අවධානය ප්‍රමාණවත් නොවන නිගමනය වේ. එමෙන් ම පූර්ව නිෂ්පාදනය මත සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ පැවැත්ම තීරණය වන බවත්, සමකාලීන රූපවාහිනි ටෙලි නාට්‍ය ගෝලීයකරණය, නූතන පාරිභෝගිකවාදය සමඟ බිහි වී ඇති තරඟකාරී වෙළෙඳපොළ ක්‍රමය තුළ ගුණාත්මකභාවය හා වාණිජ අරමුණු පසුපස හඹා යන බවත් අනාවරණය විය. මේ හේතුවෙන් පූර්ව නිෂ්පාදන අදියර ද ඇතුළු ව සමස්ත නිෂ්පාදන දාමය පිළිබඳ, රූපවාහිනි මාධ්‍ය පිළිබඳ විධිමත් හැදෑරීමක් සිදු කළ යුතු බවත්, ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය තුළ වෘත්තිමයභාවයක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමත්, විනිවිධභාවයකින් යුත් නියාමන ක්‍රියාවලියක් භාවිත කළ යුතු බවත් පර්යේෂණ යෝජනා අතර විය.

***ප්‍රමුඛ පද:*** රූපවාහිනිය, ශානර, ටෙලි නාට්‍ය, පූර්ව නිෂ්පාදනය, සන්නිවේදනය.

[1] ජනමාධ්‍යවේදී (විශේෂවේදී) සිව්වන වසර, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී පාලි මණ්ඩපය. ayesharathnayaka1998@gmail.com

# අද්‍යතන ශ්‍රී ලාංකේය මාපිය දාරක සබඳතාව කෙරෙහි සංඛ්‍යාංක මාධ්‍ය සිදු කරන බලපෑම පිළිබඳ විශ්ලේෂණයක්

*ආර්.අයි.ටී. සතුරුසිංහ*[1]

අද්‍යතනයේ සියලු මානව විලාසයන් වෙනස් කරමින් ජංගම දුරකථන, පරිගණක ආදි සංඛ්‍යාංක මෙවලම් ඔස්සේ සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය වේදිකාවන්හි දෙමව්පියන් සහ දරුවන් ගත කරන තිර කාලය ඉහළ අගයක් ගෙන ඇත. එවන් පසුබිමක ශ්‍රී ලාංකේය මාපිය දාරක සබඳතාව කෙරෙහි සංඛ්‍යාංක මාධ්‍ය බලපෑමක් සිදු කරයි යන පර්යේෂණ ගැටලුව ඔස්සේ අද්‍යතන ශ්‍රී ලාංකේය මාපිය දාරක සබඳතාව කෙරෙහි සංඛ්‍යාංක මාධ්‍ය සිදු කරන බලපෑම විමර්ශනය කිරීමේ පර්යේෂණ අරමුණ ඇති ව කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවලින් පුද්ගලයන් 180 දෙනෙකුගේ නියැදියක් අහඹු ලෙස තෝරා ගනිමින් පර්යේෂණ ක්‍රියාවලිය සිදු කෙරිණි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවේශයන් ඔස්සේ මිශ්‍ර ප්‍රවේශයක් භාවිත කරන ලදී. ප්‍රශ්නාවලිය බෙදා හැරීම මඟින් රැස්කර ගත් දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා විෂය ප්‍රවීණයන් තිදෙනෙකුගෙන් ප්‍රශ්න කළ අතර දෙමාපිය දූදරු දෙපාර්ශ්වය නිරීක්ෂණය කරන ලදී. බහුතර ප්‍රතිශතයක දෙමව්පියන් දෛනික ව සංඛ්‍යාංක මාධ්‍ය වෙත ප්‍රවේශ වීම හේතුවෙන් දෙමව්පියන්ට දරුවන් සමඟ ගත කිරීමට ඇති කාලය අවම වී මාපිය දාරක සබඳතාවේ ශක්තිමත්භාවය හීන වී යන බව අනාවරණය විය. නව යොවුන් වියේ දරුවන් සහිත කුටුම්භ තුළ එම තත්වය කැපී පෙනේ. ජංගම දුරකථනය ජනප්‍රිය ම සංඛ්‍යාංක මාධ්‍ය මෙවලම ය. දෙමව්පියන් දරුවා සමඟ සංඛ්‍යාංක මාධ්‍ය භාවිත කිරීමේ චර්යාව දරුවා සංඛ්‍යාංක මාධ්‍ය වෙත යොමු වීමට අභිප්‍රේරණයක් වී ඇත. දරුවා සංඛ්‍යාංක මාධ්‍ය පයීත සමඟ වැඩි කාලයක් අන්තර් ක්‍රියා දක්වමින් අතථ්‍ය සමාජ පරිසරයකට අනුයෝජනය වීමෙන් සමාජානුයෝජන ස්වරූපයන් ද වෙනස් වෙමින් පවතී. දෙමාපියන් සහ දරුවන් අතථ්‍ය සංඛ්‍යාංක පයීතයන්ට අනුකූල ව මානසික, සමාජීය හා ආධ්‍යාත්මික ජීවිතය හැඩගස්වා ගැනීමෙන් පරාධීන පෞරුෂයක් සහිත සමාජ සම්බන්ධතාවන්ගෙන් වියුක්ත හුදෙකලා අර්ධ තාක්ෂණික මානවයෙක් බවට පත් වේ. සංඛ්‍යාංක මාධ්‍ය සමාජ හා පුද්ගල ප්‍රගමනය උදෙසා බුද්ධිමත් ව උපයෝගී කරගැනීම පුද්ගල දෘෂ්ටිය හා දෙමාපිය දාරක සම්බන්ධතාවයේ ශක්තිමත් බව මත දෙමාපියන් තමාගේ සහ දරුවාගේ මාධ්‍ය භාවිතය පාලනය කරමින් සිදු කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** සංඛ්‍යාංක මාධ්‍ය, මාපිය දාරක සබඳතාව, තිර කාලය, අතථ්‍ය සමාජය, සමාජානුයෝජනය

[1] ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, ishangathathsarani@gmail.com

# දූරකථනය කුටුම්භ සන්නිවේදනය දුරස්ථභාවයට බලපාන අයුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්.

*ඩබ්ලිව්.ඒ.ටී.ඩී. වික්‍රමරත්න*[1]

තාක්ෂණයේ දියුණුවෙහි ප්‍රතිඵලයක් ලෙස සෑම නිවසක ම ලොකු කුඩා සියලු සාමාජිකයන් අතර ම දූරකථනය අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. මෙබැවින් පවුලේ සාමාජිකයන් අතර පවතින අන්‍යෝන්‍ය සන්නිවේදනය දුරස්ථ ව මොවුන් දූරකතනය සමඟ හුදෙකලා ව කාලය ගත කරයි. මේ නිසා කුටුම්භ තුළ පවතින අන්‍යෝන්‍ය බැඳීම දුරස්ථ වී ඇති බව හඳුනාගත හැකි ය. යථෝක්ත පරීක්ෂණයේ පර්යේෂණ ගැටලුව ලෙස දූරකථනය කුටුම්භ සන්නිවේදනයේ දුරස්ථභාවයට බලපාන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වසයෙන් දූරකථනය නිසා කුටුම්භය ඇති වී තිබෙන දුරස්ථභාවය අවම කරගන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම වන අතර ඒ අරමුණු වසයෙන් දූරකථන නිසා කුටුම්භය ඇති වී තිබෙන දුරස්ථභාවය අවම කරගන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම වන අතර උපඅරමුණු වසයෙන් දූරකථන නිසා කුටුම්භය තුළ පවතින දුරස්ථභාවය අවම කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ පුද්ගලයන් අතර දැනුවත් භාවයක් ඇති කිරීම අරමුණු වශයෙන් තබාගෙන මෙම අධ්‍යනය සිදු කරන ලදී. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. ක්ෂේත්‍ර නොවන ගවේෂණයන් යටතේ පූර්ව අධ්‍යයන පිළිබඳ අවධානය යොමු කර ඇත. එහි පර්යේෂණ ආශ්‍රයෙන් ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථ සහ ලිපි ආදිය අධ්‍යයනය කෙරුණි. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ නිවාසවලින් තොරතුරු ලබා ගනු ලැබී ය. ප්‍රතිඵල සහ සාකච්ඡාව ලෙස මෙම අධ්‍යයනය මඟින් කුටුම්භය තුළ දූරකථනය නිසා සන්නිවේදනය දුරස්ථභාවය ඇති වීමට බලපාන ලබන හේතු සාධක රැසක් අනාවරණය කර ගැනීමට හැකි විය. මෙහි දී කුටුම්භය තුළ සිටින සාමාජිකයන් දෛනික ව තම ජීවිතය දූරකථනය සමඟ කාලය ගත කිරීමට වැඩි හොරා ප්‍රමාණයක් වැය කිරීම තුළින් නිවැසියන්ට අන්‍යෝන්‍ය වසයෙන් අදහස් හුවමාරු කරගැනීමට හැකියාවක් උදාවීම සීමිත වේ. මෙමඟින් කුටුම්භයේ පුද්ගලයන්ට විවිධ මානසික ව්‍යාධීන්වලට ගොදුරු වීමට ඉඩකඩ ඇති අතර එය සියදිවි නසා ගැනීමට තරම් උග්‍ර වී ඇත. පවුලේ දරුවන් තම විවේකී කාලය පෙර තම සහෝදරයන් සමඟ විනෝදයෙන් විවිධ ක්‍රීඩාවල නිරත වෙමින් ගත කළ නමුත් වර්තමානයේ දූරකථන ක්‍රීඩාවල දරුවන් තනි ව ම නිරතවීම මඟින් පවුල තුළ සහෝදර සහෝදරියන් අතර මනා සන්නිවේදනයක් සිදු නො වේ. එමෙන් ම කුටුම්භයෙහි සිටින දරුවන් උපදෙස් ලබා ගැනීම තම ප්‍රශ්න ගැටලු දුක සැප බෙදා ගැනීම නිවැසියන් අතර සිදු කිරීම සීමා සහිත කර ඇති අතර දූරකථනයෙන් හඳුනාගත් පුද්ගලයන් අතර ඒ පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම තුළින් කුටුම්භ සන්නිවේදන දුරස් ව ගොස් ඇත. තව ද වර්තමානයේ පුද්ගලයන් දූරකථන ක්‍රමයට තම ව්‍යාපාර ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සිදු කිරීම තුළින් කුටුම්භය තුළ සන්නිවේදනය දුරස් වී ඇති බව මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. නිගමනය ලෙස වර්තමාන සමාජ සන්දර්භය තුළ තාක්ෂනික දියුණුවත් සමඟ පුද්ගලයන්ට දූරකථන දෛනික කටයුතු සඵල කර ගැනීමට බොහෝ ඵලදායි ය. එහෙත් කුටුම්භය තුළ දූරකථන භාවිතයට ඇබ්බැහි වීම ස්වයං පාලනයක් සහිත ව කුටුම්භ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වාගෙන භාවිත කළ යුතු බව මෙම පර්යේෂණ අධ්‍යයන මඟින් නිගමනය කරනු ලැබී ය.

***ප්‍රමුඛ පදඃ*** දූරකථනය, කුටුම්බය, සන්නිවේදනය, පවුල, සාමාජිකයන්

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, wickramarathanathanuja@gmail.com

# ශ්‍රී ලාංකීය සමාජ සංස්කෘතියට ''සෝප් ඔපෙරා'' නාට්‍ය කලාව තුළින් සිදුවන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්.

*එච්. පී. තශිලා ප්‍රබෝධි*[1]

මිනිසා යනු සමාජීය සත්ත්වයෙකි. මිනිසා විවිධ මානව අවශ්‍යතාවයන් සපුරා ගැනීම උදෙසා සමාජීය ජීවියෙකුගේ භූමිකා රංගනයක නිරත වේ. සංස්කෘතික සභ්‍යත්වයක් සහිත වූ ශ්‍රී ලාංකීය සමාජ සංස්ථාව තුළ සාධනීය හා නිශේධනීය සමාජීය විපරිවර්තනයන් ඇති කිරීමට රූපවාහිනීයේ ආගමනය ප්‍රමුඛ වශයෙන් බලපාන ලදී. මෙහි දී විශේෂයෙන්ම රූපවාහිනී ටෙලි නාට්‍ය කලාවේ එක් අංශයක් ලෙස ''සෝප් ඔපෙරා'' නාට්‍ය කලාව හඳුනාගත හැකිය. එමගින් ලාංකීය සමාජ සංස්කෘතියේ මිනිස් චර්යාව, මිනිස් කථන විලාසය, ඇඳුම් පැළඳුම් රටාව, ආහාරපාන රටාව, චාරිත්‍ර වාරිත්‍ර විධි ආදී සංස්කෘතිකාංගයන්ට සාධනීය හා නිශේධනීය බලපෑම් එල්ල කරන්නට විය. එම සමාජ සංස්කෘතික බලපෑම අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙහි දී ''සෝප් ඔපෙරා'' නාට්‍ය කලාවෙහි ආගමනය හා ව්‍යාප්තිය, ''සෝප් ඔපෙරා'' නාට්‍ය තුළ ස්ත්‍රිය සහ පුරුෂයා නිරූපිත ආකාරය, වර්තමාන ලාංකීය සංස්කෘතිකාංග ඉන්දීය ආභාසයට හුරු වූයේ කෙසේ ද? යන මාතෘකා සම්බන්ධයෙන් මෙම අධ්‍යනයේ දී සොයා බැලුණි. මෙහි දී අධ්‍යනය සඳහා 'ඉන්දීය සෝප් ඔපෙරා' නාට්‍ය කලාව තෝරාගත් අතර එහි දී සිරස නාලිකාවේ විකාශනය වූ ''මේ ආදරේ' නාට්‍ය සහ ''ප්‍රේම දඩයම'' ටෙලි නාට්‍ය, හිරු මාධ්‍ය නාලිකාව තුළ විකාශනය වන ''අනූපමා'' නාට්‍ය යන නාට්‍ය ත්‍රිත්වය තෝරා ගන්නා ලදී. මෙහි දී පර්යේෂණ නියැදිය වශයෙන් වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙසෙන විවිධ වයස් පරතරයන්හි පුද්ගලයන් 50ක් අනුසාරයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කරගෙන දත්ත රැස් කරන ලදී. ලබාගත් දත්ත විශ්ලේෂණයට අනුව ශ්‍රී ලාංකීය සමාජ සංස්කෘතිය තුළ ස්ත්‍රියකගේ දෛනික චර්යා රටාව වෙනස් කිරීමට, ස්ත්‍රී ආධිපත්‍යයක් සහිත පවුල් සංස්ථාවක් නිර්මාණය වීමට, පුරුෂ ආධිපත්‍ය බිඳ වැටීමට, විවාහ සංස්ථාවේ අස්ථාවරත්වයන් ඇති වීමට, අනියම් ලිංගික සම්බන්ධතා සමාජගත වීමට, මිථ්‍යා විශ්වාස පසුපස හඹායන සමාජයක් නිර්මාණයට, පාසල් අධ්‍යාපනයෙන් ශිෂ්‍ය ප්‍රජාව දුරස්ථ කිරීමට ඉන්දීය ''සෝප් ඔපෙරා'' ටෙලි නාට්‍ය කලාව බලපෑම් කර ඇති බව නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද :*** *සෝප් ඔපෙරා නාට්‍ය, සමාජ සංස්කෘතිය, ස්ත්‍රී ආධිපත්‍යය*

[1] සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. thashilaprabodi708@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Economics & Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# AN EXPLORATION OF FACTOR INFLUENCE BY LABOR MIGRATION FROM RURAL TO URBAN IN SRI LANKA

A study based on Ridipana Grama Sewa Division, Badulla Districts

*S. Rukshan Shyma*[1]

The globalization impacts the urbanization, labor migration and change in social economic conditions in the economy. The labor migration is one of the major problems in the society. The scare literatures exhibit the labor migration from rural to urban (LMRU) effect to the whole economy including, makes slums in urban areas, traffic congestion, air water pollution and cultural issues in economy. The problem is that the labor mobility from rural to urban and it leads to generate most issues in cities. This study focuses on Ridipana Grama Sewa Division, Badulla district, aiming the exploration causes and factors which affects the LMRU. The research employed qualitative research design and gathers data from 20 respondents through a developed interview guides and personal interviews. And Secondary data was collected through Newspapers, articles and books. The target population was labors who migrated from rural to urban cuties in Badulla district of Sri Lanka. The sample size was 20, and was selected based on purposive sampling technique. Thematic method was applied as analytical tool. The finding of the study revealed that various factors impact the LMRU including social, economics, region, phycology and environment factors as well. Furthermore, economic opportunity is one of the most important factors in LMRU as the urban areas have most job vacancies infrastructure development and road networks than rural area. According to the secondary data, The Urban population in 2022 is 19% greater than 2021 and beyond. And also in some cases, environment factors contribute to LMBR such as natural disasters, drought and other climate related issues. To reduce the LMRU, several strategies are proposed including, invest in rural infrastructure, Agriculture Modernization, Diversification of rural economy, enhancing the social security nets, PPP and support to the SMEs in rural areas. Finally, the LMRU is the crucial problem in economy and the “market intervention” and “civil society intervention” and “government intervention” That also helps to avoid LMRU.

***Keywords:*** Labor Migration, Economic Opportunities, Agriculture Modification, Diversification, Market Intervention

[1] Department of Economics, Faculty of social Science and Humanities, Rajarata University of Sri Lanka. rukshashamal530@gmail.com

# A STUDY ON LABOR SHORTAGE IN RUBBER PLANTATION OF KALUTARA DISTRICT

*K.H.D. Madhushani*[1]

One of the important industries that affects our country's economic growth is the plantation industry. Rubber is a Brazil-native crop introduced in Sri Lanka by the British. The most traditional rubber-growing districts are Colombo, Gampaha, Katutura, Kandy, Matale, Galle, Matara, Kurunegala, Rathnapura, and Kegalle. Kalutara district is the second-highest large rubber plantation area. The main objective of this study is to determine the reasons for the labor shortage in rubber plantations of Kalutara district. The Research design is quantitative. The study area of this study is Namunukula Plantation, pallegoda estate in Mathugama Sectary division at Kalutara District. The population considered for this study is about 320 Laboure registered under Namunukula plantations. Therefore, 175 sample tappers were chosen at random by using a systematic method (Using the statistical package for social sciences). A stratified random sampling method has been used for selecting the respondents. In this study, there are two different data collection methods primary data and secondary data. Accordingly for this study data analysis was used by Multiple linear Regression with the statistical package for social sciences and output analysis by the table of descriptive statistics for all the variables under investigation. The study reveals that labor shortage is due to dissatisfaction with work life, benefits to labourers, low scope for development, low income, lack of skill, improper working condition and passion to work also affect to the workers. Thus, improve the quality of work life by recognizing the labourers work or rewarding them, increasing the daily wage of the labourers, providing training to labourers, improving working environment and improving social security measures can reduce labour shortage in plantation.

***Keywords:*** Laborer, Labor shortage, Plantation, Rubber Plantation, Estate Sector

---

[1] Rajarata University of Sri Lanka, Mihintale. disnamadushani@gmail.com

# EFFECT OF ECONOMIC GROWTH ON ENVIRONMENTAL POLLUTION: A COMPARATIVE ANALYSIS BETWEEN DEVELOPED AND DEVELOPING COUNTRIES

*W.A.I.D. Wijerathna[1]* D.H.D.S. Kulasinghe[2]*

Environmental pollution is a critical factor worldwide due to the enhanced frequency and the severity of natural disasters and catastrophes and it crucially affects the survival of the universe. Hence the study focused on the impact of economic growth on environmental pollution. This research study comparatively analyzes the impact of economic growth on environmental pollution in developed and developing countries and it investigates the impact of economic growth and environmental pollution. The study incorporated a data series over the period of 1980-2022 of 50 countries. The panel data regression analysis employed in this study to analyze the impact of economic growth and the environmental pollution which are proxied using the Gross Domestic Product Growth rate and the Carbon Emissions (CO2) metric tons per capita with the control variable incorporated the energy consumption. In addition, the researchers assessed the Environmental Kuznets Curve (EKC) theory in the study to provide an in depth understanding on the studying field. Further the study revealed that the significant positive impact of the economic growth on the environmental pollution over the developing countries. The study supports the validity of the EKC theory in explaining the relationship between economic growth and environmental degradation. Hence, establishing environmentally friendly economic policies and practices are highly appreciated to lower environmental pollution and to shrink the adverse effects of the impact of economic growth on environmental pollution in the developing countries. These research findings highlight the importance of sustainable practices, environmental regulations, and collaborative efforts to mitigate the negative impacts of economic development on the environment. This study serves as a foundation for future research in this critical area to have a sustainable environment in the future while having a coherence between the lower emission rates and the higher economic growth rates.

***Keywords:*** Carbon Emission, Economic Growth, Environmental Pollution, Environmental Kuznets Curve, Gross Domestic Product Growth Rate

[1] Department of Accounting, Faculty of Management, KIU Campus. imeshika@kiu.ac.lk
[2] Department of Accounting, Faculty of Management, KIU Campus. senalikulasinghe@gmail.com

# EFFECTIVENESS OF SAMURDHI PROGRAM AS A POVERTY ALLEVIATION STRATEGY IN SRI LANKA: A QUALITATIVE EXPLORATORY STUDY

*W.M.A.S. Premarathna*[1] *W.M.S. Sekara*[2]

Poverty is a significant and persistent issue with far reaching consequences. Accordingly, poverty reduction is a crucial achievement and understanding the factors contributing to this success is essential. The Samurdhi program introduced in 1995 is often cited as a significant factor in poverty reduction effort in Sri Lanka, yet the desired goals have not been fully realized. Over the past 28 years significant government expenditure totaling approximately 600 billion rupees has been allocated to the program. Despite the substantial investment and the program's primary objective of poverty eradication, the Samurdhi program has been unable to effectively address the countries poverty problem. This is evident from the continuous expenditure and the persisting number of beneficiaries over the years. In 2022, the government allocated 65 billion rupees for the program benefiting1.7 million individuals. The inability of the Samurdhi program to achieve its intended goal raises important questions regarding its effectiveness and impact on poverty reduction effort in Sri Lanka. Main objective of this study is to study the causes of less effectiveness of Samurdhi as a poverty alleviation strategy in Sri Lanka. Specific objectives are to identify specific characteristics of beneficiary households who success and failed in move out of poverty, to explore the nature of determinants of Samurdhi program which helped beneficiaries to move out of poverty and to explore the nature of determinants of Samurdhi program which caused beneficiaries not to move out of poverty. The qualitative exploratory approach was used as research design. Population of the study consist of all families residing in the Mailewa Gramma Niladhari Division totaling 210 families. The sample for this study was used 20 families purposively selected. This sample was comprised 10 families who are lost Samurdhi benefits within a short period of time (approximately 5 years) and 10 families who are still receiving Samurdhi benefits for more than 5 years. Primary data collected from semi-structured in depth interviews. Qualitative data analysis using a descriptive method was selected as data analysis technique. Descriptive narratives and quotes were used for data presenting. Additionally, graphs and tables have been used to present relevant secondary data and provide a visual representation of key information. The study found that the effectiveness of the Samurdhi program was not at a satisfactory level. This study found several reasons (targeting issues, lack of sustainable livelihood, limited impact on poverty reduction, weak monitoring and evaluation, corruption and politicization insufficient support services and lack of coordination with other programs) for the failure of the Samurdhi program to effectively address poverty. These findings will lead to improving the effectiveness of the Samurdhi program.

**Keywords:** Beneficiaries, Effectiveness, Poverty alleviation, Samurdhi program, Sri Lanka

[1] Rajarata University of Sri Lanka, Mihintale amalisubhashini376@gmail.com

[2] Rajarata University of Sri Lanka, Mihintale sewwandimadhu1999@gmail.com

# Identifying Factors affecting rural youth unemployment in Sri Lanka.

*H.M.T.D Herath*[1]

The United Nations defines the term "Youth" as group pf people between the ages of 15 and 24. According the Department of Census and Statistics unemployed is defined as a person who does not have a job for more than four weeks and who is willing, available and is taking all the necessary actions to find a job and ready to accept a job offer within two weeks. Unemployment is considered as a multidimensional concept that integrates economic, political, social dimensions. The purpose of this study, which was based on the research problem of what factors affect rural youth unemployment in Ibbagamuwa Divisional Secretariat Division, was to show how those factors affect rural youth unemployment. Primary data was collected using a structured questionnaire. Secondary data was collected using literature review and google information. Convenience sampling methods were applied to select 100 sample respondents from the Ibbagamuwa Divisional Secretariat Division. Multiple Linear Regression model was used for analyzing data. This research took six months to complete. Tables, graphs, maps were used to present the data. Skills mismatches, including language, digital literacy affect youth unemployment. The study also showed that young women, young people with post-secondary education, vocationally trained, high levels of language and digital literacy with young people are more likely to be unemployed. Based on the findings of the study, the government and all relevant institutions should expand higher education centers that help youth acquire technical skills to create their own jobs. Furthermore, policy makers are encouraged to rethink possible reforms in education and vocational training system to improve the knowledge, skills, attitudes of young people.

***Keywords:*** youth, unemployment, education, job, skills

[1] thiwankadilrukshih@gmail.com

# THE IMPACT OF MICROLOAN FACILITIES ON POVERTY ALLEVIATION WITH SPECIAL REFERENCE TO KOTAWELLA SANASA PRIMARY SOCIETY IN KEGALLE DISTRICT

*P.G.K.N. Senadheera*[1] *K.W.K. Gimhani*[2]

Micro finance has been highlighted as a critical turning point in any emerging country, and micro loan is the most powerful micro-financial tools for economic development. As a result, microfinance institutions employ the microloan facility to alleviate poverty among poor individuals and to assist Small and Medium Enterprises in overcoming financial challenges. The SANASA Society is a well-known financial institution in Sri Lanka that gives microloans to over 8000 primary societies in order to alleviate poverty. Hence, the primary goal of this study was "To identify impact of microloan facilities on poverty alleviation among customers in Sri Lanka's Sanasa Primary Society". The study followed the positivism philosophy and identified three independent variables, such as loan interest rate, ease of getting a loan, and level of awareness, after analyzing existing literature. Moreover, the study was conducted in a deductive way by using survey and quantitative research techniques. Further, the study sample size included 54 Samurdhi recipients who joined the SANASA primary society to take out micro loans and fall below the poverty line, chosen from a population of 122 using a simple random sampling procedure. The study findings revealed that an affordable microloan interest rate, the ease of getting a loan, and the awareness level of microfinance positively influenced poverty alleviation and an affordable or fair interest rate was identified as the most influential factor in poverty reduction. Hence, it was suggested that SANASA Primary Society charge a reasonable and affordable interest rate, simplify the loan application process from filling to approval, improve employee supportive behavior through an employee training program, and conduct a customer awareness program to alleviate poverty by providing microloans to individuals.

***Keywords:*** Awareness, Easiness of getting loan, Interest rate, Micro Finance, Micro Loans

[1] *Department of Regional Science and Planning, Faculty of Management & Finance, SANASA Campus, Sri Lanka.* Kasunisenadheera3@gmail.com

[2] *Department of Banking & Finance, Faculty of Management & Finance, SANASA Campus, Sri Lanka.* Kashiniesp@gmail.com

# THE IMPACT OF SOCIAL MEDIA MARKETING ON THE SALES PERFORMANCE OF SMES IN SRI LANKA

(Special reference to Kalutara District)

*T.M.N. Wasana*[1]

This study examines the impact of social media marketing on the sales performance of Small and Medium Enterprises in Sri Lanka. SMEs in Sri Lanka play a significant role in driving economic growth, contributing 52% to the GDP and generating employment opportunities for 45% of the workforce. Emphasizing the importance of social media marketing for these businesses, it can greatly enhance profitability, especially in terms of boosting sales performance. The main purpose of in this study to examine the relationship between social media marketing and sales performance in small and medium enterprises and specific purpose of this study is identifying the most influence factors for social media marketing. The quantitative research design was used in this research and Dodangoda Divisional Secretariat Division was chosen in the study area. Both primary data and secondary data were employed. The primary data was collected by a structured questionnaire. Secondary data was collected from divisional secretarial division reports. The sample for the analysis consisted of 100 small and medium enterprises entrepreneurs who were randomly selected. Descriptive Statistic Analysis, Pearson's Correlation Analysis, and Multiple Regression Analysis were used to analyze. The data analysis technique is used in Statistical Package for Social Sciences software. The result obtained through regression analysis established that social media marketing has impacts on the sales performance of small and medium enterprises. The findings indicate that compatibility, perceived usefulness, and perceived ease of use have a positive impact on the influence of social media marketing adoption by SMEs. Albeit, the cost has a significant and negative impact on social media marketing used by SMEs. The study recommends further studies to be conducted on the strategies to be used to improve the application of social media marketing in the small and medium enterprises.

***Keywords:*** performance, sales, small and medium enterprises, social media marketing, social media

[1] Department of Economics, Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale. nethminiwasana98@gmail.com

# WOMEN'S ROLE IN HOUSEHOLD FOOD SECURITY IN RURAL SRI LANKA

(Special reference to Anuradhapura district, Sri Lanka)

*D.A.A.S. Dissanayake*[1]

Food security has been prioritized in the domestic economic policies of many developing nations. Nations gain from having a healthy population since it immediately increases labor production and lowers spending on health-related concern. Achieving food security is essential for a healthy nation since the nutrition that people consume heavily influences how healthy the population is. Many studies have identified that women play a significant role in reducing food insecurity in their own households, hence there has been an increasing trend to focus food security policies on women's empowerment. Despite the fact that women are culturally allocated higher responsibility in practically all household tasks, including household food management, there is a dearth of research on the role of women in achieving household food security in Sri Lanka. Hence, this study aimed to analyze the women's role in household food security in rural Sri Lanka. This study is conducted using qualitative data analysis using descriptive methods. The sample for this study will include 20 families, purposively selected. This research essentially dependent on primary data. Primary data will be collected through semi – structured in – depth interviews with the selected sample. The study identified that women play a significant role in ensuring household food security in all four dimensions of food security; they contribute significantly to farming household food availability, their contribution to income plays an essential role in household food access, particularly in low-income households, and their nutritional knowledge is also important in the proper utilization of food in households. Accordingly, these findings suggest that women's contributions to food security are essential, and that policymakers should prioritize women's empowerment and education with the objective to improve food security.

***Keywords:*** women's role, household, food security, rural area, developing nations

[1] Rajarata University of Sri Lanka, Mihintale. sewdissanayake@gmail.com

# ආර්ථික දුෂ්කරතා නේවාසිකාගාරගත විද්‍යාර්ථීන්ට බලපෑම් කරන ආකාරය විමර්ශනය කිරීම: ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ඇසුරින්

*බී. එම්. එල්. එස්. කේ. බස්නායක*[1]

විවිධ ප්‍රදේශවලින් විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුළත් වන අතර නේවාසිකාගාර තුළ රැඳී සිටිමින් අධ්‍යයන කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් ඔවුනට හිමි වේ. නේවාසික ව රැඳී සිටීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ නේවාසිකාගාරගත විද්‍යාර්ථීන්ට ආර්ථික දුෂ්කරතා බලපෑම් කරන්නේ කෙසේ ද යන ප්‍රධාන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දුටුගැමුණු පිරිමි නේවාසිකාගාරයේ සිසුන් 25ක් සහ ඥානම් ගැහැනු නේවාසිකාගාරයේ සිසුන් 60ක් ලෙස සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන් අසූපස් දෙනෙක් පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබූහ. ගූගල් පෝරමයක් හරහා ලබාගත් ප්‍රතිචාර මත දත්ත ලබා ගන්නා ලදී. ආර්ථික දුෂ්කරතා නේවාසිකාගාර ගත විද්‍යාර්ථීන්ට බලපෑම් කරන්නේ කෙසේ දැයි හඳුනා ගැනීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. උපඅරමුණු අතර ආර්ථික අපහසුතා අධ්‍යාපන කටයුතුවලට බලපෑම් කරන්නේ කෙසේ ද ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ නේවාසිකාගාරගත විද්‍යාර්ථීන් තුළ ගැටලු නිරාකරණයට පවතින විසඳුම් කෙබඳු දැයි හඳුනා ගැනීම ඇතුළත් විය. මෙහි දී නේවාසික ව රැඳී සිටින සිසුන් බහුතරයක් ආර්ථික අපහසුතා හේතුවෙන් පීඩාවට පත් වන බව අනාවරණය විය. බහුතරයක් සිසුන්ගේ පියා පමණක් රැකියාවක් සිදු කරනු ලබයි. 56 දෙනෙක් නේවාසිකාගාරගත ව අධ්‍යාපන කටයුතු සිදු කිරීමට අවශ්‍ය මුදල් පවුලේ අය සහ ශිෂ්‍යාධාර හරහා ලබා ගනිති. මාසික වියදම සඳහා රුපියල් 10000 - 20000 අතර මුදලක් වැය වීම, ආහාර සඳහා වියදම අධික වීම, ප්‍රමාණවත් පරිදි ආහාර සහ භාණ්ඩ නේවාසිකාගාර අවන්හන් තුළ නොමැති වීම, අවශ්‍ය මුදල් නොමැති විට යහළුවන්ගෙන් මුදල් ඉල්ලා ගැනීම, නේවාසිකාගාරයෙන් බැහැර ව නිවසට යාම, කුසගින්නේ සිටීම ආදිය සඳහා සිසුන් යොමු වන බවත් අනාවරණය විය. තමා විසින් ම රැකියාවක් කර අවශ්‍ය මුදල් සොයා ගනු ලබන්නේ 1%ක් තරම් සුළු පිරිසක් වීම, ආර්ථික අපහසුතා හේතුවෙන් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන කටයුතු අතර මඟ නවත්වන්නට සිතීම, නේවාසික ව රැඳී සිටීමට ප්‍රමාණවත් මුදලක් නොලැබීම සුවිශේෂී සොයා ගැනීම් අතර විය. ලබා දෙන ශිෂ්‍යාධාර මුදල වැඩි කිරීම, අධ්‍යාපනයෙහි නියැලෙනවාත් සමඟ අමතර රැකියාවන් සඳහා යොමු වීම හරහා ගැටලු වලක්වා ගැනීමට හැකි බව සිසුනගේ යෝජනා අතර විය. නේවාසික ව රැඳී සිටීමේ දී බොහෝ සිසුන් ආර්ථික ගැටලු මත පීඩාවන්ට පත් වන බව අවසාන නිගමනය වේ.

***ප්‍රමුඛ පද:*** නේවාසිකාගාර, විද්‍යාර්ථීහු, ආර්ථික, දුෂ්කරතා

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. lakshikasudarshanils@gmail.com

# දිළිඳුකම පිටු දැකීම තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා බෞද්ධ ඉගැන්වීම්හි දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ. කේ. සී. අයේෂානි අබේසිංහ*[1] *අමුගොඩ ධම්මජීව හිමි*[2]

දිළිඳුකම පිටු දැකීම තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා බෞද්ධ ඉගැන්වීම්හි දායකත්වය නම් මෙම පර්යේෂණයේ මූලික උපන්‍යාසය වනුයේ දිළිඳුකම පිටුදැකීම පිළිබඳ බෞද්ධ ආකල්පය සැබවින් ම ප්‍රායෝගික වූ සදාචාරාත්මක පිළිවෙතක් බව පෙන්වා දීමයි. එමඟින් එහි වර්තමාන අවශ්‍යතාව උදෙසා න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ අධ්‍යයනයෙහි උපයෝගීතාව තුළින් තිරසාර සංවර්ධනය ඇති කළ හැකි බව පෙන්වාදීම අරමුණ වේ. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය යටතේ ගොඩනැගුණු මෙම පර්යේෂණයේ දී ත්‍රිපිටකයත් ඒ හා බැඳි අටුවා ආදි ප්‍රාථමික මූලාශ්‍රයත් අධ්‍යයන ක්ෂේත්‍රයට සමගාමී ව රචිත අද්‍යතන ග්‍රන්ථ, ලිපි ආදි ද්විතීයක මූලාශ්‍රයත් උපයෝගී කොට ගැනේ. බුදුදහමට අනුව දිළිඳුකම ලෞකික හා ආධ්‍යාත්මික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා බාධාවක් වන අතර සමාජීය වපසරිය තුළ දිළිඳුකම යන්න සාපේක්ෂ කොට ගැනේ. එය පුද්ගල දෘෂ්ටික වූ සංකල්පයකි. දිළිඳුකම යන්න නිර්වචනය කිරීමේ දී ආගමික, භෞතික, සංස්කෘතික ආදි විවිධ මානයන් භාවිත කර ඇති අතර එහි දී සමාජ, සංස්කෘතික හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ව ද විෂය වේ. දිළිඳුකම තුළින් සමස්ත සමාජයේ ම අවගමනය සාධනය වන අතර එතුළින් සමාජ, ආර්ථික, දේශපාලනික හා පාරිසරික වසයෙන් විවිධ අර්බුදයන්ට මුහුණ දීමට සිදු වේ. බුදුදහම තුළ දිළිඳුකම සාධාරණීකරණය නො කරයි. දිළිඳුකම ප්‍රතික්ෂේප කරන බුදු දහම ධනයේ අවශ්‍යතාව පෙන්වා දෙනුයේ දුප්පත්කම කාමභෝගී ගිහියනට දුකක් බව අවධාරණය කරමිනි. දිළිඳුකම පිටුදැකීම උදෙසා පිළියම් රාශියක් බෞද්ධ සූත්‍ර දේශනා තුළින් ඉදිරිපත් වන අතර එතුළින් සමාජගත අර්බුද හා පුද්ගලයාට මුහුණ පාන්නට සිදු වන අර්බුද සමනය කරගන්නා ආකාරය මැනැවින් පෙන්වා දෙයි. ජනතාවගෙන් උපයා ගත් රාජ්‍ය භාණ්ඩාගාරය ජනතාවගේ ම සමෘද්ධිය පිණිස යෙදවීම මෙන් ම එතුළින් දිළිඳුකම තුරන් කිරීම අරමුණු කරගත් රාජ්‍ය පාලනයක් පිළිබඳ ව පෙන්වා දෙන දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ දී රාජ්‍ය පාලකයන් රාජ්‍යයේ කෘෂිකාර්මික, කාර්මික, වාණිජ, රාජ්‍ය සේවය යනාදි අංශ කෙරෙහි පමණක් නො ව තම ස්වයං ශක්තියෙන් නැඟී සිටීමට නොහැකි ජනතාව කෙරේද අවධානය යොමුකර කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි. දිළිඳුකම පිටුදැකීම විෂයෙහි පෞද්ගලික දායකත්වය ද අගය කොට සලකන බුදුදහම බාහු බලය යොදා ධාර්මික ව ධනය උපයාගත යුතු බවත් නිසි අයුරින් ධනය වියපැහැදම් කිරීම හා ආයෝජනය කිරීමත් මෙන් ම ධනය ඉතිරි කිරීමත් කළ යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව බෞද්ධ ආර්ථික චින්තනය තිරසාර සංවර්ධනය අරමුණු කරගත් දූරදර්ශී පදනමක් සහිත උභයාර්ථ සාධනයෙහි ම පවතින්නක් බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ආර්ථිකය, උභයාර්ථ සාධනය, තිරසාර සංවර්ධනය, දිළිඳුකම, බුදුදහම

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com

[2] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. dhammajeewa1@gmail.com

# වී ගොවියාගේ ආර්ථික සුබසාධනය සඳහා අතරමැදි කන්න භෝග වගාවේ බලපෑම - හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

*එච්. ටී. වී. එම්. ආරියරත්න*[1]

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය තුළ වැදගත් වනුයේ වී වගාව හා අනෙකුත් අතිරේක භෝග වගාවයි. ඒ අතරින් වඩාත් වැදගත් වනුයේ වී වගාවයි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් වැඩි ප්‍රතිශතයක් වී වගාව සහ අනෙකුත් අතිරේක භෝග වගාව සඳහා යොදවා ඇති අතර ග්‍රාමීය ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් සේවා නියුක්ත ව සිටිනුයේ ද දේශීය කෘෂි අංශය තුළ ය. World Bank, 2009ට අනුව ලෝකයේ දුප්පතුන්ගෙන් 75%ක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වෙමින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. ඒ අනුව ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය දේශීය කෘෂි අංශයේ සංවර්ධනය මත රඳා පවතී. මෙහි දී කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම සඳහා ක්‍රම 03ක් අනුගමනය කර හැක. ඒවා නම්, වගා කර හැකි භූමි ප්‍රමාණය වැඩි කර ගැනීම, ඉඩම් අක්කරයක සාමාන්‍ය ඵලදාව වැඩිකර ගැනීම හා එකම භූමියක භෝග විවිධාංගීකරණය තුළින් අස්වැන්න වැඩි කර ගැනීම වේ. වී ගොවියා අතිරේක භෝග වගාවට නැඹුරු වීමෙන් අර්ථික සුභසාධනයේ වර්ධනයක්, ගොවිපල ඵලදායීතාව ද ඉහළ යෑමක් හඳුනාගත හැකි ය. එහෙත් ගොවියා අතිරේක ආහාර වගා කිරීම හේතුවෙන් ඔවුන්ගේ පරිභෝජනයේ ද වෙනස්කම් සිදු වේ. විශේෂයෙන් රනිල ශාකවල ශාරීරයට හිතකර පෝෂ්‍ය පදාර්ථ රැසකින් අනූන වීමෙන් ගොවියාගේ කුටුම්බයේ ආහාර සුරක්ෂිතභාවයක් හට ගනු ලැබේ. තව ද ගොවියාට ඊළඟ කන්නය වන මහා කන්නයට පොහොර භාවිතය අවම වන බැවින් පොහොර සඳහා දරන පිරිවැය යම්තාක් දුරට අවම කර හැකි ය. එසේ ම පොහොර කාර්යක්ෂමතාව ඉහළ යෑම තුළින් මහ කන්නයේ භෝග අස්වැන්නේ ඉහළ යෑමක් සිදු වේ. මෙවැනි විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් මැද කන්නයේ අතිරේක භෝග වගාව මඟින් ලැබේ. මේවැනි පසුබිම නිෂ්පාදක ආර්ථික සුභසාධනයට අතරමැදි කන්නයේ බලපෑම අධ්‍යයනය කිරීමේ අරමුණ හා අතරමැදි කන්නයේ බෝග වගා කරන සහ නොකරන ගොවීන්ගේ සමාජ ආර්ථික පසුබිම, අතරමැදි කන්නයේ භෝග වගාවේ ප්‍රතිලාභ තීරණයට හා අතරමැදි කන්නයේ බෝග වගාවේ සීමාවන් හඳුනා ගැනීමත් මෙහි සෙසු අරමුණු වේ. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසටය් ග්‍රාම නිලධාරී වසම් 30ක් අයත් වන අතර එම වසම් පහසු නියැදීමෙන් තෝරා, එම තෝරා ගත් වසමේ සමස්ත වී නිෂ්පාදන ගොවියන් අතුරින්, පහසු නියැදීමෙන් නියදිය සඳහා වී වගා කරන ගොවියන් අතුරින් සමස්ත සංගහනය නියෝජනය වන පරිදි ගොවියන් 30කගේ නියැදියෙන් දත්ත රැස්කිරීමට සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගෙන, දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අදායම් වියදම් ඇස්තමේන්තු තුළින්, ඇස්තමේන්තුවෙන් අතරමැදි කන්න වගාවෙන් මාසික ආදායම රු. 16461.11ක් වන බවත් යල හා මහ කන්න දෙක ම වගා කිරීමෙන් මාසික ව ලැබෙන ආදායම වනුයේ රු. 7166.67 බවත්. (නියැදි සමීක්ෂණයට අනුව) ඒ තුළින් යල හා මහ කන්න දෙකෙහි ම ලාභයට වඩා වැඩි ලාභයක් අතරමැදි කන්න වගා කිරීමෙන් ලැබෙන බව හා දෙවන විශ්ලේෂණය වූ ප්‍රතිපාදන විශ්ලේශනය තුළින් ස්වායත්ත විචල්‍ය වන වියදම එක් ඒකයකින් ඉහළ යන විට පරායත්ත විචල්‍ය වන ආදායම 0.758කින් වැඩි වන බව, ස්වායත්ත විචල්‍ය වන වියදම එක් ඒකයකින් ඉහළ යන විට පරායත්ත විචල්‍ය වන ආදායම 1.750කින් වැඩි වන බව හා මේ අනුව වියදම් වැඩි කිරීමට සාපේක්ෂ ව වැඩි වේගයකින් ආදායම වැඩි වනුයේ අතරමැදි කන්නයේ බව නිගමනය විය. යුගල t පරීක්ෂාවෙන් අතරමැදි කන්නයට පෙර ආදායමේ මධ්‍යනය 86000 (SD63141.876) , අතරමැදි කන්නයත් සමඟ පසු ආදායමෙහි සාමන්‍ය 283533.33 (SD75892.612) වේ. එයින් පෙන්නුම් කරන්නේ අතරමැදි කන්නයත් සමඟ ගොවියාගේ ආදායම සැලකිය යුතු වර්ධනයක් සිදු ව ඇති බව සංඛ්‍යාත්මක ව නිගමනය කළ හැකි බවයි. අවසාන වසයෙන් අතරමැදි කන්න වගාව ප්‍රවර්ධනයට, අතරමැදි කන්නය සඳහා ගොවියාට ලැබෙන රාජ්‍ය අනුග්‍රහය වැඩි කිරීම, මූල්‍ය ආයතන මගින් එම ගොවියන්ට ලබා දෙන සහයෝගය වැඩි කිරීමට රාජ්‍ය උපදෙස් ලබා දීම, ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඔවුන් දිරිමත් කිරීම හා අවශ්‍ය උපදේශන සේවා සැපයීම යන නිර්දේශ ද ඉදිරිපත් කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ආර්ථික සුභසාධනය, අතරමැදි කන්නය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. virajimadushika1@gmail.com

# විද්‍යුත් බැංකුකරණයට ග්‍රාමීය ජනතාවගේ අවධානය යොමුවීම අවම වීම කෙරෙහි බලපාන සමාජ-ආර්ථික සාධක

උඹව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේහි හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙළුව වසමෙහි බැංකු ගනුදෙනුකරුවන් ආශ්‍රිත ව

*අයි. ඒ. පී .කුමාරි*[1]

වර්තමාන ලෝකය තාක්ෂණය මත පදනම් වූ තරගකාරී ලෝකයකි. මේ නිසා මිනිසුන්ගේ ජීවන තත්ත්වය පවා පෙර පැවති තත්ත්වයට වඩා මහත් සේ වෙනස් ය. මෙම තාක්ෂණයේ දියුණුවත් සමඟ කරළියට පැමිණි ගෝලීයකරණය යන සංකල්පය යටතේ ඉදිරිපත් වන විද්‍යුත් බැංකුකරණය යන සංකල්පය වර්තමානය වන විට ලෝකයේ රටවල් බොහෝමයක් වැලඳගත් සංකල්පයකි. මෙම සංකල්පය ලෝකයට සාපේක්ෂ ව ලංකාවේ ප්‍රචලිතවීමේ තත්ත්වය තවමත් දුර්වල මට්ටමක පවතී. එනම් මෙය නාගරික ජනතාව අතර හා ග්‍රාමීය ජනතාව අතර පැතිර යාම ගත් විට ග්‍රාමීය ජනයා විද්‍යුත් බැංකුකරණය කෙරෙහි අවම මුසු වීමක් දක්වන බවක් පෙනී යයි. එම නිසා ග්‍රාමීය ජනතාවගේ අවධානය යොමුවීම අවම වීම කෙරෙහි බලපාන සමාජ - ආර්ථික සාධක ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන බැංකු අතරින් විද්‍යුත් බැංකුකරණය පාරිභෝගිකයන් සම්මත කර ගැනීමට බලපාන සාධක සොයා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලිය භාවිත කරන ලදි. මෙම පර්යේෂණයේ නියැදිය ලෙස, උඹව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේහි හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නෙළුව වසමෙහි සිටින ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන ප්‍රධාන බැංකු තුනේ ගණුදෙනුකරුවෝ 160 දෙනෙක් තෝරා ගනු ලැබූහ. මෙම පරීක්ෂණය සඳහා ද්විතීයක දත්ත ද භාවිත වේ. ලංකා බැංකුව, මහජන බැංකුව හා සම්පත් බැංකුව යන බැංකු අතර ප්‍රකාශිත දත්ත, අන්තර්ජාල මූලාශ්‍රය විටෙක දත්ත ක්‍රමය ලෙස භාවිත කරන ලදි. පාරිභෝගිකයාගේ ආකල්ප බලපෑම විද්‍යුත් බැංකුකරණය අනුගමනයට ඇති ධන බලපෑම, තාක්ෂණික අවබෝධය පිළිබඳ ධනාත්මක බලපෑම, සංජානනය හැසිරීම් කෙරෙහි ඇති ධනාත්මක බලපෑම, පාරිභෝගිකයාගේ අධ්‍යාපනික මට්ටම කෙරෙහි ඇති ධන බැලපෑම යන විචල්‍යයන් මෙහි දී භාවිත කර තිබේ. විද්‍යුත් බැංකුරණය පාරිභෝගිකයන් විසින් සම්මත කර ගැනීමට බලපාන සාධකවල බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනය බහු ප්‍රතිගාමී විශ්ලේෂණයක් භාවිත විණි. මෙම පරීක්ෂණයේ විශ්ලේෂණ මෙවලම් ලෙස SPSS මෘදුකාංගය භාවිත කර තිබේ. ප්‍රතිගාමී විශ්ලේෂණයට අනුව අධ්‍යයනයෙන් හෙළි වන්නේ, පාරිභෝගිකයාගේ ආකල්ප, විෂය සම්මතයන් සහ සංජානනීය හැසිරීම් විද්‍යුත් බැංකුකරණය භාවිතයට ධනාත්මක ලෙස බලපාන බවයි. නිර්දේශය වන්නේ බැංකුව ඔවුන්ගේ අලෙවිකරණ වැඩසටහන හරහා විද්‍යුත් බැංකුකරණය භාවිත කිරීමට පවතින බිය නැති කිරීමට, සේවාව ලබාගන්නා අතරතුර දී යම් කිසි ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදු වේ දැයි පවතින බිය නැති කිරීම, සාම්ප්‍රදායික ව හුරු වී සිටි බැංකුකරණ සම්ප්‍රදායෙන් වෙන් වීමට ඇති අකමැත්ත නැති කරවීම, ගිණුමෙහි ස්වභාවය අනුව ලබා ගත හැකි මුදල සීමා කර තිබීම නිසා අවශ්‍යතා සපුරා ගැනීමට බාධාව නැති කිරීමට අවශ්‍ය පියවර ගැනීම යන කරුණු ආමන්ත්‍රණය කළ යුතු බවයි. බැංකුව ඔවුන්ගේ විද්‍යුත් බැංකුකරණ වෙළෙඳපොළ අවකාශය වැඩි කරනු ඇති අතර ජනතාවට විද්‍යුත් බැංකු නිෂ්පාදන පරිභෝජනය කිරීමට ද හැකියාව ලැබේ.

***ප්‍රමුඛ පද:*** අන්තර්ජාල බැංකුකරණය, ගණුදෙනුකරුවෝ, ග්‍රාමීය ජනතාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යන අංශය , සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Education & Learning



**FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES**
**RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE**

# THE IMPACT OF CELL PHONE USAGE ON THE EDUCATION OF SCHOOL CHILDREN (PARTICULARLY FOCUSING ON THE COLOMBO DISTRICT)

*N.W.M.K.T. Kavinda*[1]

This research study investigates the impact of cell phone usage on the education of school children in the Colombo District, Sri Lanka, employing a qualitative research approach. Data were collected from two Colombo-based schools, with a sample comprising 15 students, 15 teachers, and 15 parents. In this urban and developed region, cell phones have become prevalent among students, particularly outside the classroom setting, with potential implications for their academic performance and learning outcomes. Through qualitative methods, including focus group discussions with students, teachers, and parents, this research aims to comprehensively understand the experiences, perspectives, and concerns surrounding cell phone usage for educational purposes. Most students use cell phones for both educational and daily activities outside of school, prompting concerns about responsible usage and potential misuse among teachers and parents. Teachers, constrained by school policies that discourage cell phone use in class, stress responsible off-hours usage to limit distractions, while parents worry about the financial burdens of phone use. Data analysis primarily relies on thematic analysis of qualitative data from focus group discussions, extracting insights from participants' narratives and perceptions. The findings emphasize the necessity of policies, parental guidance, and strategies to maximize cell phones' positive educational impact beyond classrooms. This involves establishing responsible usage guidelines, offering parental support, and achieving a balance with academic responsibilities. By addressing these recommendations, the educational landscape can effectively harness the benefits of cell phones while mitigating potential drawbacks. This research contributes to the existing knowledge on cell phone usage in education, specifically focusing on the Colombo District, and offers valuable insights for policymakers, educators, and parents to make informed decisions. Ultimately, the study aims to enhance educational practices, promote positive learning experiences, and ensure the optimal integration of cell phones in educational settings, considering the limitations within the classroom context.

***Keywords:*** Cell phone usage, Education, Impact, School children

[1] University of Kelaniya. tharindunanayakkarawasam@gmail.com

# TO PREPARE AND UNDER SIXTEEN MALE VOLLEYBALL TEAM USING SPORT EDUCATION MODEL

*J.T.P.M. Dharmasena*[1]

The purpose of this study was to develop basic skills in volleyball by using Sport Education Model among selected male players. The pretest and posttest are applied to the one group and the comparison between pre experimental designs with above tested groups are evaluated in this research. Only the treatment group is utilized to the model and control group is excluded. The sample was taken from population at the students of under sixteen male volleyball players in Random sampling technique. Twelve (n=12) male volleyball players were the sample size for this research. Under the major research questions that researcher concerned to design the activities /drills which are used to develop the participant's skills level. The necessary guidance for research and conducting pre-test & post-test were collected from Web sites, Journals, books, observation. The yield data were analyzed by using descriptive statistic and represent by using charts, mini tabs data and also discuss comparing with the mean value. The researcher investigated that there is a positive effect for the skills performance of under sixteen male volleyball players with using ten week training schedule. The performance evaluation tests showed statistically significant differences between the pre-test results and post-test results ($P < 0.05$). So, the null hypothesis rejected and alternative hypothesis accepted. Furthermore, accepting and witnessing the built hypothesis of researcher and the final analyzed data indicated the implemented action plan helps to answer the research questions.

***Keywords:*** Sport Education Model, volleyball, skill, drill, players

[1] Sabaragamuwa University of Sri Lanka, Belihuloya. thilina890213@gmail.com

# නව යොවුන් වියේ සුරක්ෂිතභාවය උදෙසා ලිංගික අධ්‍යාපනයෙහි පවතින උපයෝගීතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්. ඒ. ඩී. එස්. එම්. ගුණසේකර*[1]

ලිංගිකත්වය නව යොවුන් විය සංජානනය කරයි. නව යොවුන් විය යනු ළමා විය හා වැඩිහිටි විය අතර පවතින සංක්‍රාන්තික අවධියක් නොහොත් පරිවර්තනීය අවධියකි (Transition Period). මෙම අවධියේ දී සීඝ්‍ර මානසික මෙන් ම ශාරීරික හා ලිංගික සංවර්ධනයක් දක්නට ලැබේ. වැඩිවියට පත්වීමත් සමඟ ම ප්‍රාථමික හා ද්විතීයක ලිංගික ලක්ෂණ වඩාත් කැපී පෙනෙයි. 20 වන සියවස අග භාගය පමණ වන විට ජනමාධ්‍ය මඟින් භාවිත අවිධිමත් ලිංගික කරුණු පිළිබඳ යෞවනෝදය තුළ කුතුහලය බෙහෙවින් තියුණු වන අවධියක එහි ඌනතාවන් දක්නට විය. විශේෂයෙන් ම 1960 ගණන්වලින් පසු ව බටහිර රටවල ව්‍යාප්ත වූ නව යොවුන් ගැබ් ගැනීම් තුළින් මෙම ඌනතාව වඩාත් තීව්‍ර වූ අතර පසු ව පාසල් පාදක ලිංගික අධ්‍යාපනයෙහි අවශ්‍යතාව විද්‍යමාන විය. ශ්‍රී ලංකාවෙහි තරුණ ජනගහනය මිලියන 4.4 පමණ වන නමුත් ඉන් හරි අඩකට පමණ විධිමත් ලිංගික අධ්‍යාපනයක් නොමැත. 2012 වර්ෂයෙහි ගූගල් (google) සෙවුම් යන්ත්‍රය තුළ Sexuality (ලිංගිකත්වය) යන වචනය වැඩි ම ප්‍රමාණයක් සොයා බැලීම් කර ඇති රටවල් අතර ශ්‍රී ලංකාව ප්‍රමුඛස්ථානයට පත් වූයේ ලිංගික අධ්‍යාපනයෙහි පවතින ඌනතාව හේතුවෙනි. කෙසේ නමුත් ළමා ලිංගික අපයෝජන, අපචාර මෙන් ම දූෂණයන් ද සිදු වීම දැකිය හැකි අතර එය ගෝලීය අර්බුදයක් දක්වා විකාසනය වී ඇත. නව යොවුන් වියේ සුරක්ෂිතභාවය උදෙසා ලිංගික අධ්‍යාපනයෙහි පවතින උපයෝගීතාව කෙබඳු වේ ද යන පර්යේෂණ ගැටලුව පාදක ව ලිංගික අධ්‍යාපනයෙහි නව යොවුන් වියේ සුරක්ෂිතභාවය උදෙසා පවතින උපයෝගීතාව පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් සසම්භාවී නියැදි ක්‍රමය යටතේ මිශ්‍ර පර්යේෂණ ක්‍රමය තුළින් පර්යේෂණයට අදාළ අභ්‍යුපගමනයන් විග්‍රහ කර ඇත. මෙහි දී ගුණාත්මක දත්ත අධ්‍යයනයේ දී සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමයත්, ප්‍රමාණාත්මක දත්ත අධ්‍යයනයේ දී ප්‍රශ්නාවලී ක්‍රමයත් යොදා ගනිමින් පුද්ගලයන් 100 කින් යුතු නියැදියක් පර්යේෂණයට භාජනය කරන ලදි. ලංකාවේ ළමා අපයෝජන, අපරාධ, ස්ත්‍රී දූෂණ වැඩි වීමට බලපාන ප්‍රධානතම හේතුව විධිමත් ලිංගික අධ්‍යාපනයක් නොමැතිකමත්, විධිමත් ලෙස ලිංගික අධ්‍යාපනය ලබා දීම තුළින් ලිංගික අපයෝජන, අපරාධ, ස්ත්‍රී දූෂණ අඩු වන බවත්, දරුවන් ලිංගික ක්‍රියාවලට පෙලඹීමේ ප්‍රවණතාව අඩු වන බවත් පර්යේෂණ ප්‍රතිඵල තුළින් අනාවරණය වන අතර නව යොවුන් වියේ සුරක්ෂිතභාවය උදෙසා ලිංගික අධ්‍යාපනය උපයෝගී වන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ලිංගික, නව යෞවන, අපයෝජන, සුරක්ෂිතභාවය, අධ්‍යාපන

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, Shiwanthikamadhushani6@gmail.com

# පාසල් ගුරුවරුන්ගේ ක්ලමථ මට්ටම පිළිබඳ අධ්‍යයනය.

*ඩී. එච්. ධර්මසේන*[1]

පාසල් සංවිධානය තුළ ඉතා සුවිශේෂී භූමිකාවක් ලෙස 'ගුරුවරයා' පෙන්වා දිය හැකි ය. ගුරුවරයා යනු වඩාත් ඵලදායි අයුරින් අනාගතයට යහපත් පුද්ගලයකු දායාද කිරීම සඳහා ශිෂ්‍යයා මෙහෙයවන්නා වූ තැනැත්තා ය. අධ්‍යාපන පද්ධතියේ වැදගත් ම ඒකකය වන පාසල තුළ දරුවෙක් සිය ජීවිතයේ තීරණාත්මක කාලයක් ගත කරයි. එහි දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරුන් මුහුණ පාන්නා වූ ක්ලමථය අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ සාකච්ඡා කිරීමේ දී විශේෂ අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍රයකි. මෙසේ සමාජ සංවර්ධනය සඳහා මූලික වන වෘත්තියක් වන ගුරු වෘත්තිය තුළ සැලකිය යුතු ගුරුවරු ප්‍රමාණයක් ක්ලමථ තත්ත්වයෙන් පීඩාවට පත් වෙති. මෙම පර්යේෂණය මඟින් පාසල් ගුරුවරුන් අත්විඳින ක්ලමථයෙහි මට්ටම්, එහි මූලාශ්‍රය ගවේෂණය කිරීම සිදු කෙරිණි. මෙහි දී මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද රජයේ පාසල් 3ක් ආශ්‍රයෙන් එක් පාසලකින් ගුරුවරුන් 20 බැගින් ගුරුවරුන් 60ක් සරල සසම්භාවී ක්‍රමය යටතේ නියැදිය වසයෙන් තෝරා ගෙන අධ්‍යයනය සිදු කෙරිණි. සමීක්ෂණ මෙවලම යටතේ ප්‍රශ්නාවලියක් භාවිත කරමින් ප්‍රාථමික දත්ත එක් රැස් කරන ලදී. මෙම අධ්‍යයනය මඟින් පාසල් තුළ විෂය මාලාවට සිසුන්ගේ ප්‍රේරණය නොමැති වීම, ඉගැන්වීම අතරතුර සිසුන්ගේ හැසිරීම සහ පන්ති කාමරයේ විනය පවත්වා ගැනීම සම්බන්ධ ව යන අවස්ථාවල දී ගුරුවරුන් වැඩි වසයෙන් ඉහළ ක්ලමථ මට්ටමක සිටින බව තහවුරු විය. එමෙන් ම වැඩි වසයෙන් මෙම තත්ත්වයට මුහුණ පා ඇත්තේ ගුරුවරියන් වීම ද විශේෂත්වයකි. මේ සම්බන්ධ ව පර්යේෂණ සිදු කරන ඕනෑ ම පර්යේෂකයෙකුට මෙම පර්යේෂණය අධ්‍යයනය කළ හැකි අතර, විශේෂයෙන් ම පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා මෙම අධ්‍යයන ප්‍රතිඵල උපයෝගී කරගත හැකි ය. හඳුනාගත් ඉහළ ක්ලමථ මට්ටම් සහිත ගුරුවරුන් සඳහා සාර්ථක උපදේශන වැඩසටහන් සංවිධානය කිරීමට හැකියාවක් ඇත.

***ප්‍රමුඛ පද:*** ක්ලමථ මට්ටම, ගුරු වෘත්තිය, ඉගෙනුම් ඵලදායිතාව.

[1] කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව, දළුගම. dilshaniharshika26@gmail.com

# පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක් - හම්බන්තොට අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින්

*එච්. ටී. වී. එම්. ආරියරත්න*[1]

දෙමව්පියන් විසින් මෙලොවට දයාද කරන දරුවා දාර්ශනිකයෙකු, උගතෙකු, බුද්ධිමතෙකු මෙන් ම සමාජයට වටිනා සම්පතක් බවට පත් කරන්නේ පාසල තුළින් වන අතර එහි දී ගුරුවරයාගේ දායකත්වය අතිශය වැදගත් වේ. එවැනි සුවිශේෂ කර්තව්‍යයක් සිදු කරන ගුරුවරයා ගුරුවරයෙකු ලෙස තෘප්තිමත් ව තම රැකියාවේ නිරත වන්නේ ද යන්න මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ගුරුවරයා යනු පාසල් පද්ධතියේ පවතින මානව ප්‍රාග්ධනය වන බැවින් ඔවුන් කළමනාකරණ කිරීම බෙහෙවින් වැදගත් ය. ගුරුතෘප්තිය කෙරහි බලපාන සාධක සොයා බැලීම මෙම අධ්‍යයනයේ පසුබිම වේ. මේ ඔස්සේ ග්‍රාමීය පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ සේවාව සඳහා දරන ආකල්පය තුළ රැකියා තෘප්තිය, අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර තෘප්තියට බලපාන සාධක, ගුරුවරයා මුහුණපාන සමාජ - ආර්ථික ගැටලු හා ගුරු තෘප්තිය වර්ධනය කිරීමේ මාර්ග සොයා බැලීමක් මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කෙරෙයි. මෙම අධ්‍යනයට මිශ්‍ර පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදී. ඒ අනුව දකුණු පළාතට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධ්‍යාපන කොට්ඨාසයට අයත් ගුරවරුන් හා විදුහල්පතිවරුන් ඇතුලු 60 දෙනෙකුගේ නියැදියක් භාවිත කරන ලදී. දත්ත එක්රැස් කිරීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නාවලී ක්‍රමය (Google form) යොදා ගෙන දත්ත විශ්ලේෂණයට බහුගුණ ප්‍රතිපායන අකෘතිය මෙන් ම ගුරු තෘප්තිය පරායත්ත විචල්‍ය ලෙස යොදා ගනිමින් වැටුප, පාසල්වල පවතින යටිතල පහසුකම්, විදුහල්පතිගේ කළමනාකාරීත්වය, සහෝදර ගුරුභවතුන් අතර බවතින සබඳතාව, සමාජ පිළිගැනීම, පන්ති කාමරයේ පවතින පහසුකම් හා උගන්වනු ලබන විෂය යනාදිය ස්වායත්ත විචල්‍යන් ලෙස යොදගනිමින් දත්ත විශ්ලේෂණය කර ඇති සහසම්බන්ධතා අකෘතියට අනුව නිර්ණන සංගුණකය 0.589ක් වේ. ඒ අනුව ස්වායත්ත විචල්‍යය හා පරායත්ත විචල්‍යය අතර ධන සම්බන්ධතාවක් ඇත. වර්තමාන පවතින තත්ත්වයන් යටතේ ගුරුවරයෙකු ලෙස මෙම වෘතීයේ ම නිරත වීමට 87%ක් කැමැත්ත පළ කර ඇත. ඉතුරු 13% ම වෙනත් රැකියාවක් ලැබුණ හොත් යෑමට කැමත්තක් දක්වති. මෙම 13% තුළ සිටින ගුරුවරුන් බොහෝ දෙනෙක් තරුණ වයසේ පසුවෙති. තෘප්තිමත් ගුරුවරුන් 71.7%ක් ද, තරමෙක් තෘප්තිමත් ගුරුවරුන් 25%ක්ද, තරමක් අතෘප්තිමත් ගුරුවරුන් 3.3%ක් ද පවති. මෙහි දී සමස්ත නියැදියෙන් අතෘප්තිමත් ගුරුවරුන් දක්නට නොමැත. ඒ අනුව සමස්තයක් වසයෙන් ගුරුවරුන් ගුරුවරයෙකු ලෙස තෘප්තිමත් ව සිටී. ගුරුවරුන් ග්‍රාමීය පාසල්වල ඉගැන්වීම් කටයුතු කිරීමට කැමත්තක් දක්වයි. එම පාසල්වලින් ගුරුවරයාට ලැබෙන සමාජ පිළිගැනීම හා ආදරය බොහෝ වැඩි බව ඔවුන්ගේ අදහස්වලින් පෙනී යයි. විශ්‍රාම යෑමට ආසන්න ගුරුවරුන් බොහෝමයක් තම රැකියා ජිවිතය ගැන සතුටුදායක මට්ටමක රැඳී සිටිති. යෝජනා ලෙස, සිසුන්ට හා ගුරුවරුන්ට තෘප්තිමත් විය හැකි පරිදි අධ්‍යපනික පහසුකම් සලසා දිය යුතුයි. ජාතික ආර්ථිකයට අනාගත තරුණයන් දායකත්වය දිය හැකි ආකාරයට අධ්‍යාපනය වෙනස් විය යුතුයි. රැකියා වෙළඳපොළ සඳහා ඉලක්කගත අධ්‍යාපනයක් අවශ්‍යයි. අනවශ්‍ය ලෙස විවිධ පෝරම් පිරවීම හා ලේඛන කටයුතුවලින් පීඩාවට පත් නො කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ගුරුවරයාට රජයෙන් මීට වඩා අනුග්‍රහය ලබාදිය යුතුයි.

***ප්‍රමුඛ පද:*** ගුරු තෘප්තිය , ගුරු තෘප්තියට බලපාන සාධක

---

[1] අධ්‍යාපනවේදී අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. virajimadushika1@gmail.com

# පිරිවෙන් ගුරුවරයාගේ රැකියා තෘප්තිමත්භාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්. එස්. චතුරානි.*[1]

ගුරුවරයා යනු දරුවන් නිවැරදි මාර්ගයට යොමු කරවන දැවැන්ත බලවේගයකි. ගුරුවරයාගේ කායික මෙන් ම මානසික ව පවතින යහපත් තත්ත්වයන් මත ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙය බලපායි. තෘප්තිමත් ව යහපත් මානසිකත්වයෙන් ඉගෙනීමේ කටයුතුවල නිරත වන ගුරුවරයා තම දරුවන්ට සෑම විට ම යහපත් නිවැරදි දැනුම ඉතා ඕනෑකමින් ලබා දෙයි. මානව සම්පත තෘප්තිමත් කිරීම අසීරු කාර්යයක් වුව ද ඔවුන්ට ඉගැන්වීමට සුදුසු පරිසරය හා අවශ්‍ය අනෙකුත් සාධකයන් නිවැරදි ව ලබා දීම ගුරුවරයාගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීමට හේතු වේ. තෘප්තිමත්භාවයක් නොමැති වූ විට තම කාර්යය සාර්ථක ව ඉටු නොකරන අතර ම අදාළ ආයතනයේ රැඳී සිටීම පවා ප්‍රතික්ෂේප කරන අතර, නිතර නිතර ගැටුම් ඇති කර ගැනීමට පවා පෙලඹේ. වර්තමාන පිරිවෙන් තත්ත්වය තුළ පෙරට සාපේක්ෂ ව යම් පසුබෑම් ස්වභාවයක් පවතින බව දැකගත හැකි අතර ගුරුවරුන්ගේ පිරිවෙන් මාරු කිරීම, සේවයෙන් ඉවත් වීම වැනි අවස්ථා විශාල වසයෙන් නිරීක්ෂණය වේ. මෙකී තත්ත්වය මත පිරිවෙන්වල රැකියාවෙහි යෙදෙන ගුරුවරුන්ගේ තෘප්තිමත්භාවය කෙසේ ද යන්න සෙවීම පර්යේෂණ ගැටලුව වේ. ඒ පිළිබඳ විමසා බලා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රධාන අරමුණ වේ. වර්තමාන පිරිවෙන් ගුරුවරයාගේ රැකියා තෘප්තිය විමසීම හා ඒ සඳහා හේතු වන සාධක විමර්ශනය පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වේ. මේ සඳහා ඩින්හැම් හා ස්කොට් දෙදෙනා (1998) විසින් ඉදිරිපත් කර ඇති තෘප්තිමත් බව මැනීමේ ත්‍රිත්ව සාධක න්‍යාය න්‍යායාත්මක පදනමෙහි ලා ගෙන පර්යේෂණය සිදු කරන ලදී. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයේ 'අභිසාරී සමගාමී පිරිසැලසුම' පර්යේෂණයට යොදා ගන්නා ලදී. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කරන ලද අතර ප්‍රතිශත, ප්‍රස්තාර, වගු, සංඛ්‍යා ආශ්‍රයෙන් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය ද විස්තරාත්මක විශ්ලේෂණය හා තේමා විශ්ලේෂණයෙන් ගුණාත්මක දත්ත විශ්ලේෂණය ද සිදු කරන ලදී . ඒ අනුව පැවිදි ගුරුවරු 10ක්ද ගිහි ගුරුවරු 10ක්ද ලෙස ගුරුවරුන් 20ක් අහඹු නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද අතර එම ගුරුවරුන්හට මාර්ගගත ක්‍රමයට ප්‍රශ්නාවලියක් ලබා දෙමින් අදාළ දත්ත රැස් කර ගන්නා ලදී. පර්යේෂණ ප්‍රතිඵල ලෙස පිරිවෙන් ගුරුවරුන්ගේ තෘප්තිමත් බව 35%ක් වැනි ඉතාමත් පහළ මට්ටමක පවතින බව අනාවරණය කරගත හැකි විය. ගිහි පැවිදි හා සේවා කාලය මත බෙදීමකින් තොර ව ගුරු තෘප්තිය අඩු මට්ටමක පවතින බවත්, මධ්‍යස්ථ තෘප්තිමත් බවක් ඇති කරන සාධක ලෙස කාර්ය මණ්ඩල සහයෝගිතාව, පරිවේණාධිපති නායකත්ව භූමිකා සංවර්ධනය, පහසුකම් ප්‍රමාණය ද අනාවරණය විය. අතෘප්තිකර සාධක ලෙස ශිෂ්‍ය සාධන මට්ටම දුර්වල වීම, වෘත්තීය සංවර්ධන අවස්ථා අඩු වීම, රැකියාවේ අවිනිශ්චිත බව, සමාජ පිළිගැනීමක් නොමැති වීම හා දේශපාලන මැදිහත් වීම ආදිය දැක්විය හැකි ය. ඒ අනුව බහුතර ගුරුවරුන් පිරිසක් පිරිවෙන්වල ඉතා අවම තෘප්තියකින් යුතු ව කටයුතු කරන බවත් ඒ සඳහා බලපාන සාධක ද බහුල ව පවතින බවත් අනාවරණය කරගත හැකි විය. තෘප්තිය අඩු වීමට හේතු මෙන් ම මධ්‍යස්ථ තෘප්තිමත්භාවයෙන් හා අතෘප්තිමත් ස්වභාවයෙන් සිටින ගුරුවරයා ලෙස කාණ්ඩ තුනක් හඳුනාගත හැකි විය. ඒ සඳහා බලධාරීන් හා ගුරුවරුන් ඇතුළු සියලු නිලධාරීන් සාධාරණ හා විනිවිද බවකින් යුතු ව පත් කිරීම, පිරිවෙන් නිලධාරීන් පත් කිරීම් සඳහා දේශපාලන මැදිහත් වීම ඉවත් කිරීම, පිරිවෙන් ගුරුවරුන්ට ස්ථාන මාරු ක්‍රමයක් සැකසීම, අවශ්‍ය පහසුකම් පිරිවෙන්වලට ලබා දීම, රැකියා අවිනිශ්චිත බව ඉවත් කිරීම, පරිවේණාධිපතිවරුන්ට හා ගුරුවරුන්ට පුහුණු පාඨමාලා පැවැත්වීම ආදිය ගුරු තෘප්තිය වර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ගුරුවරයා, පිරිවෙන, තෘප්තිමත් රැකියා නියුක්තිය, පිරිවෙන් අධ්‍යාපනය, වෘත්තිය තෘප්තිමත් බව

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ mjsudarshichathurani@gmail.com

# ශ්‍රී ලංකාවේ වත්මන් පාසල් අධ්‍යාපන ක්‍රමයේ පවතින සමාජීය ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් නූතන සිංහල කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙන්)

*ඩබ්.ආර්.ඒ ඉසුර උදයංගන*[1]

විධිමත් හා අවිධිමත් යන්නෙන් වූ අධ්‍යාපනය පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලිය සිදු කරයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අධ්‍යාපනික කටයුතු සිදු වූ බවට පුරාවිද්‍යාත්මක සාධක සාක්ෂ්‍ය ඇත. සී. ඩබ්. ඩබ් කන්නන්ගර මහතා ඉදිරිපත් කළ 1945 අංක 21 දරන නිදහස් අධ්‍යාපන පනතත් සමඟ ශ්‍රී ලංකාවේ සෑම අයෙකු සඳහා ම නිදහස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව හිමි විය. යුග ගණනාවක් ඔස්සේ ඒකාකාරී ව ගලාගෙන ආ කවිය අද්‍යතන යුගයේ දී වෙනස්කම් රාශියකට භාජනය කරමින් මනා ව්‍යුත්පත්තියකින් යුතු වූ නූතන කවියා, එක් කාව්‍ය වස්තු විෂයකට පමණක් සීමා නො වී තම අනුභූතීන් පුළුල් ව සමාජයට විශද කිරීමට නව්‍ය කාව්‍ය ප්‍රස්තුතයන් උපයුක්ත කොට ගන්නා ලදී. එලෙස, අද්‍යතන සිංහල කවියා දක්ෂ ලෙස තම කාව්‍ය වස්තු විෂයන්ට වත්මන් ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රමයේ පවතින සමාජීය ගැටලු උපයුක්ත කර ගැනීමට උත්සුක විය. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් පැවතිය ද එහි පවත්නා සමාජීය ගැටලු පෙන්වා දෙමින් එයින් ළමා පරපුරට වන දැඩි බලපෑම අනාවරණය කිරීමයි. නූතන කවියා අධ්‍යාපනය කාව්‍යට වස්තුවිෂය කර ගත්තේ ඇයි, නූතන පාසල් අධ්‍යාපන ක්‍රමයෙහි කවියා විශද කරන ගැටලු මොනවාද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි. වර්ෂ 2010 - 2022 අතර කාලයේ ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනයේ විෂමතා වස්තු විෂය කර ගනිමින් විරචිත අද්‍යතන සිංහල කාව්‍යයන් කිහිපයක් පමණක් ඇසුරු කිරීම මෙහි පර්යේෂණ සීමාවයි. මෙම පර්යේෂණය පුස්තකාල හා අන්තර්ජාල මූලාශ්‍රය ඔස්සේ ලබා ගත් ද්විතීයක දත්ත පාදක කර ගනිමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයට අනුකූල ව සිදු කරන ලදී. අතීතයේ සිට පැවත එන්නා වූ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වර්තමාන පාසල් අධ්‍යාපනයට සිදු කරන ලද බලපෑම මෙහි දී පැහැදිලි විය. පර්යේෂණයේ ප්‍රතිඵල වසයෙන් නිදහස් අධ්‍යාපනය වුවත් අද වන විට ඍණාත්මක වෙනස්කම්වලට භාජනය වී විභාග ක්‍රමයේ පවතින දැඩි අකාර්යක්ෂම බව නිසා තරඟකාරී අධ්‍යාපන රටාවක් නිර්මාණය වී ඇති බව පැහැදිලි විය. පවතින පාසල් අධ්‍යාපන ක්‍රමය ළමුන් සතු කුසලතා යටපත් කරමින් ස්වාර්ථය හඹා යන මනුෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය කරන බව දෘශ්‍යමාන විය. අද්‍යතන සිංහල කවියා ස්වකීය කාව්‍ය නිර්මාණ ඔස්සේ පාසල් අධ්‍යාපන රටාවේ දුර්වලතාවක් ලෙස සැලසුම් සහගත අධ්‍යාපන ප්‍රතිපත්තියක් නොමැති වීම පෙන්වා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පවතින සමස්ත අධ්‍යාපන ක්‍රමවේදයේ විධිමත් වූ ප්‍රතිපත්තිමය වෙනසක් සිදු විය යුතු බව මෙම අධ්‍යයනය මඟින් නිගමනය විය.

***ප්‍රමුඛ පදඃ*** අද්‍යතන සිංහල කවිය; නිදහස් අධ්‍යාපනය; පාසල් අධ්‍යාපනය; වස්තු විෂය; ළමා පරපුර

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය isururajapaksha30@gmail.com

# සමාජ පන්තිය විසින් ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි සිදු කරන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක විමර්ශනාත්මක අධ්‍යයනයක්

*බී. එම්. සී මධුසංඛ බණ්ඩාර*[1]

අධ්‍යාපනය යනු වියුක්ත සංකල්පයක් වන අතර එය පුද්ගලයා සතු දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමේ මූලික ක්‍රියාවලියක් ලෙස පෙන්වා දිය හැකි ය. අතීත මිනිස් ක්‍රියාකාරකම් සහ ජන සමාජය විසින් උකහා ගත් දැනුම සහ අත්දැකීම් දෙවන පරම්පරාව වෙත පවරා දීම අධ්‍යාපනය තුළින් මූලික වසයෙන් සිදු කෙරෙන අතර ග්‍රීක ජාතික සොක්‍රටීස් සඳහන් කළේ අධ්‍යාපනය යනු දැනුම ඒකරාශී කරන ක්‍රියාවලියක් ලෙසට ය. අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ සමාජ සංවර්ධනය මෙන් ම පුද්ගල සුභසිද්ධිය උදෙසා මූලික වසයෙන් මිනිසා පුහුණු කරවීම වේ. මේ අනුව මිනිස් සමාජය සමඟ අධ්‍යාපන පද්ධතිය මැනවින් බද්ධ වී තිබෙන බවක් හඳුනාගත හැකි ය. සමාජ පන්තියක් යනු සමාන තත්ත්වයන් සහිත පුද්ගලයන් කාණ්ඩගත වීමක් ලෙස හඳුනාගත හැකි ය. එම සමාජ කණ්ඩායම් හෙවත් සමාජ ස්තරවල අනුක්‍රමික පිළිවෙළ අනුව ඔවුන්ගේ ආර්ථික ශක්තිය පැවතිය හැකි ය. සමාජය තුළ පුද්ගල ක්‍රියාකාරීත්වය මුල් කොටගෙන නිර්මාණය වන ධනපති සහ නිර්ධන වසයෙන් සමාජය තුළ පන්ති ක්‍රමයක් හඳුනාගත හැකි අතර එවන් සමාජයක් තුළ සම අධ්‍යාපන අවස්ථා ලබා ගැනීම යම් ගැටලුකාරී තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය. ඒ අනුව ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතිය කෙරෙහි සමාජ පන්තිය විසින් සිදු කෙරෙන බලපෑම කවරාකාර ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූ අතර අධ්‍යාපනය පිළිබඳ ව හඳුනා ගැනීමත්, සමාජ පන්තිය යන්න පිළිබඳ ව හඳුනා ගැනීම සහ සමාජ පන්තිය ශ්‍රී ලාංකේය අධ්‍යාපන සංස්ථාව කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීම ආදිය මෙම පර්යේෂණය සිදු කිරීමේ මූලික අරමුණු විය. පර්යේෂණ ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයක මූලාශ්‍රයන් අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. ද්විතීයක මූලාශ්‍රය යටතේ පොත් පත්, පුවත්පත්, සඟරා සහ පුස්තකාල පරිහරණය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. සමාජ පන්තිය සෑම සමාජයක ම දක්නට ලැබෙන සෑම පුද්ගලයෙකු ම සාමාජිකත්වය දරන විවිධ කරුණු අනුව සංයෝජනය වූ ඒකකයක් ලෙස හඳුනාගත හැකි ය. ඒ අනුව යම් පුද්ගලයෙකු සතු රැකියාව, නිවසේ ස්වාභාවය, සාමාජිකත්වය දරන සමාජය, ආදායම සහ අධ්‍යාපන මට්ටම යන සාධකයන් පුද්ගලයෙකු අයත්වන සමාජ පන්තිය තීරණය කෙරෙන මූලික සාධකයන් ලෙස පෙන්වා දිය හැකි ය. එසේ ම පවුල් පරිසරය, ආදායම් මට්ටම සහ සමාජ ආකල්පයන් ද මෙම සමාජ පන්තිය නිර්ණය කෙරෙන මූලික සාධකයන් ලෙස ගත හැකි ය. ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රියාවලියෙහි ලා සමාජ පන්තිය විසින් සිදු කෙරෙන බලපෑම පිළිබඳ සාධක රැසක් පර්යේෂණ ප්‍රතිඵල තුළින් අනාවරණය විය. සමාජය තුළ ඉහළ පන්තිය නියෝජනය කරන දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන අතර පහළ පන්තික දරුවන් කෙරෙහි අවම සැලකිල්ලක් දක්වන නිසා අධ්‍යාපන සාධනයෙහි විවිධ විෂමතාවන් දැකගත හැකි ය. මධ්‍යම පන්තික දෙමාපියන් සමාජ සචලතාව නැති කිරීමේ උපක්‍රමයක් ලෙස අධ්‍යාපනය සලකන අතර පහළ පන්තික සමාජවල දෙමාපියෝ එවැනි දේ නො සලකති. එසේ ම ශ්‍රී ලාංකේය දරුවන්ගේ උසස් අධ්‍යාපන මට්ටම් කෙරෙහි ද සමාජ පන්තිය බලපෑම් කර තිබෙන බවත් විශ්වවිද්‍යාලය ප්‍රවේශවන්නන් වැඩි පිරිසක් මධ්‍යම පාංතික දරුවන් බව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනඥයින් විසින් සිදු කළ පර්යේෂණ තුළින් අනාවරණය විය. ඒ අනුව මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දී අවසන් වසයෙන් නිගමනය කළ හැක්කේ ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රියාවලිය කෙරෙහි සමාජ පන්තිය විසින් ප්‍රබල බලපෑමක් සිදු කරන බව ය.

***ප්‍රමුඛ පදඃ*** අධ්‍යාපනය, අධ්‍යාපන මට්ටම, ආර්ථික ශක්තිය, පරම්පරාව, සමාජ පන්තිය, රැකියාව

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madusankabandaranayaka42@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# English Language & Teaching




FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# A STUDY ON THE PATTERNS OF CODE-MIXING IN SRI LANKAN TELEVISION ADVERTISEMENTS: BASED ON SINHALA AND ENGLISH TELEVISION ADVERTISEMENTS

Mahrifa Faiz[1] Dilani Kaushika Dhananjaya[2] Namuni Palihakkara[3] H.M. Navoda Malsha[4]

Code-mixing is a common linguistic phenomenon observed in bilingual or multilingual contexts. It is commonly used in Sri Lanka by mixing Sinhala and English. This study aims to discover the most frequently used code-mixing pattern in Sri Lankan bilingual Television (TV) advertisements. Hence, the patterns in which code-mixing occurs in bilingual TV advertisements were examined. This study employed a qualitative approach. Accordingly, twenty Sri Lankan bilingual TV advertisements, broadcast during prime hours in Hiru, Derana and Sirasa TV channels were randomly selected as research samples. Then, the data were qualitatively analyzed using thematic analysis methodology. Subsequently, the collected data were categorized into six themes. The findings reveal that Nominalization, Hybridization, Nativization, Alternation, Internal mixing of words, and Coinage were six code-mixing patterns occurring in the selected advertisements. The findings inferred that Hybridization is the most frequently used code-mixing pattern in Sri Lankan Bilingual TV advertisements. Moreover, our findings imply that code-mixing is a common phenomenon used by creative writers in TV advertisements to reach a wider audience. It shows how English exerts its power on the national language of Sri Lanka. Such forms of code-mixing have become extremely natural in the Sri Lankan context where both Sinhala and English co-exist.

***Keywords:*** advertisements; bilingual; code-mixing; multilingual

[1] University of Kelaniya, Kelaniya. mahrifafaiz636@gmail.com
[2] University of Kelaniya, Kelaniya. gwdilanik@gmail.com
[3] University of Kelaniya, Kelaniya. namunipalihakkara@gmail.com
[4] University of Kelaniya, Kelaniya. navodamalsha@gmail.com

# A STUDY INVESTIGATING SPEAKING ANXIETY AND ITS EFFECT ON SPEAKING PERFORMANCE AMONG ESL FIRST YEAR SPORTS SCIENCE UNDERGRADUATES OF THE UNIVERSITY OF KELANIYA.

*T.H. Nethini Ishara Hettiarachchi*[1]

The relationship between speaking anxiety and speaking performance is complex and multifaceted. The ability to communicate fluently in English is crucial for many English as a Second Language (ESL) learners because of anxiety. However, many ESL learners face challenges in developing their speaking skills, such as a lack of self-confidence, fear of making mistakes, feeling nervous, panicking, and difficulties in applying grammar and vocabulary knowledge in spontaneous speech. This research study delves into the intricate relationship between speaking anxiety and speaking performance among first-year Sport Science ESL undergraduates at the University of Kelaniya, Sri Lanka. The primary objective of this research study is to investigate the reasons for speaking anxiety and its effect on speaking performance. This study included 50 first-year undergraduates from the Sports Science Department of the Faculty of Science and the English Language Teaching Coordinator. The data collection was performed by incorporating questionnaires, semi-structured interviews, and observations. The study was conducted using a mixed-method research method, where the collected qualitative data were analyzed using thematic analysis, while SPSS 23.0, is used to analyze the quantitative data. As a result of the research findings, it was determined that there is a lack of speaking performance due to anxiety, and reasons for speaking anxiety are discovered. According to the researcher, the study's findings can be used to identify the reasons for speaking anxiety and this can be used as a guideline to reduce speaking anxiety by upgrading the speaking performance of the ESL undergraduates of the Sports Science Department.

***Keywords:*** Speaking anxiety, Speaking performance, Undergraduates, Second Language

[1] University of Kelaniya. nethini99ishara@gmail.com

# ESL STUDENTS' ATTITUDES TOWARDS STUDENT-CENTERED LEARNING ACTIVITIES: A STUDY AMONG UNDERGRADUATES OF UNIVERSITY OF RUHUNA.

*K.P.A. Hansani*[1]

This study aims to explore the attitudes of English as a Second Language (ESL) students towards student-centered learning activities in teacher-centered classrooms. Teachers incorporate student-centered learning activities to cater to diverse learning styles and preferences despite teacher-guided activities. However, different students may have diverse attitudes towards the utilized student-centered activities as students have different learning styles and preferences. Therefore, the objective of this study is to identify ESL students' attitudes towards student-centered learning activities. The research sample for this study consists of 20 undergraduates from the Faculty of Humanities and Social Sciences at the University of Ruhuna. Since there is a lack of research specifically incorporating the undergraduates of the University of Ruhuna, there is a clear empirical research gap. Using a qualitative method approach, the study administers a questionnaire. Gathered data is analyzed through MS Excel and presented through charts. Additionally, the thematic analysis is conducted to identify recurring themes in the participants' responses. The data analysis reveals that ESL students actively engage in various student-centered activities like speaking, reading, writing, and listening within their ESL classrooms. Notably, activities such as role plays, reading authentic materials, writing essays, and listening to authentic resources serve as strong motivators for students to learn English. Furthermore, the majority of students find these activities particularly helpful in improving their English language skills, as they provide valuable opportunities to practice and apply what they have learned from their regular lessons. Consequently, student-centered activities offer practical exposure to the content taught in the classroom, which contributes to their language development. Overall, students find that these activities are more engaging and empower learner autonomy and confidence within the students. However, a few students suggest that those utilized activities should improve to capture the attention of students more effectively. Teachers can gain insights from this study to enhance learner autonomy and create a more stimulating environment for ESL students.

***Keywords**:* Attitudes, ESL classroom, Learner autonomy, Student-centered learning activities, Teacher-centered classroom

---

[1] University of Ruhuna, Matara. amahansani99@gmail.com

# A NEEDS ANALYSIS FOR AN ESP PROGRAM FOR FINANCIAL MANAGEMENT UNDERGRADUATES AT THE UNIVERSITY OF KELANIYA.

*G.Y.B. Bandara*[1]

This research study focuses on a needs analysis and course design for English for Financial Management students at the University of Kelaniya, Sri Lanka. It aimed to investigate the English language-related challenges faced by Financial Management undergraduates and the required language skills and effective learning materials with activities for the undergraduates. The study employs a mixed method. The data were gathered by conducting interviews and getting the responses for a questionnaire from a non-probability sample of fifteen undergraduates. The qualitative data were utilized to understand the field of study and the quantitative data were used to design and select suitable course content. This study demonstrated that speaking skills should be prioritized along with vocabulary development, compared to reading, writing, and listening. According to students' responses, the activities related to improving vocabulary and developing speaking in practical situations are the most elevated concerns. This study reflected on students' attitudes towards 'proficiency in English' that they consider an essential factor when entering the future world and their career development from the perspective of a Financial Management undergraduate. The findings should be implemented by prioritizing the needs of the students when designing the English for Financial Management course. This English for Special Purposes course is determined to overcome the shortcomings and challenges faced by the students by providing a specific platform to develop speaking skills and vocabulary.

***Keywords:*** Needs Analysis, Financial Management, Undergraduates, Speaking skills, Vocabulary development, Course design

[1] Kelaniya University of Sri Lanka. bineshikabandara@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Environmental Management & Water Resources Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# IDENTIFYING THE FACTORS AFFECTING CHRONIC KIDNEY DISEASE (CKD) IN ANURADHAPURA DISTRICT, SRI LANKA.

*I.N.M. Alexander*[1] *R.M.S.T. Ranwala*[2]

Chronic kidney disease (CKD) is indeed a significant public health problem globally, and is particularly pronounced in Sri Lanka, with Anuradhapura district in the North Central Province identified as a high-risk area. Several factors contribute to the prevalence of CKD in Sri Lanka and particularly in the Anuradhapura district: that is, Agricultural Practices, Contaminated Water, climate and dehydration, genetic predisposition, and Limited Healthcare Access etc. This paper aimed to identify the prevalence of CKD and explored the factors associated with its occurrence in Anuradhapura district. For this study used to a multi-stage cluster sampling method to select fifty participants aged 20 years and above. A structured questionnaire used to collect their life style and medical history data and also blood and urine samples obtain for laboratory analysis and finally CKD was defined as estimated glomerular filtration rate <60 mL" refers to individuals with a kidney function estimated to be less than 60 mL/min. Among the study population, which include both males and females, the majority of participants with chronic kidney disease (CKD) will spread within the age group of 40 to 60 years. The prevalence of CKD in the Anuradhapura district is significant and calls for timely urgent attention. This study identifies several risk factors such as age, gender – male, occupation, law educational backgrounds. In this paper, we attempt to explore additional factors contributing to CKD in the Anuradhapura District. Lastly, we provide some recommendations to mitigate this renal disease: that is, Improved Water Quality, Public Awareness Campaign, Regular Monitoring and Evaluation and Regular Screening Programs etc.

***Keywords:*** Chronic kidney disease; pronounced; prevalence; estimated glomerular filtration rate; renal disease

[1] Rajarata University of Sri Lanka, Mihintale. nipunialexander2000@gmail.com
[2] Rajarata University of Sri Lanka, Mihintale. ssh2020372@ssh.rjt.ac.lk

# ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා මහජන පුස්තකාලයන්හි දායකත්වය පිලිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: බස්නාහිර පළාත ඇසුරින්

*එම්.ජී. තාරුක*[1] *එම්.ජී.එච්.කේ. විජේරත්න*[2]

ගෝලීය වශයෙන් මානව වර්ගයා දරිද්‍රතාවයේ පීඩාවෙන් නිදහස් කර ගැනීමත්, මිහිකත සුවපත් කිරීමේ අරමුණත් පෙරදැරිව බිහි වූ තිරසර සංවර්ධන ඉලක්ක ලොව සෑම රටක්ම සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමුඛ සංකල්පයකි. මෙහිදී ශ්‍රී ලංකාව තුළ මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථ යතාර්ථයක් කර ගැනීම උදෙසා මෙරට මහජන පුස්තකාල පද්ධතියට තිරසර සංවර්ධනය සඳහා වූ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා මහජන පුස්තකාලයන්හි දායකත්වය කෙබඳුද? යන ප්‍රස්තුතය පාදක කොටගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා මහජන පුස්තකාලවල දායකත්වය කෙබඳුද? යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. තිරසර සංවර්ධන ඉලක්කයන් පිළිබඳව අවබෝධයක් මහජන පුස්තකාලයාධිපතිවරුන් සහ කාර්යමණ්ඩලයට තිබේදැයි හඳුනා ගැනීම, තිරසාර ඉලක්කයන් සාක්ෂාත් කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන පුස්තකාල සේවාවන්හි ගුණාත්මකභාවය අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු හා අභියෝග හඳුනා ගැනීම මෙහි සෙසු අරමුණු වේ. මෙහිදි ගුණාත්මක පර්යේෂණ වර්ගය, සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිතා කරන ලදී. අරමුණු සහගත නියැදියට අනුව බස්නාහිර පළාතේ ප්‍රධාන දිස්ත්‍රික්ක 03 වන කොළඹ,ගම්පහ,කළුතර දිස්ත්‍රික්ක තෝරාගන්නා ලදී. එහිදී එම දිස්ත්‍රික්ක 03හි ප්‍රධාන මහජන පුස්තකාලය බැගින් මහජන පුස්තකාල 03ක් තෝරාගන්නා ලදී. පුස්තකාලයාධිපති හා කාර්යමණ්ඩලය සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මහජන පුස්තකාලවල වාර්ෂික වාර්තා, වාර්ෂික සැලසුම් වාර්තා හා සමීක්ෂණ ඇසුරින් ද්විතීයික දත්ත රැස් කර ගන්නා ලදී. ජාත්‍යන්තර මට්ටමින් තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගනිමින් මහජන පුස්තකාල හරහා ගුණාත්මක වූ පුස්තකාල සේවාවක් ක්‍රියාත්මක කරනු ලැබේ. නමුත් ශ්‍රී ලංකාව තුළ නිසි ප්‍රමිතීන්ට අනුකූලව ඒකීය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන බවක් දක්නට ලැබේ. තිරසාර ඉලක්කයන් පිළිබඳව නිසි අවබෝධයකින් තොරව සම්ප්‍රදායික වූ පුස්තකාල සේවා මත රැඳෙමින් පුස්තකාල සේවා ක්‍රියාත්මක කරනු ලැබේ. මහජන පුස්තකාල ගත් කළ මව් ආයතනයට යටත්ව ක්‍රියාත්මක වන බවක් දක්නට ලැබේ. එහිදී ප්‍රතිපාදන ලබාදීමේ විෂමතාවයන් දක්නට ලැබීම මෙහි පර්යේෂණ ප්‍රතිඵල වේ. මෙලෙස තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගනිමින් මහජන පුස්තකාලවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පුහුණුව පුස්තකාල කාර්යමණ්ඩලයට ලබා දිය යුතුය. මේ සඳහා නිසි නායකත්වයක් සහ නිවැරදි මඟ පෙන්වීමක් මහජන පුස්තකාල පද්ධතියට ලබා දිය යුතු වේ.

***ප්‍රමුඛ පද:*** තිරසර සංවර්ධනය, තිරසර සංවර්ධන ඉලක්කයන්, පුස්තකාල, මහජන පුස්තකාල

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව. erandakaushalya1@gmail.com
[2] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.

# රා කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් පයාගල ග්‍රාමය ඇසුරෙන්

*එම්.ඩබ්ලිව්.අයි.ඒ. සිල්වා*[1]

ලෝකයේ එක් එක් ප්‍රදේශයන්ට ආවේණික වූ ප්‍රාදේශික ආර්ථික කටයුතු දැකගත හැකි අතර ඒවා ගෝලීය, කලාපීය හා ප්‍රාදේශික මට්ටමින් හඳුනාගත හැකි ය. කිසියම් ප්‍රදේශයක පවතින දේශගුණය භූ විෂමත ආදි භූගෝලීය සාධක මෙන් ම මානව අවශ්‍යතා වෙළෙඳපොළ ආදි මානුෂ සාධකවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශික ආර්ථික කටයුතු ස්ථානගත වේ. ප්‍රාථමික ප්‍රාදේශීය ආර්ථික කටයුත්තක් වන රා කර්මාන්තය හා බැඳී ඇති විවිධ ක්‍රම උපායන් සිරිත් විරිත් පිළිබඳ ව අධ්‍යයනයක් කර ඔවුන්ට අනන්‍ය වූ ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත භාවිත කරන ලදී. ක්ෂේත්‍ර නිරීක්ෂණය මඟින් හා ව්‍යූහගත හා අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත එක් රැස් කළ අතර අන්තර්ජාලය හා පෙර ප්‍රකාශිත ලිපි අධ්‍යයනය කිරීමෙන් පර්යේෂණය සඳහා ද්විතීයක දත්ත ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ පිහිටා ඇති කළුතර දිස්ත්‍රික්කයේ පයාගල ග්‍රාමය මෙම පර්යේෂණය සඳහා නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. පර්යේෂණය සඳහා සමස්ත ශ්‍රී ලංකාව ම නියෝජනය වන පරිදි එක් කුඩා ප්‍රදේශයක් තෝරා ගැනීමේ හේතුවෙන් මෙම පර්යේෂණයේ යම් සීමා දැකගත හැකි වේ. මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත මත පදනම් ව ගුණාත්මක ක්‍රමවේදයට සිදු කරන ලදී. එහි දී සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රය අනුව අනුරාධපුර රාජධානියේ සිට පැවත එන කර්මාන්තයක් ලෙස රා කර්මාන්තය හැඳින්විය හැකි අතර පෘතුගීසි ආක්‍රමණයෙන් පසු ව මෙම කර්මාන්තය තවදුරටත් සංවර්ධනය විය. මෙම පර්යේෂණයේ දී රා කර්මාන්තයට සුවිශේෂී වූ ඔවුන්ට ආවේණික වූ ක්‍රමවේද හඳුනාගත හැකි විය. මෙම කර්මාන්තයේ මූලික පියවර ලෙස රා මැදීමට සුදුසු ලෙස ගස් කට්ටි (පොල් වතු) සකස් කර ගැනීමේ සිට මල් තැලීම,රා මැදීම, ප්‍රවාහනය, ගෙවීම් සිදු කිරීම ආදි සියලු අවස්ථාවල දී සාම්ප්‍රදායික ක්‍රමවේදයක් දැකගත හැකි විය. මෙම කර්මාන්තයට ආවේණික වූ ක්‍රමවේදයන් පිළිබඳ ව ගැඹුරු අධ්‍යයනයේ දී ඒ සියලු ක්‍රම විවිධ වූ හේතු සාධක හා අරමුණු මත පදනම් වී ඇති බව හඳුනාගත හැකි විය. නිදසුනක් වශයෙන් රා මැදීම සඳහා ගස් ඇදීමේ දී භාවිත කෙරෙන ලණු දවසක් පමණ මුහුදෙහි පෙනෙන්නට තබා භාවිතයට ගනු ලබයි. එමගින් ලණුවල ශක්තිමත් භාවය හා දිගුකාලීන පැවැත්ම ඔවුන් විසින් අපේක්ෂා කරන ලදී. පරිසරය හා බැඳී පවතින මෙම කර්මාන්තයෙහි පරිසර හිතකාමී ක්‍රමෝපායන් දැකගත හැකි වූ අතර රා කර්මාන්තයේ දී මතු වන විවිධ ගැටලුවලට තිරසර ක්‍රම උපාය භාවිත කර ඇති අන්දම මෙම පර්යේෂණයෙන් දැකිය හැකි විය. ඒ අනුව, පොල් රා කර්මාන්තයේ සුවිශේෂී ඉපැරණි පරිසර හිතකාමී ක්‍රමෝපායන්හී භාවිතය දැකගත හැකි වූ බව මෙමගින් නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පද:** ඉපැරණි, ක්‍රමෝපායන්, පරිසර හිතකාමී, පොල්, රා කර්මාන්තය

[1] මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය 2000miangelsilva@gmail.com

# පරිසර කළමනාකරණය පිළිබඳව ත්‍රිපිටකාගත සූත්‍ර ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

*කේ.ඩබ්ලිව්.ඩී. නූජිත*[1]

පරිසරය යනු අහස, ජලය, වාතය හා පොළොව ආදි ස්වාභාවික සම්පත් හා ශක්තීන්ගෙන් සමන්විත වූවෙකි. මිනිසාට බෙහෙවින් ම බලපාන සාධකයක් ලෙස පරිසරය දැක්විය හැකි ය. ඒ අනුව මිනිසා හා පරිසරය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් මැනවින් පවති. එමෙන් ම මිනිසාගේ හැසිරීම් රටාවන් පරිසරය කෙරෙහි ද පාරසරික ක්‍රියාවලියන් මිනිසා කෙරෙහි ද අන්‍යෝන්‍ය ලෙස බලපාන බවඅංගුත්තර නිකායේ අධම්මික සූත්‍රය මගින් ප්‍රකට වේ. කෙසේ වෙතත් නූතන මිනිසා විද්‍යාත්මක ඥානයෙන් පෝෂණය වීමත් සමග ම පරිසරයට ප්‍රබල ලෙස බලපෑම් එල්ල කරයි. ඒ නිසා පරිසරය රැක ගැනීමට මිනිස්සු විවිධ ක්‍රියාමාර්ග ගනිති. මේ අනුව විවිධ බලපෑම් මගින් පරිසරය විනාශ වීමෙන් වලකා ගැනීම සඳහා බුදුන් වහන්සේ විසින් ප්‍රායෝගික වූ පරිසර කළමනාකරණ පද්ධතියක් සිය ශ්‍රාවකයාට පෙන්වා දී ඇත. ඒ බව හමුවන්නේ ත්‍රිපිටකය තුළනි. මේ අනුව මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ ත්‍රිපිටකය තුළ බුදුන් වහන්සේ පෙන්වා දුන් පරිසර කළමනාකරණ පද්ධතිය ප්‍රකට වන්නේ කෙසේ ද යන්නයි. මේ අනුව මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ වත්මන් පාරසරික අර්බුදයන් අවම කිරිම සඳහා ත්‍රිපිටකයෙන් හෙළි වන පරිසර කළමනාකරණ පද්ධතිය අධ්‍යයනය කිරිමයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මූලික වසයෙන් සූත්‍ර පිටකය හා විනය පිටකය යන පිටක ග්‍රන්ථ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ගෙන එහි එන මෙම පර්යේෂණ ගැටලුව හා සම්බන්ධ දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. බෞද්ධ පරිසර කළමනාකරණ පද්ධතිය මූලික වසයෙන් මනස පාදක කරගෙන ක්‍රියාත්මක කෙරෙන පරිසර කළමනාකරණ පද්ධතියක් බවත්, වත්මන් පාරසරික අර්බුද ඇති වීමට හේතු වී ඇත්තේ මානව අකල්ප පරිසර හිතකාමී නොවන නිසා බවත් පරිසරය කෙසේ ද සාර්ථක ලෙස හිතකාමී ව කළමනාකරණය කල යුත්තේ යන්න බුදුන් වහන්සේ විසින් පෙන්වා දී ඇති ආකාරය අග්ගඤ්ඤ සූත්‍රය, සාමඤ්ඤඵල සූත්‍රය යනාදි සූත්‍ර මගින් පෙන්වා දීම යනාදිය මෙම පර්යේෂණය මගින් ප්‍රකට වන ප්‍රතිඵල වේ. වන විනාශය, ජල දූෂණය, වායු දූෂණය වැලකීම හා තුරුලතා රැක ගැනීමට වගේ ම ඒවායේ පෝෂණය කිරිම සඳහා ගත යුතු ප්‍රායෝගික ක්‍රියාමාර්ග රැසක් ත්‍රිපිටකය තුළින් උද්දීපනය වේ. එමෙන් ම බෞද්ධ පරිසර කළමනාකරණය සම්බන්ධ මානව ආකල්ප නූතන පරිසරවේදීන්ට හා අනෙකුත් සියලු ම දෙනාට නූතන පරිසර ගැටලු විසඳීම සඳහා ත්‍රිපිටකයෙන් ප්‍රකට වන පරිසර කළමනාකරණ පද්ධතිය බෙහෙවින් දායක කර ගත හැකි බව මෙම පර්යේෂණය මගින් පෙන්වා දිය හැකි වැදගත්කම ලෙස දැක්විය හැකි ය. මේ අනුව ත්‍රිපිටකයෙන් ප්‍රකට වන පරිසර කළමනාකරණ පද්ධතිය මගින් වත්මන් පාරසරික අර්බුද අවම කර ගත හැකි බව මෙම පර්යේෂණය මගින් මනා නිගමනයකට එළඹිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** කළමනාකරණය, ත්‍රිපිටකය, පරිසරය, බෞද්ධ, සූත්‍ර

[1] රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, nujithadulith@gmail.com

# INTEGRATED WITH GEOSPATIAL TECHNIQUES TO ANALYSIS OF MORPHOLOGICAL CHANGES IN SOUTHERN COASTAL AREA OF SRI LANKA.

*H.I.R. Perera*[1] *H.M. Upeksha Madhuwanthi*[2] *G.N.D. Perera*[3]

Morphological Changes are the changes in the Shape and form of land features over time. Thalalla Bay Beach in the southern coastal area occupies a special place here because it has an untouched and clean coastal area. It has a specific coastal ecosystem and landform such as the protected cove in the shape of a crescent which is about 2km long and flanked by palm trees. The objective of this study is to map and calculate the morphological changes in the Thalalla Bay Beach area. These changes were mapped and integrated with GIS environment based on Google Earth satellite images in 2005, 2015, and the 2023 respectively. Hence, used the geographically digitizing method comparing Google Images from each year and using a field survey. During the last 15 years, this area has changed over time with the formation of new morphological patterns such as dramatically narrowing the estuary and increasing the number of settlements with the increasing tourism. Furthermore, it can be identified that the river gradually widened by 2005, 2015, and 2023. As a result, the size of the beach has increased over time. The result revealed 3.98 ha in 2005 and 8.44 ha in 2023. This is due to the narrowing of the river and the deposition of sediments on the shoreline. The morphological features have changed with the effect of both natural and human factors. The result of the present study can be used for environmental-based institutes to develop sustainable environmental plans and reduce the negative impact caused by land erosion.

***Keywords:*** Coastal, Erosion, Geospatial techniques, Morphological changes, Thalalla Bay beach.

[1] University of Ruhuna, Sri Lanka, Matara. ishadi.17848@uhss.ruh.ac.lk
[2] University of Ruhuna, Sri Lanka, Matara. upeksha.18274@uhss.ruh.ac.lk
[3] University of Ruhuna, Sri Lanka, Matara. devindin47@gmail.com

# වත්මන් සමාජයේ පවතින ජල දූෂණ කටයුතු හා පරිසර විනාශයන් ජය ගැනීම කෙරෙහි බෞද්ධ ඉගැන්වීම්වල ඇති දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

*ටී.ජී.එස්.අයි. මධුහංසි*[1]

ලෝකයේ ජීවත් වන සෑම ජීවියෙකුගේ ම නිවහන වන්නේ පරිසරයයි. පරිසරයේ ඇති ප්‍රධාන අංගයක් වශයෙන් ජල සම්පත පෙන්වා පෙන්වා දිය හැකි ය. මිනිසාට ජලය බෙහෙවින් අත්‍යවශ්‍ය වේ. ජලය මිනිසාගේ ජීව රුධිරය හා සමාන ය. ජලය හා පරිසරය එකට බැඳී පවතී. එහෙත්, වර්තමානයේ මානව අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් විශාල වසයෙන් පරිසර හානි සිදු කරන අතර, ඒ හා සමාන ව ම ජල දූෂණ කටයුතු ද සිදු වේ. අතීතයේ බුදුරදුන් ජීවමාන කාලයේ දී උන්වහන්සේගේ දේශනාවන්හි පරිසර කළමනාකරණය මෙන් ම, ජල සම්පත් භාවිතය පිළිබඳ ව මැනවින් දක්වා තිබේ. ඒ අනුව වර්තමානයේ සිදු වන පරිසර හානි අවම කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වලට අනුව කටයුතු කිරීම තුළින් හැකියාව ලැබේ. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ, වත්මන් සමාජයේ පවතින ජල දූෂණ කටයුතු හා පරිසර විනාශයන් ජය ගැනීම කෙරෙහි බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබෙන දායකත්වය කෙතෙක් දුරට උපයෝගී වනවා ද යන්නයි. පරිසරය සහ ජල සම්පත්හි වටිනාකම අවබෝධ කර දෙමින්, බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පරිසරය සහ ජල සම්පත් සංරක්ෂණය කළ හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ ලෙස පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ, වර්තමානයේ සීඝ්‍ර ලෙස පරිසර හානි මෙන් ම ජල දූෂණ කටයුතු ද සිදුවන බැවින් ඒවා අවම කර ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල අන්තර්ගත කාරණා ක්‍රියාත්මක කරන්නේ කෙසේ දැයි ජනතාව දැනුම්වත් කිරීමයි. මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු රැස් කර ඇත. මිනිසාගේ පැවැත්මට ජලය පමණක් නො ව, පරිසරය ද බෙහෙවින් ම අත්‍යවශ්‍ය වේ. ජලය, පරිසරය හා මිනිසා අතර ත්‍රිකෝණාකාර වූ බැඳීමක් පවතී. ඒ නිසා අතීතයේ මානව අවශ්‍යතාවන් පරිසරය හා ජලය මුල් කර ගනිමින් සිදු කළ බැවින් විශාල වශයෙන් පරිසර හා ජල දූෂණ කටයුතු සිදු නො විණි. එහෙත්, වර්තමානයේ මානව අවශ්‍යතාවන් ඉටු කර ගැනීමේ දී පරිසර හා ජල හානි විශාල වසයෙන් වැඩි වීමක් දක්නට ලැබේ. ඒ නිසා බෞද්ධ ඉගැන්වීම්වල ඇති කාරණා පිළිබඳ එනම්, ජල සංරක්ෂණ ක්‍රම සහ පරිසර සංරක්ෂණ ක්‍රම පිළිබඳ ගැඹුරින් සිතා බලා ක්‍රියා කිරීම තුළින් පවතින පරිසර හානි, ජල දූෂණ කටයුතු තරමක් දුරට හෝ අවම කර ගනිමින් මානව අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකියාව පවතී.

***ප්‍රමුඛ පද:*** දූෂණය, ජලය, පරිසරය, බෞද්ධ, මිනිසා

[1] පාලි බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය maduhanshi123@gmail.com

# UNRAVELING THE FUTILITY: INEFFECTIVENESS OF *Escherichia coli* REMOVAL BY TREATMENT PLANT UPON REINTRODUCTION TO POLLUTED CANALS

*S.A.P.T. Samaraweera[1]*   M.M.M. Najim[2]*

Greater Kurunegala Sewage Treatment Plant (GKSTP) plays a crucial role in safeguarding public health by removing contaminants from wastewater before discharge. *Escherichia coli* (*E. coli*) is a prominent fecal contamination indicator of water. Despite the substantial investments made by treatment plants to remove pathogens from wastewater, the efficacy of this process is questioned when the treated water is reintroduced into contaminated canals. This study aimed to investigate whether the removal of microbes in a treatment plant is effective when the treated water is put back into the same polluted canal, assessing the feasibility of achieving significant pathogen removal maintaining water quality standards. Composite water samples were collected from 5 sampling sites along the canals downstream to GKSTP during the dry (DS) and wet (WS) seasons for microbiological analysis using Membrane Filtration Protocol. The *E. coli* of water was assessed for spatial and temporal variations using an Analysis of Variances (ANOVA). *E. coli* count of water along Kurunegala city canals exhibited notable spatial variation ($p<0.05$). Based on the findings, the *E. coli* counts in 100mL of water during the WS ranged from 482 to uncountable whereas in the DS it ranged from 216 to not clear (contaminated with other bacteria). *E. coli* levels remain high during the WS and this could be attributed to surface runoff from residential and agricultural areas, discharges from unconnected pipes to sewage networks, and due to intentional release of sewage during WS. Despite the presence of a GKSTP, biological parameters such as *E. coli* count cannot be effectively reduced unless all sewage pipes within the city are connected and treated. The futility of treatment costs becomes evident as reintroducing treated water into polluted canals leads to microbial recontamination, posing a significant risk to water quality standards downstream, thereby jeopardizing the safety and well-being of water users. It underscores the need for a comprehensive approach to address persistent pollution sources and ensure effective water quality management.

**Keywords:** *E. coli*; microbiological analysis; treatment plant; wastewater; water quality

---

[1] Department of Zoology and Environmental Management, Faculty of Science, University of Kelaniya, Sri Lanka. pamudisamaraweera@gmail.com

[2] Faculty of Agriculture, Sultan Sharif Ali Islamic University (UNISSA), Kampus Sinaut, Km 33, Jln Tutong, Kampong Sinaut, Tutong TB1741 Brunei Darussalam. najim.mujithaba@unissa.edu.bn

# ENVIRONMENTAL AND SOCIO - ECONOMIC ISSUES DUE TO MINING OF SANDS - A CASE STUDY IN ALUTHGAMA GN DEVIATION, KURUNEGALA DISTRICT.

*K.A.L.C. Kuruppu Arachchi*[1]

Mining is the extraction of sand, usually from an open pit. It can be excavated from sand dunes, beaches, rivers, water streams and even ocean beds. Today, mining is a major economic activity in developing countries which has created various environmental and socio-economic issues. The main objective of this study is to identify the environmental and socio- economic issues created by illegal sand mining in Aluthgama GN division in the Kimbulwana Oya basin. This study was conducted based on primary and secondary data with cross - sectional mix methods combining both quantitative and qualitative research methods. A questionnaire and field observations were used to collect primary data. Collected qualitative and quantitative data was analyzed using Microsoft excel software. Secondary data were collected from various sources. According to the analysis, the banks and the bed of the river have been eroded immensely due to the sand mining. A sloping road has been constructed for the passage of vehicles to the river bed. Due to continuous dumping of sand, bank erosion and uprooting of surrounding vegetation can be seen and the size characteristics of river sediments have been changed. The biodiversity of the environment has been greatly damaged. The plant systems on the banks of the river have been destroyed, the life cycle of aquatic organisms has been damaged, and certain food webs and chains have been broken. This creates socio-economic impacts in the area as a means of generating income. Water scarcity has become a serious problem in many areas along the river during the dry season. Lack of clean water for bathing, loss of land, frequent conflicts between miners and fishing communities due to rapid decline in fish stocks. Finally, it helps to educate people about the environmental, socio-economic values, guide authorities to consider the long-term consequences of sand mining and contribute to the formulation new policies. It can be used to protect and preserve rivers and valleys from sand mining.

***Keywords:*** Sand mining, River, Environment Socio-economic, Impact, River bed

[1]Department of Environmental Management, Rajarata University of Sri Lanka. lahiruchathuranga1011@gmail.com

# ADVANCEMENTS IN GIS AND RS TECHNOLOGIES FOR MONITORING MARINE OILSPILLS: A SYSTEMATIC REVIEW OF ENVIRONMENTAL IMPACTS AND FUTURE DIRECTIONS.

*U.P.P.T. Thennakoon[1]* J.A.S.G. Randimali [2] K.L.T.D. Keerthirathna[3] U.P.S. Priyankara[4] K. Mahendraraj[5]*

Marine oil spills are one of the major human-induced disasters with serious environmental impacts. Therefore, understanding the extent and depth of environmental impacts is crucial to the concept of ecosystem health assessment. With this background, we conducted a systematic review to identify the main types of GIS and RS applications to detect oil spills and to identify how these types of GIS and RS have been useful in quantifying the environmental impact caused by oil spills. In the article screening process, research articles related to oil spills published from 2018 to 2023 were extracted using the "Google Scholar" academic search engine. We employed "oil spill, GIS & RS, marine biodiversity, Asian region" as inclusive keywords to screen out articles. For the final analysis of the data, the screening process yielded a total of 52 articles. The analysis results showed that the majority of studies have employed Arc GIS combined with machine learning models to detect the location, extent, and characteristics of the oil spill, including oil type, texture, and thickness. In monitoring oil spills, satellite imagery, synthetic aperture radar, and high-resolution hyper-spectral sensors with CNN machine learning are utilized, along with optical RS, ESRI, and ArcGIS databases. Integration of GIS platforms with spatial decision support systems and analytical hierarchical process models, plus secondary data sources, assesses the onshore and offshore environmental impacts caused by oil spills. Studies evaluate GIS and RS tools' effectiveness and their impact on marine oil spills, revealing significant progress in Asian marine oil spills. However, it is clear that introducing inclusive and comprehensive approach is important to address challenges including the development of real-time monitoring systems, the integration of autonomous systems, RS fusion approaches, and oil spill remediation techniques. Such advancements will contribute to the effective management and responses to oil spills on spatiotemporal aspects and minimize their ecological and economic impacts on the marine environment.

***Keywords:*** GIS and RS; Marine Biodiversity in Asian region; Oil spills detection; Advanced machine learning.

---

[12345] Department of Agricultural Engineering and Environmental Technology, Faculty of Agriculture University of Ruhuna, Matara, Sri Lanka. piyumithennakoon5@gmail.com

# පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක් නිර්මාණය කිරීම සඳහා පෙරදිග දැනුම් පද්ධතියේ පෙළඹවීම් පිළිබඳ අධ්‍යයනයක් -- ගලමුදුනගම හුදෙකලා ගම්මානය ඇසුරින්

*කේ.ඒ.ජේ.එස්.ජයසූරිය[1], ජේ.ඊ.එම්.සී.එල්.ගුණරත්න[2]*

වර්තමානය වන විට ගෝලීය මට්ටමින් බොහෝ දෙනා ස්වකීය විවේකය සඳහා නාගරික ප්‍රදේශයෙන් පිටතට ඇදී යනු ලබයි. එහිදී බොහෝ දෙනා ජනශූන්‍ය හුදකලා වූ ජෛව විවිධත්වයෙන් අනූන පරිසර පද්ධතීන්හී ඇති ස්වභා සුන්දරත්වය විඳින්නට එකතුවීම දක්නට ලැබේ. සංචාරක ආකර්ශනය බහුල රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය පරිසරය හා බැඳුණු සංකල්පයන් සමග එකතුවෙමින් පවතින බව දිනෙන් දින හඳුනාගත හැකිය. වර්තමානය වන විට සංචාරක ආකර්ශනය නකල්ස් රක්ෂිත කලාපය හා ඒ ආසන්නව දක්නට ලැබෙන ජෛව විවිධත්වයෙන් අනූන වූ ජනශූන්‍ය පරිසර පද්ධති ආශ්‍රිතව සහ සාම්ප්‍රදායික ගම්මාන කෙරෙහි  වර්ධනය වෙමින් පවති. වර්තමානයේදී සීඝ්‍රයෙන් මානව ආකර්ශනය දිනාගන්නා ප්‍රදේශ ඉක්මනින් විනාශ වන බවක් දක්නට ලැබේ.  සංචාරක කර්මාන්තය මෙම පරිසර පද්ධති ආරක්ෂා වන අයුරින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා දේශීය දැනුම් පද්ධතිය තුළ ගොඩ නැගී තිබූ සංකල්පයන් මොනවාද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව මෙම ප්‍රදේශයන් තුළ හරිත සංචාරක කර්මාන්තය ගොඩනැගිය යුත්තේ කෙසේද.? පරිසරය හා බැඳුණු සංකල්පයන් තුළින් පරිසර හිතකාමි සංචාරක කර්මාන්තයක් ගොඩනගනුයේ කෙසේද? යන්න අධ්‍යනය කිරීම මෙම අධ්‍යයනයෙහි උප අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා අදාළ ප්‍රාථමික දත්ත හුදෙකලා ගම්මානයක් වූ  ගලමුදුනගම , සුළුගුණේ යන ප්‍රදේශතුළ  ක්ෂේත්‍රයට ගමන්කරමින් සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය තුළින් සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය තුළින් ප්‍රශ්නාවලි 80 ක් භාවිතයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. එමෙන්ම ද්විතීයික දත්තයන් ප්‍රදේශය පිළිබඳ ඇතුළත් පර්යේෂණ පත්‍රිකා ආධාරයෙන් ලබා ගන්නා ලදී . මෙම ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය දියුණු විමේදී ගමනාන්තය වන ගලමුදුන සාම්ප්‍රදායික ගම්මානයෙහි ජනතාවගේ සිරිත් විරිත් හා එකී සමාජ සංස්ථාව තුළ ගොඩනැගී ඇති පරිසරය හා සම්බන්ධ පාරිසරික සාරධර්මයන්ට අවනත වීමට සංචාරකයින් යොමු කිරීමේ වැදගත්කමක් හඳුනාගත හැකි විය. ජනශූන්‍ය වූත් ජෛවවිවිධත්වයෙන් සහ ස්වභා අසිරියෙන් අනූන වූ රක්ෂිත කලාපය විජනපාත පාරිසරික අත්දැකීම් ලබා ගැනීමට ඉතා ඉවහල්වන බවද හඳුනාගත හැකි විය.  ඒ අනුව මෙම ප්‍රදේශය තුළ හරිත සංචාරක කර්මාන්තය වර්ධනය වීමේදී විජනපාත පරිසර පද්ධතීන් හඳුනාගැනීමත් ඒ තුලින් එම පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීමට යොමු කිරීමත් අවශ්‍ය බව මෙම අධ්‍යයනය තුළින් සනාථවිය. මෙම ප්‍රදේශය අධ්‍යයනය කිරීම තුළින් මෙම ගම්වාසීන්ට ආවේණික ජලාධාර කළමනාකරණ හා කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පාරිසරික සංකල්ප කිහිපයක් හඳුනාගත හැකි විය.විශේෂයෙන්ම මෙම ප්‍රදේශයන්හි ජනතාව මුදල් පසුපස හඹා නොයන පුද්ගලයින් බවත් ඔවුන් මෙකී පරිසරය විනාශ වන අයුරින් කිසිදු පුද්ගලයෙකු ගම්මාන වලට පැමිණිය යුතු නැති බවට දැඩි මතයක සිටින බවත් පැහැදිලි විය. සංචාරක කර්මාන්තයේදී මෙම ප්‍රදේශය තුළ ප්‍රවාහනය සඳහා මාර්ග ආදිය වැඩි දියුණු කිරීම පරිසරයට සෘජුව හානිදායක වන බවත් ජනතාවට මාර්ග වල අවශ්‍යතාවයක් නොමැති බවත් මනාව පැහැදිලි විය. ඒ අනුව සංචාරක කර්මාන්තය වර්ධනය වීමේදී මෙවැනි ප්‍රදේශවලට ආවේණික සිරිත් විරිත් හා ඔවුන්ගේ දේශීය දැනුම් පද්ධතිය තුළ ඇති සංකල්පයන්  ආරක්ෂා කර ගනිමින් සංචාරක කර්මාන්තය ගොඩනැගිය යුතු බව පැහැදිලිවේ.

***ප්‍රමුඛ පද:*** *සංචාරක කර්මාන්තය, විජනපාත පරිසර පද්ධති , දේශීය දැනුම් පද්ධතිය , පරිසර හිතකාමි , ජෛව විවිධත්වය*

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. ; jayasankajs11@gmail.com

[2] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. ; chaminilakshika2000@gmail.com

# නකල්ස් කඳුවැටිය වෙත තිබෙන්නා වූ සංචාරක ආකර්ශණය පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යනයක් සිදු කිරීම.

*එම්.ඊ.ඩී.කේ.මුණසිංහ*[1]

නකල්ස් කඳු වැටිය ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්ක වල පිහිටා ඇත. සිංහල වැසියන් සාම්ප්‍රදායිකව මෙම කඳුවැටිය හඳුන්වනු ලබන්නේ දුම්බර කඳුවැටිය ලෙසයි. දුම්බර වනපෙත සංචාරක ආකර්ෂණය දිනාගැනීමට විශේෂම හේතුව වනුයේ ස්වභාව සෞන්දර්ය උපරිම අන්දමින් විඳිමින් මෙම කඳුවැටිය තරණය කිරීම සංචාරකයින් දක්වන දැඩි කැමැත්ත නිසාවෙන් ම වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලෝක උරුමයක් වන නකල්ස් කඳු වැටිය මැද ප්‍රදේශ වල පිහිටා ඇති සුන්දර ස්ථාන දෙස් විදෙස් සංචාරකයින්ට මුදල් අයකර නැරඹීමට යාමට අවස්ථාව ලබා දී ඇත. එහිදී නකල්ස් කඳුවැටියේ සංචාරය කරන සංචාරකයෙකුට පවත්නා වූ ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන මොනවාද? යන්න පරීක්ෂණ ගැටලුව ලෙස යොදා ගෙන ඇත. පරීක්ෂණ තුළින් බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණ වනුයේ නකල්ස් කඳු වැටිය සංචාරක ගමන් මාර්ගයක් ලෙස පවත්වාගෙන යාමේදී ඇතිවන ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන හඳුනාගෙන ඒ සඳහා සංචාරක ආකර්ශණය ප්‍රවර්ධනය කිරීමයි. යොදාගත් පරීක්ෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේශණය මෙන් ම ක්ෂේත්‍ර නොවන ගවේශණ ක්‍රම මගින් තොරතුරු ලබා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගැනීම ඒ සඳහා ශ්‍රී ලංකීය සංචාරකයින් වගේ ම තෙල්දෙණිය, මාතලේ, රිවස්ටන්, වල්පොලමුල්ල ප්‍රදේශ වලින් අහඹු ලෙස තෝරගත් පිරිසගෙන් ලබාගත් සම්මුඛ සාකච්ඡා වගේ ම එම සංචාරක ප්‍රදේශ තුල සංචාරය කරමින් ලබාගත් අත්දැකීම් මෙන් ම පුස්තකාල ගවේශණයක් සිදු කරන ලදී. මෙමගින් නකල්ස් කඳු වැටිය සංචාරය කිරීමට පැමිණෙන සංචාරකයින් නිසාවෙන් ග්‍රාමීය සංස්කෘතියට සිදුව ඇති ධනාත්මක බලපෑමට සාපේක්ෂව ඍණාත්මක බලපෑම් ද සිදු ව ඇත. දේශීය සංචාරකයන් මෙන්ම විදේශීය සංචාරකයින් ද මෙම නකල්ස් කඳුවැටිය තරණයට වැඩි ඇල්මක් දක්වයි. වර්ථමානය වන විට සංචාරක මගපෙන්වන්නන්ගේ ප්‍රධාන ගමනාන්තයක් ලෙස මෙම කඳු වැටිය පත් වී ඇත. එහි දී විශාල කණ්ඩායම් වශයෙන් මෙන් ම කුඩා කණ්ඩායම් වශයේ පෙර සැලසුම් කර ගත් ගමන්මාර්ගයක් ඔස්සේ නකල්ස් කඳු වැටිය තරණය කිරීමක් සිදු කරයි. එහි දී ප්‍රධාන වශයෙන් ම සංචාරකයින්ගේ අකර්ශණනය දීනාගත් ස්ථානයන් ලෙස දූවිලි ඇල්ල, කළුදිය පොකුණ, ස්භාවික තටාකය, කඳු මුදුන් 05 ආදි ස්ථාන පෙන්වා දිය හැක. නකල්ස් කඳු තරණයට ඇල්මක් දක්වන විදේශීකයන් සඳහා යෝජනාවලියක් ද මෙම පරීක්ෂණයෙන් ඉදිරිපත් කර හැකිය.

***ප්‍රමුඛ පද*** *- නකල්ස් කඳුවැටිය, ආකර්ශණය, සංචාරක, උරුමය, දේශීය, විදේශිය*

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ssh2020292@ssh.rjt.ac.lk

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# History & Culture



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# ටිබෙට් බුද්ධ හා බෝසත් ප්‍රතිමා කලාවෙහි විද්‍යාමාන වන සංස්කෘතික සම්ප්‍රේෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*කේ.ජී. ශෂී සඳලංකා ධර්මරත්න*[1]

ලෝක බෞද්ධ සංස්කෘතිය තුළ ඉතා විශාල වපසරියක් ටිබෙට් බෞද්ධ සංස්කෘතියට හිමි වේ. ලෝකයේ අන්‍ය සංස්කෘතීන්ට සාපේක්ෂ ව ඉතා සුවිශේෂ අනන්‍යයතාවක් පෙන්වන අතර එම සංස්කෘතිකාංගයන් අතරින් බුද්ධ හා බෝසත් ප්‍රතිමා කලාවට හිමි වන්නේ ඉතා සුවිශේෂ ස්ථානයකි. මෙම ටිබෙට් බුද්ධ ප්‍රතිමා කලාවෙහි දැකගත හැකි වන අන්‍ය සංස්කෘතික සම්ප්‍රේෂණ මොනවා ද යන ගැටලුව පදනම් කරගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරේ. තන්ත්‍රයානයේ අදහස් මුල් කරගනිමින් නිර්මාණය වූ ටිබෙට් බුද්ධ ප්‍රතිමා කලාවෙහි දක්නට ලැබෙන අන්‍ය සංස්කෘතිකමය වන අභාසයන් හෙළිදරවු කරගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. එබැවින් මෙම පර්යේෂණයේ වැදගත්කම ලෙස සඳහන් කළ හැකි වන්නේ බුද්ධ ප්‍රතිමා කලාවේ විකාශනය හා සම්බන්ධ වැදගත් තොරතුරු සම්පිණ්ඩණය කළ හැකි වීමයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරනු ලැබේ. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වසයෙන් සම්මුඛ සාකච්ඡා සිදු කෙරෙන අතර ද්විතියක මූලාශ්‍රය වශයෙන් පොත් පත් හා සඟරා ආදිය ද භාවිත කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වසයෙන් ටිබෙට් බුද්ධ ප්‍රතිමාවන්හි ඉන්දියාවේ ගාන්ධාර කලා අභාසය ද එමෙන් ම කාශ්මීර කලාපීය බුද්ධ ප්‍රතිමා ආභාසය ද ටිබෙට් ප්‍රතිමා කලාවෙහි දක්නට ලැබෙන බව සාක්ෂ්‍ය සහිත ව ම පෙන්වා දිය හැකි ය. එමෙන් ම Zhang Zhung රාජධානියෙහි දී වර්ධනය වන ප්‍රතිමා කලාව තුළ බෝසත් ප්‍රතිමා නිර්මාණකරණයේ වැඩි ප්‍රවණතාවක් දැකිය හැකි වේ. එහි හින්දු හා මහායාන ආභාස ද බොන් සංස්කෘතික ආභාසය ද මෙහි දක්නට ලැබෙන බව පෙන්වා දිය හැකි ය. මෙම සියලු ආකාරයේ ආභාසයන් ලැබූව ද ටිබෙටයට ආවේණික වූ බුද්ධ හා බෝසත් ප්‍රතිමා කලාවක් ද දක්නට ලැබෙන බව පෙන්වා දිය හැකි ය. එබැවින් මෙම සියලු කරුණු විමර්ශනාත්මක ව අධ්‍යයනය කල්හි ලබා ගත හැකි නිගමනය වසයෙන් සඳහන් කළ හැකි වන්නේ විවිධ අභාසයන්ගේ සම්මිශ්‍රණයක් ලෙස පූර්ව අවධියේ සිට වර්ධනය වෙමින් අවුත් පසු ව ටිබෙටයට ම අනන්‍යය වූ බුද්ධ හා බෝසත් ප්‍රතිමා කලාවක් නිර්මාණය වූ බවයි.

***ප්‍රමුඛ පදඃ*** ටිබෙටය, බුද්ධ ප්‍රතිමා, කලා ආභාසය, තන්ත්‍රයානය

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව, sandalankashashi000@gmail.com

# රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල කොට්ඨාසයට අයත් කොට්ටිඹුල්වල වළගම්බා රජමහා විහාරයේ නඩත්තු කටයුතු රාජකාරි ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

*කේ. වී. ටී. එම්. ඒකනායක*[1]

රත්නපුරයේ පිහිටි වළගම්බා රජමහා විහාරය ඓතිහාසික පූජනීය ස්ථානයක් වන අතර එහි පවතින නඩත්තු කටයුතු රාජකාරී ක්‍රමය මත බැඳී පවතින බවත් තහවුරු වේ. රාජකාරිය රජුගේ කාර්යයක් වේ. අතීතයේ විවිධ ඉඩකඩම් පරිත්‍යාග කෙරුණු බවට සාධක ඇත. නින්දගම්, විදානේගම්, ගබඩාගම්, විහාරගම්, දේවාලගම් ආදි ලෙස හඳුනා ගැනේ. මේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාට පැවරී ඇති කාර්ය සඳහා සහාය වීම ද විහාරස්ථානයට අයත් වූ ගොඩමඩ ඉඩම්වල කෙරෙන කෘෂිකාර්මික කටයුතු සැලසුමට අනුව බෙදා වෙන් කිරීම ද දෛනික කාර්යයන් රාජකාරි ක්‍රමය මත බැඳී පැවතුණි. ඒ අනුව අධ්‍යයන ගැටලුව වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොට්ටිඹුල්වල වළගම්බා රජමහා විහාරයේ නඩත්තු කටයුතු රාජකාරි ක්‍රමය මත බැඳී පවතින්නේ ද යන්න විමර්ශනය කිරීමයි. පර්යේෂණ අරමුණ වන්නේ විහාරස්ථානයේ නඩත්තු කටයුතු සිදු කෙරෙන්නේ කිනම් කාරණා සඳහා ද එය සිදු වන්නේ කෙසේ ද එම නඩත්තු කටයුතු හා අදාළ විහාරගම් ජනයා රාජකාරි ක්‍රමය මත බැඳී පවතින ආකාරය පිළිබඳ ව යන්න අධ්‍යයනය කිරීමයි. මේ කරුණු සාධනය කර ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, අන්තර්ජාලය සහ සම්මුඛ සාකච්ඡා වැනි දෑ භාවිත කෙරිණි. කොට්ටිඹුල්වල වළගම්බා රජමහා විහාරස්ථානයේ විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පය, ඓතිහාසිකත්වය, පුරාවිද්‍යාව වැදගත්කම් පිළිබඳ ව බොහෝ පර්යේෂණ ද ශාස්ත්‍රීය ලිපි ලියැවී ඇති නමුත් නඩත්තු කටයුතු රාජකාරි ක්‍රමය මත බැඳී පැවතීම පිළිබඳ අධ්‍යයනය කර නැත. මෙම අධ්‍යයනය මගින් ජනයාගේ සිතුම් පැතුම් චින්තනය හා සමාජික තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට හැකියාවක් ඇත. රාජකාරි ක්‍රමය අනුව කොට්ටිඹුල්වල විහාරස්ථානයේ කාර්ය බෙදී යන ආකාරයත්, රාජකාරි ක්‍රමය සාධනීය නිශේධනීය පැතිකඩ හා නූතනය රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වීමත් එයින් ඇතිවෙන අභියෝග පිළිබඳ වත් රාජකාරි කටයුතුවලින් හෙළි වන සමකාලීන තොරතුරු පිළිබඳ වත් සාකච්ඡා කෙරේ. රාජකාරි ක්‍රමය ඥාන ගබඩාවක්, නව දැනුම සොයා ගැනීමටත්, නඩත්තු කටයුතු රාජකාරි ක්‍රමය මත බැඳී පවතින බවට රත්නපුරයේ වළගම්බා රජමහා විහාරස්ථානයෙන් නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** රත්නපුර, නඩත්තු, රාජකාරි ක්‍රමය, වළගම්බා, කොට්ටිඹුල්වල

[1] ශ්‍රී ලංකා රජරට විශ්ව විශ්වවිද්‍යාලය, tharangamaduwanthi98@gmail.com

# ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ෆාහියන් දේශාටන වාර්තාවේ උපයෝගිතාව පිළිබඳ විමසුමක්

*ආර්. එච්. එල්. දිසානායක*[1]

බෞද්ධ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස චීනයට බුදුදහම ලැබුණු අතර එය චීනය තුළ මනා සේ ව්‍යාප්ත වී ගියේ ය. කෙසේ වෙතත් චීනයේ බුදු දහම ඔප්නැංවීම සඳහා චීන භික්ෂූන් වහන්සේලා දේශාටනයේ යෙදී බෞද්ධ පොතපත සොයා ගැනීම ආදි කාර්යයන් සඳහා දායක වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස චීන සංචාරක භික්ෂුවක වූ ෆාහියන් භික්ෂූන් වහන්සේ චීනයේ සිට බුදු දහම පිළිබඳ බෞද්ධ ග්‍රන්ථ සොයා විවිධ රටවලට වැඩම කළහ. ඉන් අවසාන වරට වැඩම කළා යැයි සඳහන් වන්නේ ශ්‍රී ලංකාවටයි. ෆාහියන් විසින් තමා ගිය රටවල තොරතුරු ඇතුළත් කරමින් රචනා කළ ඔහුගේ දේශාටන වාර්තාව පැරණි ලංකාව පිළිබඳ තොරතුරු හැදෑරීමට වටිනා විදේශීය මූලාශ්‍රයකි. මෙම අධ්‍යයනය මගින් පර්යේෂණයට ලක් කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ෆාහියන් දේශාටන වාර්තාවේ උපයෝගිතාව පිළිබද විමසා බැලීමකි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ෆාහියන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා සමගාමී ව ලංකාවේ දේශීය සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල සඳහන් වන කරුණු සමග සංසන්දනාත්මක ව මෙම අධ්‍යයනය සිදු කර තිබේ. මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වූයේ ෆාහියන්ගේ වාර්තාවෙහි වැඩි අවධානය යොමු ව ඇත්තේ ලංකාවේ ආගමික පසුබිම හා සමාජ පසුබිම පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීමට බවයි. සමස්ත අධ්‍යයනය තුළින් පෙනී යන්නේ අනුරාධපුර යුගයේ ආගමික හා සමාජ ඉතිහාසය පිළිබඳ ෆාහියන්ගේ දේශාටන වාර්තාවේ සඳහන් තොරතුරු අනෙකුත් මූලාශ්‍රයවල දක්නට ලැබෙන තොරතුරු හා සැසඳෙන බවයි. බෞද්ධ සංස්කෘතියේ ස්වරූපය පිළිබඳව හැදෑරීමේ දී ෆාහියන්ගේ වාර්තාවේ සඳහන් කරුණු සුවිශේෂ වේ. ඒ අතර භික්ෂූන්ගේ ජීවන රටාව, බෞද්ධ උත්සව, ආරාම සහ භික්ෂූන්ගේ වාසස්ථාන පිළිබඳ තොරතුරු, ජනතාවගේ සමාජය ස්වරූපය පිළිබඳ ව දක්වන තොරතුරු දෙස බලන විට එවක සමාජය තුළ යහපත් ආගමික සමාජ වටපිටාවක් පැවති බව පෙන්වා දිය හැකි ය. ෆාහියන්ගේ සමස්ත කර්තව්‍ය දෙස බලන විට වසර දෙකක් ලංකාවේ නතර වී සිටි ඔහු ලංකාව පිළිබඳ ඉතාමත් වටින තොරතුරු ඉදිරිපත් කර තිබේ. එමෙන් ම අතීතයේ සිට චීන ලංකා සබඳතා ඉතාමත් මනා සේ පැවැති බවට ද ඔහුගේ මෙම ගමන් විස්තරය සාධක වෙයි.

***ප්‍රමුඛ පද:*** ෆාහියන්, බෞද්ධ සංස්කෘතිය, චිනය, දේශාටනය

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hirushadissanayaka2000@gmail.com

# සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා බෞද්ධාගමික සංකල්පයන්හි උපයෝගීතාව පිළිබඳ විමසුමක්

*එච්.එම්.එන්.එම්.ඒකනායක*[1]

මිනිසුන් එකිනෙකා අතර සහකම්පනයෙන් කටයුතු කිරීමට ආගමික සංකල්ප මග පෙන්වන ලදී. බෞද්ධාගමික සංකල්පයන් මඟින් සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා දක්වා ඇති මතවාද හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා බෞද්ධාගමික සංකල්පයන්හි උපයෝගීතාව කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදාගනු ලැබුවේ පුස්තකාලය අධ්‍යයනය තුළින් එක්රැස් කළ දත්ත ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමය යටතේ විශ්ලේෂණය කිරීමයි. සහකම්පනය සැබැවින් ම මානව හිතවාදී ගුණයකි. එහි ලා පාලකයා ජනතාව හා අන්‍යෝන්‍ය සබඳතාවෙන් කටයුතු කළ යුතු ය. පාලනයේ දී හිංසාව පිටු දකිමින් ජනතාව විෂයෙහි යහපත් පාලනයක නිරත විය යුතු අතර අන්‍ය මත ඉවසමින් ක්‍රියා කළ යුතු වේ. පරමාදර්ශී රජු පිළිබඳ දක්වන දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැහැමි බවින් සාර්ථක පාලනයක් ගෙන යාමත් (ධම්මිකො ධම්ම රාජා) එම පාලනය මිනිසුන්ට පමණක් නො ව මෘග පක්ෂීන්ට පවා ආරක්ෂාව ලබා දෙන්නක් බවත් (රක්ඛාවරණගුත්ති සංවිදහස්සු) දක්වා තිබේ. සතර සංග්‍රහ වස්තු දක්වන සිගාලෝවාද සූත්‍රයේ දී දානය, ප්‍රිය වචනය මෙන් ම අර්ථ චරියාව වන අනුන්ට වැඩ පිණිස කටයුතු කිරීමත් සියලු දෙනාට ම සැප දායකත්වයට පත් කිරීමත් පාලකයාගේ යුතුකම වේ. පත්තකම්ම සූත්‍රයේ සඳහන් පංච ශීලය සමාජ සුරක්ෂිතතාව සඳහා සෘජු ව බලපායි. අනන්‍යයන් ගැන සිතමින් අන්සතු දේ ආරක්ෂා කිරීමත් ගෘහස්ත සදාචාරය සුරැකීමත් බොරුවෙන් වැලැකී සහකම්පනයෙන් ක්‍රියා කිරීමත් සමාජ සුරක්ෂිතතාවට හේතු වන බව එහි පෙන්වා දී තිබේ. සතර සංග්‍රහ කිරීම නම් තමා හා සමාන ව අන්‍යයන් පිළිබඳ චින්තනය සකස් කර ගැනීමට ඇති හැකියාවයි, සහකම්පනයයි. සංයුක්ත නිකායේ වේළුද්වාර සූත්‍රයේ 'අත්තුපනායික ධම්ම පරියාය' යනුවෙන් දැක්වෙන්නේ මෙම ලක්ෂණයයි. බුද්ධ නියමයට අනුව මිනිසා කෙරෙහි පමණක් නො ව ජීවී පරිසරය කෙරෙහි සහකම්පනයෙන් ක්‍රියා කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍යය තාන්ත්‍රික වගකීමක් වේ. දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රයේ දස සක්විතිවත් පැහැදිලි කරමින් මෘග පක්ෂී සමූහයාට දැහැමි ව ආරක්ෂාව සැලසිය යුතු බව අවධාරණය කර ඇත. බුදු දහමේ මූලික ඉගැන්වීම්වල අරමුණ වී ඇත්තේ පාලකයා, ජනතාව හා පරිසරය විෂයෙහි අන්‍යෝන්‍ය සබඳතාව ඇති කරමින් සදාචාරවත් යුක්තිගරුක සමාජයක් බිහි කිරීම ය. බෞද්ධාගමික සංකල්පයන් මඟින් සහකම්පනයෙන් යුත් සමාජයක් නිර්මාණය උපායමාර්ගික ව සිදු කර ඇති බව මෙමඟින් හඳුනා ගත හැකි ය.

***ප්‍රමුඛ පද:*** අන්‍යෝන්‍ය සබඳතාව, බුදු දහම, සමාජය, සහකම්පනය, සංකල්ප

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, nimeshaekanayake65@gmail.com

# An Inquiry of the Religious Principles and Their Uses Made by the Ancients for Social Compassion (Based on Rajarata Civilization)

*H.M.N.M.Ekanayaka*[1]

Since the pre-Buddhist era, a perfect relationship has been built between religion and government. This research aims to identify the religious policies made by the ancients during the Rajarata civilization period. The research problem here is how the developed religious policies were used for social solidarity and what is their utility. The research methodology used was the analysis of the data collected through the library study under the historical-comparative method. Even when there is no specific religion, man is motivated to live religiously based on nature. After the *Mahindagamana*, the kings governed the country with religious ideas in mind. Accordingly, even though King *Dutugemunu* was not present until the *Mahathupa* was completed, he was determined to build *Ruwanwelisaya* without paying wages before it was completed. He is a unique character in modern society because of his compassion towards the unknown. Also, it is mentioned in the chronicles that King *Buddhadasa* lived his life as a Bodhisattva with *Dasaraja Dhamma* entertaining the people with four magazines. According to the *Mahavamsa*, King Agbo followed the Ten Commandments and issued the decree "No animal should perish" to ensure the safety of everyone's lives. In the *Vessagiri* inscription No. 2 about the 4th King Mihindu, he is described as a ruler who was perfect with compassion and pleased the hearts of all the people. It is also stated in the *Vevelketiya* inscription, the Badulu Pillar Inscription of King Kasyapa V, and the *Padduvasnuwara* inscription that the rulers of this country have used *Panchasheela*(Five precepts) for their governance policies. Thus religious values and humane qualities have naturally been added to the way of life of the people through the formulation of religious policies. It is clear that religion has been well used for the formulation of state policies for the sake of social empathy and the implementation of state policies through decrees and rules due to the state respect that religion had and the ruler's doctrinal and mutual relationship between each other.

***Keywords:*** Buddhism, empathy, government policies, religion, society

[1] Rajarata University of Sri Lanka, Mihintale , nimeshaekanayake65@gmail.com

# අනුරාධපුර ලෝක උරුම පූජා නගරය ආශ්‍රිත ව ජන ආර්ථිකය නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව අධ්‍යයනයක්

*ඊ. ඩී. එන්. මධුරංගි*[1]

යුනෙස්කෝව මගින් ප්‍රකාශිත ලෝක උරුමයක් වන අනුරාධපුර පූජා භූමිය දෙස් විදෙස් බැතිමතුන් හා සංචාරකයන් විශාල ප්‍රමාණයක් පැමිණෙන ස්ථානයකි. මෙසේ අනුරාධපුර පූජා නගරයට පැමිණෙන පිරිස් නිසා, නොයෙක් වෘත්තීන්වල හා සේවාවන්වල යෙදෙමින් සිය ජීවන තත්ත්වය පවත්වාගෙන යන ජනතාව හට කිසියම් ආර්ථික පිටුවහලක් ලැබී ඇත. පූජා නගරයෙහි රාජ්‍ය අනුග්‍රහය යටතේ හෝ එසේ නොමැති ව වෘත්තීන්වල නිරත වන ජනතාවගේ ආර්ථිකය නැංවීමට ගත හැකි වඩාත් ඵලදායි ක්‍රියාමාර්ග පවතිනවා ද යන්න අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ අරමුණ වන අතර මේ සඳහා මිශ්‍ර ක්‍රමවේදය යොදාගන්නා ලදී. එනම් මෙම පර්යේෂණ ක්‍රමවේදය සඳහා ගුණාත්මක හා සංඛ්‍යාත්මක යන පර්යේෂණ ක්‍රමවේද යොදා ගැනිණි. එහි දී දත්ත එක්රැස් කිරීමේ දී විශේෂයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ප්‍රමුඛතාවක් ලබා දුන් අතර එසේ එක්රැස් කරගන්නා ලද දත්ත විශ්ලේෂණය කර නිගමනයන්ට එළඹීම සිදු කරනු ලබයි. අනුරාධපුර පූජා නගරයෙහි පවත්වාගෙන යන ඇතැම් වෙළඳසැල් හා අනවසර පදිංචිකරුවන් උරුමයට හා එහි සංස්කෘතික අගයට හානි වන පරිදි අනවසරෙන් පවත්වාගෙන යන ආර්ථික ක්‍රියාකාරකම් ද නිරීක්ෂණය වේ. එසේ ම රාජ්‍යය මැදිහත් වීම මඟින් ජනතාවට ආර්ථික ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් ස්ථාපනය කරන ලද වෙළඳසැල් ද පවත්වා ගෙන යනු ලබයි. ලෝක උරුම පූජා නගරය ආශ්‍රිත ව ආර්ථික යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් සේ ම එය වඩාත් පුළුල් අධ්‍යයනයකින් හා එය සුදුසු ආයතනවල මැදිහත්වීමෙන් සිදු කළ යුතු වුවත් මේ දක්වා එය විධිමත් ව සිදු නොවන බව නිරීක්ෂණ වී තිබේ. එබැවින් ගැටලු රාශියක් ද පැන නැගී තිබේ. එසේ වුව ද උරුමය හා එහි සංස්කෘතික අගයට හානි නොවන පරිදි ග්‍රාමීය ජන ආර්ථිකයට ප්‍රතිලාභ ලැබිය හැකි අවකාශයක් නිර්මාණය කිරීම කාලීන වසයෙන් ඉතා වැදගත් වේ. එය ආර්ථික ප්‍රතිලාභ අවශ්‍ය කණ්ඩායම් වෙත නිසැක ව ම හිමි වන ක්‍රියාවලියක් ලෙස සකස් විය යුතු ය. ඒ සඳහා රාජ්‍යය ආයතන හා ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂිත කණ්ඩායම් අතර වඩාත් පුළුල් මැදිහත් වීමක් සිදු විය යුතු බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** අනුරාධපුර පූජා නගරය, උරුමය, සංචාරකයන්, රාජ්‍යය ආයතන, ආර්ථික ප්‍රතිලාභ

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. nimashamadurangi31@gmail.com

# කෝට්ටේ යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ඉතිහාසය හා දියුණුවට බලපෑ හේතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් ඇසුරෙන්)

*අයි. එම්. එම්. මධූෂාන්* [1]

මහින්දාගමනයෙන් පසු ව ක්‍රි. පූ තුන් වන සියවසේ සිට ලංකාවේ ලේඛන කලාවේ භාවිතය සංවර්ධනය වීම ආරම්භ විය. මුල් කාලයේ දී එම ලේඛන කලාව භාවිත කරමින් ලෙන් ලිපි වැනි දේ සටහන් කිරීම පිණිස ය. පැරණි සම්භව්‍ය සිංහල සාහිත්‍ය නිර්මාණය වූයේ අනතුරු ව ය. එකී සම්භව්‍ය සිංහල සාහිත්‍ය ලංකාවේ, එක් එක් යුගයන්වල යම් යම් වෙනස්කම්වලට භාජනය වෙමින් දියුණු විය. කෝට්ටේ යුගය සාහිත්‍යය සංවර්ධනයේ දියුණු අවධියක් නියෝජනය කරයි. එම යුගයේහි සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු තොරාගත් මූලාශ්‍රය කිහිපයක් ඇසුරෙන් හඳුනා ගැනීම, මෙම පර්යේෂණයේ අරමුණ වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයේහි සාහිත්‍යයේ දියුණුවක් ඇති විමට හේතු මොනවා දැයි සොයා බැලීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනිණි. දත්ත සපයා ගැනීමේ දී සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය ප්‍රධාන විය. ඒ අනුව ප්‍රාථමික මුලාශ්‍රයත්, ද්විතියක මුලාශ්‍රයත්, මඟින් විමර්ශනය සිදු කරන ලදී. කෝට්ටේ යුගයේ විවිධ වර්ගයේ ග්‍රන්ථ රාශියක් රචනා වු බව, මහාවංසයයේ තෙවන කොටසෙහි සදහන් වි ඇත. සනදේශ කාව්‍ය, භක්ති කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, සිලෝ කාව්‍ය, අස්න කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝශ ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ ඒ අතර වේ. එලෙස ම ගිහි පැවිදි උගත් පඬිවරුන් රාශියක් ග්‍රන්ථකරණයේහි නියැලීම ද, කෝට්ටේ යුගයේ සාහිත්‍යයේ දියුණුවක් ඇති විමට හේතු විය. තොටගමුවේ ශ්‍රි රාහුල හිමි, වෑත්තෑවේ හිමි, විදාගම මෛත්‍රි හිමි, පැවිදි උගතුන් ලෙසත් හය වන පැරකුම්බා රජු ගිහි උගතෙකු ලෙසත් ග්‍රන්ථකරණයේ නිරත වුවන් අතර වෙති. තව ද දියුණු පිරිවෙන් නිර්මාණය වි තිබූ බව සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අනුව පැහැදිලි ය. පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙන, කෑරගල පද්මාවති පිරිවෙන, තොටගමු විජයබාහු පිරිවෙන එසේ බිහි වු පිරිවෙන් අතර වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව, කෝට්ටේ යුගයේහි දියුණු පිරිවෙන් බිහි වීමත්, විවිධ වර්ගයේ පොත පත රචනා වීම නිසාත්, උගත් පඬිවරුන් රාශියක් බිහිවීමත් නිසාත්, සම්භාව්‍ය සාහිත්‍යයේහි දියුණුවක් නිර්මාණය වු ආකාරය සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු, ඔස්සේ නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** කෝට්ටේ යුගය, සාම්භාව්‍ය , සාහිත්‍යය , ලේඛනය , ග්‍රන්ථ

---

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, madushamilinda9@gmail.com

# සාම්ප්‍රදායික සමාජය සතු ආහාර කල් තබා ගැනීමේ සංරක්ෂණ විධි ක්‍රම හා එහි නූතන තත්ත්වය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*කේ.ඩී. නිෂාදි මල්කා [1]*

ලොව අන් කිසිදු රටකට නොදෙවෙනි ස්වාධීන සංස්කෘතියක් ශ්‍රී ලාංකිකයන් සතු ව පැවතියත් අධිරාජ්‍යවාදී පාලනයට නතු වීමෙන් පසු චින්තනයෙන්, ආකල්පවලින් පමණක් නො ව ආහාරවලින් පවා අනුකාරකවාදීන් වී ඇත. සාම්ප්‍රදායික සමාජය සතු ව අතිරික්තයක් තිබූ අවස්ථාවල දී ඒවා කල් තබා ගැනීමේ සංරක්ෂණ විධි ඔවුන් සතු වූවා පමණක් නො ව ඒ පිළිබඳ ව දැනුම් සම්භාරය නොඅඩු ව තිබුණි. ඒ අනුව සාම්ප්‍රදායික සමාජය සතු ආහාර කල් තබා ගැනීමේ සංරක්ෂණ විධි ක්‍රමය හා එහි නූතන තත්ත්වය කෙසේ ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි. එලෙස සාම්ප්‍රදායික සමාජය සතු ආහාර කල් තබා ගැනීමේ සංරක්ෂණ විධි ක්‍රම හා එහි නූතන තත්ත්වය දක්වා වෙනස් වී ඇති ආකාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූ අතර මෙහි දී පුස්තකාලය අධ්‍යයනය හරහා ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය භාවිතය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මෙන් ම අන්තර්ජාල භාවිතය ඔස්සේ දත්ත ග්‍රහණය කර ගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව මෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස බස්නාහිර පළාතේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇස්වත්ත ග්‍රාම නිලධාරී වසම තෝරා ගන්නා ලදී. සාම්ප්‍රදායික සමාජය සතු ව තිබූ නිෂ්පාදන රටාව තුළ අතිරික්තයන් පැවති අවස්ථාවල දී ඒවා කල් තබා ගැනීමට හැකි වන පරිදි කටයුතු කිරීමට ගැඹුරු දැනුමක් ඔවුන් සතු ව පැවති බව මෙම පර්යේෂණයේ දී වඩාත් පැහැදිලි විය. ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ආහාර ඔවුන් කල් තබා ගත්තේ ද ස්වභාවික ආකාරයට වීම මෙහි ඇති අපූර්වතම ලක්ෂණයයි. ඒ අනුව අව්ව, සුළඟ වැනි ස්වාභාවික සම්පත්වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමට ඔවුන් සමත් වී ඇත. එහි දී හිරු රශ්මිය, ගිනි රශ්මිය, විවිධ ස්වභාවික සංයෝග ආදිය යොදා ගනිමින් සම්පූර්ණ වසයෙන් ම ස්වාභාවික ක්‍රියාවලිය ආදර්ශයට ගනිමින් ආහාර කල් තබා ගැනීමට ක්‍රම අත්හදා බලා ඇති බව ප්‍රත්‍යක්ෂ විය. අතිරික්ත ආහාර තම්බා වේලීම, යුෂ මිරිකා කැකැරීම, පොළොව යට වැළලීම, වැලි යට දැමීම ආදිය ඔවුන් නිරතුරු ව ම යොදා ගන්නා ලද ක්‍රම කිහිපයකි. එහෙත් පසුකාලීන ව කාර්මීකරණයේ උපරිම තලයට ළඟා වීමෙන් පසු සාම්ප්‍රදායික ක්‍රම වෙනුවට උෂ්ණත්ව පාලනය, සාන්ද්‍රීකරණය, රසායනික ද්‍රව්‍ය එකතු කිරීම වැනි ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබූ අතර ඒ හරහා විවිධ රෝගාබාධ ඇතිවීම, කෘත්‍රිම ආකලන ද්‍රව්‍ය නිසා පෝෂකවලට හානි සිදුවීම, ආවේණික රස, සුවඳ, වර්ණ වෙනස්වීමේ අවධානම වැනි ගැටලු රැසකට මුහුණ පෑමට සිදු වී ඇති බව තහවුරු විය. ඒ අනුව මූලික වසයෙන් මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දී සාම්ප්‍රදායික ආහාර කල් තබා ගැනීමේ සංරක්ෂණ විධි ක්‍රම යළිත් පරිභෝජනයට සමීප කිරීම තුළින් මෙම ගැටලු අවම කිරීමට හැකි වන බව අනාවරණය විය.

***ප්‍රමුඛ පද;*** සාම්ප්‍රදායික ආහාර, ආහාර කල්තබා ගැනීම, සංරක්ෂණ විධි, සාම්ප්‍රදායික සමාජය

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nishadi98malka@gmail.com

# දේශීය වෛද්‍ය ක්‍රමයේ දී භාවිත වන මිනුම්ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්.ඒ.එන්. සෙව්වන්දි*[1]

බටහිර වෛද්‍ය විද්‍යාව ආරම්භ වීමට පෙරාතු ව සිට එනම්, මානව ශිෂ්ටාචාරය ආරම්භයේ පටන් පැවති වෛද්‍ය ක්‍රමය වූයේ ආයුර්වේදය හෙවත් පෙරදිග වෛද්‍ය විද්‍යාවයි. හෙළ වෙදකම ලෙස මෙරට ප්‍රචලිත වූ දේශීය වෛද්‍ය විද්‍යාව අප සතු වටිනාම උරුමයකි. දේශීය වෛද්‍ය ක්‍රමයේ දී භාවිත වන මිනුම්ක්‍රම පිළිබඳ මෙම පර්යේෂණයේ දී විමර්ශනයට ලක් විය. දේශීය වෛද්‍ය ක්‍රමයේ දී භාවිත වන මිනුම්ක්‍රම කවරේ ද, එම මිනුම්ක්‍රමවල වර්තමාන භාවිතය කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලු විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කළ අතර දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාලය සමීක්ෂණය හා අන්තර්ජාලය සමීක්ෂණය යන ක්‍රමවේද ඔස්සේ සිදු විය. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී දේශීය වෛද්‍යවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරමින් ලබා ගත් දත්ත ද්විතීයක මූලාශ්‍රය ලෙස භාවිත කළ හෙළ වෙදකම සම්බන්ධ ග්‍රන්ථ හා ලිපි ලේඛන ආශ්‍රයයෙන් ලබා ගත් දත්ත හා සංසන්දනය කරමින් දත්ත විශ්ලේෂණය සිදු විය. දත්ත සංවිධානය සටහන් හා පර්යේෂණ පත්‍රිකාව සැකසීමෙන් සිදු කළ අතර ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සාරසංක්ෂේපය හා ප්‍රස්තුතීකරණය හරහා සිදු වේ. හෙළ වෙදකමේ භාවිත මිනුම් ක්‍රම සහ හඳුන්වන ආකාරය, නූතනයේ භාවිත මිනුම් ක්‍රම සහ හඳුන්වන ආකාරය අතර වෙනස්කම් රැසක් මෙහි දී හඳුනාගත හැකි විය. අතීතයේ දී කලං, පලං, පත, අවුන්ස, මේස හැඳි, තේ හැඳි ආදි වසයෙන් මිනුම් ක්‍රම පැවති අතර එම මිනුම් ක්‍රම නූතන මිනුම් ක්‍රම අනුව හඳුනා ගැනීමේ දී; මංචාඩිය යනු මිලි ග්‍රෑම් දෙසිය පනහකි (250mg) කලං එකක් යනු ග්‍රෑම් පහකි (05g), පලං එකක් යනු ග්‍රෑම් හැටකි (60g), පත එකක් යනු මිලි ලීටර් දෙසිය හතලිහකි (240ml), අවුන්සයක් යනු මිලි ලීටර් තිහකි (30ml), මේස හැඳි එකක් යනු මිලි ලීටර් පහළොවකි (15ml), තේ හැඳි එකක් යනු මිලි ලීටර් පහකි (05ml). හෙළ වෙදකම පිළිබඳ උනන්දුවක් දක්වන ප්‍රජාවට මෙවැනි මිනුම්ක්‍රම සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීම පර්යේෂණයේ වැදගත්කමයි. අතීයේ භාවිත වූ බොහෝ මිනුම්ක්‍රම වර්තමානය වන විට විවිධ වෙනස්කම්වලට භාජනය වී ඇති අතර නවීන මිනුම්ක්‍රම අනුව පැරණි මිනුම්ක්‍රම හඳුනාගන්නා ආකාරය මෙම පර්යේෂණයෙන් පැහැදිලි විය.

***ප්‍රමුඛ පද:*** අතීත, මිනුම්ක්‍රම, වර්තමාන, වෙනස්කම්, හෙළ වෙදකම

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, sewwandinimesha30@gmail.com

## රත්න ප්‍රාසාදයේ මුරගල දක්වා මුරගලේ විකාශනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්.පී. නිසංසලා රත්නතිලක* [1]

මුරගල් යනු පූජනීය හෝ රාජකීය ගොඩනැගිල්ලකට පිවිසෙන ද්වාරයේ දෙපසින් කොරවක්ගල් ආවරණය වන අන්දමට බිම් මට්ටමේ පිහිටුවා ඇති හතරැස් පැතලි ගල් පුවරු වේ. මෙම මුරගල් අතීතයේ පටන් නොයෙකුත් වෙනස්කම්වලට භාජනය වෙමින් විකාශනය වී පැමිණි බව ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ කලා නිර්මාණ අතර ඇති එක් සුවිශේෂී කලා නිර්මාණයක් වන මෙම මුරගල පැරණි දේශීය කලාකරුවාගේ නිර්මාණ කුසලතාවන් හා ශිල්පීය කුසලතාවන් පිළිබිඹු කරන කැටයම් අංගයක් වන අතර එය ලක්දිවට ආවේණික කලා නිර්මාණයක් ද වේ. මුරගලේ විකාශනය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී එය නොයෙකුත් වෙනස්කම්වලට භාජනය වෙමින් පැමිණ පසු ව රත්න ප්‍රාසාදයේ මුරගල දක්වා නිර්මාණාත්මක අන්දමින් වර්ධනය වූ බව සඳහන් කළ යුතු ය. මුරගලේ විකාශනය කෙබඳු ස්වරූපයකින් සිදු වූයේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුවයි. ඒ අනුව මුරගලේ විකාශනය පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වන අතර මෙහි දී ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් ප්‍රාථමික මූලාශ්‍රය වසයෙන් ගොඩනැගිලි නටබුන් ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පොත්පත්, පුවත්පත්, සඟරා සහ පුස්තකාලය පරිහරණය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. ඒ අනුව දත්ත විශ්ලේෂණය කිරීමේ දී මුදුනේ දෙකොන් හැඩ ගන්වන ලද කැටයම් රහිත දිග හතරැස් මුරගල, මුදුනේ ගැටය සහිත මුරගල, පුන්කලස සහිත මුරගල, වාමන රුව සහිත මුරගල, නාග රුව සහිත මුරගල එහි ලා බෙහෙවින් වැදගත් වන බවත් මෙම මුරගලට බහිරව රූප වෙනුවට ධෘතරාෂ්ට, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන සතර වරම් දේව රූප එකතු වී තිබීම මෙහි විශිෂ්ට අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි බවත් නිගමනය කළ හැකි විය.

***ප්‍රමුඛ පදඃ*** ගොඩනැගිලි, විකාශනය, මුරගල, කැටයම්, රත්න ප්‍රසාද

[1] සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය nisansalarathnathilaka99@gmail.com

# රන්කොත් වෙහෙර ගොඩනැගීමේ දී ස්වභාවික භූමිය උපයෝගී කරගෙන ඇති ආකාරය

ආර්. පී. ඉෂාන් මධුසංඛ[1], එම්.එන්.එම්. සිල්වා

පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථවලට අනුව බෞධාගමික ගොඩනැගිලි පිහිටි, පොළවට ඉහළින් හෝ උස් භූමියක ඉදිකිරීම් සිදුකරන බවට සඳහන් වේ. රන්කොත් වෙහෙර ගොඩනැගීමේ දී ස්වාභාවික භූමිය උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර, සෙසු අරමුණු ද කිහිපයකි. එනම් රන්කොත් වෙහෙර ස්වභාවිකව පිහිටි උස් බිමක ඉදි කර තිබේ ද, එම ඉදිකිරීම් සිදුකිරීමේ දී භූමිය ස්වභාවිකව  සංරක්ෂණය කර තිබේ ද, අතීතයේ බෞද්ධාගමික සිද්ධස්ථාන ගොඩනැගීමේ දී තිරසර සංවර්ධන සංකල්පය දායක කරගෙන ඇති ද යන අරමුණු ත්‍රිත්වය යි. මෙම අරමුණු සනාථ කර ගැනීම සඳහා පොළොන්නරුව රන්කොත් වෙහෙර හා එම භූමිය මෙහි දී පරීක්ෂණයට ලක්විය. පර්යේෂණ ක්‍රමවේදයන් ලෙස මූලාශ්‍ර  ගත තොරතුරු, පුරාවිද්‍යාත්මක සාධක, සමෝච්ච රේඛා සිතියම්, සම්මුඛ සාකච්ඡා (ආලාහණ පිරිවෙන් ව්‍යාපෘති කළමනාකරු සමග) සහ ක්ෂේත්‍ර අධ්‍යනයන් යන ක්‍රමවේදයන් භාවිත කරනු ලැබීය. අනුරාධපුර හා පොළොන්නරු පැරණි නගරවල භූ විෂමතාවය සැළකූවිට පොළොන්නරු භූ විෂමතාවයේ ස්වභාවික උස්බිම් ලක්ෂණ දැකගත හැකිය. ඒ අනුව රන්කොත් වෙහෙර හා භූමිය ස්වභාවිකවම පිහිටි උස් බිම් ප්‍රදේශයක් බවට හඳුනා ගත් අතර, එම ඉදිකිරීම් සිදු කිරීමේ දී ස්වභාවික භූමිය සංරක්ෂණය වන අයුරින්ම සිදුකර ඇති ආකාරය හඳුනා ගැනීමට හැකිය. අතීතයේ බෞද්ධ ආගමික ගොඩනැගිලි ඉදිකිරීමේ දී ද, තිරසර සංවර්ධනයේ අභිමතාර්ථ දාහතෙන් භෞමික පරිසර පද්ධතිය තිරසාර ලෙස භාවිත කිරීම, ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, කුසගින්න දුරලීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම යන අභිමතාර්ථයන් මෙම ඉදිකිරීම් සඳහා ද භාවිත වූ බව පර්යේෂණ මගින් සනාථ විය. එමඟින්, ස්වාභාවික භූමිය සංරක්ෂිතව ඉදිකිරීම සිදුකර ඇති ආකාරය සනාථ කර ගැනීමටත්, ඉදිකිරීම් සිදු කිරීමේ දී තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කරගෙන ඇති ආකාරයත් හඳුනාගැනීමට හැකි විය. එයින්, අනාගත ඉදිකිරීම් සිදු කිරීමේ දී ද මෙම තිරසර සංවර්ධන අභිමතාර්ථයන්හි සඳහන් වන සුවිශේෂී වූ අභිමතාර්ථයන් එලෙසම භාවිත කිරීම ඉතාමත්ම වැදගත් බව පැහැදිලි විය.

***ප්‍රමුඛ පද*** : පොළොන්නරුත බෞද්ධාගමිකත තිරසරත ස්වභාවිකත සංරක්ෂණය

[1] oishanmadusanka555@gmail.com

# දෙගල්දොරුව රජමහා විහාරයේ සිතුවම් හි නිරූපිත තත්කාලීන කාන්තා වස්ත්‍ර පිළිබඳ අධ්‍යයනයක්.

*ඒ.එම්.ඩී.පී.එම්.අත්තනායක*[1]

අනුරාධපුර සහ පොළොන්නරු යුගයන්ගෙන් පසු විහාර සිතුවම් කලාවේ සාධක අල්ප වූවත් මහනුවර යුගය වන විට සුවිශේෂී සිතුවම් කලාවක සාධක දැකගත හැකිය. මෙම සිතුවම් කලාව අනුරාධපුර සහ පොළොන්නරු සිතුවම් මෙන් සම්භාව්‍ය කලා සම්ප්‍රදායේ සිතුවම් නොව ගැමි ජනතාවගේ සාරධර්ම, සිතුම් පැතුම් ආදිය පිළිබිඹු කෙරෙන ගැමි කලා සම්ප්‍රදායයි. මහනුවර යුගයේ සිතුවම් සහිතව නිර්මාණය වූ දෙගල්දොරුව රජමහා විහාරයේ සිතුවම් තුළ පවතින වස්ත්‍ර තත්කාලීන කාන්තා ජීවිතය සම්බන්ධව ගොඩනැගුනු බව තහවුරු කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදයන් ලෙස මූලාශ්‍ර අධ්‍යයනය, ක්ෂේත්‍ර අධ්‍යයනයන් යොදාගන්නා ලදී. එසේම පර්යේෂණයේ දී රූපමය දත්ත, සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සමඟ විශ්ලේෂණයෙන් ඒ බව තහවුරුකර ගනු ලැබීය. සිතුවම් හි රූප සාමාන්‍ය සහ රාජකීය වශයෙන් ද්විත්වයකට වර්ග කළ හැකි අතර, සාමාන්‍ය කාන්තාවන් උඩුකය නිරුවත්ව හෝ තනපටක් සහ යටිකය සඳහා චීත්ත රෙදි සහිතව නිරූපණය කර ඇත. රාජකීය හෙවත් ඉහළ පන්තිවල කාන්තාවන් නූතන ඔසරියට සමාන වස්ත්‍ර සහිතව නිරූපිත ය. උඩුකය සඳහා අලංකාර දික් වූ අත් සහිත හැට්ට භාවිත කර තිබේ. උඩරට ක්‍රමයේ කාන්තා වස්ත්‍ර නූතනයේ දී පරිණාමය වී පැවතියත් එම විලාසිතාවන් අධ්‍යයනය කිරීමෙන් පවා ඉහත කී කාරණය සනාථ කර ගැනීමට හැකි විය. මෙම ඇඳුම් නිමවා ඇත්තේ කපු නූලෙන් ඉතාමත් සරල ආකාරයෙන් බව මහනුවර ශ්‍රී දළදා මාළිගයේ සහ කොළඹ කෞතුකාගාරයේ ඇති පුරාවිද්‍යාත්මක සාධක මගින් සනාථ කර ගැනීමට හැකි විය. වර්තමානය වන විට ඔසරිය තරමක් වෙනස් වී තිබුණ ද, උඩරට රදල සංස්කෘතිය තුළ කුල කාන්තාවන්ගේ කුලවත්භාවය ප්‍රකාශ කරන ප්‍රධාන සංකේතයක් වී තිබේ. සාරියට සහ ඔසරිය අතර පවතින වෙනස නම් සාරියේ සාමාන්‍ය රැලි ස්වභාවයත්, ඔසරියේ ඉන වට ඇති නෙරියත් යන වෙනස්කම ය. ඔසරිය පැලදීමේ ආරම්භය පිළිබඳව නිශ්චිතව පැවසිය නොහැකි වුවත් ඒ සඳහා දකුණු ඉන්දීය බලපෑම් ලැබී ඇති බව පැහැදිලි ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර පවසන ආකාරයට සාරියට යම් වෙනස්කම් සිදු වී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වූ බවත් ''ඔහොරි'' යන වචනයෙන් ඔසරිය යන්න බිඳී ආ බව දක්වයි. මෙම සිතුවම් හි කුලවත් කාන්තාවන්ගේ වස්ත්‍ර ඔසරියට සමාන බවත් තත්කාලීන බවත් ඒ අනුව සනාථ කර ගැනීමට හැකි විය.

***මුඛ්‍ය පදඃ*** මහනුවර; දෙගල්දොරුව; වස්ත්‍ර; රාජකීය; ඔසරිය

[1] ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, prasadmadhu758@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Information Systems & Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# ETHICAL AND SOCIETAL IMPLICATIONS OF ADVANCED ARTIFICIAL INTELLIGENCE (AI) ADOPTION

*W.U.Withanachchi[1]*

Artificial Intelligence (AI), the ability of digital computers and computer-controlled robots to perform tasks associated with intelligent beings, has a history dating back to Alan Turing's pioneering work. Within recent years, AI has seen widespread applications across various industries and has transformed many aspects of our lives. The background of this study is based on the rapid growth and adoption of AI technology worldwide, while also acknowledging the several ethical, social, and practical concerns that it presents. However, as AI continues to advance, it has become evident that it brings a range of challenges and drawbacks that require careful consideration. This study aims to delve into these negative consequences associated with AI technology and raise public awareness about them. The methodology of this study involves an analysis of existing literature and research on AI-related issues. It includes a review of case studies, surveys done by experts, and opinions to gather insights into the impact of AI on job displacement, privacy, security, development costs, ethical dilemmas, and its limitations in understanding human emotions and social interactions. This study highlights the critical need for a balanced approach to the integration of AI technology into our society. While AI holds immense potential to enhance various aspects of our lives, it is essential to address and mitigate the associated challenges and drawbacks. Based on the findings of this research, can indicate several key recommendations to minimize its negative consequences. Those are, implementing responsible AI practices, enhancing data quality and diversity, promoting transparency and accountability, and establishing robust regulatory frameworks. By giving careful consideration to these ethical concerns and adopting a collaborative approach involving technology developers, policymakers, and the public, we can harness the full potential of AI while minimizing the negative consequences it may bring to society.

***Keywords:*** Artificial Intelligence (AI); AI technology; Ethical Concerns; Negative Consequences; Approach;

---

[1] General Sir John Kotelawala Defence University. waruniwithanachchi@gmail.com

# PREVALENCE OF THALASSEMIA IN KURUNEGALA DISTRICT: MAP BASED ANALYSIS.

*R.D.M. Damayanthi*[1]

Thalassemia, a hereditary blood disorder, poses a significant public health concern in many regions, including Kurunegala District in Sri Lanka. This research aims to investigate the prevalence patterns and trends of Thalassemia patients, with a specific focus on patients who registered at the National Thalassemia Center in Kurunegala District. The main objective of this study is making geospatial analysis using ArcGIS software to map the distribution of Thalassemia patients across the district and identify the patterns and trends. The most Thalassemia patients have recorded in Kurunegala district. So the research problem centers on understanding the spatial distribution, as well as exploring potential contributing factors that may influence the prevalence patterns. Data were collected from medical records and interviews affected children and their families as secondary data and primary data. The maps created through ArcGIS and Excel software showcased distinct spatial patterns of Thalassemia and illustrating areas with varying prevalence rates. special finding is Most of thalassemia patients are in East Half of the Kurunegala district and it spread to the outer area. Most of that patients (more than 50%) are children. Such insights can provide valuable information for health authorities, policymakers, and healthcare practitioners to better allocate resources and implement targeted interventions for Thalassemia prevention, management, and awareness campaigns. Moreover, this research contributes to the growing field of spatial epidemiology and highlights the potential benefits of incorporating geospatial analysis in addressing public health challenges like Thalassemia in kurunegala district.

***Keywords:*** Thalassemia, Prevalence Patterns, Spatial distribution, Arc GIS, Geospatial Analysis.

[1] Kelaniya University of Sri Lanka, Kelaniya. rdmdamayanthi@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Linguistics & Language Studies




**FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES**
**RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE**

# සිංහල භාෂාව ලේඛනගත කිරීමේ දී ඇති වන සංකීර්ණතා මඟහරවා ගැනීමට අජිත් තිලකසේන විසින් යෝජිත ප්‍රායෝගික සිංහල හෝඩිය පිළිබඳ අධ්‍යයනයක්

*ඩබ්ලිව්.එම්.එන්.ඩී. අබේරුවන්*[1] *එම්.ජී.කේ.එල්. බණ්ඩාර*[2]

සිංහල භාෂාව සංකීර්ණ වූ භාෂාවකි. මෙම සංකීර්ණත්වය කථනයේ දී ඇති වූවක් නොවන අතර ලේඛන කටයුතු සිදු කිරීමේ දී ඇති වූවකි. පිළිගත් සම්මත අක්ෂර මාලාවේ දීර්ඝ ස්වර දැක්වීමේ දී යොදන සංකේතවල විවිධත්වය, ණ-න, ල-ළ, ශ-ෂ-ස අක්ෂර භේදය, අල්ප්‍රාණ මහප්‍රාණ භේදය දැක්වීමේ දී ඇති වන දෝෂ පදනම් කොට ගත් ගැටලුවකි. පුද්ගල භාෂාන්තර ඥානය වර්ධනය කර ගැනීම උදෙසා අදාළ භාෂාවේ අක්‍ෂර රූපාවලිය දැන සිටීම ඉතා වැදගත් වේ. භාෂාවක සරල හා නිරවුල් අක්‍ෂර මාලාවක් පවති නම් එම භාෂාව ලේඛන ගත කිරීමේ දී හට ගන්නා වූ ව්‍යාකූලතා අවම වේ. සිංහල භාෂාව මුඛ්‍ය භාෂාව කර ගත් ලාංකිකයන් මෙන් ම භාෂාන්තර ඥාන වර්ධනයට උත්සුක වන දේශදේශාන්තර ජනයාහට සරල නිරවුල් අක්‍ෂර මාලාවක අවශ්‍යතාව නිරන්තරයෙන් පවතී. කථනයේ දී ශබ්ද වසයෙන් නිකුත් කෙරෙන වචන ලේඛනයේ දී විවිධ සංකේත මඟින් නිරූපණය වේ. එක ම ශබ්දයක් සඳහා වන විවිධ සංකේත ලේඛනය තුළ ගැටලු සහගත බැවින් ඒ සඳහා පිළියම් සොයන්නන් අතර වූ අජිත් තිලකසේන ස්වාධීන ව මෙතෙක් පැවති සම්මතය පසෙක ලා නව්‍ය ක්‍රමයක් ගොඩනඟා ගත් ලේඛකයෙකි. ඔහු විසින් සිංහලයට හඳුන්වා දෙනු ලැබූ අක්‍ෂර මාලාව 'ප්‍රායෝගික සිංහල හෝඩිය' නම් විය. සිංහල භාෂාව ලේඛනගත කිරීමේ දී ඇති වන සංකීර්ණතා මඟහරවා ගැනීම උදෙසා ප්‍රායෝගික සිංහල හෝඩිය සුදුසු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වන අතර සිංහල අක්ෂර මාලාවේ පවතින ගැටලු හඳුනා ගැනීම, අජිත් තිලකසේනගේ ප්‍රායෝගික සිංහල හෝඩිය පිළිබඳ අවබෝධ කර ගැනීම මෙහි අරමුණු වේ. සිංහල භාෂක සමාජයට මෙන් ම සිංහල භාෂා ශක්‍යතාව වර්ධනයට උත්සුක අන්‍ය භාෂක සමාජයන්ට ද මෙය වැදගත් වේ. විද්වත් දේශන, පුවත්පත් ලිපි, භාෂාත්මක ලිපි, විද්වත් ග්‍රන්ථාදි මූලාශ්‍රය පරිශීලනය කොට ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තොරතුරු සම්පාදනය කොට ගත් අතර සිංහල ලේඛනය සඳහා යෝජනාවක් පමණක් වූ ප්‍රායෝගික අක්ෂර මාලාව පිළිබඳ භාෂක සමාජය දැනුවත් කිරීම මෙහි අවසන් ප්‍රතිඵලය වේ. සිංහල භාෂාව වසර ගණනාවක් පුරා වෙනස්කම් රාශියකට භාජනය වෙමින් වත්මන් තත්ත්වය දක්වා පරිණාමය වී ඇත. භාෂාවක් නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය විය යුතු බවත්, වර්තමානය හා සසඳන කල සිංහල අක්ෂර මාලාව නිරවුල් වීම මඟින් ජාත්‍යන්තර වසයෙන් සාර්ථක ගනුදෙනුවක නිරත විය හැකි බවත් මෙමඟින් එළඹිය හැකි නිගමන වේ.

***ප්‍රමුඛ පද:*** සිංහල භාෂාව, භාෂා පරිණාමය, ප්‍රායෝගික සිංහල හෝඩිය, භාෂණය, ලේඛනය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, niroshanidilrukshi1998@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, kavindu.0098@gmail.com

# ලංකාවේ නූතන රූපවාහිනී වැඩසටහන් නිවේදකයන් සිංහල, ඉංග්‍රීසි මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් භාවිත කරන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*එච්.එන්.ටී. සිල්වා [1]   කේ.ටී.එස්. තිලකරත්න [2]*

ලංකාවේ වර්තමාන ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකා තුළ සිංහල භාෂා මාධ්‍යයෙන් දෛනික ව රූපවාහිනී වැඩසටහන් රැසක් විකාශනයට පත් කරනු ලබයි. ඒ අනුව එම රූපවාහිනී වැඩසටහන් මෙහෙයවනු ලබන ප්‍රවීණ මෙන් ම ආධුනික (නවක) නිවේදක නිවේදිකාවන් බොහෝ පිරිසක් හඳුනාගත හැකි ය. මොවුන් වැඩසටහන් නිවේදන කටයුතු සිදු කිරීමේ දී බොහෝ විට සිංහල භාෂා මාධ්‍ය ප්‍රමුඛ කොට ගත්ත ද යම් අවස්ථාවල දී විවිධ ප්‍රමාණයන්ගෙන් සිංහල හා ඉංග්‍රීසි භාෂා එකට මිශ්‍ර වූ මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් භාවිත කරන ආකාරයක් දැකගත හැකි ය. මේ අනුව ලංකාවේ නූතන රූපවාහිනී වැඩසටහන් නිවේදකයන් නිවේදන කටයුතු සිදු කිරීමේ දී මෙලෙස මිශ්‍ර  භාෂා ව්‍යවහාරයක් යොදා ගැනීම නිසා ඉන් ප්‍රකාශ වන අර්ථය වටහා ගැනීමේ දී ශ්‍රාවකයන්ට ගැටලුවක් ඇති වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර මෙලෙස නූතන රූපවාහිනී නිවේදකයන් නිවේදන කටයුතුවල දී මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් භාවිත කිරීමට හේතු වන කරුණු සහ එතුළින් ශ්‍රාවකයන්ට අර්ථ සූචනය කර ගැනීමට යම් ගැටලුවක් ඇති වේ ද, නො වේ ද යන්න අධ්‍යයනය  කිරීම මෙහි පර්යේෂණ අරමුණ වේ. ඒ අනුව ලංකාවේ ප්‍රධාන රූපවාහිනී නාලිකාවන් කිහිපයක විකාශනය වූ තෝරාගත් රූපවාහිනී වැඩසටහන් කිහිපයක් පමණක් පර්යේෂණ සීමාව වසයෙන් ගෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ එම නිවේදකයන් වැඩසටහන් නිවේදනයේ දී භාවිත කළ භාෂා ව්‍යවහාරය පිළිබඳ ව විශේෂයෙන් නිරීක්ෂණය කරමින් දත්ත හඳුනාගෙන එලෙස ලබා ගත් සියලු දත්ත මනාව විශ්ලේෂණය කොට මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙහි දී යම් නූතන කථන විලාසිතාවක් ලෙසත්, සාමාන්‍ය ජනතාව බොහෝ දුරට දැනට භාවිත කරන භාෂා ව්‍යවහාරයක් වන නිසාත්, සමහර නිවේදකයන්ගේ ආධුනික බව නිසාත්, නිරායාසයෙන් ම මුවගට නැගෙන භාෂා ව්‍යවහාරයක් වන නිසාත්, නිවේදනයට යම් පහසුවක් හා සජීවී කථන ස්වරූපයක් ගෙන දෙන නිසාත්, සමහර සිංහල වචන ප්‍රකාශ කරනවාට වඩා ඒවායෙහි ඉංග්‍රීසි වචන ප්‍රකාශ කිරීම ඉතා පහසු වන නිසාත්, බටහිර සංස්කෘතිය හා මුසු වූ යම් උසස් සමාජ තත්ත්වයක ස්වරූපයක් නිරූපණය කිරීමට අවශ්‍ය වන නිසාත්, නිවේදකයන්ගේ සාමාන්‍ය කථන ස්වභාවය හා වැඩසටහනේ ස්වභාවය නිසාත් සහ යම් පිරිස් විවිධ වෙනත් වෘත්තීන්හි කටයුතු කරන අතරතුර පැමිණ නිසි පුහුණුවකින් හෝ අත්දැකීමකින් තොර ව ඉතා කෙටි කාලයකින් නිවේදන කටයුතුවල නිරත වන නිසාත් වැනි විවිධ හේතු සාධක මත සමහර නිවේදකයන් තම නිවේදන කටයුතුවල දී මෙසේ මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් භාවිත කරනු ලබන බව පර්යේෂණ ප්‍රතිඵල වශයෙන් අනාවරණය කරගත හැකි විය. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයට අනුව සෑම රූපවාහිනී වැඩසටහන් නිවේදකයෙකු ම මෙසේ මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් නිවේදන කටයුතුවල දී යොදා නොගන්නා බවත්, එය සාමාන්‍යයෙන් නිවේදකයන්ගේ වෘත්තීයමය පුහුණුව හා අත්දැකීම මත සහ වැඩසටහනේ සමස්ත ස්වභාවය මත සම්පූර්ණයෙන් ම රඳා පවතින බවත්, ඒ අනුව නූතන සියලු රූපවාහිනී වැඩසටහන් නිවේදකයන්ගෙන් ඉතා අඩු පිරිසක් පමණක් යම් සමාජ සංස්කෘතික හේතු සාධක කිහිපයක් මත පිහිටා මෙලෙස මිශ්‍ර භාෂා ව්‍යවහාරයක් භාවිත කරමින් රූපවාහිනී වැඩසටහන් නිවේදන ක්ෂේත්‍රය වර්තමානය තුළ යම් වෙනස් වූ මුහුණුවරකින් ශ්‍රාවකයන් වෙතට ගෙනයන්නට උත්සාහ ගන්නා ආකාරයත්, ඒ කෙසේ ද යත් නූතන සමාජයේ දිවි ගෙවන බොහෝ ශ්‍රාවකයන්ට මිශ්‍ර භාෂා ව්‍යවහාරය භාවිතයෙන් සිදු කරන වැඩසටහන් ශ්‍රවණයේ දී අර්ථ සුචනය කර ගැනීමට කිසිදු ගැටලුවක් ඇති නොවන බවත් මෙසේ පර්යේෂණ නිගමනයන් වසයෙන් පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පද :*** *නූතන රූපවාහිනී වැඩසටහන්, නිවේදකයන්, සිංහල ඉංග්‍රීසි මිශ්‍ර භාෂා ව්‍යවහාරය, අර්ථ සුචනය*

[12] භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nadunsilva1997@gmail.com, thiwankashyamalee@gmail.com

# A CRITICAL STUDY ON THE MORPHOLOGICAL PROCESSES USED BY SRI LANKAN FACEBOOK USERS IN DEFINING SRI LANKAN VARIETY IN ENGLISH.

*J.W.M. Jayawardhana*[1] *N.A.D.P.S. Nissaka*[2] *W.M.A.K. Warnasooriya*[3] *W.M.P.J. Wasala*[4]

A morphological process is a word formation process which adds new vocabulary into a language. Sri Lankan English (SLE) is an emerging concept of varieties in English that has links with native languages in Sri Lanka. In every language, vocabulary plays a pivotal role in verbal and written communication. This study investigates the application of morphological processes by Sri Lankan Facebook users and their contribution in forming a new set of vocabulary in English with special reference to bilingual speakers in Sri Lanka in using Facebook as a Social platform. Qualitative Research methodology involved in collecting and anodizing data in this research and 30 posts from a personal blog called "Nimesh" were analyzed. Only four morphological processes such as borrowing, compounding, clippings, and acronyms were employed to signify the process of word forming and generation of neologism in relation to **a** new concept of English language Varieties called "Sri Lankan English". Thus, the study signifies that these four processes apparently scaffold the generation of neologisms in this new variety in relation to social media platforms in Sri Lanka. Moreover, the discussion on the results of the study indicates that the Sinhala and Tamil languages have affected the expansion of SLE vocabulary. Additionally, the study illustrates that the Facebook users are very close to these word formations and a new set of vocabulary of SLE. Therefore it is obvious that these research findings witness the skills of humans and their behaviors to form new language changes in relation to the aforesaid linguistic categories of word formation. It also provides an insight on cultural, social, and linguistic characteristics to spread a positive attitudinal change among the people about Sri Lankan English.

***Keywords**:* Sri Lankan English, word formation, varieties, vocabulary, Facebook users

---

[1234] University of Kelaniya. jayawardhanagewathsala@gmail.com, supeshalapn@gmail.com, arunikaushalya1999@gmail.com, jayanganiwasala78@gmail.com

# EXPLORING HOW INTERVIEWERS ASSESS THE ENGLISH LANGUAGE COMPETENCE OF THE INTERVIEWEES THROUGH PRONUNCIATION

*E.M.E. Premaratna*[1]

Sri Lanka is a highly literate country where over 92% of its population knows at least one of the following languages: Sinhala, Tamil and English languages. However, a minority of the population possesses sound knowledge and fluency with standard pronunciation in English within the country. English is a lingua franca and is a link language according to the Sri Lankan constitution. Therefore, employers among other reasons look for local employees who speak fluent English. The interviewers evaluate the interviewees on their fluency and knowledge of English as the majority of current organisations use English extensively. Communication plays a crucial role in interacting with native speakers of English. Therefore, employers prioritise fluency in pronunciation of the English language in their employees. This study intends to explore the methods of evaluation used by interviewers to assess the English language competence of interviewees through their pronunciation. The study uses a qualitative approach. The researcher obtains primary data from semi-structured interviews conducted with interviewers. The sample includes five participants. The sample consists of organisations selected through convenient sampling. The selected organisations are multinational companies in Sri Lanka. The study provides insight into the contemporary evaluation methods used by interviewers to evaluate English language proficiency through pronunciation. The results of the study highlight the importance of standard pronunciation for effective communication in English in the fields where individuals have to deal with native speakers of English. The evaluation methods focused on pronunciation, stress and intonation, phonetic accuracy and intelligibility. Therefore, this research sheds light on the evaluation methods used by interviewers about oral skills in English in Sri Lanka. It provides a foundation for further research into the field. The research helps interviewers and interviewees with their concerns about English Speaking Skills in the Country.

***Keywords**:* Fluent English Speakers, Interviewers, Interviewees, Oral Skills, Standard English Pronunciation

---

[1] University of Ruhuna of Sri Lanka, Matara. mahoda.eranjana@gmail.com

# A STUDY ON COGNITIVE REACTIONS TOWARDS ENGLISH AS A MEDIUM INSTRUCTION OF THE UNDERGRADUATES WHO PURSUE A DEGREE IN SINHALA AT THE UNIVERSITY OF RUHUNA.

*G.D.I. Chamathsara*[1]

Cognitive reactions towards language are evaluative attitudes that reside in the human mind with reference to a particular language. Those cognitive reactions are demonstrative and effective in understanding the attitudes of learners. Moreover, the mental reactions of humans to languages cannot be directly observed, yet recognizable through verbal or physical treatments of speakers of a particular language. Therefore, this study focuses on the cognitive reaction of the 4000-level undergraduates whose study medium is Sinhala at the Faculty of Humanities and Social Sciences of the University of Ruhuna towards English as a medium of study. This study's research methodology adopts qualitative and quantitative methods such as interviews and questionnaires. Thirty participants engaged in the data collection process. Accordingly, the study investigates why the students select Sinhala as the medium of study while those students have the opportunity to start the learning process in English in a context where English is taught as a mandatory second language in universities and the Sri Lankan education system. In accordance with research findings, the majority of the learners state that English is essential, yet poor knowledge obstacles them to choosing English as the medium. Furthermore, the informants demonstrate their desire to continue learning English and emphasize finding a possible way to exterminate hardships. According to the students' cognitive reactions and their nature on to the selection of study medium, it is clear that students have a positive attitude towards English a language yet those students have a negative attitude towards their own usage of English language skills. Thus, the researcher tries to suggest taking necessary initiatives and changes in the activities used in English as a second language classrooms by enabling them to follow degrees in English.

***Keywords:*** Cognitive Reactions, English Language, Medium of Study, Sinhala, Undergraduates

[1] University of Ruhuna, Matara, Sri Lanka. muthumi1607@gmail.com

# THE IMPACT OF LANGUAGE CRISIS IN SRI LANKA.

*A.B. Nilavudeen*[1]

A crisis is an instance where something or someone is dealing with one or more extremely significant issues. Similarly, language contributes significantly to social crises. 'Language crisis' is the name given to it. Nevertheless, language is a crucial component of human communication and one of the main forms of oral, written, and physical (signed) expression. According to the Sri Lankan context, the main spoken and official languages are Sinhala and Tamil, with English being referred to as the "link language" in this multilingual nation. So, since Sri Lanka is a multiethnic nation, it is important to be bilingualism or trilingualism in Sri Lanka most of the time. But does the organization or the government adhere to it? Furthermore, spelling mistakes are common in Sri Lankan public places, such as on billboards, application forms, and even social media descriptive posts. Why did that happen? By using mixed methods such as qualitative and quantitative methods this study will be carried forward. By using random sampling interviews and social media analysis this study will basically focus on. To identify how effectively bilingualism or trilingualism is being used in our country's context as a multi-language country. Also, to analyze how carelessly the spelling mistakes have been continuing in public posters, etc. Nevertheless, to identify what causes these errors to continue in our community. According to the data, it shows that trilingualism hasn't been used properly, not in all places however in a few places it is there. Moreover, due to the carelessness, illiteracy of a second language spelling mistakes are still happening in many situations. Therefore, it is important to foster successful communication, language literacy, and cultural understanding in Sri Lanka to reduce the impact of the language crisis further.

***Keywords:*** Sri Lanka; Trilingualism; Language; Crisis; Diversity

[1] University of Peradeniya. akeedha.24@gmail.com

# SPATIAL THEORY: USE OF SPACE AS A METAPHOR IN THE NOVEL, SEVEN MOONS OF MAALI ALMEIDA BY SHEHAN KARUNATHILAKA.

*S.J.K.R.K. Kumarihami*[1]*

Space, the domain of settings and surroundings of events, characters and objects in literary narrative, along with other domains (story, character, time and ideology), constitutes a fictional universe. Space is a semantic construct built with linguistic structures employed by the literary text. Spaces are fictional places and locations which provide a topological determination to events and states in the story. It is distinguished through textual manifestations. This research investigates the spatial topologies demonstrated in the text *The Seven Moons of Maali Almeida* by Shehan Karunathilaka. The main objective of the research is to examine how space is used as a metaphor by Shehan Karunathilaka to represent semantic interpretations. The methodology of the study is qualitative while the research method is textual analysis. According to the findings, amongst the spaces, Karunathilaka has prominently used urban, rural and terrorism spaces as metaphors. The function of rural metaphors is to illustrate the rural settings, superstition, its authenticity and lack of corruption. However, through his metaphors of rural spaces, it depicts rural exoticism. The urban metaphors represent the city life, its hidden affairs, political inferences and corruption. Finally, Karunathilaka uses the terrorism as a metaphor to depict the LTTE acts and the political connections with terrorism. He has used metaphors of places and things of popular urban and rural spaces to pragmatically denote the Sri Lankan contextual inferences. In conclusion the urban and terrorist metaphors are highly correlated with the content of the text. It demonstrates the specific contemporary contextual speculations.

***Keywords:*** Exoticism, Metaphor, Space, The Seven Moons of Maali Almeida, Topologies

[1] University of Ruhuna, Matara. ridmikalpani@gmail.com

# A COMPARATIVE ANALYSIS ON PHONETICS: A STUDY OF SOUTHERN AND WESTERN SINHALA DIALECTS IN THE SRI LANKAN CONTEXT

*V.K.N. Gamage*[1]

This Qualitative Meta- Analysis explores the phonetic aspects of the Southern Sinhala Dialects and the Western Sinhala Dialects within the Sri Lankan context. This study gathers and incorporates the existing literature in order to provide a comprehensive outline on the linguistic variation, articulatory gestures, and phonological representation that distinguish these two Sinhala dialects. This study involves the phonetic distinctions found within the Southern Sinhala Dialect and the Western Sinhala Dialect, clarifying their distinctive features and providing a base for the future research investigations. It explores into the unique phonological features including the Vowel and consonant variations, Articulatory aspects including the Manner of articulation, Place of articulation and the Prosodic characteristics including the intonation and stress in the two different dialects with the exploration on the previously done literature. With the analysis of the existing scholarly works that explored the Southern and Western dialect variations, it was identified that the changes in the vowel systems, the variations in consonant articulation, the stress patterns used in the dialects and the utilization of intonation in expressing results in the variations in the two dialects. This study facilitates a deeper understanding of the phonetic differences between Southern and Western Sinhala Dialects while facilitating new insights for future studies on phonetic variations and filling the gaps of the previous researches in Sri Lanka. By exploring these details, this study enhances the knowledge on linguistics and the linguistic diversity in Sri Lanka.

***Keywords:*** Southern Sinhala Dialect; Western Sinhala Dialect; Phonetic Variation; Meta- Analysis; Linguistic Diversity

[1] University of Ruhuna, Matara. kav11nishi@gmail.com

# MORPHOLOGICAL ANALYSIS OF SRI LANKAN YOUTUBE ADVERTISEMENTS

*H.B.S.S. Chandrarathna*[1] *S.P.P.A. Gunawardhane*[2] *W.S. Madubashini*[3]

In Sri Lanka, the trend of YouTube advertising has gained prominence as one of the most productive ways of promoting productions, closely intertwined with the utilization of morphological processes within the Sri Lankan English (SLE) linguistic landscape. In the context of marketing goods and services, producers use morphological processes as a strategy to attract customers while popularizing advertisements. This study examines how frequently are morphological processes utilized in SLE within the context of YouTube advertising and aims to analyze the morphological processes used in Sri Lankan English concerning the selected YouTube advertisements and to identify the frequency of these morphological processes. Moreover, this paper investigates the effective usage of these processes by YouTube advertisers. In this study, data were collected using primary and secondary data collection methods. After conducting a comparable observation, four types of varying YouTube videos were selected for this investigation. Among the selected advertisements, compounds, borrowings, reduplications, and tags and expressions were widely used in SLE. Sinhala being the superstrate of Sri Lanka, its influence over these processes is significant. On the other hand, the co-existence of English and Sinhala languages influences the creation of new words which ultimately results in code-mixing and code-switching. The findings of the study reveal that compounding is the most productive and frequently used morphological process in the selected YouTube advertisements. The overall study depicts that the compounding and borrowings have coined new and unique words in SLE and most of the words are shaped by the influence of the Sinhala language. Thereby, YouTube advertisers use morphological processes to familiarize products among the community with the aid of language.

***Keywords**:* borrowings, compounding, morphological processes, Sri Lankan English, YouTube advertisements

[123] University of Kelaniya, Sri Lanka. salinichandrarathna07@gmail.com, prathibhaaaesh20@gmail.com, sulakshanamadubashini630@gmail.com

# UNRAVELING NOSTALGIA: FORM-CONTENT HARMONY IN BRINGING TONY HOME RELATED TO ITS LINGUISTIC STRUCTURE AND POETIC STRUCTURE

*H.M.T.T. Dhananjanee*[1]

This study explores the novel *Bringing Tony Home* by Tissa Abeysekara, focusing on the chemistry between its linguistic and poetic structures and their manifestation of the form-content relationship within the text evoking the writer's nostalgia for the past. The novel portrays the life events of the narrator, a filmmaker, recounting his youthful adventures and the return to his childhood village to reminisce about the past and bring back his beloved dog, Tony, to his new home. This qualitative study employs Sosnovskaya's Analytical Reading as a methodology to analyze linguistic elements such as phonetics, phonology, morphology, syntax, semantics, pragmatics, and discourse analysis, as well as poetic elements like tropes. Through a three-chapter structure, the novel unfolds various periods of the narrator's life, with the first and last chapters linking with the second chapter through introspective flashbacks, emphasizing the theme of nostalgia. The first-person narration further immerses the reader into the narrator's emotional experiences, while the use of compound sentences, hyphenated words, and dashes enriches the detailed descriptions, enhancing the theme of nostalgia for the past. The incorporation of Local Expressions and phrases and code switching reflects the writer's identity as a Sri Lankan, arousing cultural familiarity and historical connections. Additionally, the study analyzes the use of tropes such as the month of March, pastoral elements, and diction of fairytales, which further contribute to the narrator's nostalgia and cultural associations. The novel's poetic structure, including auditory and visual imagery, creates a cinematic quality, allowing readers to vividly experience the narrator's recollections. The symbolic significance of train sounds and whistles underlines the transient nature of life and memories. Ultimately, the findings indicate that the linguistic and poetic structures in *Bringing Tony Home* are intertwined and inseparable, effectively manifesting the theme of nostalgia for the past, and presenting readers a prevailing vision into the profound form-content relationship within the text. The novel's linguistic richness and poetic beauty offer readers a powerful insight into the complexities of the human experience and the lasting connections that nostalgia can evoke.

***Keywords:*** content, form, linguistic, nostalgia, poetic

[1] University of Ruhuna, Wellamadama, Matara. thisarithamoda2000@gmail.com

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Society & Culture



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# සංස්කෘතිකාංගයක් වන ග්‍රාමීය මිථ්‍යා විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් කිහිපයක් ඇසුරින්)

*එල්.ඒ.ආර්.එස්.එන්. ලියනආරච්චි* [1]

මිථ්‍යා විශ්වාස වූ කලි මිනිසා විසින් ගොඩනගා ගත් කළ යුතු දෑ සහ නොකළ යුතු දෑ වල එකතුවක් ලෙස දැක්විය හැකි ය. මේවා එක් එක් පුද්ගලයාගේ විශ්වාසය මත රඳා පවතී. කෙසේ වෙතත් විද්‍යාව එතරම් දියුණු මට්ටමක නොමැති කාලවකවානුවක දී මිථ්‍යාව රජ කරන ලදී. එහෙත් තව මත් මිථ්‍යා විශ්වාසයන් පසුපස යන කොටසක් ලෝකය තුළ වාසය කරති.  මෙම විශ්වාසයන් ලෝකයේ රටවල් අනුව විවිධාකාරයෙන් වෙනස් වී ඇත. විශ්වාස පිළිබඳ ව ගත් කල්හි එක් පිරිසකට  තමන්ගේ විශ්වාසයන් සහ ඇදහිලි සාරවත් ලෙසත්, අනෙක් අයගේ විශ්වාස සහ ඇදහිලි සාරවත් නොවන දෙයක් ලෙසත් දැකිය හැකි ය. මෙම මිථ්‍යාව වූ කලි සෑම සංස්කෘතිකාංගයක ම  පාහේ දැකිය හැකි කොටසකි. මෙලෙස නිර්මිත අතීතයේ සිට පැවත එන විශ්වාස පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ද දැකිය හැකි ය.  මෙම මිථ්‍යා  විශ්වාසයන් තුළ එලඹ පැවතීම පුද්ගලයාගේ සාර්ථකත්වය සඳහා මහත් බාධාවකි. එනම් තම වටිනා කාලය, මිල මුදල්, ශ්‍රමය, නිකරුණේ විනාශ වීමකි. මෙසේ පුද්ගලයන් විශ්වාස කරන්නා වූ මිථ්‍යා විශ්වාසයන්හි සත්‍ය අසත්‍යතාවක් පවතී ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. ස්වාභාවික පරිසරයේ සිදු වන්නා වූ ඇතැම් සංසිද්ධීන් සහ සත්ත්ව හැසිරීම් මූලික කොට ගනිමින් ඒවායේ සිදු වන වෙනස්වීම්, පුද්ගල දිවිය හා සම්බන්ධ කොට ගනිමින් මෙම විශ්වාස පද්ධතිය නිර්මාණය වී ඇත. මෙසේ නිර්මිත විශ්වාසයන් කොපමණ පිරිසක් විසින් විශ්වාස කරනවා ද මේවා කොතරම් දුරට මිනිස් දිවියේ එදිනෙදා කාර්යයන්ට බලපෑම් කරන්නේ ද යන්න සොයා බැලීම හා මෙම විශ්වාසයන් කොතරම් දුරට නිවැරැදි ද මේවායේ සත්‍ය - අසත්‍ය භාවය ඔප්පු කළ හැකි ද යනාදිය පෙන්වා දීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ වර්ගය යටතේ සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ දී දත්ත එක්රැස් කිරීමට මූලික වසයෙන් ම ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය යොදා ගනු ලැබී ය. එනම්, මෙහි දී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කවුඩුල්ල නම් ග්‍රාමයේ වයස අවු : 35ට වැඩි පිරිමි පුද්ගලයන් 13ක් හා  අවු : 35ට වැඩි කාන්තාවන් 20 දෙනෙකු නියැදියක් ලෙස ගෙන ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් තොරතුරු එක් රැස් කර ගන්නා ලදී. මේ ඇසුරින් ලබාගත් දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. මෙහි ප්‍රතිඵල ලෙස දැකිය හැකි වූයේ, මිථ්‍යා විශ්වාස වූ කලි පුද්ගලයන්ගේ මනෝමූලික සිතුවිල්ලක් වන බවත්, මේවාට පටහැනි ව ක්‍රියා කිරීමට පුද්ගලයන් තුළ සංස්කෘතික බියක් පවතින බවත් ය. එසේ ම තව ද, මෙම ග්‍රාමය සතු ව සමාජ විද්‍යාත්මක ව පිළිගත හැකි මෙන් ම කිසිසේත් ම පිළිගත නොහැකි විශ්වාස පද්ධතියක් පවතින බවත් මෙම එක් එක් විශ්වාසයන් පුද්ගලයාගේ මානසික මට්ටම අනුව සහ පුද්ගලයාගේ සමාජ තරාතිරම අනුව වෙනස්වීම්වලට භාජනය වන බවත් දැක ගත හැකි විය. සමස්තයක් ලෙස ගත් කල මෙම පර්යේෂණය මඟින්  මෙම ග්‍රාමයේ වාසය කරන මිනිස්සු මිථ්‍යා විශ්වාසයන් කොතරම් දුරට විශ්වාස කරත් ද, ඔවුන් මෙම විශ්වාසයන් සංස්කෘතිකාංගයක් ලෙස එදිනෙදා අනුගමනය කරන්නේ ද, ඔවුන් මෙමඟින් අපේක්ෂා කරන අරමුණු කෙබඳු ද යනාදිය පිළිබඳ ව මනා නිගමනයකට එළඹිය හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ඇදහිලි, ග්‍රාමීය, මිථ්‍යා, විශ්වාස, සමාජ

[1] රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, shanikanethminiliyanaarachchi@gmail.com

# ශ්‍රී ලාංකික කාපිරි ප්‍රජාව මුහුණ දෙන රැකියා අර්බුධයට විසඳුම් යෝජනා කිරීම වෙනුවෙන් සිදු කෙරෙන සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

(පුත්තලම දිස්ත්‍රික්කයේ සිරම්බිඅඩි ප්‍රදේශය ඇසුරෙන්)

*එච්.එම්.එන්.ටී. හේරත්* [1]

ලෝකයේ විවිධ උපසංස්කෘතීන් විසින් සාමූහික ව ජීවත් වීමට ඇති කරගත් පොදු එකගතාවේ ප්‍රතිඵලයක් වසයෙන් ගෝලීයකරණයත් සමග සංස්කෘතික විසරණය සිදු විය. අප්‍රිකානු-ශ්‍රී ලාංකිකයන් හෙවත් පොදුවේ ශ්‍රී ලාංකීය කාපිරි ප්‍රජාව වසයෙන් ප්‍රචලිත ජන කොටසක් දිගු කාලයක් තිස්සේ මෙරට වාසභූමි කරගෙන දිවි ගෙවන බව දන්නෝ සීමිත ය. මෙරට ප්‍රධාන සංස්කෘතියට අනුගත වීම, එම අනුවර්තනයේ දී පවා ඔවුන්ගේ උපසංස්කෘතික උරුමයන් නො නැසී පවත්වා ගැනීමට සමත් වීම මොවුන්ගේ සුවිශේෂීත්වය වේ. වහල් සේවය වෙනුවෙන් මෙරටට ආනයනය කළ මෙම කණ්ඩායම, වහල් සේවය නොමැති නූතනයේ රැකියා සහ යැපුම් මාධ්‍යය අහිමි වීමේ අර්බුදයට මුහුණ දෙන සංවර්ධනය විය යුතු දුර්වල ජීවන මට්ටමක පසු වෙති. මෙම ප්‍රජාවගේ රැකියා අර්බුදයට විසඳුම් යෝජනා කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර, විරැකියාව නිසා මුහුණ දී සිටින අවදානම් තත්ත්වය අනාවරණය කිරීමත්, ඔවුන්ගේ අනන්‍යයතාව වන සංස්කෘතික ප්‍රතිමානයන් සහ ඇගයුම් පද්ධතිය අනාවරණය කිරීමත්, ඔවුන් සතු සම්පත් භාවිතයෙන් ආයෝජනය අවස්ථා ඉස්මතු කර ගැනීමට මඟ පෙන්වීම අධ්‍යයන අනුඅරමුණු වේ. ප්‍රාථමික සහ ද්විතීයක දත්ත දෙවර්ගය ම භාවිත කොට විස්තරාත්මක අධ්‍යයන ක්‍රමවේදය භාවිතයෙන් අධ්‍යයනය සිදු කර ඇත. අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි සංස්කෘතික හරස් වීම්, වාර්ගික මිශ්‍රවීම් මෙන් ම ගෝලීයකරණය මධ්‍යයයේ දීත් සංස්කෘතික ප්‍රතිමානයන් ආරක්ෂා කර ගනිමින් ප්‍රධාන සංස්කෘතියට අනුවර්තනය වීමට සමත් වූ ශ්‍රී ලාංකික එක ම ජන වර්ගය වේ. ඔවුන්ගේ ජන සංස්කෘතිය ජනප්‍රිය කොට ජන මාධ්‍යය, සංචාරක කර්මාන්තය, සුළු ස්වයං රැකියා පුහුණුව ඔස්සේ ඔවුන් විසින් මුහුණ දෙන විරැකියාවට පිළියම් යෝජනා කළ හැකි ය. මෙරට සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට සක්‍රීය කණ්ඩායමක් වසයෙන් ඔවුන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය ඉංග්‍රීසි ඇතුළු භාෂා පුහුණුව සහ නූතන තාක්ෂණික හුරුව වර්ධනය කළ යුතු වේ. මෙම සංවර්ධන කටයුතු සාර්ථක කරගැනීමට මඟ පෙන්වන විවික්ත පර්යේෂණවල හිඟතාව අවම කර ගැනීම වෙනුවෙන් නවක පර්යේෂකයන් අභිප්‍රේරණය කළ යුතු බව යෝජනා කෙරේ.

***ප්‍රමුඛ පද:*** අනුවර්තනය; අප්‍රිකානු-ශ්‍රී ලාංකිකයන්; උපසංස්කෘතිය; විරැකියාව; සංචාරක කර්මාන්තය

[1] ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය nirunditharushika@gmail.com

# ශ්‍රී ලංකාවේ ආගම්වල නූතන සමාජ කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්.ඒ. නදීෂා මධුෂානි රාජපක්ෂ*[1]

මිනිසා විසින් හඳුනාගත් අපූර්ව සංකල්පයක් ලෙස ආගම (Religion) හැඳින්විය හැකි ය. සමාජය විසින් නිර්මාණය කර ගැනුණු ආගම සෑම කල්හි ම සමාජ අපේක්ෂා වෙනුවෙන් පෙනී සිටියි. ආගම යන්නෙන් ශ්‍රී ලංකාවේ ආගම් ව්‍යවහාරයෙහි ලා ගැනෙන හින්දු, බෞද්ධ, කතෝලික, ඉස්ලාම් යන ආගම් අදහස් කෙරේ. මෙම සෑම ආගමක ම මූලික ඉගැන්වීම්වල යම් විෂමතාවක් පවතී. නිදසුන් ලෙස නිර්වාණය, දෙවියන් සමඟ එක් වීම ආදිය දැක්විය හැකි ය. එසේ මූලික ඉගැන්වීම්වල යම් විෂමතාවක් පැවතුණ ද පොදුවේ මෙම සෑම ආගමක් ම සමාජ කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ බවට පත්වන්නේ ශ්‍රී ලංකාවේ සෑම ආගමක් ම සතු ව පවතින නූතන සමාජ කාර්යභාරය පිළිබඳ අවධාරණය කරලීමයි. දේශපාලන, ආර්ථික, සමාජීය හා ආගමික යන ක්ෂේත්‍රයන්හි පවතින අභියෝග ජය ගැනීම සඳහා ආගම සතු වන නූතන සමාජ කාර්යභාරය කුමක් ද යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වසයෙන් මූලාශ්‍රය අධ්‍යයනය මඟින් තොරතුරු ලබා ගනිමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ශිල්ප අන්තර්ගත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කෙරේ. සමාජය තුළ ඇති වන ආගමික හා වාර්ගික ගැටුම් ආදිය නිරාකරණය කර ආගමික සංහිඳියාව ඇති කරලීම ආගම සතු ප්‍රධාන කාර්යභාරයකි. මීට අමතර ව දේශපාලන ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන විවිධ අර්බුදකාරී තත්ත්වයන්ගෙන් මෙරට මුදවා ගැනීමට ද ආගම විසින් තම දායකත්වය සපයනු ලබයි. ආගමික ආයතන මඟින් සමාජ සුබ සාධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය සේවා හා මානුෂීය ප්‍රයත්නයන් සඳහා ක්‍රියාකාරී ව සම්බන්ධ වන්නේ ද ආගම සතු නූතන සමාජ කාර්යභාරය ප්‍රකට කරමිනි. ඒ අනුව ආගම විසින් සමාජීය අභියෝගවලට මුහුණ දීමේ දී හා ආන්තික ප්‍රජාවට සහාය දීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙවැනි අභියෝගවලට සාර්ථක ව ප්‍රතිචාර දැක්වීම සඳහා ආගම විසින් ආගමික ප්‍රතිපත්තියට එහා ගිය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ යුතු අතර එය අවධාරණය කරලීම මෙම පර්යේෂණය මඟින් සිදු කෙරේ. සමස්තයක් ලෙස මෙම කරුණු දෙස අවධානය යොමු කළ විට ශ්‍රී ලංකාව තුළ පවතින විවිධ වාර්ගික ගැටුම්, දේශපාලන අර්බුද, ආර්ථික ගැටලු ආදි අභියෝග ජය ගැනීම සඳහා මෙන් ම සමාජ සුභසාධනය සඳහා ද ආගම විසින් ආගමික ප්‍රතිපත්තියට එහා ගිය බහුවිධ කාර්යභාරයක් ඉටු කරන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** අභියෝග, ආගම, නූතන, සමාජ කාර්යභාරය, ශ්‍රී ලංකාව

[1] කැලණිය විශ්වවිද්‍යාලය nadeeshar85@gmail.com

# නුවරඑළිය වතු ආශ්‍රිත දමිළ ප්‍රජාවගේ සංස්කෘතික අනන්‍යතාවේ නූතන ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*බී.එම්.ටී.එල්. බාලසූරිය*[1] *පී.ටී. ඉසුරු ලක්මාල් චන්ද්‍රසිරි*[2] *ඒ.ජී.ඒ. සම්පත්*[3]

ශ්‍රී ලංකාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ව ජීවත් වන දමිළ ප්‍රජාව ඉන්දීය දමිළ සංස්කෘතික අනන්‍යතාව සහිත පිරිසකි. ඉන්දියානු දමිළ සහ ලාංකිය දමිළ වසයෙන් සිදු වන වර්ගීකරණයේ දී සංස්කෘතික අනන්‍යතාව තුළ බොහෝ දේ නව ප්‍රවණතා ලෙස හඳුනාගත හැකි ය. වතු දමිළ ජනතාව අතර බාහිර සහ අභ්‍යන්තර ව විවිධ සාධක මත සංස්කෘතික ලක්ෂණයන්හි වෙනස්කම් පවතී. අධ්‍යයන ක්ෂේත්‍රය වසයෙන් නුවරඑළිය රම්බොඩ ප්‍රදේශය තෝරාගෙන ඇත්තේ එම තත්ත්වය බහුල ව හඳුනාගත හැකි බැවිනි. නුවරඑළිය වතු ආශ්‍රිත දමිළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාව නව ප්‍රවණතා පිළිබඳ ව විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ. වතු ආශ්‍රිත දමිළ ප්‍රජාවගේ සංස්කෘතික ලක්ෂණ වෙනස්වීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම සහ සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් එම ජන ජීවිතයට ඇති වන බලපෑම පිළිබඳ ව විමර්ශනය කිරීම පර්යේෂණයේ අනුඅරමුණු වේ. නුවරඑළිය වතු ආශ්‍රිත ජනතාව මුහුණ දෙන සංස්කෘතික නව ප්‍රවණතා වෙනස්වීම් ලක්ෂණ කවරේ ද යන්න පර්යේෂකයා උනන්දු වූ පර්යේෂණ ප්‍රශ්නය වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මේ සඳහා යොදාගෙන ඇත. අරමුණු සහගත නියැදීම යටතේ අසූදෙනකුගෙන් යුත් නියැදියක් මේ සඳහා සම්බන්ධ කරගෙන ඇත. ප්‍රාථමික දත්ත මූලාශ්‍රය යටතේ සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත ප්‍රශ්නාවලිය යොදාගෙන ඇත. ද්විතීක දත්ත මූලාශ්‍රය යටතේ පොත්පත්, පුවත්පත්, සඟරා සහ පර්යේෂණ ලිපි යොදාගෙන ඇත.  පදනම් න්‍යාය දත්ත විශ්ලේෂණයට යොදා ගැනිණි. කෝවිලේ දී සිදු වූ විවාහ චාරිත්‍ර වර්තමානයේ බොහෝ විට මංගල උත්සව ශාලාවට සීමා වී ඇත. යම්කිසි පුද්ගලයෙකුගේ අවමංගල්‍ය චාරිත්‍ර දින තුනක් පමණ සිදු වුවත් එය වර්තමානයේ එක් දිනකට හෝ දෙදිනකට සීමා වීම සහ චාරිත්‍ර සිදු වන ආකාරය ද වෙනස් වී ඇත. මෙම ජනතාව අතර පැවති උපසංස්කෘතිකාංග ලක්ෂණ, සාමය සහ සහයෝගිතාව වෙනස් වීම නිසා සමාජ සම්බන්ධතා ජාලය දුරස් වී ඇත. සංස්කෘතිකාංග ලක්ෂණ විවිධාංගීකරණය වීම සහ නව මුහුණුවරක් පෙන්වීම නිසා වතුකරයේ වැඩිහිටි දමිළ ප්‍රජාවට යම්කිසි සමාජමය වසයෙන් බාධාවක් වී ඇති බව අධ්‍යයන ප්‍රතිඵල අතර වැදගත් වේ. තම පුරුදු සංස්කෘතිකාංග වෙනස් වීම සහ නව ප්‍රවණතාවන්ට හුරු වීමට ගත වන කාලය සමස්ත දමිළ ජනතාවට අභියෝගයක් වී ඇති අතර, මේ අනුව දේශපාලනික, ආර්ථික, සමාජ හා සංස්කෘතික වසයෙන් නව ප්‍රවණතා දමිළ සංස්කෘතියට එක් වීමෙන් එහි සංස්කෘතිකමය ව්‍යුහයේ පුළුල් වෙනසක් සිදු වී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** උප සංස්කෘතිය, නව ප්‍රවණතා, වතුකරයේ දමිළ ජනතාව, විවාහ සහ අවමංගල්‍ය චාරිත්‍ර, සංස්කෘතික අනන්‍යතාව

[1] සමාජීයවිද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, bmtlakruwan@gmail.com

[2] මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, isurulakmal0929@gamail.com

[3] සමාජීයවිද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, aruna20@gmai.com

# US VS. THEM IN CYBERSPACE: COMPARISON OF INTERNET MEMES RELATED TO ETHNICITY SHARED AFTER THE EASTER SUNDAY ATTACK AND DURING SRI LANKA'S *ARAGALAYA.*

*W.A.M.S. Wijesuriya[1]*

This paper discusses how internet memes related to ethnicity were used during two significant events in Sri Lanka: after the Easter Sunday attack and during *Aragalaya*. It is evident that many memes were shared online on both occasions, and it is apparent that ethnicity played a crucial role in determining what memes were shared. The paper analyzes how memes have been utilized as a tool of division in one context and as a tool of unitation in another context, still with hidden divisions. In the aftermath of the Easter Sunday attacks, many memes were shared on the internet, spreading hatred against certain ethnicities, while those shared during *Aragalaya* stressed the necessity of being united as one to resist the current regime. By analyzing memes that have been shared on social media platforms such as Facebook, Instagram, Twitter, and WhatsApp, and different websites, the study will uncover how two occasions have been interpreted by people in different contexts. This study uses more than a thousand memes created and shared in the Sinhala, Tamil, and English languages. It was determined that memes shared until three months after the Easter Sunday Attack on April 21 2019 and during *Aragalaya*, particularly between March and November 2022, were included in the study. In order to compare and contrast these memes, visual methodology has been employed, and content analysis, along with critical discourse analysis concepts, have been adopted. Despite the tendency to construct ethnic binaries within one context, the paper explores how these binaries can be disregarded in another context where they are hidden like sparks within ashes.

***Keywords:*** Memes; Internet; Ethnicity; Easter Sunday Attack; *Aragalaya*

---

[1] University of Peradeniya. mswijesuriya21@gmail.com

# පුරාණ බෞද්ධ සමාජයන්හි ස්ත්‍රීත්වය නිරූපණයෙහි ලා ජාතක කතාවේ දායකත්වය පිළිබඳ ව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්. සිහින සඳරුවන්*[1] *එම්.එච්.එච්. හිල්මියා*[2]

සමාජ සාරධර්ම රාශීයක් ඉදිරිපත් කරන බුදු දහම විමුක්ති මාර්ගයක් පමණක් නො ව සමාජ සාරධර්ම රාශියක් ද ඉදිරිපත් කරන අතර එහෙයින් බුදු දහම සමාජ දර්ශනයක් වන බව හඳුනාගත හැකි ය. මූලික වසයෙන් බුදුදහම විමුක්ති මාර්ගයක් වුව ද ස්ත්‍රීත්වය, පුරුෂත්වය වැනි විෂයන් ද සාකච්ඡා කර තිබෙන අතර බෞද්ධ පොත්පත්වල ස්ත්‍රී භාවය සහ පුරුෂ භාවය පිළිබඳ ව දාර්ශනික මට්ටමෙන් සාකාච්ඡා කෙරෙයි. මානව සංහතියේ පැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධානතම ජීවී සාධකය වන ස්ත්‍රීය පිළිබඳ ව විවිධ මතිමතාන්දර සහ අදහස් ගණනාවක් විවරණය කරන බුදුදහම ස්ත්‍රිය කෙරෙහි සමාජයේ පැවැති දෘෂ්ටිය 'ජාතක කථාව' මූලික කර ගනිමින් කාන්තාවන්ගේ භූමිකාවත්, ගුණාංග සහ ඔවුන් හා සම්බන්ධ සමාජ වටිනාකමුත් නිරූපණය කෙරේ. ඒ අනුව පුරාණ බෞද්ධ සමාජයන්හි ස්ත්‍රිත්වය සැලකූ ආකාරය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරිම මෙම පර්යේෂණයේ ගැටලුව වූ අතර ජාතක කතා තුළ ස්ත්‍රිත්වය නිරූපණය වන්නේ කෙසේ ද සහ මෙම කතා රචනා කරන කාලය තුළ බෞද්ධ චින්තනයේ සහ සමාජයේ කාන්තාවගේ භූමිකාව, තත්ත්වය කෙසේ ද යන්න හඳුනා ගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු වේ. මෙහි දි මෙම අධ්‍යයනයට ගුණාත්මක පරියේෂණ ක්‍රමවේදය භාවිත කළේ ය. එහි දී දත්ත රැස් කිරිමට ද්විතියික මූලාශ්‍රය ක්‍රමය යටතේ මේ සම්බන්ධයෙන් රචනා වී ඇති පොත් පත්, පුවත් පත්, සඟරා මෙන් ම අන්තර්ජාලය ආශ්‍රිත ලිපි ද භාවිත කරන ලදි. විශේෂයෙන් ම මේ සඳහා ජාතක පොතේ සඳහන් ජාතක කතා මුල් කර ගනිමින් දත්ත රැස් කළ දත්ත විශ්ලේෂණය කළ අතර සංසන්දනාත්මක ව බාහිර කෘතින් ද අධ්‍යයනය කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දි ස්ත්‍රිය පිළිබඳ ව ජාතක පොත මඟින් ආකල්පයන් ගණනාවක් නිරූපණය කර තිබෙන බව හඳුනාගත හැකි විය. එනම් ස්වාමි භක්තිය, සුවච බව, ස්ථානෝචිත පඥාව, මාතෘත්වය, කාන්තා දුර්ගුණ ද වෙයි. ස්ත්‍රින්ට හිමි වූ ලිංගික නිදහාස පිළිබඳ ව ද විවරණය කරන ජාතක කථාව ස්ත්‍රියට ආවේණික කාමුකත්වය, අනාචාරයේ හැසිරිම, තෘෂ්ණාවෙන් යුක්ත විම, කපටි බව, සැක සහිත බව, අහංකාරය නිරූපණය කළ ඇති බව දැකිය හැකි ය. ජාතක කතා තුළින් භක්තිමත් සහ ගුණවත් කාන්තාවන්ගේ සිට සමාජ තත්ත්වයන්ට අභියෝග කරන විවිධාකාර කාන්තා චරිත විශ්ලේෂණය කර ඇති බවත්, කාන්තා භූමිකාවේ බහුවිධ ස්වභාවයත් නිරූපණය කර තිබෙනු දැකිය හැකි ය. කාන්තාවන් ප්‍රඥාවන්ත, දයානුකම්පිත හා අධිෂ්ඨානශිලි චරිත ලෙස පෙන්වා දෙමින් 'කාන්තාවන් නිෂ්ක්‍රිය චරිත' ලෙස වටහා ගැනීම අභියෝගයට ලක් කර තිබිම ද හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දි එළඹිය හැකි අවසාන නිගමනය වූයේ ජාතක කතාව මගින් නිරූපණය කරන ස්ත්‍රියගේ ආකල්ප සරල නොවූ සංකිර්ණ ස්වභාවයක් ගන්නා බවත් කාන්තාවන්ගේ භූමිකාව බහුවිධ ස්වරූපයක් ගන්නා බවත් වෙයි.

***ප්‍රමුඛ පද:*** බුදු දහම, ජාතක කථා, ස්ත්‍රිය, භූමිකාව, සංකීර්ණ.

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sihinasandaruwan2000@gmail.com
[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hairulhilmiya02@gmail.com

# ජන කවිය මඟින් නිරූපිත අතීත සමාජ මානවයාගේ ලිංගිකත්වය පිළිබඳ ව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එම්.එම්. සිහින සඳරුවන්[1] එම්.එච්.එච්. හිල්මියා[2]*

පරම්පරාගත ව සිංහල මිනිසාට හිමි වු ජන සාහිත්‍යාංගයක් ලෙසින් ජන කවිය වැදගත් වන අතර පොදු ජනයා පරම්පරාවෙන් පරම්පරාවට කටින්කට පවත්වාගෙන එන කවි විශේෂයක් ලෙසින් ජනකවිය හඳුනාගත හැකි ය. ජන කවිය අනාදීමත් කාලයක සිට හෙළයේ සංස්කෘතික හරයන් ප්‍රතිනිර්මාණයෙහි ලා දායක වන ජන කවිය එදිනෙදා ජිවිතයේ ගැමියන්ට මුහුණ දිමට, අත්විදීමට සිදු වු සිදුවිම්, ජිවිතයේ ගැටලුකාරි තත්ත්වයන් මෙන් ම ජන කවිය මගින් අතීත හෙළ සමාජයේ බොහෝ තැන් විවරණය කරනු ලැබේ. එහි දී ජන කවිය මගින් නිරූපීත ප්‍රධාන මාතෘකාවක් වෙනුයේ 'ලිංගිකත්වයයි' ගජමන් නෝනා වැනි කිවිඳියන්ගේ ජන කවි මගින් ද ගැමි සමාජයේ ලිංගිකත්වය සරල සහ සුගම ලෙසින් 'කුණුහරපයක්' බවට පත් නො කර ලිංගිකත්වය විවරණය කර තිබෙන අතර  පැල් රැකීම එදා ජන ජිවිතයේ ප්‍රධාන වෘත්තියක් වු අතර මේ තත්ත්වයන් තුළ අඹුවන් හා සැමියන් අතර පවත්නා ලිංගිකත්වය ජන කවිය මගින් නිරූපණය කර තිබෙන අවස්ථා තිබේ. ජන කවිය මඟින් නිරූපිත අතීත සමාජයේ ලිංගිකත්වය කවරාකාර ද යන්න හා ලිංගිකත්වයේ විවිධ මානයන් මොනවා ද යන්න මෙම පර්යේෂණයේ මුලික ගැටලුව වු අතර ජන කවිය පිළිබඳ ව හදුනා ගැනීමත්, අතීත ගැමියාගේ ලිංගිකත්වය සහ ලිංගිකත්වය සම්බන්ධයෙන් අතීතයේ පැවැති සමාජ ආකල්පය මෙන් ම ලිංගික නිදහස පිළිබඳ ව හඳුනා ගැනීමත් මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. මෙම අධ්‍යයනයට ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළේ ය. එහි දී දත්ත රැස් කිරිමට ද්විතියික මුලාශ්‍රය ක්‍රමය යටතේ මේ සම්බන්ධයෙන් රචනා වී ඇති පොත් පත්, පුවත් පත්, සඟරා මෙන් ම අන්තර්ජාලය ආශ්‍රිත ලිපි ද භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දි ජන කවි විවිධ මානයන් ඔස්සේ වර්ග කොට ලිංගිකත්වය හා සම්බන්ධ ජනකවි හඳුනා ගනිමින් දත්ත විග්‍රහ කරන ලදි. එහි දී අතිතයේ පැවැති ලිංගික චර්යාවන්, ලිංගික විෂමතා, ලිංගික අනන්‍යතාවන්, ලිංගික විෂමතා පිළිබඳ ව හඳුනාගත හැකි විය. ඒ යටතේ අනියම් ඇසුර, කාන්තාවන්ගේ ශරිරය සම්බන්ධ ව පිරිමින්ගේ ආකල්ප, පිරිමින් ආකාර්ෂණය කරගත් කාන්තාවන් සිටි බව, වයස්ගත පුද්ගලයන්ගේ ලිංගිකත්වයට බලපෑම් එල්ල වීම, පිරිමියා මිය ගිය පසු කාන්තාවන් අනෙක් පිරිමින් හා ලිංගික ව එක් වීම, විවාහ ක්‍රමයන්හි පවත්නා ලිංගිකත්වයේ විෂමතාව, ලිංගිකත්වය කෙරෙහි පැවැති පොදු නීතින් වැනි කාරණා ගණනාවක් මෙන් ම පැල් රැකිම හමුවේ පිරිමින් හා කාන්තාවන්ගේ ලිංගික ක්‍රියාකාරිත්වය වැනි තත්ත්වයන් පැවැති බව අවබෝධ කරගත හැකි ය. මෙම පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දි එළඹිය හැකි අවසාන නිගමනය වනුයේ වර්තමානයේ තරම් ලිංගිකත්වය ව්‍යාජත්වයක් මතු කරගත් යුගයක් නොවන අතර ගැමි සමාජයේ ලිංගිකත්වය සරල මෙන් ම සමාන්‍ය, සරල දෙයක් ලෙස පිළිගත් බව වෙයි.

***ප්‍රමුඛ පද:*** ජන කවිය; ලිංගිකත්වය; අනියම් ඇසුර; ව්‍යාජත්වයක්; සරල

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sihinasandaruwan2000@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. hairulhilmiya02@gmail.com

# සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි පිළිබඳ සමාජ සංස්කෘතික අධ්‍යයනයක්

*දිල්හානි වාසනා ජයරත්න*[1]

ලෞකික දිවි පෙවෙතට අදාළ සංකීර්ණ ගැටලු හමුවේ විසඳුම් සොයන පොදු ජනයා විවිධ අභිචාර විධි කෙරෙහි නැඹුරු වී ඇත. අභිචාරයක් ලෙස හඳුනා ගනුයේ, අධිභෞතික තත්ත්ව පිළිබඳ මිනිසා තුළ ඇති විශ්වාස පද්ධතියකි. මිනිසාගේ යහපත හෝ අයහපත අරමුණු කොට ගනිමින් මිනිසා විසින් ම සිදු කරනු ලබන දෑ අභිචාර ගණයෙහි ලා සැලකේ. පුද්ගල අයහපත කේන්ද්‍ර කොටගත් දූරාභිචාර විධියක් ලෙස පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි හඳුනාගත හැකි ය. සමාජ සංස්කෘතියෙහි නිරූපිත බොහොමයක් අභිචාර විධි අධිමානුෂික පුද්ගල විශ්වාස හා සම්බන්ධ ව ගොඩ නැගී ඇත. සීනිගම දෙවොල් දෙවියන් ආශ්‍රිත ව පවතින අභිචාර විධික්‍රමය ද එවැන්නකි. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොළඹ මාතර මහා මාර්ගයේ හික්කඩුව ආසන්න මුහුදු තීරයේ සිට කුඩා දුරකින් මෙම සීනිගම දේවාලය පිහිටා ඇත. ඉන්දියාවේ සිට පැමිණි පත්තිනි දේවිය ඉදිරියේ හාස්කම් පා සීනිගමට ගොඩ බැස්ස බෞද්ධ දේව ගණයට එක් වූ දෙවි කෙනෙකු ලෙස දෙවොල් දෙවියන් හඳුනාගත හැකි ය. මෙම දෙවියන් නූතන ලාංකේය ජනයා අතර විශේෂ ප්‍රසිද්ධියක් උසුලනුයේ, පලිගැනීම් හා සම්බන්ධ අභිචාර විධි සඳහා ය. මෙම පර්යේෂණයේ දී සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි කෙරෙහි වූ නූතන ලාංකේය ජනයාගේ අචල විශ්වාසය පිළිබඳ විමර්ශනයක යෙදීම සිදු කෙරිණි. නූතන ලාංකේය සමාජය තුළ සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත ව පවතින පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි ක්‍රියාත්මක වන්නේ කවරාකාරයෙන් ද යන්න පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණයේ මූලික අරමුණ සීනිගම දෙවොල් දේවාලය ආශ්‍රිත පලිගැනීම හා සම්බන්ධ අභිචාර විධි පිළිබඳ සමාජ හා සංස්කෘතික අධ්‍යයනයක නියැලීමයි. දේවාලයේ පූජා සඳහා සම්බන්ධ වන පුද්ගලයන්ගේ අපේක්ෂා සහ දේවාලය වර්තමාන ජනප්‍රියත්වයට හේතු අධ්‍යයනය කිරීම මෙහි උපඅරමුණු වේ. සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණය, පුස්තකාල භාවිතය හා අන්තර්ජාල භාවිතය යනාදි විධික්‍රම ඔස්සේ ඒකරාශී කරගත් දත්ත ගුණාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කිරීම පර්යේෂණ ක්‍රමවේදයයි. තත් අධ්‍යයනය මගින් අනාවරණය වූයේ, සෙත් ශාන්තිය පතා දේව පූජාවන්ට සහභාගි වන පිරිස අභිභවා පලිගැනීම හා සම්බන්ධ විවිධ අභිචාර විධි උදෙසා සහභාගී වන පිරිස ප්‍රමාණාත්මක ව අධික බවයි. එහි දී යාදිනි, කන්නලව්, පොල් ගැසීම, පූනා ගැසීම, මිරිස් ඇඹරීම යනාදි පලිගැනීම් හා සම්බන්ධ අභිචාර විධි හඳුනා ගැනිණි. එම අභිචාර විධි ඔස්සේ ඉපැරණි පොදු ජනයාට සාපේක්ෂ ව නූතන ලාංකීය සමාජයෙහි පුද්ගල මනෝභාව දූශ්‍ය වීමකට ලක් වී ඇති බව හඳුනා ගන්නට වුණි. එසේ හෙයින් මෙම ආගමික සිද්ධස්ථානය වටා ඒකරාශී වන පුද්ගලයන්ගේ පුද්ගල මනෝභාව මෙන් ම දෙවියන් ඇදහීමේ මුඛ්‍ය පරමාර්ථය කාලීන ව විචල්‍යතාවකට ලක් ව ඇති බව මෙම පර්යේෂණ ඔස්සේ නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** සීනිගම දෙවොල් දේවාලය, පලිගැනීම, අභිචාර විධි, සමාජ සංස්කෘතික අධ්‍යයනය, පොදු ජනයා

[1] සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය. g.dilhaniwasana@gmail.com

# සිංහල සමාජ ජන ජීවිතය හා බැඳුණු සෙත්කවි ශාස්ත්‍රයෙහි නූතන විචල්‍යතා පිළිබඳ සංස්කෘතික අධ්‍යයනයක්

*බී.එම්.බී.ජී.ටී. ලක්ෂාණි ජයරත්න*[1]

සිංහල සංස්කෘතියේ විවිධ වූ ජනශ්‍රැතිකාංග රැසකි. මේ අතර පුද්ගල විශ්වාස පද්ධතිය හා සබැඳි අභිචාර විධි ද හඳුනාගත හැකි ය. මෙම අභිචාර විධි පුද්ගල යහපත උදෙසා සහ පුද්ගල අයහපත උදෙසා සිදු කරනු ලබයි. පුද්ගල යහපත කේන්ද්‍ර කොටගත් ප්‍රකට ජනශ්‍රැතිකාංගයක් ලෙස සෙත් කවිය හඳුනාගත හැකි වේ. පුරාතනයේ සිට වර්තමානය දක්වා පුද්ගලයන් තම අභිමතාර්ථ සාධනය කොට ගැනීම උදෙසා විවිධ වූ ප්‍රයත්න දරා ඇති අතර එහි දී ගුප්ත විශ්වාස කෙරෙහි ද අවධානය යොමු කොට ඇත. එහෙත් විද්‍යාව හෝ තාර්කික බුද්ධිය විසින් කිසිදු විටක ගුප්ත ශාස්ත්‍රීය පිළිවෙත් නො පිළිගනියි. එහෙත් පුද්ගලයා තමන්ට එල්ල වන ප්‍රශ්න, ගැටලු හමුවේ විවිධාකාර ක්‍රම පිළිවෙත් ඔස්සේ මානසික තෘප්තිය සැනසීම අපේක්ෂා කරයි. මෙම හේතුවෙන් සෙත් කවි ශාස්ත්‍රය ද මිනිසුන්ගේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා භාවිත කරන යහපත් අභිචාර විධි ක්‍රමයක් ලෙස හඳුනා ගත හැකි වේ. එහෙත් වර්තමානයේ පවතින සංකීර්ණ සමාජ යාන්ත්‍රණය, විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සමඟ පුද්ගලයන් එම අභිචාර විධික්‍රමවලට එළැඹීමේ ඌනතාවක් දක්නට ලැබේ. පුද්ගල ජීවනාලිය හා බැඳි සෙත්කවි වර්තමාන සමාජ සන්දර්භය තුළ විචල්‍යතාවලට ලක් ව ඇත්තේ කවරාකාරයෙන් ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙහි මුඛ්‍ය අරමුණ අතීත හා වර්තමාන සිංහල සමාජයේ විද්‍යමාන සෙත් කවි විචල්‍යතාවට ලක් ව ඇති ආකාරය පිළිබඳ තුලනාත්මක ව අධ්‍යයනය කිරීමයි. ඒ ඔස්සේ වර්තමාන සමාජ සන්දර්භයේ පුද්ගල ඇදහිලි හා විශ්වාසවල නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි උපඅරමුණයි. පර්යේෂණය සඳහා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාව අතුරින් තෝරාගත් නියැදියක් ආශ්‍රය කොටගෙන අවශ්‍ය දත්ත හා තොරතුරු සම්පාදනය කර ගනු ලැබූ අතර එහි දී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක යන මිශ්‍ර ක්‍රමවේදය ඇසුරු කර ගන්නට විය. සෙත් කවියේ නූතන විචල්‍යතා පිළිබඳ සැලකීමේ දී අතීතයට සාපේක්ෂ ව විශාල වසයෙන් විෂම ලක්ෂණ විද්‍යමාන කෙරේ. සිංහල සෙත් කවිය ආරම්භක අවස්ථාව ශාන්තිකර්ම හා ගැමි නාටක ගීවලත්, ඉන් අනතුරු ව නූර්ති ආදියේත් දැකගත හැකි වුවත්, වර්තමානයේ දී සිංහල ගීත සාහිත්‍යයේ සෙත් කවි ආකෘතිය රැගත් ගීත දැකගත හැකි වේ. මෙම ගීතවලින් ද කිසියම් වූ ශාන්තියක් අභිප්‍රායක් මුදුන් පමුණුවා ඇත. එහෙත් වර්තමානයේ දී විශ්වවිද්‍යාලය උපසංස්කෘතිය තුළ සෙත් කවි ආකෘතිය රැගත් කවි දැකගත හැකි අතර ම එහි මූලික අභිප්‍රාය හාස්‍ය උත්පාදනය කිරීමයි. එනම් සෙත් කවියෙහි පැවති මූලික ලක්ෂණය එහි දී අභියෝගයට ලක් කර ඇත. එමෙන් ම වර්තමානයේ දී සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සෙත් කවිය පුද්ගලයාට සාමාන්‍යකරණය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව අතීතයේ වඩාත් සැලකිලිමත් හා ශාස්ත්‍රීය පදනමකින් යුතු ව බිහි ව ප්‍රකට වූ සෙත් කවිය වර්තමාන සමාජයේ ආකෘතිකමය, පරමාර්ථමය සහ භාවිතමය වසයෙන් විචල්‍යතාවට බඳුන් ව ඇති බව මෙම පර්යේෂණ ඔස්සේ නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** සිංහල ජන සමාජය, සෙත්කවිය, නූතන විචල්‍යතා, සංස්කෘතික අධ්‍යයනය, ජනශ්‍රැතිකාංග

[1] සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.

# බුදු දහම තුළ විවරණය වන සුළු මවගේ භූමිකාවෙහි වර්තමාන සමාජ අවශ්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ*[1]

සමාජය තුළ කුඩා ම ඒකකය පවුලයි. පවුලේ පියාගේ දෙවන විවාහයෙන් පවුලට එක් වන කාන්තාව සුළු මව හෙවත් පුංචි අම්මා ලෙස ව්‍යවහාර කෙරෙයි. ස්ත්‍රී චරිත අතර වර්තමාන සුළු මවගේ භූමිකාව බෞද්ධ ධර්මානුකූල ද යන ගැටලුව මත ගොඩනැගෙන මෙම පර්යේෂණය සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ සිදු කෙරේ. ත්‍රිපිටකයේ ථෙරීගාථා පාළිය, අපදාන පාළිය, විනය පිටකය, ජාතකට්ඨකථාව වැනි ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීක මූලාශ්‍රය ද මෙහි දී පාදක කොට ගනී. බුදුදහම තුළ විවරණය වන සුළු මවගේ භූමිකාව හා වර්තමාන සමාජයේ සුළු මව පිළිබඳ ව ඇති මතය තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එමඟින් ආගමානුකූල ව ගොඩනැගුණු සුළු මවගේ භූමිකාවේ වර්තමාන අවශ්‍යතාව සමාජගත කිරීම අපේක්ෂා කරයි.  මහාමායා දේවිය කළුරිය කිරීමෙන් පසු එතුමියගෙ නැගණිය වූ මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සුළු මව වසයෙන් බෝසත් කුමරුට කිරි දී හදාවඩා ගනියි. සුද්ධෝදන රජුට දාව තම කුස උපන් නන්ද කුමරු හා සුන්දරී නන්දා කුමරිය කිරි මව්වරුන්ට භාර දී බෝසත් කුමරු වෙනුවෙන් ම වෙහෙසුණ ඇය සුළු මවුවරුන් අතර උත්තරීතරත්වයට පත් ආදර්ශවත් කාන්තා චරිතයකි. බෝසතාණන් වහන්සේ බුදු බව ලැබීමෙන් අනතුරු ව ප්‍රජාපතිය ඇතුළු පන්සියයක් කාන්තාවන්ට පැවිදි භූමියට ඇතුළත් වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනුයේ කාන්තාවකට ලැබිය හැකි භාග්‍යවන්ත ම අවස්ථාව උදා කර දෙමිනි. ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේ මවු කිරි පෙවූ බුදු මවු බවත් දහම් කිරි පෙවූ බුදුහිමියන් එතුමියගේ පියාණන් ලෙසත් දක්වාලන අතර සුළු මවක් වසයෙන් එතුමියගේ චරිතාපදානය විමසීම වර්තමානයට ඉතාමත් කාලෝචිත ය. විවාහය, දික්කසාදය සුළු කොට තකා දරුවන් අසරණ කරන සමාජයක පුංචි අම්මා කෙනෙකුට සැබෑ මවක් ව දාරක ස්නේහයෙන් යුක්ත ව කටයුතු කිරීමට එමඟින් මාර්ගෝපදේශය සැලසේ. තම කුස නොදැරුවත් තම දරුවන් හා සමාන ව ම මෙත්තා කරුණා ආදි සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත ව කටයුතු කිරීමට හැකි වීම සුළු මවක් වසයෙන් ඇගේ භූමිකාව මවක් දක්වා පරිවර්තනය වීමක් ලෙස පෙන්වාදිය හැකි ය. වර්තමාන සමාජය තුළ සුලභ වන සුළු මවගේ භූමිකාව, බුදු දහම තුළ විවරණය කරනා අයුරින් හැඩගස්වා ගැනීමෙන් සමාජ විෂමතාව හා ප්‍රචණ්ඩත්වය අවම වීමට හේතු සැලසේ. මෙලෙස බුදු දහම තුළ විවරණය කරනා සුළු මවකගේ භූමිකාවේ වූ සාරය සමාජගත කරලීම තුළින් දාරක ස්නේහයෙන් පිරී දයානුකම්පාවෙන් පෝෂිත ධර්මානුකූල සමාජ වටපිටාවක් ගොඩනඟා ගැනීමට අවකාශය සැලසෙන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** දාරක ස්නේහය, ප්‍රජාපතී ගෝතමී දේවිය, බුදු දහම, සුළු මව, සමාජය

---

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com

# සහල් හා බැදී ලාංකේය ආහාර සංස්කෘතිය පෝෂණයෙහි ලා බෞද්ධ ආගමික බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ*[1]

"සහල්" ගරුත්වය හා පූජනීයත්වය හේතු කොට ගෙන "බුද්ධ භෝගය" ලෙස ව්‍යවහාර කරන අතර සහල් මත පදනම් ව විවිධාංගීකරණය වූ ආහාර සංස්කෘතියක් ගොඩනැගෙයි. වී වැපිරීමේ සිට බත් පරිභෝජනය කරනා අවස්ථාව දක්වා ම විශේෂයෙන් ගොඩනැගුණු ආහාර සංස්කෘතිය හා බැඳි විවිධ චාරිත්‍ර වාරිත්‍ර, පුද පූජා, උත්සව මෙන් ම ඓතිහාසික කාරණාවන් ද හඳුනාගත හැකි ය. ආගමානුකූල ව සාම්ප්‍රදායික තීක්ෂණ බුද්ධිය හරහා ගෝලීය පුරවැසියන් ආර්ථිකව හා මානසිකව පොහොසත් කිරීමට සහල් හා බැඳි මෙම ආහාර සංස්කෘතියේ බලපෑම පිළිබඳ විමසුමක යෙදීම මෙම පර්යේෂණයේ අපේක්ෂාවයි. සූත්‍ර පිටකය, විනය පිටකය, ජාතකට්ඨකථා වැනි සාහිත්‍ය මූලාශ්‍රය මත පදනම් ව මෙම පර්යේෂණය සිදු කෙරේ. බෞද්ධ ආගමානුකූල සහල් සංස්කෘතිය විමසීමේ දී දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රාගත ව ඇති සහල්හි උපත පිළිබඳ සඳහන් වැදගත් වේ. දළදා වහන්සේ උදෙසා සිදු කරන කිරිපිඬු පූජාව, ජයසිරිමා හාමුදුරුවන් උදෙසා සිදු කරන අලුත් සහල් මංගල්‍යය ආදි ආගමානුකූල සාම්ප්‍රදායික සංස්කෘතික උත්සව සහල් හා බැඳී ආහාර සංස්කෘතියේ සුවිශේෂී අවස්ථාවන් ලෙස හඳුනාගත හැකි ය. සම්මා ආජීවය යටතේ කෘෂිකර්මාන්තය නිර්දේශ කරන බුදු හිමියන් වී වගාව පාදක කොට විවිධ වූ සූත්‍ර දේශනාවන් සිදු කර ඇති ආකාරය ත්‍රිපිටකාගත ව දැකගත හැකි ය. උම්මග්ග ජාතකය ආදි ජාතක කථා පරිශීලනයෙන් ද සහල් හා බැඳී ආහාර සංස්කෘතියෙහි ආගමික මුහුණුවර පිළිබඳ කරුණු ගෙනහැර දැක්විය හැකි ය. ලාංකීය වී ගොවිතැනේ අත්‍යාවශ්‍ය සාධකයක් වූ වැව පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ඇරඹුණු බවට සාක්ෂ්‍ය තිබේ. පාළි ග්‍රන්ථවල වී වර්ග 317ක් හඳුනාගෙන ඇත. වී වර්ග 1000ක් පමණ ව්‍යවහාරයේ පැවති බවට මත පවතින අතර හීල් බත්, දිය බත්, මුරුතැන් බත්, මළබත්, මුත්තෙට්ටුව හා ඇඹුල ලෙස බත විවිධ වේ. සහල් උපයෝගී කොට රසකැවිලි, කැඳ, අතුරුපස ආදිය පිළියෙල කළ හැකි ය. මේ ආකාරයට විවිධ රසයන්, හැඩයන් හා වර්ණයන් එක්කාසු කරමින් ආහාර සැකසීම සිදු කළ හැකි අතර එම ආහාර පරිභෝජනය හා බෙදා දීම පිළිබඳ ඉතා වැදගත් ආදර්ශයන් බුදුදහම සපයයි. මේ අනුව සහල් හා බැඳී යහපත් ආහාර සංස්කෘතියක් ගොඩනගා ගැනීමෙන් නිරෝගීකම, මානසික සංතෘප්තිය පමණක් නො ව ආර්ථික දියුණුවත් ආගමානුකූල පරිසරයක් තුළ අත්විඳිය හැකි ය. ආහාර සංස්කෘතිය පෝෂණය වීමෙහි ලා බුදුදහමේ ආභාසය බෙහෙවින් වැදගත් වන බව පෙන්වා දිය හැකි අතර බුද්ධිය මෙහෙයවා ගෝලීය වසයෙන් ආර්ථික වත් මානසික වත් පොහොසත් පුරවැසියන් ලෙස අනාගතය සාර්ථක කරගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ආහාර සංස්කෘතිය, පොහොසත්කම, බුදුදහම, සහල්

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com

# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් මානසික අවපීඩනයට පත් වීමට බලපෑ ඇති නව්‍ය සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්. (ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය ඇසුරෙන්)

*ආර්.ඒ.ඩී.ඩී. රණසිංහ[1]*

2022 වර්ෂයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 25%ක ප්‍රතිශතයක් තරුණ ප්‍රජාව වන අතර, ඉන් 18% පිරිසක් විශ්වවිද්‍යාලයන් තුළ ලියාපදිංචි වී අධ්‍යාපනයේ නියැලී සිටිති. විශ්වවිද්‍යාලය කිහිපයක් නගරබද ව පිහිටා ඇති අතර ඉන් කිහිපයක් ග්‍රාමීය පරිසරයන් තුළ පිහිටා ඇත. වර්තමානයේ විශ්වවිද්‍යාලය තරුණයින්ට සාපෙක්ෂ ව විශ්වවිද්‍යාලය තරුණයන් අධ්‍යාපන සහභාගීත්වය අවම මට්ටමක පැවතීම, විශ්වවිද්‍යාලය අත්හැර යෑම සහ සියදිවි නාසා ගැනීම් වාර්තා විය. විශ්වවිද්‍යාල තරුණයන් සමාජශීලි බව අඩු අතර හුදෙකලා වීමට නැඹුරු ව පෞරුෂය දුර්වල සහිත ව සිය අධ්‍යාපනයෙන් පසු සමාජගත වේ. වර්තමානය වන විට විශ්වවිද්‍යාලයීය තරුණයන් අධ්‍යාපනයෙන් ඈත් වීම, ඉක්මනින් කෝපයට පත් වීමට මානසික අවපීඩනය හේතු සාධක විය හැකි ද යන්න ලබා දෙන අඩු අවධානය හේතුවෙන් සමාජීය සහ පර්යේෂණ හිඩසක් නිර්මාණය වී ඇත. මේ හේතුව මත විශ්වවිද්‍යාල තරුණයා මානසික අවපීඩනයට පත් වීමට බලපෑ ඇති නව්‍ය සාධක මොනවා ද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොද ගන්නා ලදි. තරුණ මානසික අවපීඩනයට බලපාන නව්‍ය සාධක; මානසික පීඩනය හේතුවෙන් තරුණයන්ගේ වැරදි හැසිරීම; තරුණ මානසික අවපීඩනය අවම කර ගැනීම සඳහා නව්‍ය යෝජනා; මෙම පර්යේෂණයේ අරමුණු වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාමල් වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන තරුණ විද්‍යාර්ථීන් 100ක් වෙත අහඹු නියැදීම යටතේ ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරමින් දත්ත ලබා ගන්නා ලදි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය භාවිත කරමින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණයක් තුළින් පර්යේෂණයට ආදළ දත්ත විශ්ලේෂණය කරන ලදි. නියැදියෙන් 20%ක් කුමන හෝ මත්ද්‍රව්‍යකට ඇබ්බැහි වී ඇත. නියැදියෙන් 60% පවුල් බරින් හෙම්බත් වෙමින් විශ්වවිද්‍යාලය අධ්‍යාපනය ලබන්නෝ වෙති. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනයට පරිබාහිර ක්‍රියාකාරකම් වූ කලා මංගල්‍යයන්, පීඨ සංගම්වල ක්‍රියාකාරකම්, නවක කණ්ඩායම් විශ්වවිද්‍යාල සංස්කෘතියට අනුගත කිරීමේ වැඩසටහන් තරුණයන් කේන්ද්‍රව ක්‍රියාත්මක වේ. මේ හේතුවෙන් නියැදියෙන් 3%ක් විශ්වවිද්‍යාලයීය තරුණයන් සිය ජීවිතය පිළිබඳ කලකිරීමට පත් ව ඇත. මෙලෙස විශ්වවිද්‍යාල තරුණයන්ට අධික ලෙස පවුල් බර දැරීමට සිදු වීම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, විශ්වවිද්‍යාලයේ විෂයය බාහිර ක්‍රියාකාරකම් හේතුවෙන් අධික මානසික පීඩනයට හසු ව ඇති බව හඳුනාගත හැකි අතර අවසානයේ විශ්වවිද්‍යාලය අධ්‍යාපනය අතහැර දැමීම, සියදිවි නාසා ගැනීම, දිර්ඝ කාලීන රෝගී තත්ත්වයන්ට ගොදුරු වීම නිගමනය විය. විශ්වවිද්‍යාල තරුණයන් සඳහා මනෝ උපදේශන වැඩසටහන් පැවැත්වීම, විශ්වවිද්‍යාලය උපදේශන කමිටුව යාවත්කාලීන කිරීම සහ ඔවුන්ගේ පෞරුෂය සංවර්ධනය කිරීම, අර්ධ කාලීන රැකියාවන් සඳහා යොමු කිරීමට අවශ්‍ය පසුබිම විශ්වවිද්‍යාල පරිසරය තුළ නිර්මාණය කිරීම සහ විශ්වවිද්‍යාලය තුළ විෂයය බාහිර ක්‍රියාකාරකම් අවම කිරීමට පීඨ සංගමය මැදිහත් වීමට කටයුතු කිරීම යෝජනා කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** විශ්වවිද්‍යාල තරුණයා අධ්‍යාපනය, මානසික අවපීඩනය, සියදිවි නාසා ගැනීම, මත් ද්‍රව්‍ය.

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, dushmantharanasinghe31@gmail.com

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් මනෝ උපදේශනය සඳහා යොමුවීම අවම වීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

*පී.පී.එස්.ආර්. බණ්ඩාර [1]*

අනාගත නායකයන් ලෙස විශ්වවිද්‍යාලය සිසුන්ගේ මානසික යහපැවැත්ම ඔවුන්ගේ අධ්‍යාපනික අරමුණු සාධනයෙහි ලා ප්‍රබල ලෙසින් බලපාන්නා වූ කරුණකි. එය එකී සමාජයේ තිරසාර සංවර්ධන අරමුණු කෙරෙහි දීර්ඝ කාලීන අභියෝගයක් එල්ල කරයි. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් ගත් කල මානසික ආතතිය, කාංසාව, විෂාදය වැනි මානසික රෝග රැසකට ගොදුරු වී ඇති බවට මෑතකාලීන ව බහුල ව සිදු වූ විශ්වවිද්‍යාල සිසුන්ගේ දිවි නසා ගැනීම් සාක්ෂ්‍ය දරයි. මෙවැනි මානසික ආතතියේ බලපෑම අවම කිරීම සඳහා වූ ඵලදායී ප්‍රවේශයක් වන්නේ මනෝ උපදේශනයයි. එය තම හැඟීම් ප්‍රකාශ කිරීමට රහස්‍ය අවකාශයක් සපයන අතර ම සංජානන චර්යා චිකිත්සාව (Cognitive behavioural therapy) වැනි ඵලදායී ප්‍රවේශයන් හරහා කාංසාව සහ මානසික අවපීඩනය වැනි මානසික සෞඛ්‍ය අභියෝගයන් හසුරුවා ගැනීමට උපකාර ලබා ගැනීම, චිත්තවේගයන් සාකච්ඡා කිරීමට සහ පුහුණු විශේෂඥයන්ගේ මඟපෙන්වීම ලබා ගැනීම සඳහා වූ අවකාශ සපයයි. එහෙත් මෙම උපාය මාර්ගවල සඵලතාව සහ භාවිතය අවබෝධ කර ගැනීම සඳහා ප්‍රාමාණික පර්යේෂණයන් පර්යේෂණ සාහිත්‍ය තුළ දුලබ වේ. එබැවින් මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ ඉගෙනුම ලබන විද්‍යාර්ථයන් තම මානසික ආතතීන්වල දී මනෝ උපදේශනය සඳහා යොමුවීම අවම වීමට බලපාන හේතු සාධක මොනවා ද යන්න හඳුනා ගැනීමයි. එහි ලා මිශ්‍ර අධ්‍යයන ක්‍රමවේදය ලෙස ගුණාත්මක දත්ත රැස්කිරීමට අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමයත්, ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමයත් භාවිතයට ගැනිණි. ඒ සඳහා සසම්භාවී නියැදීම ක්‍රමය යටතේ මෙරට විශ්වවිද්‍යාල 12ක විවිධ පීඨ නියෝජනය වන ලෙසින් සිසුන් 50කින් දත්ත රැස්කරන ලදී. එසේ රැස්කරගත් ප්‍රමාණාත්මක දත්ත MS-EXCEL මෘදුකාංගය මඟින් විශ්ලේෂණයක් සිදු කළ අතර ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. මෙම විශ්ලේෂණය තුළින් විශ්වවිද්‍යාලයීය සිසුන් මානසික ගැටලුවල දී මනෝ උපදේශනයට යොමු නොවීම සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස මනෝ උපදේශනය සඳහා යොමු වීමට පහසුකම් නොතිබීම, මනෝ උපදේශනයේ ප්‍රයෝජනවත් බව පිළිබඳ ඇති අනවබෝධය, තම මානසික ගැටලුවල දී වෙනත් සමීපතමයන්ගෙන් සහාය ලබා ගැනීමට යොමු වී තිබීම, මනෝ උපදේශනය පිළිබඳ විශ්වාසයක් නොවීම හා උපදේශනයට යොමුවීම මඟින් සමාජයේ අපකීර්තියට ලක් වේ යැයි ඇති වන බිය යන සාධක හඳුනාගත හැකි විය. ඒ අනුව මෙම අධ්‍යයනය තුළින් එළඹිය හැකි නිගමනය වන්නේ මෙරට විශ්වවිද්‍යාලයීය සිසුන් මනෝ උපදේශනයට යොමු වීම අවම මට්ටමක පවතින බවයි. එහි ලා රහස්‍යභාවය සුරැකෙන සේ යොමුවිය හැකි උපදේශන මධ්‍යස්ථානයක් පිහිටුවීම, මනෝ උපදේශනයෙහි ප්‍රයෝජනවත්භාවය හා ඒ සම්බන්ධ ව පවතින ඍණාත්මක ආකල්පයන් වෙනස් කිරීමට ඒ පිළිබඳ අවබෝධයක් ලබාදීම මඟින් සිසුන්ට මනෝ උපදේශන සේවාවන් ඵලදායී ලෙස ලබා ගැනීමට පවතින බාධාවන් මඟරවා ගත හැකි වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** විශ්වවිද්‍යාල සිසුන්, උසස් අධ්‍යාපනය, මානසික යහපැවැත්ම, මනෝ උපදේශනය, මනෝ උපදේශන සේවා

[1] සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. bandarapgsr@gmail.com

# බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේ දියෙකු මුහුණදිය හැකි අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*එස්.අයි.ආර්. ලියනගේ* [1]

සාර්ථක සමාජ වෘතවේදියෙකු බවට පත්වීමේ ක්‍රියාවලියෙහි එක් අංශයක් වනුයේ, විවිධ මාදාලියේ අර්බුද හැඳින ගන්නා අන්දම ඉගෙනීම සහ සේවාලාභියාගේ ලෝක දෘෂ්ටියට ගැළපෙන අයුරින් තම කාර්යය හැඩගස්වා ගැනීම ය. සමාජ විද්‍යාවට අනුව බහු සංස්කෘතිකවාදය යනු කිසියම් සමාජයක් සංස්කෘතික විවිධත්වයට අදාළ ව කටයුතු කරන ආකාරය වේ. මෙවැනි බහු සංස්කෘතික රාමුවක් තුළ සමාජ වෘතවේදියෙකු ලෙස කටයුතු කිරීමේ දී විවිධ ජනවාර්ගිකයන් හා සංස්කෘතික කණ්ඩායම් අතර පවතින අසමතුලිත සමාජ චර්යාවන් හේතුවෙන් මුහුණ දීමට සිදු වන අභියෝග හා කාර්යය ඉතා සංකීර්ණ වේ. මෙම පර්යේෂණයෙහි ගැටලුව වනුයේ බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දිය හැකි අභියෝග මොනවා ද යන්න අධයයනය කිරීම වේ. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වනුයේ බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දිය හැකි අභියෝග හඳුනා ගැනීම වන අතර උපඅරමුණ ලෙස ඵලදායී සමාජ වෘතවේදියෙකු වසයෙන් එම අභියෝග නිරාකරණය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම දැක්විය හැකි ය. මෙහි දී පර්යේෂණයට අදාළ දත්ත ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් ලබා ගැනිණි. එම ද්විතීයික මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ, පර්යේෂණ ලිපි, පුවත්පත්, වාර්තා චිත්‍රපට, අන්තර්ජාල තොරතුරු ලබාගත් අතර සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විශ්ලේෂණය කරමින් නිගමනයන්ට එළඹිණි. මෙම අධ්‍යයනය තුළින් බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස, සංස්කෘතික සම්මතයන්ගෙන් ඔබ්බට ගොස් මැදිහත්වීමට නොහැකි වීම, වාසස්ථානයෙහි පිහිටීම හා භාෂා විෂමතා, පුමිතිරිභාවය, ආර්ථික පංති පසුබිම, සංස්කෘතික ගැටුම්, කාලානුක්‍රම සංවර්ධන අභියෝග, වෙන් කොට සැලකීම හා ඵලදායී ඒකාබද්ධ ප්‍රතිපත්ති සඳහා වන අවශ්‍යතාව යනාදිය හඳුනාගත හැකි විය. බහු සංස්කෘතික සමාජයක් තුළ කටයුතු කිරීමේ දී සමාජ වෘතවේදීන් විසින් සේවාලාභියාගේ වටිනාකම් හා පක්ෂග්‍රාහීත්වය පිළිබඳ දැනුවත් වීම, සේවාදායකයාගේ ලෝක දැක්ම පිළිබඳ දැනුවත් වීම, සංස්කෘතික වසයෙන් සුදුසු මැදිහත්වීම් සිදු කරයි. එමෙන් ම බහු සංස්කෘතික සමාජයක් තුළ ඵලදායී සමාජ වෘතවේදියෙකු වසයෙන් කටයුතු කිරීම සඳහා, දැනුම, කුසලතා සහ මැදිහත්වීමේ ක්‍රමෝපාය, විශ්වාස සහ ආකල්ප, සංස්කෘතිය සංයෝජනය කිරීම, සංස්කෘතික නිපුණතාව, සංවේදනය සහ සංස්කෘතීන් වෙන් කර හඳුනා ගැනීම වැනි ගුණාංග වර්ධනය කරගත යුතු බව අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි විය. ඒ අනුව, බහු සංස්කෘතික සමාජයක් තුළ සමාජ වෘතවේදියෙකු ලෙස කටයුතු කිරීමේ දී පුද්ගලයා, පවුල, ප්‍රජාව සහ සමස්ත සමාජයේ ම අවශ්‍යතා සඳහා වන ආකල්ප තක්සේරු කරමින් ඒවාට සංවේදී වෙමින් බහු සංස්කෘතික සමාජ සුභසාධන ක්‍රියාකාරියෙකු ලෙස පරිවර්තනය විය යුතු බවට නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** බහු සංස්කෘතික සමාජය, සමාජ වෘතවේදය, අභියෝග, ජනවාර්ගිකත්වය

[1] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. sandalil525@gmail.com

# මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් සඳහා සංවරා පහාතබ්බා තුළින් සිදු වන මනෝකායික චිකිත්සාව පිළිබඳ අධ්‍යයනයක්

*යූ.එස්. ඉන්දීවරී කරුණානායක*[1]

මිනිසාගේ කායික මානසික ක්‍රියාකාරිත්වයට හා ඔහුගේ චර්යාවන්ට බලපානු ලබන, මිනිසාගේ සාමාන්‍ය තත්වය වෙනස් කරන රසායනික ද්‍රව්‍ය සියල්ල මත්ද්‍රව්‍ය ලෙස හැඳින්වේ. මත්ද්‍රව්‍ය තුළින් පුද්ගලයාගේ සමස්ත කායික හා මානසික ක්‍රියාකාරීත්වය අඩාළ කරයි. සමාජයට, සංස්කෘතික පද්ධතියට හා පෞද්ගලික ව පුද්ගලයාට අහිතකර බලපෑම් රැසක් එල්ල කරනු ලබන මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රය උපයුක්ත කරගත හැකි ය. සබ්බාසව සූත්‍රයේ කෙලෙස් ප්‍රහාණය පිණිස දක්වන ක්‍රමවේද අතර සංවරා පහාතබ්බා සුවිශේෂී වේ. ඉන්ද්‍රියානුසාරී ව ලබන අරමුණු විෂයෙහි නුවණින් දැක දැන ක්‍රියාත්මක වීම තුළින් ඉන්ද්‍රිය සංවරය කර ගැනීමට පුද්ගලයාට හැකි වේ. මෙහි දී ප්‍රධාන වසයෙන් සිදු වන්නේ මනස ප්‍රධාන කොටගත් ඉන්ද්‍රිය සංවරයකි. ඉන්ද්‍රිය ආරම්මණයන් අසංවර වූ කල්හි පුද්ගලයා වැරදි ක්‍රියා කිරීමට පෙලඹේ. ඉන්ද්‍රිය සංවරය පිළිබඳ පංචසීල ප්‍රතිපදාවේ පස් වන ශික්ෂා පදය වන මදයට හා ප්‍රමාදයට හේතු වන මත් පැන් හා මත්ද්‍රව්‍යවලින් වැලකීම සඳහා මිනිසා සම්මා වායාමයක නිරත විය යුතු බව දක්වයි. සංවරා පහාතබ්බා තුළින් පුද්ගලයාගේ ඉන්ද්‍රියන් සංවරය භාවයට පත් කර, මත්ද්‍රව්‍ය ඇබ්බැහියෙන් පුද්ගලයා වලකාගත හැකි ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අධ්‍යයනයේ අරමුණු ලෙස මත්ද්‍රව්‍ය ඇබ්බැහියෙන් වලකාලීම, මත්ද්‍රව්‍ය හා ඒවා භාවිතය තුළින් තමාට හා සමාජයට වන හානිය, පරිහානිය පිළිබඳ ප්‍රජානනාත්මක අවබෝධයක් ලබා දීම ආදිය වේ. අධ්‍යයන ක්‍රමවේදය ලෙස පුස්තකාලය ගවේෂණය ඇසුරින් සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනයේ දී මූලික වසයෙන් ත්‍රිපිටකය, ද්විතීයික මූලාශ්‍රය ලෙස මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම් සම්බන්ධ ව ලියැවී ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ ද ශාස්ත්‍රීය ලිපි ආදිය ද ඇතුළු ව පුස්තකාලය පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි. මාතර කඹුරුගමුව ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූ පිරිසක් ආශ්‍රයෙන් සිදු වූ මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස ක්‍රමයෙන් චර්යා සංස්කරණය වීමක් සිදු විය. ඉන්ද්‍රියන් සංවරය භාවයට පත් කිරීම තුළින් මත්ද්‍රව්‍ය කෙරෙහි පැවති දැඩි ආශාව හා මිථ්‍යා අදහස් ඛණ්ඩණය විය.  මත්ද්‍රව්‍ය භාවිතයෙන් තමා පත් වන තත්වය, ඇති වන රෝගපීඩා සම්බන්ධයෙන් පුද්ගලයා ප්‍රජානනාත්මක අවබෝධයක් ලැබී ය. ඉන්ද්‍රිය අරමුණු සන්නිකර්ෂණය නිසා උපදින මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැනි අසාමාන්‍ය චර්යා ඛණ්ඩනය කිරීම සඳහා සංවරා පහාතබ්බා ප්‍රජානන චර්යාවාදී චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වේ.

***ප්‍රමුඛ පදඃ*** අසාමාන්‍ය චර්යා, මත්ද්‍රව්‍ය, ප්‍රජානන චර්යාවාදී චිකිත්සාව, ප්‍රජානනාත්මක අවබෝධය, සංවරා පහාතබ්බා

[1]කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, saleelakarunanayaka@gmail.com

# ආහාරයට ඇබ්බැහි වූවන් සඳහා ත්‍රිශික්ෂාව ප්‍රජානනාත්මක චර්යාවාදී චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*යූ.එස්. ඉන්දීවරී කරුණානායක*[1]

බුදු සමයට අනුව රෝගී වීම ධර්මතාවකි. ශරීරය රෝගයන්ට කැදැල්ලකි. වර්තමානය වන විට සමාජයේ බොහෝ පිරිස් බෝ නොවන රෝගයන්ගෙන් පීඩා විඳිති. දියවැඩියාව, හෘද රෝග, අධික රුධිරගත කොලෙස්ටරෝල්, රුධිර පීඩනය හා පිළිකා මෙන් ම අධි බර, ස්ථූලතාව සඳහා අක්‍රමවත් ආහාර පරිභෝජනය හේතු වී ඇත. නූතන මනෝවිද්‍යානුකූල ව ආහාර ගැනීමේ අක්‍රමතා අතර බලහත්කාරයෙන් අධික ලෙස ආහාර ගැනීමේ අක්‍රමතාව ආහාරයට අධික ලෙස ඇබ්බැහි වීම මානසික අක්‍රමතාවක් ලෙස සලකයි. පාලනයකින් තොර ව ආහාර ගැනීමේ හා අධික ලෙස ආහාර ආශාවක් මෙම පුද්ගලයන් තුළ පවතී. ආහාරයෙහි අධික ලෙස ලොල් වීම ආධ්‍යාත්මික ජීවිතය විනාශ කරන එසේ ම ජීවිතයට සෞඛ්‍යයට කිඹුල් බියක් හා සමාන වූ තර්ජනයක් බව බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇත. මෙම ආහාරයට ඇබ්බැහි වූවන් සඳහා ත්‍රිශික්ෂාව ප්‍රජානනාත්මක චර්යාවාදී චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වේ. සීලය තුළින් චර්යාත්මක ප්‍රතිකාරයක් සිදු වේ. චර්යාව සංස්කරණය කොට ක්‍රමානුකූල පුහුණුවකින් ආහාර සෞඛ්‍යාරක්ෂිත ව ලබා ගැනීමටත්, ව්‍යායාම ආදි සෞඛ්‍ය පුරුදු චර්යාවට එක් කළ යුතු වේ. සමාධි ශික්ෂාව තුළින් මානසික චර්යාත්මක ප්‍රතිකාරයක් ඔස්සේ චින්තන රටාව සමතුලිත කිරීම හා නිවැරදි කිරීම කළ යුතු ය. සමාධි භාවනා මගින් ආහාර පිළිබඳ පවතින චින්තනය කුසල අරමුණකට යොමු කළ හැකි ය. ප්‍රඥා ශික්ෂාව තුළින් ප්‍රජානනාත්මක අවබෝධය ඔස්සේ අධි ආහාර පරිභෝජනය හේතුවෙන් ඇති වන නිදන්ගත රෝග, ඒ අනුව තමාගේ සෞඛ්‍ය තත්ත්වයට වන බලපෑම, ජීවිතයට වන හානිය පිළිබඳ ගැඹුරින් කල්පනා කිරීමට ත්‍රිෂික්ෂාව ඔස්සේ යොමු වේ. ආහාරයට ඇබ්බැහි වූවන් සඳහා ත්‍රිශික්ෂාව ප්‍රජානනාත්මක චර්යාවාදී චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක ක්‍රමවේදය භාවිත කෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය වසයෙන් ත්‍රිපිටකය, ද්විතීයික මූලාශ්‍රය ලෙස නූතනයේ දී ආහාර ගැනීමේ අක්‍රමතාව හා ප්‍රජානන චර්යාවාදී චිකිත්සාව සම්බන්ධ ව ලියැවී ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ ද ශාස්ත්‍රීය ලිපි ආදිය ද ඇතුළු ව පුස්තකාලය පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි. තව ද නූතන මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන් සමග සිදු කෙරෙන සාකච්ඡා මගින් ද දත්ත රැස් කරන ලදී. ත්‍රිෂික්ෂාව හා සම්බන්ධ චිකිත්සාව පර්යේෂණ සීමා වේ. අධ්‍යයන අරමුණ ලෙස නිරෝගීමත් ප්‍රජාවක් නිර්මාණය කිරීමයි. ආහාරයේ මත්තඤ්ඤුතාව දැන ආහාර පරිභෝජනය සඳහා පුද්ගලයා යොමු කිරීමට ත්‍රිෂික්ෂාව මනෝකායික චිකිත්සාවක් ලෙස ක්‍රියාත්මක වේ. මේ සඳහා විසඳුම් ලෙස ම. නි. සබ්බාසව සූත්‍රය, විතක්කසන්ඨාන සූත්‍රය උපයෝගී කරගනිමින් ආහාරයට ඇබ්බැහි වීමේ චිත්තවේග ඛණ්ඩනයට හැකි විය. තව ද ත්‍රිෂික්ෂාව ප්‍රජානන චර්යාවාදී චිකිත්සාවක් ලෙස භාවිත කරමින් මානසික පීඩා හා දුස්සමාහිත චර්යාවලින් තොර සමාජයක් බිහි කිරීමට අවධානය යොමු කිරීම කාලෝචිත ය.

***ප්‍රමුඛ පද:*** ආහාර ගැනීමේ අක්‍රමතාව, ප්‍රජානන චර්යාවාදී චිකිත්සාව, ප්‍රඥා, සමාධි, සීල

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, saleelakarunanayaka@gmail.com

# කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර සට්ටනය (හෙවනැල්ල නවකතාව ඇසුරෙනි)

*ඩබ්ලිව්.ඒ.එන්. සෙව්වන්දි* [1]

'ඒජන්සි' යන ඉංග්‍රීසි වචනයේ අර්ථය ප්‍රකාශ කිරීම පිණිස කාරකත්වය යන පදය යොදා ගැනේ. කාරකත්වය යනු කිසියම් පුද්ගලයෙක් හට ස්වාධීන ලෙස තීරණ ගැනීමට ඇති හැකියාව ලෙස අර්ථකථනය කළ හැකි ය. සමාජ සංස්ථිතිය යනු සමාජයේ සැකැස්මයි; දේශපාලන, ආර්ථික, සංස්කෘතික හා ආගමික වසයෙන් ගොඩනැගී ඇති මානව ක්‍රියාකාරිත්වය පාලනය කරන චින්තන පද්ධතියයි. සමාජ සංස්ථිතිය හා පුද්ගල කාරකත්වය අතර අතිශය සංකීර්ණ සබඳතාවක් පවතී. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන ක්ෂේත්‍රවල භාවිත වන මෙම සංකල්පද්වය සාහිත්‍ය කලා විචාරයෙහිලා ද උපයුක්ත කොටගත හැකි ය. සමාජයේ සාම්ප්‍රදායික ව පවත්වාගෙන යනු ලබන ස්වභාවිකකරණයට ලක් ව ඇති චින්තන රටා හෙවත් දෘෂ්ටිවාද පුද්ගල කාරකත්වය කෙරෙහි අවිඥානික ව ම බලපෑම් සිදු කරයි. කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර සට්ටනය සිරි ගුනසිංහගේ හෙවනැල්ල නවකතාව ආශ්‍රයයෙන් අධ්‍යයනයකට ලක් කිරීම මෙම පර්යේෂණයෙන් සිදු විය. කාරකත්වය හා සමාජ සංස්ථිතිය අතර සට්ටනය කෙබඳු ද යන්න පර්යේෂණ ගැටලුව විය. පර්යේෂණ ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සිරි ගුනසිංහ විසින් රචනා කරන ලද 'හෙවනැල්ල' නවකතාව භාවිත කළ අතර පුස්තකාලය හා අන්තර්ජාලය සමීක්ෂණය ඔස්සේ සෙසු දත්ත රැස් කර ගැනීමට යොමු විය. හෙවනැල්ල නවකතාවේ ජිනදාස නමැති තරුණයා කුඩා කල සිට ලොකු හාමුදුරුවෝ, ලොකු ඉස්කෝලෙ මහත්තයා වැනි සමාජයේ වැදගත් යැයි සම්මත චරිත පමණක් ඇසුරු කිරීමට යොමු කළ බැවින් සම වයසේ මිතුරන් ඇසුරු කිරීමට ඔහුට අවස්ථාව අහිමි විය. ඔහු ඇසුරු කළ වැඩිහිටියන් විසින් පෙන්වා දෙනු ලැබූ හොඳ යැයි සම්මත සමාජ සංස්ථිතික රාමුවකට අනුගත වීම හේතුවෙන් ඔහුගේ කාරකත්වය සීමා වී දැඩි මානසික සට්ටනයකට ලක් වන අයුරු එහි දී හඳුනාගත හැකි විය. ඊට වෙනස් සමාජ සංස්ථිතියක හැදී වැඩුණු ජිනදාසගේ මිතුරා වූ විජේපාලගේ චරිතය කාරකත්වයෙන් යුතු ස්වාධීන චරිතයක් ලෙස මෙහි නිරූපිත ය. කාරකත්වය යනු ස්වාධීන තීරණ ගැනීමට ඇති හැකියාව ලෙස අර්ථකථනය කළ ද, සමාජ සංස්ථිතිය අවිඥානික ව ම පුද්ගල කාරකත්වය සීමා කරන බව මෙහි දී පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** කාරකත්වය, සට්ටනය, ස්වාධීන, සමාජ සංස්ථිතිය, හෙවනැල්ල

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, sewwandinimesha30@gmail.com

# පිරිහීයන සමාජ සදාචාරය නැවත ගොඩනැගීමෙහිලා බෞද්ධ සීල ප්‍රතිපදාවේ උපයෝගීත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*රශ්මි කෞශල්‍යා ප්‍රියසාද්*[1]

ශ්‍රී ලංකා ජනසමාජය තුළ ත් පොදුවේ සමස්ත ලෝක සමාජ පද්ධති තුළ ත් සදාචාර පරිහාණියේ ප්‍රබල කැපී පෙනීමක් දක්නට ලැබෙන අතර ආගමික ප්‍රවාහයට පාලනය කළ නො හැකි පසුබෑමක් ලෙස එය හඳුනාගත හැකිය. මෙම සමාජ සදාචාර පරිහාණිය හේතුවෙන් ලෝකයේ පැවැත්ම කෙරෙහි දරුණු බලපෑමක් එල්ල කර ඇති අයුරු නිරීක්ෂණය වේ. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්හී මුඛ්‍යය පරමාර්ථය පුද්ගලයා නිර්වාණ අවබෝධය කරා මෙහෙයවීමයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ යහපත් සමාජයක් ගොඩනැංවීමෙහිලා සීල ප්‍රතිපදාව අතිශයින්ම මහෝපකාරි වන බව ය. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් දායක කර ගනු ලැබේ. පිරිහීයන සමාජ සදාචාරයෙහි සීල ප්‍රතිපදාව අනුගමනය නොකරන යම් බඳු තැනැත්තකු වේ නම්, එබඳු පුද්ගලයා තවත් අයෙකුට ඊට අනුබල දිය හැකි ද? සීලය යනු කය හා වචනයේ සංවරයයි. කය, වචනයෙහි සංවරය සමඟින් මිනිසා වෙලාගෙන ඇති අයහපත් චිත්තාවේගයන්ගෙන් ද නිදහස් වනු ඇත. එනමුත් මෙම ක්‍රියාදාමය පහසු කාර්යයක් නොවන අතර ආරම්භයක් වශයෙන් කුඩා ළමයාගේ සිට වැඩිහිටියා දක්වා සීල ප්‍රතිපදාවේ නිරත වීමෙන් ලැබෙන ආනිශංස පෙන්වාදිය යුතු ය. එමෙන්ම ඒ තුළින් පුද්ගලයාට ලැබෙන ලෞකිකමය ප්‍රතිලාභ හා ලෝකෝත්තර වශයෙන් ලැබෙන ප්‍රතිලාභ කෙරෙහි යම් පරිචයන්හි සමන්විත කරලිය යුතු ය. බුදුරජාණන් වහන්සේ සාමඤ්ඤඵල, සාලෙය්‍යක වැනි සූත්‍ර දේශනයන් හි මේ පිළිබඳ විස්තර කර ඇත. සීල ප්‍රතිපදාව මඟින් පාප සංකල්පයක් හඳුන්වා දී සමාජය සුමගට ගැනීමට බෞද්ධ ඉගැන්වීම් දක්වන දායකත්වය මෙමඟින් ඇගයීමට ලක්වන අතර බෞද්ධ සමාජයක දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා සදාචාර පද්ධතියකට යොමු කිරීම නැමැති ගුණාංගය පිළිබඳ අවධානය යොමු කෙරේ. මෙම බෞද්ධ සීල ප්‍රතිපදාව නූතනත්වයට ගැලපෙන අයුරින් විවරණය කිරීම ලෝක සමාජ යහපැවැත්ම උදෙසා කිසියම් දායකත්වයක් ප්‍රදානය වෙතැයි නිගමනය කෙරේ.

***ප්‍රමුඛ පද :*** *ජනසමාජය, ප්‍රතිලාභ, බුදුන් වහන්සේ, සමාජ සදාචාරය, සීලය*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය.

rashmikawshalyapriyasad@gmail.com

# දකුණු පළාතේ ජනවහරෙහි පවතින උපසංස්කෘතික අනන්‍යතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් (ගාල්ල ප්‍රදේශය ඇසුරින්)

*සුමුදු වාසනා ජයරත්න*[1]

සංස්කෘතිය ඕනෑම සුසමාදර්ශයක කේන්ද්‍රස්ථානයයි. එය සෑම සමාජයකටම ආවේණික වූත් අනන්‍ය වූත් අවියෝජනීය සාධකයකි. සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයේදී මහා සංස්කෘතිය මත ගොඩනැගෙන කුඩා සංස්කෘති දෙස අවධානය යොමු කිරීම වැදගත් වේ. එලෙස ගොඩනැගෙන කුඩා සංස්කෘතියක් ලෙස උපසංස්කෘතිය හඳුනාගත හැකි වේ. ජාතික, ආගමික, ආර්ථික, දේශපාලනික, සමාජීය ආදි සාධක මත වෙන් වෙන්ව පවතින සමාජවලට අයත් සංස්කෘතිය උපසංස්කෘතියයි. ඒ ඒ උපසංස්කෘතිවලට අයත් සංස්කෘතික අනන්‍යතා පවතී. සෑම උපසංස්කෘතියක්ම ජනවහර ආගම, පාලන තන්ත්‍රය, ඇදහිලි විශ්වාස, සිරිත් විරිත්, සාහිත්‍යය, කර්මාන්ත, කලාශිල්ප හා තාක්ෂණය යනාදී සංස්කෘතික අනන්‍යතාවලින් පෝෂිත වේ. එයිනුත් ජනවහරෙහි සංස්කෘතික අනන්‍යතා වැදගත් වේ. එහෙයින් මෙම පර්යේෂණයේදී දකුණු පළාතේ ජනවහරෙහි උපසංස්කෘතික අනන්‍යතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කෙරුණි. දකුණු පළාතේ ජනවහරෙහි උපසංස්කෘතික අනන්‍යතා කවරාකාර වේද යන්න පර්යේෂණ ගැටලුවයි. පර්යේෂණ අරමුණ දකුණු පළාතේ ජනවහරෙහි පවත්නා සංස්කෘතික අනන්‍යතා මොනවාදැයි අධ්‍යයනයක යෙදී මයි. ඒ ඔස්සේ දකුණු පළාතේ ජනවහරෙහි පවත්නා උපසංස්කෘතික විචල්‍යතා මතු කර ගැනීම උප අරමුණකි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුව මෙම පර්යේෂණය සිදු කෙරුණු අතර ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, පුස්තකාල පරිශීලනය මඟින් දත්ත එක්රැස් කර ගැනුණි. දත්ත රැස් කිරීම දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට පමණක් සීමා විය. මෙහිදී අනාවරණය වූයේ ප්‍රාදේශිකත්වය, භූගෝලීය විවිධතාවය, රැකියාව, වයස, ජනවාර්ගිකත්වය ආදිය පදනම් කර ගනිමින් ජනවහරෙහි විවිධ උපසංස්කෘතික අනන්‍යතා හඳුනා ගැනීමට හැකි වෙන බවයි. එහිදි දකුණු පළාතේ ජනවහර සුවිශේෂතා ලක්ෂණ සහිත වන බවත් හඳුනා ගැනුණි. විවිධ උච්චාරණ විධි, වාක්‍ය රටා, පද සංයෝග, වචනාර්ථ යනාදි ජනවහරෙහි උපසංස්කෘතික අනන්‍යතා රැසක් මෙහිදි අධ්‍යයනය විය. ඒ අනුව දකුණු පළාතේ ජනවහරෙහි පවතින උපසංස්කෘතික අනන්‍යතා දකුණු පළාතට පමණක් ආවේණික වූවක් වන බව මෙම පර්යේෂණය ඔස්සේ නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද*** *: ජනවහර, උපසංස්කෘතිය, උපසංස්කෘතික අනන්‍යතා, දකුණු පළාත, විචල්‍යතා*

[1] පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

URSSSH RUSL 2023

Undergraduate Research Symposium - Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

# Tourism Management



FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE

# IDENTIFY THE TRAVEL DESTINATION ATTRIBUTES THAT ATTRACT INTERNATIONAL TOURISTS TO VISIT KANDY TOURISM ZONE

*D.M.T.M. Jayasundara*[1]

International tourism has become the world's largest export earner in developed and developing countries including Sri Lanka. Sri Lanka stepped into the international tourism market in the 1960, however because of North and East separatist war, Covid 19 and economic crisis in Sri Lanka tourism showed a fluctuation demeanor. Thus, Sri Lanka unable to identify the attributes which are attract tourists to travel in destination. Kandy is a charming city in central Sri Lanka's lush the mountains, noticed for its rich cultural legacy and visual beauty. The city is home to the UNESCO World Heritage Site Temple of the Tooth Relic, which holds a relic of Lord Buddha's tooth. As the World Heritage Site Kandy tourism zone is one of the traditional and powerful competitors in tourism market. When investigating the competitive tourist market, tourism planners would benefit greatly from identifying crucial travel destination qualities when selecting their prospective destination. Therefore, the purpose of this study was identify the travel destination attributes that attract international tourists to visit Kandy tourism zone. Sixteen important destination attributes were identified by the literature review. International tourists, who visit the Kandy tourism zone are the target population of this study. Sample size was 100 and structured questionnaire was distributed to participants who were randomly selected international tourists in Kandy tourism zone. Factor analysis was used to identify the important destination attributes in Kandy, which were formulated according to the three ways influences. The results show that, landscape in Kandy, culture & religious value, hospitality, health, safety and relaxation are more important attributes in Kandy. Also, the findings revealed that landscape, climate, culture, religion, and service are more significant to Kandy's overall image.

***Keywords:*** Sri Lankan tourism, Kandy tourism zone, Destination attributes, International tourists, Tourist satisfaction

[1] Kelaniya University of Sri Lanka. tharakajayasundara35@gmail.com

# කුරුළුපෙත්තාගල උතුරුපියංගල රාජමහා විහාරස්ථානය සතු ඓතිහාසික වැදගත්කම සංචාරක ගමනාන්තයක් ලෙස විවෘත්ත කළ යුතු ආකාරය පිළිබඳ ව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*බී.එම්.සී. මධුසංඛ බණ්ඩාර*[1]

අනුරාධපුර රාජධානි සමයට අයත් පැරණි ගල්ලෙන් සම්ප්‍රදාය නියෝජනය කෙරෙන ඓතිහාසික සිද්ධස්ථානයක් ලෙස කුරුළුපෙත්තාගල උතුරුපියංගල රාජමහා විහාරස්ථානය හඳුනාගත හැකි ය. මෙම විහාරස්ථානය භාතිකාභය රජු විසින් ධම්මදින්න මහ රහතුන් වහන්සේ ඇතුළු පන්සියයක් රහතුන් වහන්සේලා සඳහා පූජා කරන ලද බව සැලකේ. කුරුළුපෙත්තාගල උතුරුපියංගල රජමහා විහාරස්ථානය සතු ඓතිහාසික වැදගත්කම සංචාරක ගමනාන්තයක් ලෙස විවෘත කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූ අතර මෙම විහාරස්ථානය සම්බන්ධයෙන් විධිමත් ගවේෂණයක් හෝ පුරාවිද්‍යාත්මක කැණීමක් මෙතෙක් සිදු වී නොමැති නිසාවෙන් විධිමත් පර්යේෂණයක් සිදු කිරීමටත්, විහාරස්ථානයෙහි කලාත්මක සහ පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කර ගැනීමට අවැසි යෝජනා ඉදිරිපත් කිරීමටත්, මෙම විහාරස්ථානය සංචාරක ක්ෂේත්‍රයෙහි ලා විවෘත්ත කිරීම ආදි කාරණා ඉස්මතු කිරීම මෙම අධ්‍යයනය සිදු කිරීමේ මූලික අරමුණු විය. එසේ ම ක්ෂේත්‍ර ගවේෂණය, ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය මෙන් ම සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ අන්තර්ජාලය භාවිතය ඔස්සේ දත්ත ග්‍රහණය කරගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පුරාවිද්‍යාත්මක අගයන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ප්‍රධාන දාගැබ් සහ පරිවාර දාගැබ් සතරකින් යුක්ත ව නිම කරන ලද දාගැබ් පහකින් තුනක නටඹුන් විහාරස්ථානය තුළ තවමත් ඉතිරි ව පවතී. එසේ ම ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා භාවිත කළ භාවනා කුටි සහ සක්මන් මළුවල සාධක අදටත් දක්නට ලැබේ. පියන්පතක ආකාරයකට පිහිටා තිබෙන පැරණි ගල්ලෙන ද පුරාවිද්‍යාත්මක අගයක් ලෙස හඳුනාගත හැකි ය. මෙම පිහිටි ගල්ලෙන තුළ 18 රියන් සැතපෙන බුද්ධ ප්‍රතිමාවක් ද ඒ වටා හිඳි පිළිම, හිටි පිළිම සහ බුදුන් වහන්සේගේ සූවිසි විවරණය කැටයම් කොට තිබේ. පිහිටි ගල මත තනා තිබෙන මෙම අලංකාර බුද්ධ මන්දිරයට ප්‍රවේශ වන දොරටුව ශෛලමය පාෂාණයකින් තනා තිබීම විශේෂත්වයකි. එසේ ම විශාල ගල් පර්වත කිහිපයක් ද නටබුන් වී තිබෙන පැරණි චෛත්‍යය කිහිපයක් ද අනාවරණය විය. මෙම විහාරස්ථානයේ කලාත්මක වටිනාකම් පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී අනුරාධපුර අවධියට අයත් යැයි සැලකෙන සිතුවම් කිහිපයක් පවතින අතර මේවා පිහිටි ගලෙහි ම සිතුවම් කර තිබීම විශේෂත්වයකි. තව ද ප්‍රධාන විහාර මන්දිරයේ ඇති මකර තොරණ ද කලාත්මක ලක්ෂණ පෙන්වන අතර එහි දේව, මානව, පක්ෂි, ඉරහඳ, ලියවැල් සහ වාමන රූපවලින් අලංකාරවත් කර තිබේ. මේ අනුව පුරාවිද්‍යාත්මක සහ කලාත්මක වටිනාකම් රැසකින් සමන්විත මෙම විහාරස්ථානයට වර්තමානය වන විට නිදන් සොරුන්ගෙන් සහ විවිධ අන්තවාදී පිරිස්වලින් බලපෑම් එල්ල වී තිබේ. අප්‍රකට ව පවතින ඓතිහාසික වැදගත්කමක් සහිත මෙම විහාරස්ථානය වර්තමාන සංචාරක ක්ෂේත්‍රයෙහි ලා විවෘත කිරීම කාලීන වසයෙන් වැදගත් වන අතර මෙම විහාරස්ථානය තුළ පවතින ඓතිහාසික වැදගත්කම පිළිබඳ විස්තර ඇතුළත් සඟරාවක් හෝ පොතක් නිර්මාණය කර සහනදායි මිලට ජනතාව අතර බෙදා හැරීම, මෙම ස්ථානය අවට තිබෙන වන රක්ෂිතය සංචාරකයන්ට නැරඹිය හැකි ස්වභාව සෞන්දර්ය ආරක්ෂා වන පරිදි නිර්මාණය කිරීම, සංචාරකයන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් ලබාදීම, දක්ෂ මගපෙන්වන්නන් ලවා මෙම විහාරස්ථානයේ හා ඒ අවට ඇති වැදගත්කම පිළිබඳ පෙන්වා දීම සහ දෙස් විදෙස් සංචාරකයන්ගේ සංචරණය සඳහා ගමනාන්ත පහසුකම් සැලසීම ආදිය මගින් මෙම විහාරස්ථාන පරිශ්‍රය සංචාරක ක්ෂේත්‍රයෙහි ලා විවෘත කළ හැකි බැව් පෙන්වා දිය හැකි ය. මෙලෙස පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේ දී අවසන් වසයෙන් නිගමනය කළ හැක්කේ මෙ වැනි සිද්ධස්ථාන නිසි ලෙස සංරක්ෂණය කරමින් මෙම විහාරස්ථානය තුළ පවතින ඓතිහාසික වැදගත්කම සංචාරක ක්ෂේත්‍රයෙහි ලා විවෘත කිරීමට නිසි පියවර අනුගමනය කරමින් සංචාරක ගමනාන්තයක් ලෙස නඟා සිටුවීම යුගයේ කාලීන වසයෙන් වැදගත් අවශ්‍යතාවක් වන බැව් අවසන් වසයෙන් සඳහන් කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** අනුරාධපුර රාජධානිය, ඓතිහාසික වටිනාකම, ගල්ලෙන් සම්ප්‍රදාය, ගමනාන්තය, ශෛලමය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය madusankabandaranayaka42@gmail.com

# අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමට ගත හැකි පියවර පිළිබඳ අධ්‍යයනයක්

*ජී.ඩබ්ලිව්.ටී.එස්. නවෝදි* [1]

ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඓතිහාසික රුවන්වැලිසෑය සමීපයෙහි අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය පිහිටා තිබේ. මෙය ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පවතින විශාලතම මෙන් ම පැරණිතම කෞතුකාගාරය ලෙස සැලකේ. එමෙන් ම මේ වන විට විශාලතම ශිලාලේඛන භාරකාරීත්වය ද දරන්නේ මෙම කෞතුකාගාරයයි. මෙවැනි අතිශය වටිනාකමකින් යුත් අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය එහි ඓතිහාසික අගය සුරක්ෂිත කරමින් සංචාරක කර්මාන්තයට විවෘත කළ යුත්තේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ දැනට පවත්නා අඩුපාඩු සකස් කර ගනිමින් එය සංචාරක තෝතැන්නක් බවට පත් කිරීමට අවශ්‍ය යෝජනා සකසා ලීමයි. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යටතේ ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතීයක මූලාශ්‍රය තුළින් දත්ත රැස් කරන ලදී. එමෙන් ම මෙම පුරාවිද්‍යා කෞතුකාගාරය සහ අවට ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙමින් ද කරුණු රැස් කරන ලදී. මෙලෙස එක්රැස් කරගත් කරුණු විශ්ලේෂණය කිරීමේ දී සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ අනුරාධපුරයෙහි පවතින අභයගිරි හා ජේතවන කෞතුකාගාරයන් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වුව ද අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය සංචාරකයන්ගේ අවධානය යම්කිසි අවම මට්ටමක පැවතීමට හේතු සොයා බලන ලදී. එමෙන් ම ලංකාවේ කොළඹ ඇතුළු අනෙකුත් කෞතුකාගාරයන් සමඟ ද දත්ත රැස් කොට සංසන්දනාත්මක ආකාරයෙන් කරුණු විශ්ලේෂණය කරන ලදී. මෙම පුරාවිද්‍යා කෞතුකාගාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී මෙහි ගැටලුකාරීත්වයක් ද දැකිය හැකි ය. මෙම ස්ථානයට ළඟා වීමට ඇති මාර්ගය පිළිබඳ ව ජනතා දැනුවත්භාවය අවම වීම, කෞතුකාගාරය තුළ කෞතුක වස්තූන් ඡායාරූප සහ වීඩියෝ ගැනීමට අවස්ථාව ලබා නොදීම යනාදිය ගැටලු ලෙස පෙන්වා දිය හැකි ය. එමෙන් ම ලෝකයේ ප්‍රකට ජනතා ආකර්ෂණය පවතින කෞතුකාගාරයන් සමඟ සසඳා බැලීමේ දී මෙම අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට යෝජනා මෙලෙස පෙන්වා දිය හැකි ය. ඩිජිටල් තාක්ෂණයන් භාවිත කිරීම, බහුභාෂා සංදර්ශක සහ භාෂා පරිවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කෞතුකාගාර යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම, අතථ්‍ය චාරිකා වැඩිදියුණු කිරීම, කෞතුකාගාරය තුළ අධ්‍යාපනික සහ මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මෙම කෞතුකාගාරය හුදෙක් තාක්ෂණය පදනම් කරගත් එකක් නිසා තාක්ෂණය භාවිත කරන ආකාරය පිළිබඳ ව අනුරුවවල් සකස් කිරීම යනාදීය යම්තාක් දුරකට හෝ අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ ස්ථාපිත කළ හැකි නම් මෙම ස්ථානය සංචාරක තෝතැන්නක් බවට පත් කළ හැකි ය. මෙලෙස සංවර්ධිත කෞතුකාගාරයක් දෙස් විදෙස් සංචාරකයන්ට විවෘත කිරීම තුළින් ලංකාව තුළ බිඳ වැටී ඇති ආර්ථිකය යළි නඟා සිටුවීමට ද එය දායක කරගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය, තාක්ෂණය, රටේ ආර්ථිකය, සංචාරක කර්මාන්තය, සංචාරක තෝතැන්න,

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. gwtsnawodi.2000@gmail.com

# A STUDY ON THE CONTRIBUTION OF DOCUMENTARY FILM: AN ANALYSIS OF TOURISM INDUSTRY DEVELOPMENT IN SRI LANKA.

*H.E. Gunasingha*[1]

The tourism industry in Sri Lanka is facing heightened competition in the global market, necessitating the adoption of innovative promotional strategies. This research addresses the dearth of comprehensive documentation regarding the actual contribution of documentary films to the growth and development of Sri Lanka's tourism sector. Documentary films offer a compelling medium through which the nation's distinctive cultural heritage, natural beauty, and diverse experiences can be showcased to a worldwide audience. However, empirical evidence regarding their impact remains limited. The research problem focuses on the need to understand the role of documentary films in Sri Lanka's tourism industry. The research objectives aim to investigate their impact on tourist perceptions and motivations, analyze their role in shaping the destination image, identify barriers and challenges in utilizing these films for tourism development, and propose recommendations for their effective integration into Sri Lanka's tourism promotion strategy. To achieve these objectives, a mixed-method research design will be employed, combining quantitative and qualitative approaches. Structured surveys will be distributed to 100 international tourists during the peak tourism season, while in-depth interviews with key stakeholders will provide valuable insights. Supplementary data will be collected from academic journals, industry reports, and official tourism publications. These data were analyzed by SPSS and NVivo software. Preliminary findings suggest a positive correlation between exposure to documentary films and increased interest among tourists in visiting Sri Lanka. These films play a significant role in creating awareness about the country's cultural richness, ecotourism potential, and authentic experiences. Nevertheless, challenges such as funding constraints, distribution limitations, and content authenticity hinder their full potential to contribute to sustainable tourism development in Sri Lanka. Overcoming these challenges will be crucial to maximizing the benefits of documentary films for the tourism industry.

***Keywords:*** Documentary films, tourism industry, destination branding, tourist perceptions, sustainable development.

[1] Facility of Humanities, Department of Drama, Cinema & Television Studies, University of Kelaniya. gunasinghak.h.e18@gmail.com

# PROBLEMS AND SOLUTIONS RELATED TO THE TOURISM INDUSTRY IN THE HISTORICAL DIMBULAGALA MOUNTAIN AND ITS SURROUNDINGS

*H.I. Sathsara De Zoysa*[1] *H.M.Y.P. Wickramasingha*[2]

Dimbulagala Hill, situated just 18 kilometers from Polonnaruwa Kaduruwela town, is a hidden gem of ancient history yet to be fully appreciated by tourists, both local and international. Dating back to the 1st century BC, this Buddhist sanctuary holds a trove of historical and cultural treasures, including Oushada Pokuna, Nildiya Pokuna, Buddhist Piriwena, and captivating ruins. It also features Pulligoda paintings, inscriptions from the early and late Anuradhapura periods, and striking stone Buddha statues. But the problem is that the number of local and foreign tourists visiting Dimbulagala is much lower compared to the nearby old town of Polonnaruwa. The purpose of this research is to identify the reasons for the decrease in tourist attraction and suggest some solutions. Field study and map study methods are used here. As a result, various reasons have been identified such as lack of infrastructure, lack of trained guides, lack of well-informed publications about the field, and difficulty in traveling on the roads through the forest. To address these issues, a comprehensive tourism promotion plan centered on Dimbulagala is proposed, necessitating cooperation from the government and local communities. Key steps to boost Dimbulagala Hill's appeal include creating accessible materials like books, pamphlets, travel guides, and informative reports highlighting its historical and environmental significance. These materials should be strategically placed alongside popular tourist destinations in Polonnaruwa. Training Dimbulagala's residents in hospitality management is vital to ensure a warm welcome for tourists. To enhance the visitor experience, we recommend introducing activities like water sports near Dimbulagala Lake. Crucial infrastructure improvements, such as safe and accessible roads to the reserve's attractions, and the recruitment and training of capable tourist guides, are essential components of this revitalization effort. In conclusion, by carefully implementing these strategies, Dimbulagala has the potential to emerge as an enticing destination for both domestic and international tourists eager to explore its rich history and cultural diversity.

***Keywords:*** Problems, solutions, tourism industry, Dimbulagala mountain and its surroundings

[1] Uwa wellassa University of Sri Lanka, Badulla. imeshasathsara@gmail.com
[2] University of Kelaniya, Kelaniya. yasangapraveenwick@gmail.com

# ANCIENT DIMBULAGALA HILL HIDDEN FROM LOCAL/FOREIGN TOURISTS.

*H.I.S. De Zoysa* [1]

Dimbulagala Hill, which is about 18 kilometers away from Polonnaruwa Kaduruwela town, is an ancient place that is not much visited by tourists. Dating back to the 1st century BC, this Dimbulagala Buddhist center is an important place with black water pond, blue water pond, Buddhist colleges, Pulligoda paintings, panels with Brahmic word, stone Buddha statues. I engaged in a field visit to collect this kind of information. Similarly, because of my native village, I am very fond of this study. Local and foreign tourists do not pay attention to this tourist place because of their ignorance about this place. There are many reasons for it. Namely, limited historical records, remote location, weak tourism promotions, limited local knowledge and rumors, limited infrastructure, unrecognized cultural diversity, there are many activities to attract tourists to Dimbulagala. That is, the infrastructure should be developed systematically. For that, the support of the government as well as the local communities should be taken. Likewise, Dimbulagala Mountain has plant communities rich in dry zone biodiversity. Tourists should be informed about this. Research and Development: Invest in research and development to identify and showcase lesser-known attractions and historical aspects of Dimbulagala. This will allow for a more diverse and enriching tourist experience. Similarly, brochures and tourist advertisements should be published in the vicinity of famous tourist spots about Dimbulagala. Dimbulagala area is inhabited by various peoples like Sinhala, Tamil, Adivasi... They have their own culture. State or non-state organizations should intervene to show their cultures in front of tourists. The people of Dimbulagala village should be given knowledge about hospitality management. Similarly, tourists should be allowed to try things like Udesa water sports in the vicinity of Dimbulagala Lake. By considering all these details, the historical place called Dimbulagala can attract tourists from home and abroad.

***Keywords:*** Ancient Dimbulagala, local/foreign tourists, hidden, Research and Development, historical

---

[1] Uwa wellassa University of Sri Lanka, Badulla. imeshasathsara@gmail.com

# A STUDY ON TOURIST SATISFACTION OF ZOOLOGICAL PARKS IN SRI LANKA: SPECIAL REFERENCE TO PINNAWALA OPEN ZOO

*W.D.G.M.D. Kumari*[1]

In an increasingly competitive tourism market, it is essential to assess tourists' levels of satisfaction. As a first open zoo in Sri Lanka, Pinnawala Open Zoo is located in Rambukkana, Kegalle district. Considering about tourist Satisfaction in this zoo which the conformity between tourists' satisfactions and destinations' characteristics are in unpleasant level among the domestic and international tourists when visiting this destination. This situation creates a bad image about particular zoo among the tourists. Therefore, this case study at Pinnawala Open Zoo was attempted to examine the factors that affect to the tourists' level of satisfaction at the zoo. 50 tourists selected as the sample through the simple random sampling technique. A self-administered questionnaire was designed to collect data from sample of tourists (local and foreign). According to results, 54% tourists stated that the main reason for their visit was, for entertainment, and followed by 34% of tourists that out from the sample visited the zoo with the purpose of for go out somewhere with their family, relatives, friends. In relation to the facilities that available at zoo, 70% of tourists considered that they are not in good level. However, majority of tourists at zoo stated that their overall satisfaction at zoo is not in good level. It can be concluded as, the service quality that provided to tourists at zoo, friendliness of zoo management, security at zoo, etc. are affect to the level of tourist satisfaction at Pinnawala Open Zoo and a substantial number of tourists were not recommend the zoo for their relatives, friends. However, it can be recommended that buggy vehicle service, animal feeding events at zoo, souvenir shops, etc. for increase the level of tourist satisfaction at Pinnawala Open Zoo. The recommendations of the study can facilitate future researchers, government, policy makers relevant to zoo tourism.

***Keywords:*** Tourism, Tourist satisfaction, Destination characteristics, Zoological park, Pinnawala Open Zoo

[1] Rajarata University of Sri Lanka, Mihintale. dilrukshikumari046@gmail.com

# Exploiting the Potential of Coconut Tourism; Market Analysis from the Stakeholders' Perspective

*A.L.A.P. Umashani*[1] *A.C.I.D. Karunarathne*[2] *W.M.A.H.Bandara*[3]

Tourism has witnessed significant growth and evolution, embracing new concepts to engage diverse stakeholders. Niche tourism, which tailors specific products to cater to distinct tourist segments have emerged as a notable strategy. Sri Lankan coconut industry holds immense importance, serving as a crucial source of foreign exchange, employment, and sustenance in rural livelihoods. Exploiting the potential of coconut-related activities, coconut tourism can be developed as a niche tourism segment, encompassing sustainable, nature-based, and eco-friendly practices. Market analysis plays a pivotal role in creating successful tourism products, this study aims to identify the prospects and conduct a market analysis for the development of coconut tourism in Sri Lanka, considering the perspectives of key stakeholders involved in the coconut and tourism industries. Thus, primary data was collected through semi-structured interviews with 06 tourists in Ella, employing convenience sampling, and through the snowball sampling technique with 13 other key stakeholders. The qualitative approach and thematic analysis were applied to examine the transcribed data. The findings of this study based on SWOT analysis, a map of stakeholders and their role, value chain, and marketing mix under the 7p's to developing coconut tourism as a niche tourism segment in Sri Lanka. Further, the findings encompass that there are a number of strengths and opportunities rather than weaknesses and threats to developing coconut tourism as a niche tourism segment in Sri Lanka, with significant interest and power of the key stakeholders of Government Bodies and policymakers, Tourists, Travel agencies and tour operators, Accommodation providers, Coconut manufacturers, and exporters. Moreover, the findings of the study revealed the way private sector companies work with the government and civil society to add value to the development of coconut tourism in Sri Lanka with a clearly defined and clarified marketing mix for coconut tourism with significant components for each mix. Additionally, this study provides recommendations and technical insights to foster the growth of coconut tourism, harmonizing the coconut and tourism industries in Sri Lanka. The analysis of the market and optimal resource utilization facilitates the creation of new tourism products that cater to niche categories of tourists, offering a viable solution for the sustainable development of tourism in Sri Lanka under the concept of re-thinking tourism.

***Keywords:*** Coconut Tourism, Niche Tourism, Market Analysis, Stakeholder Perspective, Sustainable Development

[1] Uva Wellassa University of Sri Lanka. probodika.umashani98@gmail.com
[2] Uva Wellassa University of Sri Lanka. chandi@uwu.ac.lk
[3] Uva Wellassa University of Sri Lanka. asanka.b@uwu.ac.lk

# ලංකාවේ ඉපැරැණි ලාක්ෂා කලාව සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා යොදා ගැනිමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යනයක්

*ඩී.ඩී.එස්.එච්. දිසානායක*[1]

ශ්‍රී ලංකාවේ ඉපැරණි ලාක්ෂා කලාව මහින්දාගමනයත් ලැබුණු ශිල්ප ක්‍රමයක් ලෙස සැලකෙන මෙම කලාව අතිතයේ රට පුරා පැතිර තිබූ බවට ඉතිහාසයේ සඳහන් වේ. ලංකාවේ බහුල වසයෙන් ලාක්ෂා නිර්මාණ හමු වූ  ප්‍රදේශ ලෙස මාතලේ හපුවිද, බලංගොඩ පල්ලේකන්ද, පාතදුම්බර, තංගල්ල ප්‍රදේශ පෙන්වා දිය හැකි ය. වර්ථමානයේ මාතලේ දිස්ත්‍රික්කය තුළ මෙම කලාව ව්‍යාප්ත ව පවති. මේ සඳහා අවශ්‍ය ලාකඩ ලබා ගන්නේ ලාක්ෂා කෘමියාගෙනි. එම කෘමියා කැප්පෙට්ටියා, කෝන්, හිඟුරු යනාදි ගස්වල වාසය කරන අතර මෙම කෘමියා ශාකය තුළ වාසය කිරීම මඟින් ඔවුන්ගේ ශරීරය තුළින් පිටවන ඉටි වර්ගයක් මඟින් මෙම ලාකඩ නිපදවනු ලැබේ. වර්තමානයේ මේවාට අවශ්‍ය කරන ලාකඩ ඉන්දියාවෙන් ආනයනය කරනු ලබයි. මාගේ මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ මෙරට පවතින පාරම්පරික ලාක්ෂා කර්මාන්තයේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සංචාරක කර්මාන්තයට උචිත පරිදි යොදා ගැනිමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිමයි. ඒ සඳහා මා විසින් සාහිත්‍යමය සාධක පොත් පත් මඟින්ද ප්‍රායෝගික කරුණු මාතලේ හපුවිද පාරම්පරික ලාක්ෂා ගම්මානය මූලික කරගනිමින් කරන ලද ක්ෂෙත්‍ර චාරිකා මඟින් ද එකතු කරගත්තේ ය. මෙම සාහිත්‍ය විමර්ශණය මඟින් සොයා ගත් කරුණු අනුව ලෝකයේ අනෙක් රටවල මෙම කලාවේ ව්‍යාප්තිය පිළිබඳ හඳුනා ගත හැකි විය. ජපානය, චීනය, බංගලාදේශය, ඉන්දියාව වැනි රටවල් තුළ නූතනයේ නිර්මාණ සිදු කරන අතර  මෙරට සතු ලාක්ෂා කලාවේ හා අනෙකුත් රටවල හමු වන මෙම කලාවන්හී විශාල වෙනස්කම් පවති. මෙම වෙනස නිසා මෙරට ලාක්ෂා කලාව සුවිශේෂි තැනක් ගනි. එහෙත් අප තව මත්  වෙළඳපොළ අවශ්‍යතා මත නිර්මාණ සිදු කරනුයේ අල්ප ලෙසට ය. එම නිසාවෙන් විශාල වෙළඳපළක් මේ වන විට අතිරික්තයක් ලෙස ලෝකය තුළ පවතී. ඒවායේ වාසි අනෙකුත් රටවල් ලබා ගනි. එහෙත් ඔවුන්ගේ නිර්මාණ මෙරට නිර්මාණ මෙන් උසස් කලාත්මක බවකින් යුක්ත ඒවා නො වේ. එහෙත් ඒවා පාරිභෝගික භාණ්ඩ වශයෙන් ඉහළ වටිනාකමක් තිබේ. අප රට තුළ කරනු ලබන නිර්මාණ සමරු ලෙස ගත හැකි නිර්මාණ වන අතර නවීන ලෝකයේ අවශ්‍යතා මත නිර්මාණය සිදු නොකිරිම විශාල ගැටලුවකි. ලාක්ෂා කර්මාන්තයේ ශිල්ප ක්‍රම යොදා ගනිමින් නව්‍ය වෙළඳපොළ මත නිර්මාණ සිදු  කිරිම තුළින් ගෝලිය මෙන් ම සංචාරකයන්ගේ ආකර්ෂණය ද ලබා ගත හැකි ය. මේ සඳහා ගත යුතු පියවර ලෙස මෙම කලාවේ නිරත වන අයට නවීන වෙළඳපළ හා නවෝත්පාදනයන් පිළිබඳ ව දැනුමක් ලබා දිමයි. එහෙත් ඉපැරණි තාක්ෂණික ශිල්ප ක්‍රම වන පට්ටල් හා නියපොතු වැඩ යන ක්‍රම ද යොදා ගනිමින් නිර්මණ සිදු කළ යුතු ය. එතුළින්  කලාවේ අනන්‍යතාවන් ආරක්ෂා කරගත හැකි වේ.  ඉන්දියාව වැනි රටවල ලාක්ෂා පට්ටලයට තාක්ෂණය එක් කර  තිබේ. මෙවැනි ක්‍රම මෙරට තුළ භාවිත කිරිම තුළින්  වෙළඳපළට තරඟකාරී ලෙස හා මහා පරිමාණ ලෙස නිෂ්පාදන යොමු  කිරිමට හැකියාව ලැබේ. මා මෙම පර්යේෂණය තුළින් සොයා ගත් කරුණු තුළින් එලඹිය හැකි නිගමනය වන්නේ මෙරට මෙරට ලාක්ෂා කර්මාන්තයේ නිරත වන ශිල්පින්ට අවශ්‍ය කරන මූලික පහසුකම් ලබා දීම සහ වෙලඳපළ ප්‍රවණතා පිලිබඳ අවබෝධයක් ලබා දීම තුළින් මෙරට සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ප්‍රායොගික ව යොදාගත හැකි බවයි.

***ප්‍රමුඛ පදඃ*** ලාක්ෂා කලාව, නවෝත්පාදනය, සංචාරක කර්මාන්ත, ගෝලිය වෙළඳපළ, සාම්ප්‍රදායික කලාව

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, hansakashehan78@gmail.com

# JOB SATISFACTION AND ORGANIZATIONAL COMMITMENT OF EMPLOYEES IN FAST FOOD RESTAURANTS AMIDST ECONOMIC CRISES IN SRI LANKA: SPECIAL REFERENCE TO KFC RESTAURANTS IN WESTERN PROVINCE IN SRI LANKA

*W.A. Hemachandra[1] D.D.P. Sanjeewa[2]*

The hospitality industry is one of the largest developing service industries in the world. The global hospitality market grew from $4,390.59 billion in 2022 to $4,699.57 billion in 2023 at a compound annual growth rate (CAGR) of 7.0%. The hospitality industry is experiencing significant growth in today's world and is widely recognized as a major contributor to the global economy. It plays a vital role in providing hospitality services to communities and attracting tourists. Since the hospitality industry is service oriented industry, all employees in the industry are equally important and their commitment directly affects the success of the organization. However, there are less studies conducted under job satisfaction and organization commitment in fast food outlets in Sri Lanka. Following the issue, the study aims to identify the impact of Job Satisfaction dimensions (Pay, Employee Empowerment, Supervision, Promotion and Training) on Organization Commitment of employees in Fast Food outlets in Sri Lanka. The study is identifying employees of fast-food outlets as the population of the current research. Data was collected through a well– structured questionnaire from a sample of 150 employees who work in KFC fast food outlets in western province using simple random sampling technique. Regression analysis, reliability analysis, descriptive analysis, and correlation analysis are mainly used in this study. SPSS version 26 software was used to analyze data. Research findings indicate that Job satisfaction variables such as Pay, Employee Empowerment, Promoting and Training have a positive impact on organization Commitment, whereas Supervision have no impact on organization Commitment. The new study confirms the earlier findings by showing that organizational commitment is one of the most crucial factors for an organization’s performance and thus job satisfaction has a favorable impact on organizational commitment. This study offers a fresh contribution to the tourism sector’s efforts to retain and motivate its workforce.

***Keywords:*** Economic crises in Sri Lanka, Fast Food Restaurants, Job satisfaction, Organizational Commitment

---

[1] Department of Tourism & Hospitality Management, Faculty of Management Studies, Rajarata University of Sri Lanka, Mihintale. hm2018014@mgt.rjt.ac.lk

[2] Department of Tourism & Hospitality Management, Faculty of Management Studies, Rajarata University of Sri Lanka, Rajarata University of Sri Lanka, Mihintale. ddpsanjeewa@gmail.com

# පාරිසරික සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී සිදු වන පරිසර හානි පිළිබඳ අධ්‍යයනයක්

*ජේ.ඒ.එස්.එන්. කුමාර* [1] *ඒ.එම්.වී.පී.ඩබ්ලිව්. අබේකෝන්* [2]

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටකට පාරිසරික සංචාරක කර්මාන්තය අත්‍යන්තයෙන් ම සම්පතක් වුවත් තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී පරිසරයට එමගින් සිදුවන අහිතකර බලපෑම් ඉතා ඉහළ ය. ඒ අනුව මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ පාරිසරික සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ දී සිදු වන පරිසර හානි හඳුනාගෙන ඒවාට අවශ්‍ය පිළියම් යොදා තිරසාර පාරිසරික සංචාරක කර්මාන්තයක් ස්ථාපිත කිරීමයි. පර්යේෂණයට අදාළ ප්‍රාථමික දත්ත මීමුරේ, මිහින්තලේ, ත්‍රිකුණාමලය, මීයන් ඇල්ල, නාරංගල, ගලමුදුන, හන්තාන කඳුවැටිය යන සංචාරක ස්ථානවල සංචාරය කරමින් සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය, සම්මුඛ සාකච්ඡා මගින් රැස් කර ගැනිණි. පොත්, සඟරා, පර්යේෂණ පත්‍රිකා සහ අන්තර්ජාලය යන ද්විතියක මූලාශ්‍රය මගින් ද අදාළ දත්ත රැස් කර ගැනිණි. පාරිසරික සංචාරක කර්මාන්තය පදනම් කරගෙන මූලික ව ම ස්වභාව සෞන්දර්යය විඳීම, කඳවුරු බැඳීම, කඳු නැගීම්, වන සතුන් කුරුල්ලන් නැරඹීම, ගම්බද ප්‍රදේශවල සංචාරය, ආදී විවිධ සංචාරක ක්‍රියාකාරකම් සිදු කරයි. පාරිසරික සංචාරක කර්මාන්තයේ දී ස්වභාවධර්මය මත පදනම් ව තිරසාර කළමනාකරණයකින් සංචාරක ව්‍යාපාර කටයුතුවල නියැළීම නොවුණ හොත් ස්වභාවික පරිසරය විනාශ වනු ඇත. ශ්‍රී ලංකාවට ආවේණික ශාක හෝ ශාක කොටස්, සතුන් වෙනත් රටවලට අපනයනය, සංචාරක ස්ථානවල අපද්‍රව්‍ය බැහැරලීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම, ඉඩම් හායනය, පාංශු ඛාදනය, කොරල් පර සහ මුහුදු ජීවීන් විනාශය, සමරු තිළිණ සෑදීමට ස්වභාවික සම්පත් බහුලව භාවිතය, පාරිසරික සංචාරක ස්ථාන නැරඹීමට එන සංචාරකයන් ප්‍රමාණය වැඩි වීමෙන් පරිසර සමතුලිතතාව බිඳවැටීම, සංස්කෘතික කාරණා ස්වභාවික පරිසරය සමග බද්ධ කිරීමෙන් වැරදි මතවාද සංචාරකයන් අතර ප්‍රචාරය වීම ආදීය එලෙස උද්ගත ව ඇති ගැටලු වේ. ජෛව විවිධත්වයෙන් හා සංස්කෘතික උරුමයන්ගෙන් පොහොසත් ශ්‍රී ලංකාවේ පාරිසරික සංචාරක ව්‍යාපාරය නඟා සිටුවමින් පරිසර හානි වැළැක්වීමට පාරිසරික සංචාරක මුලපිරීම් සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය, ස්වාභාවික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, වගකිවයුතු වනජීවී සංචාරක ව්‍යාපාරය දිරිමත් කිරීම, සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම, පරිසර හිතකාමී ප්‍රවාහන විකල්ප ප්‍රවර්ධනය, අඩු බලපෑම් සහිත සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය, ආධාර සංචාරක ව්‍යාපෘති ප්‍රවර්ධනය, පාරිසරික බලපෑම් අවම කිරීම, සංචාරක පරිමාව කළමනාකරණය, සංචාරක කටයුතු අධීක්ෂණය, පර්යේෂණය වැනි යෝජනා ඉදිරිපත් කළ හැකි අතර එමඟින් තිරසාර පාරිසරික හිතකාමී සංචාරක කර්මාන්තය රටේ ආර්ථිකයට නිසැක ව ම ශක්තියක් වනවා සේ ම පරිසරයට ද හිතකාමී වන බව මෙම අධ්‍යනයෙන් පැහැදිලි විය.

***ප්‍රමුඛ පදඃ*** ශ්‍රී ලංකාව, පරිසරය,  සංචාරක කර්මාන්තය, ශ්‍රී ලංකාවේ ආර්ථිකය, පාරිසරික සෞන්දර්යය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. sanjaya.nayanakumara98@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. ssh2020005@ssh.rjt.ac.lk

# STUDY ON CHALLENGES & OPPORTUNITIES OF CULINARY TOURISM DEVELOPMENT: SPECIAL REFERENCE TO HATTON AREA

*P. Kamalapriya[1] D.D.P. Sanjeewa[2]*

The Hatton region in Sri Lanka has been identified as a tourist destination among domestic and foreign pilgrims and tourists, which has abundant tourism resources but has not yet been discovered as a separate area for tourism development. Culinary tourism presents fresh prospects for communities to seamlessly blend tourism with local food systems, thereby fostering economic growth, meeting the rising appetite for high-quality culinary experiences, and enriching the cultural heritage of the region. This research aims to analyze the key challenges and potential opportunities of tourism development in the Hatton region. The qualitative research approach was employed, and direct in-depth interviews were conducted with a sample of twenty tourism service operators, including divisional authentic food producers, food vendors, the Sri Lanka Tourism Development Authority, tea estate owners, and the divisional secretariat office in Hatton, a tourist destination. Thematic analysis was adopted to achieve the research objectives, using Nvivo version 11 for statistical data analysis of the study. The findings of the research highlight community willingness to involve in tourism operation, skillful residents making foods related to Indian Tamil and Sinhala mixed culture, natural and cultural tourist attractions related to Tamil and Sinhala culture as potential opportunities. Furthermore, a lack of community awareness and motivation on tourism, lack of government involvement, middle-income community lifestyle, and social media-addicted, unemployed young generation have been identified as challenges to developing culinary tourism in Hatton. The data was gathered during the COVID-19 pandemic period and economic crises, which limited the number of respondents expected to be interviewed. The study recommends that Sri Lankan policymakers promote tourism awareness programs, culinary trails, collaboration of local food vendors and government, quality assurance, and hygiene standards for the tourism development in the Hatton region, not only as a pilgrim destination but also as a destination of culinary vividness utilizing the "Culinary Tourism" concept.

***Keywords:*** Challenges and Opportunities, Culinary tourism, Tourism Development

---

[1] Department of Tourism & Hospitality Management, Faculty of Management Studies, Rajarata University of Sri Lanka, Mihintale. kamalapriya405@gmail.com
[2] Department of Tourism & Hospitality Management, Faculty of Management Studies, Rajarata University of Sri Lanka, Mihintale. ddpsanjeewa@mgt.rjt.ac.lk

# ලෝක සරණාගත ප්‍රස්තුතය අභිමුඛ ශ්‍රී ලංකා රජයේ කාර්යභාරය පිළිබඳ විමර්ශනය

*ඒ.ටී.සී. ප්‍රනාන්දු*[1]

සරණාගතයන් පිළිබඳ ප්‍රස්තුතය සමස්ත ලෝකයටම විසඳාගත නොහැකි වූ මානුෂීය අර්බුදයකි. ජාති, කුල,ආගම්, සමාජ හෝ යුද්ධය, ප්‍රචණ්ඩත්වය හේතුවෙන් තම රට හැරයාමට බල කෙරුණු පුද්ගලයින් සරණාගතයින් ලෙස හැඳින්වේ. එවන් සරණාගත සංක්‍රමණිකයන් විසින් ජීවත් වීමට බියෙන් තොර භූමියක්, සරණයක් සොයමින් තවත් රටකට සරණය සොයා පැමිණේ. සරණාගතයින් පිළිබඳ ප්‍රස්තුතය සමස්ථ ලෝකය විසින්ම ආමන්ත්‍රණය කළ යුතු ගෝලීය ගැටලුවක් බවට එසේ නිර්මාණය විය. 1951 සරණාගතයන් පිළිබඳ සම්මුතිය හා එහි 1967 ප්‍රොටොකෝලය සරණාගතයන් වෙනුවෙන් ජාත්‍යන්තරය තුළ ගොඩනගා ගන්නා ලද සරණාගතයන් පිළිබඳ නෛතික රාමුවයි. එහිදී ශ්‍රී ලංකාව සරණාගතයන් පිළිබඳ 1951 සම්මුතියෙහි පාර්ශවකරුවෙකු නොවේ. නමුත් සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය හා අත්සන් තබන ලද කෙටිකාලීන විසඳුම් ලබාදීමේ අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සරණාගතයින් සම්බන්ධව කටයුතු කරනු ලැබේ.ඒ මත පදනම්ව මෙම පර්යේෂණයේ න්‍යායාත්මක පදනම ගොඩ නගා ගෙන ඇත. ඒ අනුව මෙම පර්යේෂණය මගින් මෙරටට පැමිණෙන සරණාගතයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ කාර්යයභාරය පිළිබඳ විමර්ශනයක් සිදු කෙරේ. පර්යේෂණයට අදාළව ජාතිකව හා ජාත්‍යන්තරව සිදු කරන ලද සාහිත්‍යය විමර්ශනය තුළින් හෙළි වූයේ ශ්‍රී ලංකාව තුළ මීට පෙර මෙවැනි පර්යේෂණයක් සිදු කර නොමැති බවයි. ඒ තුළින් පර්යේෂණ හිඩැස මතු කරන්නා ලදී. මෙරටට සංක්‍රමණය වන සරණාගතයින්ගේ නෛතික පදනම, ඔවුන්ගේ ආහාරපාන, සෞඛ්‍ය තත්වය, අධ්‍යාපන අවස්ථා, වාසස්ථාන ආදී සරණාගතයින්ගේ ජීවන තත්වය සම්බන්ධව රජයේ කාර්යභාරය මැන බැලීම මෙම පර්යේෂණය මූලිකව අරමුණු කරගෙන ඇත. එහිදී අධ්‍යයන ප්‍රදේශය ලෙස මීගමුව ධීවර සහයෝගීතා ව්‍යාපාරයේ අධීක්ෂණය යටතේ රැඳී සිටින සරණාගත ප්‍රජාව තෝරාගන්නා ලදී. ඒ අතුරින් 50 කුගෙන් යුත් නියැදියක් තෝරා ගනු ලැබූ අතර එම නියැදිය සරණාගතයන් 40 දෙනකු ගෙන් ද,රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් 10 දෙනෙකුගෙන්ද සමන්විත වේ.මෙම පර්යේෂණය ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත දෙවර්ගයම භාවිතා කරමින් සිදු කරනු ලබන ගුණාත්මක අධ්‍යයනයකි. ප්‍රාථමික දත්ත සහභාගී නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරගත් අතර ද්විතික දත්ත පොත්පත්,සගරා,ලිපි, අන්තර්ජාලය යටතේ රැස්කර ගන්නා ලදී.මෙම පර්යේෂණය තුළින් ලබා ගන්නා ලද අවසාන නිගමනය වූයේ ශ්‍රී ලංකාව තුළ සරණාගතයන් වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කලයුතු බවයි.

***ප්‍රමුඛ පදඃ*** සරණාගතයින්, ලෝක සරණාගත ප්‍රස්තුතය, 1951 සරණාගත සම්මුතිය, ශ්‍රී ලංකා රජය, සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය

[1] දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. chashminifdo@gmail.com

# SERVICE QUALITY AND CUSTOMER SATISFACTION IN TRADITAIONAL FOOD COURTS (HELA BOJUN RESTAURANTS) IN SRI LANKA

*D.D.P. Sanjeewa*[1]

Hela bojun restaurant is a traditional food court concept initiated by the Department of agriculture in the aim of empowering the rural women by generating agriculture based entrepreneurship, employment and private enterprise opportunities while encouraging young people to become aware of and interested in local, wholesome, and nutritious traditional cuisine and reducing the effects of the unhealthy Western fast-food culture. However, the level of service quality of Hela bojun restaurants and customer satisfaction has not been measured for years since its initiation. The purpose of this study is to examine the relationship between service quality and customer satisfaction in Traditional food courts in Sri Lanka. Quantitative research approach was followed for the study and a structured questionnaire was developed and distributed among 150 customers who visited the food courts in Southern Province applying the convenient sampling method. This study identified service quality dimensions as independent variables and customer satisfaction as dependent variable based on SERVQUAL model. Gathered data was analyzed through univariate, bivariate and multivariate analysis using SPSS version 26. According to the results of the analysis, Reliability, Responsiveness, Assurance and Empathy have a positive significant impact on customer satisfaction whereas a negative insignificant impact of empathy on customer satisfaction. According to the findings, the service quality act as an important factor of higher customer satisfaction in traditional Sri Lankan food courts. The study was conducted during the post-pandemic period limiting to Southern Province which identified as limitations of the study. To achieve a high level of customer satisfaction, supervisors and operators would concentrate on Reliability, Responsiveness, and Assurance while focusing on Empathy, which will lead to customer retention and increased socio-economic benefits.

***Keywords:*** Service quality, Customer satisfaction, Hela bojun restaurant, Traditional food courts

[1] Department of Tourism and Hospitality Management, Faculty of Management Studies, Rajarata University of Sri Lanka. ddpsanjeewa@gmail.com

# THE PROCEEDINGS OF 3rd UNDERGRADUATE RESEARCH SYMPOSIUM - 2023

ISSN 2719-2253
9 772719 225005

FACULTY OF SOCIAL SCIENCES AND HUMANITIES
RAJARATA UNIVERSITY OF SRI LANKA - MIHINTALE